Mr. A.T.S. Pushpakumara, Mr. G.M.G. Priyantha, (Deputy Principal Officers); Mr. M.R.D.T. Thilakasiri (Assistant Principal Officer); Mr. U.D.M.M. Wijesinghe (Parliamentary Officer); Mr. A.U. Premachandra (Senior Assistant Parliamentary Officer) Mrs. N.A. Dharmadasa (Telephone Supervisor)

# ADMINISTRATION DEPARTMENT

**DIRECTOR (ADMINISTRATION) -** Miss. G. Thatchanarany

**DEPUTY DIRECTOR (ADMINISTRATION) -** Mrs. E.D.S.M. Fernando

**ESTABLISHMENTS OFFICE -** Mr. W.P.L. Jayasinghe, (Assistant Director - Administration); Mr. W.A.K.C. Udapola, Mrs. S.P. Gamage (Principal Officers); Mrs. U.N. Panditha, Mrs. H.A.T.D. Hewaarachchi, Mrs. G.N.D. Thilakarathna, Mr. H.U.P. Kumara (Deputy Principal Officers); Mrs. D.M.D. Alahakone, Mrs. K.A.M.R.S. Rodrigo, Mr. D.G.M.S.M. Dehigahalanda (Assistant Principal Officers); Mrs. A.N.D. Gunarathna, Mrs. K.I.M. Perera, Mrs. W.S.Y. Zoysa, Mrs. R.R.G.D.K. Jayathilaka (Parliamentary Officers); Mrs. H.A.R.R. Gunasekara, Mrs. W.R.G.S. Shamalee (Assistant Parliamentary Officers)

**MEMBERS' SERVICES OFFICE -** Mr. M.U.M. Vasik (Assistant Director- Administration); Mr. E.D.J. Wickramasinghe (Principal Officer); Mr. W.P.J. Pushpakumara Pathirana, Mr. P. D. N. Fernando (Deputy Principal Officers); Mrs. R.P.Y.T. Warusawithane (Assistant Principal Officer); Mr. K.S. Silva (Assistant Parliamentary Officer)

**FOREIGN RELATIONS AND PROTOCOL OFFICE –** Mrs. G.V. Ama Sudanthi, Mrs. T.W.A. Jayaratne (Senior Parliamentary Protocol Officers); Mr. H.N.D.R.B. Nanayakkara (Assistant Parliamentary Protocol Officer)

**TRANSPORT OFFICE -** Mr. S.B. Kulugammana (Assistant Director-Administration); Mr. W.G.S. Shantha, Mr. M.R.B. Senaratne, Mrs. I.C.K. Ranasinghe, Mr. A.G.R.K. Abeyratne (Parliamentary Officers); Mr. R.P.H. Kularatne (Assistant Parliamentary Officer)

**RIGHT TO INFORMATION UNIT -** Mr. P. K. D. S. W. Wijegunawardena (Deputy Principal Officer); Mrs. D.P.A.P.H. Kulathunga (Parliamentary Officer)

**SENIOR STENOGRAPHERS -** Mr. H.P.C.S. Tillakaratne, Mr. R.P. Rasika Rajapaksha

**STENOGRAPHERS -** Mrs. P.D.N.P. Kumari, Mrs. A. Rajanimala, Mrs. D.W.B.A. Jayanatha, Mrs. P.W.C. Priyadarshani

**SENIOR TRANSLATORS -** Mrs. A. Rukmanidevi, Mr. S.M. Nazir, Mr. S.M.A.K. Karunaratne, Mr. M.M. Halimdeen

**BUNGALOW MANAGER -**

**RECORD KEEPER -** Mr. E.K.K.P. Pushpalal

**DOCUMENTATION SUPERVISOR –** Mr. S.V. Bokalawela

## HANSARD DEPARTMENT

**EDITOR OF HANSARD –** Mrs. C.N. Lokukodikara de Silva

**DEPUTY EDITORS OF HANSARD –** Mrs. S.K.M.W. Samarasekera, Mr. M.S.M. Linnas, Miss H.G. Pujika

**ASSISTANT EDITORS OF HANSARD -** Mrs. R.D.P. Sujeewani, Mrs. D.P.A.N.N. Weerasinghe, Mrs. K.G.N.P. Rabel, Mrs. K.P.S. Perera, Mrs. K.A.J.S. Perera, Mrs. K.D.S. Kularatne Aluthgamage, Miss Geethani Warnasuriya, Mr. H.G. Lakshitha, Mrs. P.M.G.P. Priyangika, Mrs. M.I.S. Nishra

**SENIOR HANSARD REPORTERS –** Mrs. H.D.L.S. Peiris, Mrs. P.V.T.V. Gamage Arumadura, Mr. S.M.R.B. Pataliya, Mrs. W.A.D.P. Wijekonda, Miss S.M.A. Kumuduni, Mrs. F.H.A.N. Silva, Mrs. E.H.W. Irangika, Mrs. T.T. Kumanayake, Mrs. H.R.P. Chandani, Miss C.R. Karunaratna, Mr. M.T.A.D. Millagastenna, Mr. H.G. Manjula, Mrs. D.R.D. Hettige, Miss M.M.C.K. Marasinghe, Mrs. M.P. Niroshi Sajeewani, Mrs. K.P. Pathma

**HANSARD REPORTERS –** Mrs. T.U. Weerasekara, Miss G.A. Hiruni Punsara, Mr. N. Ketheeswaran, Mrs. M. Pushpakumara, Mrs. T.N. Samarasinghe, Mr. K.M.D. Lanka, Mrs. H.R.U.S. Nivarchana, Mrs. E.V.T.R. Edirisinghe, Mrs. Indunil Dhammika, Mrs. M.A. Jesmina, Miss A. Mirunalini, Miss M.B.T.N. Priyadarshani, Mrs. W.G.P.R. Samanmali, Mrs. R.S. Alahapperuma, Mrs. H.G. Maduka Shithari

**SENIOR COMMITTEE REPORTERS -** Mrs. P.G.K.N. Mihiri, Mrs. J.A.T. Samanthika, Mrs. R.M. Darshika Siriwardena

**COMMITTEE REPORTERS –** Miss S. Thushanthini, Mrs. J.K.I. Nilmini, Mrs. M.A.K.S. Sanjeewani, Miss. R.P.G. Kumari, Miss T.P.R.T. Kumari, Mrs. L.P.Wadanambi, Mrs. D.S. Hewavithana, Miss S.N. Kalawana

**SENIOR INDEXING OFFICERS –** Mr. M.M.M. Nasaar, Miss S.A.D. Manori, Mr. J. Naushad, Mrs. M.B.V.N.T. Fernando, Mr. A.M.C.M. Adikari

**RECORDING SUPERVISOR –** Mr. A. V. Kaggodaarachchi

## FINANCE AND SUPPLIES DEPARTMENT

**DIRECTOR (FINANCE) –** Mr. G. Sarath Kumara

**FINANCE AND ACCOUNTS OFFICE –** Mrs. K.A.I. Senarathna, (Assistant Director - Administration); Mr. L.B.R. Pathmasiri (Principal Officer); Mrs. I.K. Samarasekera, Mrs. D.C.S. Rupasinghe (Deputy Principal Officers); Mr. M.A.K.D.C. Kumara, Mrs. R.M.S. Samanjika, Mr. S.L. Wickrema, Mr. W.K.D.S. Kumarasiri, Mrs. T.P. de Costa (Assistant Principal Officers); Mrs. L.D.H. Molligoda, Mr. N. D. H. D. Perera, Mrs. W.W.S.R.M.H. Samaranayake (Parliamentary Officers)

**SUPPLIES AND SERVICES OFFICE –** Mr. Anil Hewawasam (Assistant Director - Administration); Mrs. H.M.C.N.K. Herath, (Principal Officer); Mrs. J.A.D. Jayasinghe (Deputy Principal Officer); Miss A.P.K.K.P. Thilakaratne (Assistant Principal Officer); Mrs. M.E.K.K. Fernando, Mrs. L.A. Ranaweera, Mrs. A.I.B. Weeratunga, Mrs. D.R.A.M.D. Sewwanthi, Mr. T.G. Balasuriya, Mr. T. H. S. U. Thirimanna., Mr. D.A.M. Baddewithana (Parliamentary Officers)

**CATERING ACCOUNTS OFFICE –** Mr. I.M.A.K. Idirisinghe (Assistant Parliamentary Officer)

**SENIOR STORES OFFICER –** Mr. K.D. Kapila

**RECEIVING OFFICER –** Mr. B. K. Sampath

**SHROFF –** Mr. M.G.N.G. Dharmasena

**STOREKEEPER (TECHNICAL) -** Mr. M.P.P. G. Silva

**PURCHASING OFFICER –** Mr. A.E.S.P. Perera

**STOREKEEPER –**

## DEPARTMENT OF THE CO-ORDINATING ENGINEER

**CO-ORDINATING ENGINEER –** Mr. D.L.D. Adikari

**DEPUTY CO-ORDINATING ENGINEER –** Mr. K. K. D. Hannadi

**CHIEF INSPECTOR (CIVIL) –** Mr. C.S. Balasooriya

**SENIOR CHIEF INSPECTOR (ELECTRICAL) –** Mr. W.G.W.M.P.P.B. Weerakoon

**INSPECTOR (CIVIL) –** Mr. C. U. B. Gamage

**SENIOR IINSPECTOR (ELECTRICAL) -** Mr. S.S. Elvitigala

**ASSISTANT PRINCIPAL OFFICER –** Mrs. A.L.A.U. Amarasinghe

**SENIOR TECHNICAL OFFICER (ELECTRICAL) -** Mr. W.R.A. de Mel, Mr. P.W.A.U.K. Dayaratne, Mr. P.R. Karunathilake, Mr. P.A.S. Lalith Kumara

**TECHNICAL OFFICER (ELECTRICAL) -** Mr. N.D.C.D. Kannangara, Mr. N.M.S.S. Nawarathne

**TECHNICAL OFFICER (CIVIL) -** Mrs. H.D. Jayakody

## CATERING AND HOUSEKEEPING DEPARTMENT

**DIRECTOR (CATERING AND HOUSEKEEPING SERVICES) -** Mr. R. H. Edirisinghe

**EXECUTIVE CHEF -** Mr. L.K.C.S. Gajanayake

**EXECUTIVE HOUSEKEEPER -** Mr. D.D.I. Thushara

**F & B MANAGER -** Mr. K.M.H. Nalin Rodrigo

**DEPUTY F & B MANAGER -**

**SOUS CHEF -** Mr. D.M.M.M.B. Ulapane

**ASSISTANT HOUSEKEEPER -** Mr. M.D. Perera

**SENIOR RESTAURANT MANAGER -**

**RESTAURANT MANAGERS -** Mr. W.S.S. Perera, Mr. K.A.D.A. Wijesiri, Mr. K.A.A. Jayantha, Mr. L.P. Perera, Mrs. S.C. Renuka, Mr. M. K. N. Daminda

**GARDEN SUPERVISOR –** Mr. R.M.J. Rajapaksha

**SENIOR HOUSEKEEPING SUPERVISORS -** Mr. M.D.E.M.N. Karunarathna, Mr. K.N. Basnayake, Mr. S.D. Rathnasiri

**HOUSEKEEPING SUPERVISORS –** Mr. G.R.S.K.D. Gamlath, Mr. B.D. Pushpakumara

**F & B SUPERVISORS -** Mr. M.G.U. Jayasiri, Mr. K.S. Sumanaweera, Mr. S.A.N. Senadhira, Mr. B.M.C. Perera, Mr. G.D. Anil, Mr. W. N. R. Wijewardena, Mr. D. H. B. B. Pathamasiri, Mr. N. W. M. Turin, Mr. H. D. T. Priyantha, Mr. A.D.D.S. Gunasekara, Mr. S.J. Gamage, Mr. H.R.K.S.K.Peiris

**KITCHEN STEWARDING SUPERVISOR -** Mr. G.A. Wijesinghe

**CHEF-DE-PARTIE -** Mr. P.R. Wijesinghe, Mr. B.T.R. Hewamana , Mr. R.P. Helambage, Mr. M.W.W.M.P.C.C. Walgama,

**SENIOR LEADING COOK -**

**LEADING COOKS -** Mr. J.M.R. Premalal, Mr. K.D. Piyasiri, Mr. D.H.A.A. Kumarasiri, Mr. H. Wijesiri, Mr. A.A.D. Suranga, Mr. K.V.A. Jayawardene, Mr. W.R.G.A.P. Patrick, Mr. R.M.M. Srimal, Mr. G.S.P. Suraweera, Mr. B.A.P. Pushpakumara

**PARLIAMENTARY OFFICER -** Mr. M.M. Dharmasena

## DEPARTMENT OF LEGISLATIVE SERVICES

**DIRECTOR (LEGISLATIVE SERVICES) -** Mr. H.E. Janakantha Silva

**TABLE OFFICE -** Mr. M.J. Perera, Mr. M.M.M. Mabrook (Assistant Directors - Administration); Mr. P.H. Kumarasinghe, Mr. K.R. Herath (Principal Officers); Mrs. V.P.G.S. Vidanapathirana, Mr. R.A.R.L. Ranawaka (Deputy Principal Officers); Mrs. A.C.F. Nusrath (Assistant Principal Officer); Mrs. H.E.C. Silva, Mr. U.P.B.M. Undugoda, Mrs. N.N. Hettige, Miss E.H. Jayaweera, Mr. K.D.G.M. Krisantha (Parliamentary Officers)

**BILLS OFFICE -** Mr. D.D.U.K. Munasinghe (Assistant Director - Administration); Mr. A.S. De Silva (Principal Officer); Mr. J. Naseerdeen, Mrs. K.C.K. Peiris, Mrs. R.A.D.N. Geyowanee (Assistant Principal Officers); Mr. J.T.L.P. Sameera, Miss. D.R.K. Ranasinghe (Parliamentary Officers)

**COMMITTEE OFFICE -** Mrs. C.I. Dissanayake (Assistant Director- Administration); Mr. N.N. Wewelwela, (Principal Officer); Mrs. R.A.N.D. Alwis, Mr. R.C. Wijeyathilake, Mrs. W.M.L.M. Weerasinghe (Assistant Principal Officers); Mrs. E.A.N.M. Edirisinghe, Mrs. H.N. Fernandopulle (Parliamentary Officers)

**PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE -** Mrs. N.S. Wickramarathne, Mrs. A.C.P. Suriyapperuma (Assistant Directors - Administration); Mrs. C.M. Bulathsinhala (Principal Officer); Mrs. B.J. Abeysinghe, Mr. S.A.M. Shaheed (Deputy Principal Officers); Mrs. G.R.U. Gamage, Mrs. W. L. S. D. de Alwis (Assistant Principal Officers); Mr. K.M.G.K. Jayawardana, Mrs. U.M.S. Prabashini, Mrs. J.M.S. Nirmani, Miss G.K.C. Thilakarathna, Mrs. R.C. Kulathilaka, Mrs. G.M.H.S. Gamlath, Miss. H.M.D. Lakmali , Mrs. M. S. Bandulahewa (Parliamentary Officers)

**PUBLIC PETITIONS COMMITTEE OFFICE -** Mrs. K.T.C.K. Peiris (Assistant Director - Administration); Miss. S.R.M.H.G. Samaradiwakara (Principal Officer); Mr. H.R.C. Silva, Mrs. S.W.T.R. de Silva (Deputy Principal Officers); Mr. K.T.L.A. Chandrasiri (Assistant principal Officer); Mrs. B.S. Rangika, Mrs. H.G.K. Buddhika (Parliamentary Officers)

**MINISTERIAL CONSULTATIVE COMMITTEE OFFICE -** Mr. A.A.S.P. Perera (Assistant Director - Administration); Mr. W.W.N.N.C. Fernando (Principal Officer); Mrs. C.M. Subasinghe, Mrs. M. K. S. D. Alwis, Mrs. D.V.O. Weerakoon (Deputy Principal Officers); Miss. R.M.D.K. Priyadarshani (Assistant Principal Officer); Miss D.I.T. Sarathchandra (Parliamentary Officer)

**LIBRARIAN -** Mr. S.L. Siyath Ahemed

**DEPUTY LIBRARIAN -** Miss. K.D.S. Wijenayake

**ASSISTANT LIBRARIAN -** Mr. G. Ratnayake

**JUNIOR ASSISTANT LIBRARIAN GRADE I -** Mr. W.A. Gunarathna

**JUNIOR ASSISTANT LIBRARIAN -** Mr. H.A.S.S. Perera

**CHIEF RESEARCH OFFICER -** Mr. G. Kumanayake

**SENIOR RESEARCH OFFICER -** Mr. M. Ajiwadeen, Mrs. G.R.A. Godagama, Mrs. P.L.T. Erandathi

**RESEARCH OFFICERS -** Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas

**CHIEF PARLIAMENTARY INTERPRETER** - Mr. W.M.U. Bandara

**DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS** - Mr. I.L. Abdul Jabbar, Mr. J.A.S.P. Perera, Mr. C.J. Karunaratne

**SENIOR PARLIAMENTARY INTERPRETERS** - Mr. K.D.R. Padmasiri, Mr. A. Saravanabavanandan, Mr. A.G. Mohamed Fiqrhi, Mr. G.F.B. Sureshwaran, Mrs. N.B.C.J. Nissanga, Mrs. H.V.S. Heendeniya, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. M.H.M. Ramis

**PARLIAMENTARY INTERPRETERS** - Mr. D.D.V.N. Dhammage, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mrs. A.L.A.D. Thiumini, Mr. M.Z.M. Azka, Mrs. A.R.Thirukumar, Mr. M.I.M. Fazi, Mr. N.J. Wickramage, Mr. P.M.A. Hussain, Mr. B.M. Razeel

## DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

**DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT)** - Mr. H.M.C. Perera

**SYSTEMS ENGINEER** - Mr. N.B.U. Nawagamuwa

**SYSTEMS ANALYST** - Mr. C.J. Willoraarachchi

**COMMUNICATION / SECURITY ENGINEER** - Mr. G.N. Lakmahal

**SYSTEMS DESIGNER** - Mr. M.N.C. Wickramasinghe

**SYSTEMS ADMINISTRATOR -** Mr. A.S.D.M. Wickramaratne

**WEB AND NETWORK ADMINISTRATOR -** Mr. N.G.L.S. Karunathilaka

**DATA BASE ADMINISTRATOR-** Mr. N.M.P.U. Premachandra

**SENIOR COMPUTER PROGRAMMERS-** Mr. D. Panditha, Miss P.M.M. Chandima

**COMPUTER PROGRAMMER -** Mrs. S.A.A.B. Athukorala

**SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) -** Mr. U.L. Geeganage

**SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) -** Mr. M.N.M. Shifaq

**SENIOR ASSISTANT COMPUTER PROGRAMMER -** Mrs. P.L.I.G. Cooray

**SENIOR HELP DESK CO-ORDINATOR** - Mrs. B.N.H. Thissera

**PARLIAMENTARY OFFICER –** Mr. W.V.R. Wickramaratne

**SENIOR COMPUTER OPERATORS** - Mrs. P. Jehanya, Mr. J.S. Colombage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyatunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Ali, Mr. A.R.M. Rikaz Ali, Mr. A.M. Fowsul Ameen

**SENIOR COMPUTER TECHNICIANS -** Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

**SENIOR TECHNICAL ASSISTANTS -** Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

## DEPARTMENT OF COMMUNICATION

**PUBLIC OUTREACH OFFICER -** Mrs. Y.L.R. Nootan

**MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) -** Mr. U.G.N. Duminda

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (SINHALA) -**

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (TAMIL) -** Mr. S. Jeyaprakash

**MEDIA OFFICE COORDINATOR (SINHALA) -** Mr. S.A.S.K. Silva

# පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**නවවන පාර්ලිමේන්තුව - පළමුවැනි සභා වාරය**

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்
ஒன்பதாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்

# PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT
**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
**NINTH PARLIAMENT - FIRST SESSION**


**287** වන කාණ්ඩය | தொகுதி **287** | **VOLUME 287**


## පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2021* නොවැම්බර් *23* වන අඟහරුවාදා**
*2021 நவம்பர் 23, செவ்வாய்க்கிழமை*
*Tuesday, 23rd November, 2021*

---

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### 2021.11.20 වන දින ගරු තිසකුට්ටි ආරච්චි මහතා පාර්ලිමේන්තුවේදී කළ කථාව
### 2021.11.20ஆம் திகதி மாண்புமிகு திஸகுட்டி ஆரச்சி பாராளுமன்றத்தில் ஆற்றிய உரை
### SPEECH MADE BY HON. THISAKUTTI ARACHCHI IN PARLIAMENT ON 20.11.2021

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2021 නොවැම්බර් 20 දින අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට සහභාගි වෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිසකුට්ටි ආරච්චි මහතා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ සහ පාර්ලිමේන්තුවෙන් පිටස්තර කාන්තාවකගේ නම් සඳහන් කරමින් මෙම උත්තරීතර සභාවට අගෞරවයක් වන අයුරින්, විශේෂයෙන්ම කාන්තා පාර්ශ්වයට අපහාස කරමින් සිදු කරන ලද කථාව සම්බන්ධයෙන් ද, ඊයේ දින, එනම් නොවැම්බර් 22 දින උදෑසන පාර්ලිමේන්තුවේ කාන්තා මන්ත්‍රී සංසදය විසින් මා හමුවීමෙන් අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් ඒ සිද්ධිය පිළිබඳව සභා ගර්භයේදී මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය ගැඹුරින් අධ්‍යයනය කර ඒ සම්බන්ධයෙන් මෙම ගරු සභාවේ විශේෂ අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.

ගරු තිසකුට්ටි ආරච්චි මහතා විසින් විශේෂයෙන්ම කාන්තා පාර්ශ්වයට අපහාස කරමින් මෙම උත්තරීතර සභා ගර්භයේදී කරන ලද එම අශෝභන කථාව පිළිබඳව මාගේ කනගාටුව ප්‍රකාශ කරන අතරම, මෙවැනි අයෝග්‍ය, අශෝභන වචන භාවිත කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙන්ම පිටස්තර පාර්ශ්වයන්ට අපහාස කරමින් කරනු ලබන කථාවලින් වැළකී සිටින ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිසකුට්ටි ආරච්චි මහතාට දැඩි ලෙස අවවාද කරමි.

තවද, මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී වළක්වා ගැනීම පිණිස දෙපාර්ශ්වයේම ප්‍රධාන සංවිධායකවරයන් විසින් තම පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. දිගින් දිගටම මෙවැනි තත්ත්වයන් පාර්ලිමේන්තු සභා ගර්භයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් සිදු කරනු ලබන්නේ නම්, ස්ථාවර නියෝගවලට අනුකූලව සභාවේ විනය පවත්වාගෙන යාම සඳහා දැඩි ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට මට සිදුවන බව ද මෙයින් අවධාරණය කරමි.

## II

### අය වැය කාරක සභා විවාදයේදී මන්ත්‍රීවරුන් අසුන් ගැනීම පිළිබඳ රීති
### வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்தின் பொழுது உறுப்பினர்களின் இருக்கை தொடர்பான விதிகள்
### RULES PERTAINING TO SEATING OF MEMBERS DURING COMMITTEE STAGE DISCUSSION OF BUDGET

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2022 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස කාරක සභා අවස්ථාවේ විවාදය අද දින ආරම්භ කිරීමට නියමිත බැවින් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ

[ගරු කථානායකතුමා]

විවාදයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ අසුන් ගැනීම පිළිබඳ රීති සම්බන්ධයෙන් පසුගිය වසරවලදී මෙන්ම මෙම වසරේදීද, සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ දැන ගැනීම සහ අවධානය සඳහා මතු සඳහන් නිවේදනය මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

සෑම මන්ත්‍රීවරයෙකුටම වෙන් කරන ලද ආසනයේ සිට පමණක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ විවාදයේදී කථා කළ යුතු බවට හත්වැනි පාර්ලිමේන්තුවේදී හා අටවැනි පාර්ලිමේන්තුවේදී ද, අවස්ථා තුනකදීම මාගේ පූර්වගාමී කථානායකවරයන් විසින් අසුන් ගැනීම සම්බන්ධයෙන් කරන ලද තීරණය තවදුරටත් තහවුරු කරමින් එම තීරණය යෝග්‍ය පරිදි ඉදිරියටත් එලෙසින්ම අනුගමනය කළ යුතු බවට මම අවධාරණය කරමි.

ඒ අනුව, 2021.11.08වන දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළැඹි තීරණය අනුව ද අය වැය කාරක සභා අවස්ථාවේදී රාජ්‍ය අමාත්‍යවරයාට/නියෝජ්‍ය අමාත්‍යවරයාට, කැබිනට් අමාත්‍යවරයා ආසන්නයේ අසුන්ගත හැකි වුවද, විවාදයේදී කථා කිරීම වෙන්කරන ලද අසුනේ සිට පමණක් සිදු කළ යුතු බව ද අවධාරණය කරමි.

තවද, පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා ක්‍රියා පිළිවෙළ සම්බන්ධ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 93 සිට 99 දක්වා විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ලිපිලේඛනාදිය පිළිගැන්වීම. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. එතුමිය පැමිණෙන්න තව පොඩ්ඩක් ප්‍රමාද වෙයි. එතුමිගේ වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබතුමා දැන් නිවේදනයක් නිකුත් කළා. නමුත්, මේ තත්ත්වය දිගින් දිගටම තිබෙන නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ අපි, ඊයේ ඔබතුමා මුණ ගැසී ඔබතුමාගෙන් ඉල්ලා සිටියේ, එතුමියට වෙච්ච ඒ හානියට අඩු ගණනේ ප්‍රකාශයක් හෝ ඒ අදාළ මන්ත්‍රීවරයා ලවා ලබා දෙන්න කියලා. මොකද, මෙය දිගින් දිගටම සිදු වනවා. මීට ඉස්සෙල්ලා කැබිනට් ඇමතිවරයෙක් මේ ගැන කථා කළා. හැබැයි, එතුමිය වෙනුවෙන් කථා කළාට කිසිම පියවරක් ගැනුණේ නැහැ. එදා මූලාසනයේ හිටපු මන්ත්‍රීතුමා කියා තිබුණේ, එතුමාට එහෙම දෙයක් ඇහුණේ නැහැ කියලා. ගරු කථානායකතුමනි, මේ වාගේ දේවල් හැම තිස්සේම සිදු වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ තත්ත්වය පාලනය කරන ලෙස.

විශේෂයෙන්ම අදාළ මන්ත්‍රීවරයාගේ හැසිරීම පිළිබඳව අපි ඔක්කෝම දන්නවා. කාන්තා මන්ත්‍රීවරියක් හැටියට එතුමිය පුදුම කැපවීමෙන්, මහන්සියෙන් හා තනිව බොහොම ගෞරවාන්විතව ජීවත් වන කෙනෙක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එතුමියගේ වරප්‍රසාද කඩවීම වෙනුවෙන් මීට වැඩි දෙයක් කර දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ සම්බන්ධව ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාට දැනුම් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, එතුමා කළ කථාව ඔබතුමා හෙළා දැක තිබෙනවා. මම ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. නමුත් ඔබතුමා, මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ කථා කරන ආකාරය පිළිබඳ සොයා බැලීමේ වගකීම විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරුන්ට පැවරුවා. ඒක කරන්න අපට බැහැ. ඒක කරන්න ඕනෑ, මූලාසනයෙන්. මූලාසනයෙන් තමයි කියන්න ඕනෑ, "මේ වචන සුදුසුයි, මේ වචන නුසුදුසුයි" කියලා. මම ඔබතුමාට ඊයේත් කිව්වා, ඒ අවස්ථාවේ ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා නැඟිටලා "ඒ වචන වැරදියි. ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න" කියා පැවසූ බව.

මූලාසනයේ හිටපු මන්ත්‍රීතුමා කිව්වා, "කියපු නරක වචන මට ඇහුණේ නැහැ." කියලා. මම ඔබතුමාට ඊයේත් මේක කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, තමන්ගේ කණ්ඩායමේ මන්ත්‍රීවරු පාලනය කිරීම පාර්ලිමේන්තුවටම භාර දෙනවාය කියලා. සංවිධායකතුමා වශයෙන් ඔබතුමාගේ කණ්ඩායම හැසිරවීමට ඔබතුමාට යම් කිසි වගකීමක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ මූලාසනයේ සිටින මන්ත්‍රීවරයා හැම තිස්සේම ඉන්නවා නේ. එතුමාට තමයි වගකීම තිබෙන්නේ. මම ඔබතුමාට ඊයේත් කිව්වා. ඔබතුමා හොඳට බලන්න බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ගැන. කථානායකවරයාටත් මේසයක් නැහැ; නිලධාරින්ටත් මේසයක් නැහැ. මම ඇහුවා, ඇයි, මේ මේස දාලා නැත්තේ කියලා. ඒ ගොල්ලන් කිව්වා, "මූලාසනයේ සිටින කෙනා සහ නිලධාරින් A-Z කථාව අහගෙන ඉන්නම ඕනෑ. ඒ නිසා තමයි මේස දාලා නැත්තේ." කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හරි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කියන්නේ මේකයි. නිලධාරින් කථාව අහගෙන ඉඳලා, කථානායකතුමාට උපදෙස් දෙන්න ඕනෑ, "මේ කථා හරි, මේ කථා වැරදියි" කියලා. ඒක අද වෙන්නේ නැහැ. මම ඔබතුමාට පක්ෂ නායක රැස්වීමේදීත් කිව්වා නේ, ඒක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලිවම. ඔබතුමා කියන කාරණයට මම එකඟයි. නමුත් ආණ්ඩු පක්ෂයටත්, විරුද්ධ පක්ෂයටත් සංවිධායකවරුන්

වශයෙන් දෙදෙනෙක් පත් කරලා තිබෙන්නේ, තමන්ගේ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම පාලනය කර ගැනීම සඳහා. එහෙම නැතුව මන්ත්‍රීවරුන්ගේ පැමිණීම පිළිබඳව සොයා බැලීමට විතරක් නොවෙයි.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමා පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
ගරු කථානායකතුමනි, සමාවෙන්න. මම මේ පාර්ලිමේන්තුවේදී අය වැය විවාදයේදී කරපු කථාවේ කාරණා කිහිපයක් මුල් කරගෙන විපක්ෂයේ අපේ මාතලේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමිය ඊයේ මගේ නම ප්‍රකාශ කරමින් කථා කළා. විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමියගෙන් සහ මේ කෑ ගහන විපක්ෂයේ සංවිධායකතුමාගෙන් මම එක ප්‍රශ්නයයි අහන්නේ.

මා කථානායකතුමාටත් කියන්නේ මේකයි. මම කියපු අසභ්‍ය වචනය මොකක්ද කියලා මට කියන්න. *[බාධා කිරීම්]* මට පැහැදිලි කරන්න දෙන්න, ගරු කථානායකතුමනි. මට මේ කාරණය පැහැදිලි කරන්න දෙන්න. *[බාධා කිරීම්]* මට මේ කාරණය පැහැදිලි කරන්න දෙන්න, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* මට මේ කාරණය පැහැදිලි කරන්න දෙන්න. මගේ කථාවේදී - *[බාධා කිරීම්]* මට මේ කාරණය පොඩ්ඩක් පැහැදලි කරන්න දෙන්න. ඔබතුමන්ලා කියන ඔක්කොම මා අහගෙන සිටියා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතින් වැරැදි වචනයක් කියැවුණා නම්, ඒකට සමාවෙන්න කියලා කිව්වා නම් ඊට වඩා හොඳයි.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
ගරු කථානායකතුමනි, මගේ අතින් කාන්තාවන්ට අපහාස වන විධියේ වචනයක් ඇත්තටම පිට වුණා නම් තමයි මම සමාව ඉල්ලන්න ඕනෑ. එහෙම නම්, පොළේ බඩු විකුණන වෙළෙන්දෙක් මා කියපු එළවලු විකුණන විධිය මට අර්ථ කථනය කරලා දෙන්න. ඒක මා යහපත් සිතින් කියපු දෙයක්. මම වල් නැහැ. ඒක අහපු මිනිසුන් වල් වුණාට මට කරන්න දෙයක් නැහැ, ගරු කථානායකතුමනි. මා කිව්වේ යහපත් සිතින්. *[බාධා කිරීමක්]* අහගන්න. මම කාන්තාවන් අපහසුතාවට පත් කළේ නැහැ. කාන්තාවන් අපහසුතාවට පත් කර ගන්නේ කාන්තාවන් විසින්. මම බටු ගැන කිව්වාම කොහොමද කාන්තාවන්ට අපහසු වන්නේ? මම වට්ටක්කා ගැන කිව්වාම, මම පතෝල ගැන කිව්වාම කොහොමද කාන්තාවන්ට අපහසු වන්නේ? මට මේක තේරෙන්නේ නැහැ. සමාවෙන්න, ගරු කථානායකතුමනි.

මීට වඩා දේවල් මේ පාර්ලිමේන්තුව ඇතුළේ සිද්ධ වුණා. රන්ජන් රාමනායක මහත්මයා හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියට අපහාසාත්මකව කථා කරනකොට, රන්ජන් රාමනායක මහත්මයා එක්ක මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමියගේ සම්බන්ධතාව පිළිබඳ හඬ පට එළියට එනකොට මේ කාන්තාවන් කොහේද සිටියේ?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කෙළින්ම කථා කළා. මේ පාර්ලිමේන්තුවේ පිටිපස්සේ ඉඳගෙන,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒවා කියනකොට කාන්තා අයිතිවාසිකම් කොහේද තිබුණේ?

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා,-

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, මට අසාධාරණයක් කරන්න එපා. හේතුව, ඊයේ රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට අවස්ථාව දීලා මම පාඩුවේ හිටියා.

මට ඔබතුමා කිව්වා අද අවස්ථාව දෙනවා කියලා. ගරු කථානායකතුමනි, මේ වැඩේ අසාධාරණයි. මම මගේ කථාව තුළ උඩ ඉඳලා පහළට විපක්ෂයට පහර දුන්නා. ඒ වාගේම හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කථාවක් උපුටා අරගෙන, 'දැන් සැපද, පොල් තිබෙනවාද, ලාභද' කියලා මම ඇහුවේ එතුමාට එහෙම අහන්න අයිතියක් තිබෙන බව කියන්නයි. හැබැයි, විපක්ෂයේ ඒ මන්ත්‍රීවරිය අපේ මන්ත්‍රීවරුත් එක්ක ඒ කථාව කියලා තිබුණා ඊයේ. දැන් එළවලු කීයද, එළවලු ලාභද කියලා ඊයේ කියලා තිබුණා. ඒ නිසා මම එතුමියගේ නම පාවිච්චි කරලා ඇහුවා. ඔබතුමිය කියලා තිබුණා, පොළේ තිබුණු එළවලු ගැන කථාවක්. මම එළවලු ගැන කථා කළා මිසක් කාන්තාවන් අපහසුතාවට පත් කරන කිසිම දෙයක් කිව්වේ නැහැ. නැවත වතාවක් මම කියන්නේ මේකයි. කියපු මම වල් නැහැ, අහපු ඔබ වල් වුණාට මට කරන්න දෙයක් නැහැ.

මම සමාව ගන්නවා ජාතියෙන්ම. මම ජාතියෙන්ම සමාව ගන්නවා මට පැහැදිලිව -ඊයේ ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ - ඔබතුමිය ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමාට කළ චෝදනාව, පොහොර සම්බන්ධව වංචාවක් වුණා කිව්වා. ගණන් මිනුම් කිව්වා.*[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. ගණන් මිනුම් කිව්වා. හැබැයි, ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළේ ගණන් මිනුම් සහිතව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇති.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. ගණන් මිනුම් සහිතව. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. මට ඉවර කරන්න දෙන්න. ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා ගණන් මිනුම් එක්ක කරුණු ඉදිරිපත් කළා වාගේ ඔබතුමිය පැහැදිලිව මට කියන්න, ගරු තලතා මන්ත්‍රීතුමී, ඔබතුමියත් කියන්න කාන්තාවන් අපහසුතාවට පත් වන විධියට මම කියපු පරුෂ වචනය මොකක්ද කියලා. ඔබගේ කටින් මට කියන්න. මම එදාට පිළිගන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ඔව් කියන්න, ගරු රාජ්‍ය ඇමතිතුමියනි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිතුමිය හැටියට මට වගකීමක් තිබෙනවා, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න. මේ සභා ගර්භයේ ඉන්නවා මන්ත්‍රීවරු 225දෙනෙක්.

මන්ත්‍රීවරුන් 225දෙනාට අදාළ කරුණු කාරණා මිස ඊට පරිබාහිර කාන්තාවන්ගේ සහ පුරුෂයන්ගේ නම් මේ සභාවට ගේන්න එපා කියලා මම ඔබතුමන්නාන්සේලාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ සභාවේ උත්තරීතර බව රැකෙන්නේ මේ 225දෙනාගේ හැසිරීම අනුවයි. අද රටම අපි දිහා බලාගෙන ඉන්නවා, දරුවෝ බලාගෙන ඉන්නවා. මේ සභාවේ කාන්තා මන්ත්‍රීවරියන් 12දෙනායි ඉන්නේ. බොහොම අමාරුවෙන් අද අපි කාන්තාවන් දේශපාලනයට ගේන්නේ. ඒ නිසා මේ සභාවේ සිටින මන්ත්‍රීවරියන්ට වක්‍රාකාරයෙන් හෝ එවැනි අසභ්‍ය ප්‍රකාශයක් කරනවා නම්, පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අපි සම්පූර්ණයෙන්ම එය හෙළා දකිනවා. එයට විරුද්ධව කටයුතු කරන්න කියලා මම ඔබතුමන්නාන්සේලාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 77(1)හි මෙසේ සඳහන් වෙනවා:

> "යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතා ම හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මගින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිතා කිරීමේ වරද කරනු ලැබූ විගස ම කථානායකවරයා විසින්, එම මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවකදී...."

මම ඒ ස්ථාවර නියෝගය සම්පූර්ණයෙන් කියවන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ අනුව, එවැනි අවස්ථාවක මන්ත්‍රීවරයා සභාවෙන් ඉවත් කරන්නට පුළුවන්.

එතුමා කියපු ඒ වචන තුන අපි ආයෙත් කියන්නේ නැහැ. අපට කැතයි, ලජ්ජයි, හිරිකිතයි. ඕනෑම වචනයක යට අර්ථයක් ඇතිව කථා කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඕනෑ නම් ආයේ ඒ වචන තුන කියන්න. ගරු කථානායකතුමනි, අපි බබාලා නොවෙයි නේ; පාර්ලිමේන්තුවේ ඉන්න අපි බබාලා නොවෙයි. ගරු මන්ත්‍රීතුමා, දැන් ගරු කථානායකතුමාත් පිළිගත්තා ඔබතුමා වරදක් කළා කියලා. ගරු කථානායකතුමනි, දැන් තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා challenge කළා, එහෙම ඔප්පු කළොත් මන්ත්‍රී ධුරයෙන් අයින් වෙනවා කියලා. ගරු මන්ත්‍රීතුමා, දැන් තමුන්නාන්සේ මේ ගරු සභාවට නිගරු කරන්නේ නැතිව කරුණාකර යන්න ගෙදර. *[බාධා කිරීම්]* යන්න ගෙදර. කරුණාකර මේ සභාවෙන් යන්න. *[බාධා කිරීම්]*

**ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඒ අවස්ථාවේ මූලාසනයේ සිටියේ ඔබතුමා නේ. *[බාධා කිරීම්]*

**ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
ගරු කථානායකතුමනි, ඊයේ දිනයේත්, අදත් මේ සභාවේදී මගේ නම විවිධ විධියට සඳහන් කරමින් කථා කරලා තිබුණා. *[බාධා කිරීම්]*

ඒ නිසා මට වගකීමක් තිබෙනවා, ඒ වෙලාවේ මා දුටු දේ, මට ඇහිච්ච දේ කියන්න. එය මගේ වගකීමක් හැටියට මා දකිනවා. ගරු කථානායකතුමනි, එදා මේ විවාදාත්මක - *[ඝෝෂා කිරීම්]* ගරු කථානායකතුමනි,-

***[මේ අවස්ථාවේදී මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]***

*[இச்சந்தர்ப்பத்தில் உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்கள்.]*

*[At this stage, some Members walked into the Well of the House and created an uproar.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා මෙතැනින් යන්න. *[ඝෝෂා කිරීම්]* කරුණාකර මන්ත්‍රීතුමන්ලා දෙපළ යන්න. *[ඝෝෂා කිරීම්]* කරුණාකර මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ආසනවලට ගිහින් ඉඳගන්න. *[ඝෝෂා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ආසනවලට ගිහින් ඉඳගන්න.*[බාධා කිරීම්]* Point of Order එක ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කලින් ඔබතුමන්ලා ආසනවලට යන්න. *[බාධා කිරීම්]* කරුණාකර යන්න. මන්ත්‍රීතුමන්ලා කරුණාකර ආසනවලට යන්න.*[බාධා කිරීම්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ point of Order එක ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, *[බාධා කිරීම්]* මම හිතනවා, මෙතැනදී නැවත වතාවක් මගේ වරප්‍රසාද අභිමිවීමක් සිද්ධ වෙනවා කියලා. *[බාධා කිරීම්]* පේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ගරු සභාපතිතුමියත් පිළිගන්නවා, මෙය වක්‍රෝක්තියෙන් කාන්තාවන්ට කළ අපහාසයක් විධියට. *[බාධා කිරීම්]*

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මොකක්ද, අපහාසය? ඒක කියන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, ඔබතුමාත් පිළිගන්නවා, මේ තුළින් වක්‍රෝක්තියෙන් කාන්තා අපහාසයක් සිද්ධ වෙනවා; ලිංගික හිංසනයක් සිද්ධ වෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැන් නියෝගය දුන්නා. ඒක නිසා මේක මෙතැනින් අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

මෙතුමා එම වාක්‍යය නැවත වතාවක් කියන්න කිය කියා අභියෝග කිරීම තුළ නැවත වතාවක් ඒ දේමයි සිද්ධ වෙන්නේ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාට දියණියක් ඉන්නවා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. මිනිත්තු පහක් - *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. ඔබතුමා මිනිත්තු පහක් එතුමාට දුන්නා. ඒ වාගේම ඒ වෙලාවේ මූලාසනයේ හිටපු මන්ත්‍රීතුමා ඒ පිළිබඳව දැක්වූ ප්‍රතිචාරය පිළිබඳත් ගැටලුවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග යටතේ ඔබතුමාට මේ පිළිබඳව මීට වඩා දැඩි තීන්දුවක් ගන්න හැකියාව තිබෙනවා. මොකද, මීට කලිනුත් මම තලතා අතුකෝරල මැතිනිය සම්බන්ධයෙන් ගත් තීරණවලදී මට අවවාද කළා මිසක, වෙන දෙයක් සිද්ධ වුණේ නැහැ. එදා ඒවාට හරි තීන්දුවක් ගත්තා නම්, අද මේ දේ වෙන්නේ නැහැ කියන එකත් මම කියන්න ඕනෑ.

එතුමා මට තර්ජනය කරනවා, හඬ පටයක් ගැන කියලා. මේ විධියට අපේ කටවල් වහන්න,- *[බාධා කිරීමක්]* අපි දන්නවා, දැන් තාක්ෂණය දියුණුයි කියලා. ඒ නිසා ඕනෑම දෙයක් කරන්න පුළුවන්. ඒක වෙනම කථාවක්. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මේකයි. මේ රටේ ජනාධිපතිතුමාට ඔය වාක්‍යය පෙන්වලා, එතුමාගේ මැතිනියට මේක අහන්න සලස්වන්න, එතුමියට අහගෙන ඉන්න පුළුවන්ද කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අම්මාටත්, බිරිඳටත් මේක අහන්න සලස්වන්න, වෙන්නේ මොකක්ද බලන්න. එම නිසා මේ සභාවේ ගෞරවය රකින්න කියා මා නැවත වතාවක් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම වෙන කාරණයක් කියන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නිවේදනය තුළ ඔබතුමා ඉතා වැදගත් කාරණයක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව අපේ සම්පූර්ණ ගෞරවය ඔබතුමාට හිමි වනවා. ඔබතුමා උගත්, බුද්ධිමත්, පරිණත නායකයෙක් හැටියට වාගේම කථානායකවරයා හැටියට පිළිගත්තා, ඒක අසභ්‍ය වාක්‍යයක් බව. ඒ නිසා ඒ වගකීම ඔබතුමා ආණ්ඩු පක්ෂයටත්, විපක්ෂයටත් පැවරුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇති. ඔය කාරණය ඔතැනින් නතර කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
හැබැයි, ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ ගැන සොයා බලලා, පරීක්ෂණ කරලා, ඒක වැරැදි නිසා තමයි, අසභ්‍යයි කියන කාරණය තේරුම් අරගෙන යම් දඬුවමක් ඉදිරියේදී දෙනවා කියන කාරණය ප්‍රකාශ කළේ. ඒ මන්ත්‍රීවරයා මේ වැරැද්ද කළා කියන කාරණය ඔබතුමා ප්‍රකාශ කළාට පස්සේ ආපසු එතුමාට මොනවාද කියන්න තිබෙන්නේ, ගරු කථානායකතුමනි?

**ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, දිගින් දිගටම මගේ නම සඳහන් වන නිසා මම වෙනුවෙනුත් යුක්තියක් ඉෂ්ට කරන්න ඕනෑ. ඒ වාගේම මම එදා ගත් ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක ගැනත් මට කියන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමනි, ඔබතුමා වාගේම මමත්, අපේ සභාපති නාමාවලියේ ඉන්න අපේ මන්ත්‍රීවරු සියලු දෙනාත් දන්නවා, මේ සභාවේ මූලාසනයේ වාඩි වන කෙනාට ලොකු වගකීමක් පැවරී තිබෙන බව. අපට තිබෙන්නේ ඇස් දෙකයි, කන් දෙකයි. මේ ගරු සභාවේ මන්ත්‍රීවරු 225 දෙනෙක් ඉන්නවා. සමහර විවාදාත්මක අවස්ථාවලදී හැමෝම කථා කරනවා; හැමෝම mike එක ඉල්ලනවා. එතකොට අපට නිතර පෙනෙන කෙනාට තමයි අපේ ඇහැ යොමු වන්නේ, ගරු කථානායකතුමනි. එදා ඔය සිද්ධිය සිදු වන වෙලාවේදීත් විවාදාත්මක අවස්ථාවක් මතු වුණා. ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාත් ප්‍රශ්න මතු කළා. ඒ වෙලාවේ විවාදාත්මක අවස්ථාවක් මතු වුණා. සමහර වෙලාවට, සමහර මන්ත්‍රීවරු කියන දේවල් හැම එකක්ම අපට ඇහෙන්නේ නැහැ; මන්ත්‍රීවරු 225 දෙනාම කියන ඒවා අපට ඇහෙන්නේ නැහැ. මම, ඔය මූලාසනයේ වාඩි වුණු හැම දවසේම මට පුළුවන් උපරිම විධියට මගේ වගකීම ඉෂ්ට කරපු මන්ත්‍රීවරයෙක්. මා විශ්වාස කරන හැටියට සභාපති නාමාවලියේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් උපරිම සේවාවක් මූලාසනයට ඉෂ්ට කරපු මන්ත්‍රීවරයා මම වෙන්න ඇති. මම කවදාවත් මේ ගරු සභාවේ කිසි කෙනෙකුට අයුක්තියක්, අසාධාරණයක් වන විධියට පෙනී ඉඳලා නැහැ.

මගේ දේශපාලන ජීවිතයේ කවදාවත් අසාධාරණකමක් කර නැහැ. ඡන්දය ඉල්ලන කාලයේවත් බොරු කියා මන්ත්‍රී තනතුරු ගන්න කටයුතු කළ කෙනෙක් නොවෙයි මම. ඒ වාගේම තව කාරණයක් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අපි V8 ගෙනියන්න මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් නැහැ. ඒ විධියට මන්ත්‍රීවරුන්ට දෝෂාරෝපණ කරනකොට අපිට හරිම දුකයි. මේ දේ අපි ඉතාම සද්භාවයෙන් කරන්නේ. එදා මට ඇහුණු දේ තමයි කිව්වේ. ඇහුණේ නැති දේවල් "ඇහුණේ නැහැ" කියන්න මට

[ගරු අජිත් රාජපක්ෂ මහතා]

අයිතියක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියනවා,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ලිපිලේඛනාදිය පිළිගැන්වීම. *[බාධා කිරීමක්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර, අපි ඔය ප්‍රශ්නය ගැන කථා නොකර ඉඳිමු.

**ගරු තිසකුට්ටි ආරච්චි මහතා**
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නය ඉවරයි. අපි වෙනම අවස්ථාවක ගනිමු ඒක. *[බාධා කිරීම්]* ලිපිලේඛනාදිය පිළිගන්වන්න ඉඩ හරින්න. ඊට පසුව අවස්ථාව දෙන්නම්. *[බාධා කිරීමක්]*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2020 වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2022 කෙටුම්පත් ඇස්තමේන්තුවල පාය ආදියෙහි යෝජිත වෙනස් කිරීම් ලැයිස්තුව.- [මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු දුමින්ද දිසානායක මහතා (සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - சூரிய சக்தி, காற்று மற்றும் நீர் மின்னுற்பத்திக் கருத்திட்ட இராஜாங்க அமைச்சர்)
(The Hon. Duminda Dissanayake -State Minister of Solar Power, Wind and Hydro Power Generation Projects Development)
ගරු කථානායකතුමනි, විජිතපුර, උස්ගල හන්දිය, 4 කණුව, අංක 7/ඒ දරන ලිපිනයෙහි පදිංචි කේ.සී.ඒ. ජයලත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩී.වී. චානක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු සිසිර ජයකොඩි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petition ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න, ගරු මොහමඩ් මුසම්මිල් මහතා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාටත් දැනුම් දීලා මම ගිය සතියේත් මේ ගැන කථා කළා. පාර්ලිමේන්තුවට පැමිණි පළමු දවසේම ප්‍රශ්න 670ක් භාර දීපු මන්ත්‍රීවරයෙක්, මම. මේ දක්වා පළමු ප්‍රශ්නය ඇහුවේ මම. මහ ලේකම්තුමා එදා කිව්වා, මන්ත්‍රීවරයෙකුට සතියකට වරක් ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ලැබෙනවා කියලා. නමුත්, අය වැය පටන් ගත්තාට පස්සේ මට එක ප්‍රශ්නයකට පමණයි අවස්ථාව ලැබුණේ. මගේ සහෝදර මොහමඩ් මුසම්මිල් මන්ත්‍රීතුමාත් එක්ක මගේ විරෝධතාවක් නැහැ. මම එතුමාගේ නම කිව්වේ, එතුමා මේ තුන්වැනි ප්‍රශ්නයයි අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. [බාධා කිරීමක්]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මා ළඟ ඒ ඒ දවස්වලට අදාළ න්‍යාය පත්‍ර ටික තිබෙනවා, ගරු කථානායකතුමනි. මට එක ප්‍රශ්නයක් අහන්න විතරයි අවස්ථාව දුන්නේ. මගේ ප්‍රශ්න තව 622ක් එකතුවෙලා තිබෙනවා. අපි හැම දවසකම ප්‍රශ්න 10ක් ගෙනැල්ලා දෙනවා. අපි පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන එක කරදරයක් නම්, ඒවාට උත්තර දෙන්න බැරි නම්, අපි ප්‍රශ්න අහන එක නවත්වලා දාන්නම්. මෙතැනදී අනුගමනය කරන ක්‍රමවේදය ගැන අපට කියන්න. මෙතැනදී ගරු කථානායකතුමා වැරදි නැහැ කියලා මම දන්නවා. නිලධාරින් තමයි මේ ක්‍රමවේදය ගැන පැහැදිලි කරන්න ඕනෑ. තෝරලා, එක එක හැඳිවලින් මන්ත්‍රීවරුන්ට බෙදන්න එපා කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කරපු නිසා නිවැරදි කිරීමක් කරන්න මටත් අයිතියක් තිබෙනවා. ගිය සතියේ තමයි මට එක ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ලැබුණේ. ඊට පස්සේ අවස්ථාව ලැබෙන්නේ මේ සතියේ. ගරු මන්ත්‍රීතුමනි, මාසයකට එක් අවස්ථාවක් නොවෙයි, සතියකට එක් අවස්ථාවක් ලැබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගිය සතියේ එක් අවස්ථාවක් දුන්නා.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මම තව කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුව අමතද්දී මුළු සත්තු වත්තම මතක් කළා. ඒවා සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු නිහඬව ඉන්නවා. අපි කියනවා, කරුණාකර ඒ විනයත් පවත්වා ගන්න කියලා. සත්තු වත්තේ ඉන්න සියලු සතුන්ගේ නම් කියලා තමයි ෆොන්සේකා මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ කථා කරන්නේ. ඉතින් අඩුම ගණනේ ඒවාට විරුද්ධ වෙන්න. විපක්ෂ නායකතුමා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා හෝ එතුමා පාලනය කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 82 (1) යටතේ කරුණු සඳහන්ව තිබුණත්, මේ අදාළ මන්ත්‍රීවරයා ඔබතුමාගේ නියෝගය පිළිගන්නේ නැහැ කියන එක කියැවුණා. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ඒ සම්බන්ධයෙන් ඔබතුමා දෙන්නා වූ තීරණය අපට නැවත වාරයක් හෙට දවසේත් දැනුම් දෙන්න කියලායි. එතුමා එක්කෝ ඒ ප්‍රකාශය ගැන කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ; මේ ගරු සභාවෙන් සමාව ඉල්ලන්න ඕනෑ. එහෙම නැත්නම්, ඔබතුමා ඒ සම්බන්ධව තීරණයක් ගන්න ඕනෑ, ගරු කථානායකතුමනි. අපි ඒ සම්බන්ධයෙන් අවසාන තීරණයක් බලාපොරොත්තු වෙනවා.

අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිතුමිය වන ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියට මා ස්තුතිවන්ත වෙනවා, මන්ත්‍රීවරියක වෙනුවෙන් පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව පෙනී සිටීම සම්බන්ධයෙන්. ඒ වාගේම, තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීවරයා දැනට මේ ගරු සභාවේ නැති, හිටපු මන්ත්‍රීවරයකුගේ සහ මන්ත්‍රීවරියකගේ -රන්ජන් රාමනායක මැතිතුමාගේ සහ හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියගේ - නම් සඳහන් කළා. ඒවා මෙතැනට අදාළ නැහැ. ඒ නම් දෙක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම බැහැ. [බාධා කිරීම්]

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### බලශක්ති අමාත්‍යාංශයට වාහන මිලදී ගැනීම: විස්තර
### வலுசக்தி அமைச்சுக்குக் கொள்வனவு செய்யப்பட்ட வாகனங்கள்: விபரம்
### PURCHASE OF VEHICLES FOR MINISTRY OF ENERGY: DETAILS

459/2020

1. **ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලීටර් 13,200ක ඉන්ධන ප්‍රවාහන ධාරිතාවකින් යුත් ටැංකි සහිත රථ 05ක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩරය කැඳවනු ලැබුවේ කවුරුන් විසින්ද;

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

(iii) එම ටෙන්ඩරය එවකට අදාළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම රථ 05 මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල;

(ii) එක් රථයක් මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල;

(iii) එම රථ මිලදී ගන්නා අවස්ථාව වනවිට එක් රථයක වෙළෙඳ පොළ වටිනාකම;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 13,200 லீற்றர் எரிபொருளை ஏற்றிச்செல்லக் கூடியவாறான கொள்ளளவுடன்கூடிய தாங்கி களைக் கொண்டமைந்த 05 வாகனங்களைக் கொள்வனவு செய்வதற்காக 2016ஆம் ஆண்டில் அமைச்சினால் கேள்விப்பத்திரம் கோரப் பட்டுள்ளதா;

(ii) ஆமெனில், மேற்படி கேள்விப்பத்திரத்தைக் கோரியவர்கள் யார்;

(iii) மேற்படி கேள்விப்பத்திரம் அப்போதைய உரிய அமைச்சின் பெறுகைகள் குழுவுக்கு ஆற்றுப்படுத் தப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி 05 வாகனங்களையும் கொள்வனவு செய்வதற்காகச் செலவிடப்பட்டுள்ள மொத்தத் தொகை;

(ii) ஒரு வாகனத்தைக் கொள்வனவு செய்வதற்காகச் செலவிடப்பட்டுள்ள தொகை;

(iii) மேற்படி வாகனங்கள் கொள்வனவு செய்யப் படும்போது வாகனமொன்றுக்கான சந்தைப் பெறுமதி;

எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether there was an invitation for tenders by the Ministry in 2016 to purchase five vehicles with tanks having 13,200 litre fuel transport capacity ;

(ii) if so, by whom tenders were invited; and

(iii) whether that invitation for tenders was referred to the then relevant Ministry Procurement Committee?

(b) Will he also inform this House of -

(i) the total amount spent on purchasing those five vehicles;

(ii) the amount spent on purchasing one vehicle; and

(iii) the market value of one vehicle at the time those vehicles were purchased?

(c) If not, why?

**ගරු උදය ගම්මන්පිල මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு உதய கம்மன்பில - வலுசக்தி அமைச்சர்)
(The Hon. Udaya Gammanpila - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) ප්‍රසම්පාදන අස්ථිත්වය (Procuring Entity) වූ CPSTL ආයතනය විසින්.

(iii) අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවට යොමු කළ යුතු මිලදී ගැනීමක් වුවත් එසේ යොමු කර නොමැත.

(ආ) (i) රුපියල් 99,188,586.00 + VAT

(ii) රුපියල් 19,837,717.20 + VAT

(iii) දළ වශයෙන් රුපියල් මිලියන 20ක් පමණ විය.

(ඇ) අදාළ නොවේ.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු ඇමතිතුමනි, (අ) (iii)ට, එනම් "එම ටෙන්ඩරය එවකට අදාළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරනු ලැබුවේද?" කියන ප්‍රශ්නයට උත්තරය නැවත කියන්න පුළුවන්ද?

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවට යොමු කළ යුතු මිලදී ගැනීමක් වුවත් එසේ යොමු කර නොමැත.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු ඇමතිතුමනි, ඒවා යහ පාලන කාලයේ නේද අරගෙන තිබෙන්නේ?

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
ඔව්, අනිවාර්යයෙන්ම.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, ලෝක වෙළෙඳ පොළේ බලශක්ති ඉල්ලුම විශාල වශයෙන් වැඩි වී තිබෙන අවස්ථාවක්, මේක. ඒ වාගේම ඉන්ධන මිල උච්චාවචනයත් සිද්ධ වෙනවා. ඒ අතර අපට මාධ්‍යවලිනුත් දැනගන්නට ලැබුණා, ඉන්ධන මිල සූත්‍රයක් පිළිබඳව නැවත කථා වෙලා තිබුණු බවක්. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ලෝක වෙළෙඳ පොළේ මිල උච්චාවචනයත් එක්ක ඉන්ධන මිල සූත්‍රයක් පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවාද කියලා.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
ගරු කථානායකතුමනි, ලෝක වෙළෙඳ පොළේ මිල ඉහළ යෑමට අනුරූපීව අපේ මිල වෙනස් කරන්නේ නැහැ කියන්නේ මොකක්ද? ඒ මිල වෙනසේ පාඩුව දරන්නේ වෙන කවුරුත්

නොවෙයි, මේ රටේ බදු ගෙවන ජනතාව ම තමයි. කවුරුවත් ගෙදරින් ගෙනැල්ලා ඒ පාඩුව පියවන්නේ නැහැ. මේ රටේ සිටින සුපිරි ධනපතියන් ළඟ තිබෙනවා, තෙල් ලීටරයකට කිලෝමීටර 3ක්, 4ක්; උපරිමය කිලෝමීටර 5ක් පමණක් යන වාහන.

ඉතින් ජීවිතේට වාහනයක් පාවිච්චි කරලා නැති, සමහර විට සුපිරි වාහනයක් දැකලා නැති ඈත එපිට ගම්මානයක ගැමියෙකු කිලෝමීටර ගණනාවක් පයින් ගිහින් කඩෙන් බඩු ගන්න කොට ගෙවන වැට් එකෙන් ධනවතුන්ගේ ඒ ඉන්ධන වියදමේ -ඉන්ධන පිරිවැයේ- බර ඔවුන් දරනවා; ගමේ දුප්පත් ජනතාව ඒ බර දරනවා. ඒක අසාධාරණයි. ඒ නිසා මගේ යෝජනාව වුණේ මිල ස්ථායීකරණ අරමුදලක් පිහිටුවිය යුතුයි කියන එකයි. ඒක තමයි ඉන්ධන වියදම ජීවන වියදමට බරපතළ ලෙස බලපාන, නිෂ්පාදන වියදමට බලපාන ශ්‍රී ලංකාව වාගේ රටකට ගැළපෙන්නේ. ඒ අනුව ඉන්ධන ස්ථායීකරණ අරමුදලක අවශ්‍යතාව දැකලා මම ඒ සම්බන්ධයෙන් 2021 මාර්තු මාසයේ 15වන දා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළා. තවමත් ඒකට අනුමැතිය ලැබී නැහැ. ඒ අතර, මිල සූත්‍රයකට යා යුතුයි කියා ශ්‍රී ලංකා මහ බැංකුව යෝජනා කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මගේ අදහස නම්, මිල ස්ථායීකරණ අරමුදල තමයි ලංකාවට වඩාත් ගැළපෙන්නේ කියන එකයි. එය නොකරනවා නම්, අඩුම වශයෙන් මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම හෝ වහාම කළ යුතුයි.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි. මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ රටේ ගෑස් සම්පත සහ ස්වාභාවික ඛනිජ තෙල් නිධි තිබෙනවා කියලා අප ඉපදෙන්නත් කලින් ඉඳලා කථා වෙලා තිබෙනවා. ඉතින් අපේ පරම්පරාවත් අහලා තිබෙන්නේ ලංකාවේ ගෑස්, ඛනිජ තෙල් තිබෙනවා කියලායි. නමුත් අපේ ඛනිජ තෙල් සහ ගෑස් නිධිවලින් ගන්නා ඛනිජ තෙල් හෝ ගෑස් පාවිච්චි කරන්න අපට හැකි වෙලා නැහැ. එන හැම ආණ්ඩුවක්ම කිව්වා අවශ්‍ය කැණීම් සිදු කරලා රටේ ජනතාවගේ පරිහරණය වෙනුවෙන් ඒවා ගන්නවා කියලා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අපේ මේ ආයු කාලය ඇතුළේවත් ඒ කැණීම් කරන්න පුළුවන් වෙයි ද, එහෙම නැත්නම් එය ඊළඟ පරම්පරාවකට ඉතුරු වෙයි ද කියලා.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
ගරු කථානායකතුමනි, 2015 දී අත්සන් කළ පැරිස් සම්මුතිය අනුව 2050න් පස්සේ ලංකාව ඇතුළු ලෝකයේ සාතිශය බහුතරයක් රටවල් තෙල් භාවිතය අත් හැරීමට නියමිතයි. ඒ නිසා අපේ තිබෙන මේ තෙල් සහ ගෑස් සම්පත ඊළඟ පරම්පරාවට ගොඩ දාන්න ඉතිරි කරන්න බැහැ. අපි වහාම එය කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය මූලික වෙන්දේසි කිරීම් ලබන මාර්තු මාසයේ ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. දැනටමත් සමාගම් ගණනාවක් එම ගවේෂණ කටයුතු සඳහා ලංකාවට පැමිණ තිබෙනවා. නමුත් අපි ප්‍රධාන අභියෝග තුනක් දකිනවා, ගරු කථානායකතුමනි. පළමුවැනි එක තමයි, ලෝකය ඛනිජ තෙල් භාවිතයෙන් ඉවත් වන අවස්ථාවක, ශ්‍රී ලංකාව ඛනිජ තෙල් කර්මාන්තයට පැමිණෙන නිසා ආයෝජකයන් සොයා ගැනීමේ අභියෝගය. දෙවැනි අභියෝගය තමයි, කොවිඩ් වසංගතය නිසා සමස්ත ලෝකයේම අරමුදල් හිඳිලා තිබෙන මොහොතක තමයි අපේ ශ්‍රී ලංකාවට ඩොලර් බිලියන ගණනක දැවැන්ත ආයෝජනයක් බලාපොරොත්තුවෙන් ලෝක වෙළෙඳ පොළට යන්නේ. තුන්වැනි අභියෝගය තමයි, ශ්‍රී ලංකාව ණය ශ්‍රේණිගත කිරීම්වල ඉතාම පහළ මට්ටමක තිබෙන නිසා, ආයෝජකයන් ලංකාවට පැමිණීමට දක්වන මැළිකම. ඒ වාගේම, New Fortress Energy සමාගම සමඟ ගිවිසුමෙන් ගෑස් වෙළෙඳ පොළේ ඒකාධිකාරය එක් සමාගමකට යැමෙන් ලංකාවේ වෙළෙඳ පොළ ලංකාවේ ගෑස්වලට අහිමිවීමේ අවදානමත් යම් බාධාවක් වෙන්න පුළුවන්. අපි ඒ සම්බන්ධයෙන් දැනටමත් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් සිටිනවා.

## රජය සතු අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන: විස්තර

## அரச கைத்தறி நெசவுக் கைத்தொழில் நிலையங்கள்: விபரம்

## GOVERNMENT-OWNED HANDLOOM TEXTILE CENTRES: DETAILS

713/2020

**2. ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති රජය සතු අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) මේ වන විට එම මධ්‍යස්ථානවලින් නිෂ්පාදනය කරනු ලබන දේශීය රෙදිපිළි වර්ග කවරේද;

(iv) අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා රජයෙන් ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම නිෂ්පාදන විදේශ වෙළෙඳ පොළට අලෙවි කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கையில் அமைந்துள்ள அரசாங்கத்துக்குச் சொந்தமான கைத்தறி நெசவுக் கைத்தொழில் நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவை அமைந்துள்ள பிரதேசங்கள் யாவை என்பதையும்;

(iii) இன்றளவில் மேற்படி நிலையங்களின்மூலம் உற்பத்தி செய்யப்படுகின்ற உள்நாட்டு ஆடை வகைகள் யாவை என்பதையும்;

(iv) கைத்தறி நெசவுக் கைத்தொழிலுக்கு அரசாங்கத்தினால் வழங்கப்பட்டுள்ள சலுகைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி உற்பத்திகள் வெளிநாட்டுச் சந்தைக்கு விற்கப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அந்நாடுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු මයන්ත දිසානායක  මහතා]

asked the Minister of Industries:

(a) Will he inform the House -

(i) the number of Government-owned handloom textile centres situated within Sri Lanka at present;

(ii) the areas where they are situated;

(iii) what local textiles are manufactured by these centres at present; and

(iv) what concessions have been given by the Government for handloom textile industry?

(b) Will he also inform this House -

(i) whether such products are sold at markets in foreign countries; and

(ii) if so, what those countries are?

(c) If not, why?

**ගරු  දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர -  பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)

ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 602කි.

(ii) මේ සඳහා පිළිතුර පිටු ගණනාවක සඳහන් වෙනවා. එක් එක් දිස්ත්‍රික්කයට අදාළව එම පිළිතුර මම සකස් කර තිබෙනවා. ඔබතුමාට මම එය ලබා දෙන්නම්. එම සටහන මා **සභාගත*** කරනවා.

(iii)

| අංකය | පළාත | නිෂ්පාදනය කරනු ලබන දේශීය රෙදිපිළි වර්ග |
|---|---|---|
| 01 | වයඹ පළාත | සාරි, සරොම්, ලුංගි, ටසල්, බුමුතුරුණු (carpets), මේස රෙදි, ඇඳ ඇතිරිලි, තිර රෙදි, ඇඳුම් රෙදි, තුවා, කොට්ට උර, අත්පිස්නා (serviettes), දූවිලි පිසින රෙදි (dusters), අත් ලේන්සු, කවනි, කුඩා පුටුකවර (stool covers) |
| 02 | ඌව පළාත | සාරි - වර්ණ සාරි හා රෙයෝන් සාරි, සරොම්, මේස රෙදි, ඇඳ රෙදි, කොට්ට උර, තිර රෙදි, දූවිලි පිසින රෙදි (dusters), තුවා, ලුංගි, තිර රෙදි, ඇඳුම් රෙදි, ටසල්, අත්පිස්නා |
| 03 | නැඟෙනහිර පළාත | සාරි, සරොම්, මේස රෙදි, ඇඳ රෙදි, කොට්ට උර, තිර රෙදි, දූවිලි පිසන රෙදි (dusters), තුවා, ලුංගි, තිර රෙදි, ඇඳුම් රෙදි, ටසල්, අත්පිස්නා, පුටු රෙදි ආවරණ (cushion covers), බිත්ති සැරසිලි, පිරිමි අය සඳහා කමිස, කාන්තාවන් සඳහා ඇඳුම් |
| 04 | උතුරු පළාත | ඇඳ ඇතිරිලි, වියන ලද සාරි, කොට්ට උර, වේට්ටි, තුවා |
| 05 | සබරගමුව පළාත | සාරි, සරොම්, ලුංගි, මේස රෙදි, ඇඳ ඇතිරිලි, තිර රෙදි, ඇඳුම් රෙදි, සර්වියට්, දූවිලිපිසින රෙදි (dusters), කුඩා පුටු කවර (stool covers), කමිස, ෂෝල්, සිවුරු රෙදි |
| 06 | උතුරු මැද පළාත | සාරි, සරොම්, මේස රෙදි, ඇඳ ඇතිරිලි, තිර රෙදි, ඇඳුම් රෙදි, තුවා කොට්ට උර, බුමුතුරුණු (carpets) |
| 07 | බස්නාහිර පළාත | සාරි (සාමාන්‍ය කපු සාරි, මල්බාන ලද කපු සාරි, රෙයෝන් සාරි, මල් බාන ලද රෙයෝන් සාරි, ෂේඩඩ් කපු සාරි, ෂේඩඩ් රෙයෝන් සාරි, පල්ලු සාරි, දුම්බර රටා මිශ්‍ර කපු සාරි), ඇඳුම් රෙදි (සුදු රෙදි, කොටු රෙදි, තනි වර්ණ, දික් ඉරි, හරස් ඉරි, රෙයෝන් නූල් භාවිතයෙන්, සුදු කමිස රෙදි), සරොම් රෙදි, සරොම්, වූල් තුවා,/ හනිකොම් තුවා රෙදි රෝල් සහ තුවා වශයෙන්, අමු රෙදි, සුදු තිර රෙදි, තිර රෙදි (72", 54"), ලුංගි රෙදි, ලුංගි, දූවිලිපිසින රෙදි (dusters), 72" පළල රෙදි, සාරි රෙදි, ඇඳ රෙදි (54",72",80",108" x 94") රෝල් සහ ඇඳ රෙදි කට්ටල, මේස රෙදි (කොටු, ශත පහ මෝස්තරය, කුකුල් අඩි මෝස්තරය) සහ මසා නිම කළ මේස රෙදි, සාටක (කපු, රෙයෝන්), බුමුතුරුණු (carpets), ටසල්, දුම්බර රෙදි, මේස දරනු (table mats), රෝහල් සඳහා අවශ්‍ය වන විවිධ රෙදි වර්ග කොළ, නිල් සුදු රෙදි, ජී.එස් තුවා, ශල්‍යකර්ම ගවුම (surgeon frocks), අත්පිස්නා රෙදි රෝල් සහ මසා නිමකළ අත්පිස්නා, කුර්තා, කුර්තා රෙදි, කමිස, කොට්ට උර රෝල් සහ මසා නිම කළ කොට්ට උර, බෑග් සඳහා රෙදි සහ නිම කළ බෑග්, පුටුරෙදි ආවරණ (cushion covers) සහ මසා නිම කළ පුටු රෙදි ආවරණ, ගවුම්, සාය |
| 08 | දකුණු පළාත | සාරි - කපු සාරි/රෙයොන් සහ කපු මිශ්‍ර සාරි (silk sarees) / ටයිඩයි/ මල්බාන රෙදිපිළි, තුවා - හනි කොම්බ්/ වූල් තුවා සරොම්, ඇඳුම් රෙදි, ඇඳ රෙදි හා කොට්ට උර, මේස රෙදි, තිර රෙදි, අත්පිස්නා, ටසල්, කේෂ්මන් |
| 09 | මධ්‍යම පළාත | සාරි, සරොම්, ලුංගි, කමිස, හැට්ට (blouses), ළමා ඇඳුම්, ඇඳ රෙදි, තිර රෙදි, ඇඳුම් රෙදි, මේස රෙදි, කොට්ට උර, පුටුරෙදි ආවරණ (cushion covers), ලේන්සු, කවනි, මේසදරනු (table mats), අත්පිස්නා, තුවා, පාපිසි, බිත්ති සැරසිලි |

(iv) ඔව්.

- රාජ්‍ය ආයතන සඳහා වන රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අවශ්‍යතා පළාත් මට්ටමින් දේශීය නිෂ්පාදකයන් වෙතින් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සන්දේශයක් අනුමත කර ඇත.

- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ආයතනයන්හි පහසුකම් වැඩි දියුණු කිරීම හා නඩත්තු කටයුතු සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම තුළින් පළාත් කර්මාන්ත

****  පුස්තකාලයේ තබා ඇත.***
**  நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
**  Placed in the Library.*

දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන යම් ප්‍රමාණයක් වෙන් කරනු ලැබේ.

- ඊට අමතරව 2021 වර්ෂයේ මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශය වන බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පොදු පහසුකම් මධ්‍යස්ථාන සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබාදී ඇත.
- පුහුණු කාලයෙන් පසුව රෙදි වියන්නන් ලෙස රැකියා අවස්ථා ලබාදෙන අතර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳ පොළ මිල ගණන් අනුව සකස් කරන ලද මිල අනුව කෑලි පදනම මත ගෙවීම් කරනු ලැබේ.
- පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තු මඟින් එම දෙපාර්තමේන්තු යටතේ සේවය කරනු ලබන කාර්මිකාවන් සඳහා දෛනික ඉලක්ක පදනම් කර ගනිමින් පැමිණීමේ දීමනාවක් ලබාදීම.
- මෙම පැමිණීමේ දීමනා සහ දෛනික ඉලක්ක පදනම් කර ගනිමින් ගෙවනු ලබන දීමනා පළාතේ ආණ්ඩුකාරවරයාගේ නිර්දේශ මත ගෙවනු ලබයි.

(ආ) (i), (ii)

ගරු මන්ත්‍රීතුමනි, ලක්සල ආයතනය පළමු වතාවට පළමුවෙනි කන්ටේනර් එක හෙට ලංකාවෙන් පිටතට යවනවා. අපි ඒක යවන්නේ ඇමෙරිකාවට. මේ වන විට අපි රටවල් පහක් සමඟ ගිවිසුම් අත්සන් කර තිබෙනවා. ඒ අනුව, අපි විශේෂ දේශීය නිෂ්පාදන විධියට අත්යන්ත්‍ර රෙදිපිළිත් පිටරට යවන්න අවශ්‍ය කරන කටයුතු මේ වැඩ පිළිවෙළත් එක්ක සකස් කරනවා. මේ රටවල් දැනට අපේ ලක්සල ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර තිබෙනවා. විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ජපානය, ඩුබායි රාජ්‍යය ඇතුළු තවත් රටවල් ගණනාවක් සමඟ අපි දැනට ගිවිසුම් අත්සන් කර තිබෙනවා. ගිවිසුම් අත්සන් කර තිබෙන රටවල් තමයි මම මේ කිව්වේ.

(ඇ) පැන නොනඟී.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඩොලර් හිඟවීමේ ගැටලුවත්, රටේ පවතින ආර්ථික අර්බුදයත් නිසා අමුද්‍රව්‍ය ලංකාවට ගෙන ඒම සඳහා සහ ඒවා නිෂ්පාදන හැටියට නැවත පිටරට යැවීම සඳහා වන වැඩ පිළිවෙළේදී ඒ කර්මාන්තකරුවන් වෙනුවෙන් විශේෂ ක්‍රමවේදයක් සකස් කර තිබෙනවාද? ඒකටත් උත්තරයක් දෙන්න ඔබතුමා උත්සාහ කළා. දැනට තිබෙන ආර්ථික තත්ත්වයත් එක්ක, ඩොලර් හිඟයත් එක්ක අපි කොහොමද ඒ කර්මාන්තය බේරා ගන්නේ? ඒවා import and export කිරීමට විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බදුවලට යටත්ව තමයි අපට ආනයනය කරන්න සිදු වෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒවා ආනයනය කරන්නේ පෞද්ගලික ආයතන. පෞද්ගලික ආයතන අමුද්‍රව්‍ය ගෙනැල්ලා තමයි නිෂ්පාදකයන් සියලුදෙනාට ඒවා බෙදා හරින්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න. අපේ සළුසල ආයතනය මඟින් ඒ අමුද්‍රව්‍ය ආනයනය කරලා යම් අඩු මිලකට ඒවා ලබා දෙන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ගැන අපි දැනට සාකච්ඡා කරගෙන යනවා. මම රාජ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වෙනකොට සළුසලත් ඉතාම නරක තත්ත්වයකයි තිබුණේ. අපි දැනට සති දෙකකට කලින් ජාවත්තේ සළුසල නැවත ක්‍රමානුකූලව විවෘත කළා. අපි ඒකට අවශ්‍ය භාණ්ඩ ටික දීලා ඒ වැඩ පිළිවෙළ පටන් ගන්නවා. අපි බලාපොරොත්තු වෙනවා, සළුසල මඟින් ලංකාවට අවශ්‍ය නූල් ප්‍රමාණය ගෙන්වන්න. ඒ විතරක් නොවෙයි, ඩයි වර්ග ගෙන්වා ගන්නත් වැඩ පිළිවෙළක් අපි සකස් කරනවා. විශේෂ කැබිනට් පත්‍රිකාවක් යොමු කර, ආණ්ඩුවේ ආයතනයකින් ගේනකොට ඒවාට tax එකක් නැතුව ගේන්න පුළුවන් වැඩ පිළිවෙළක් ගැන අපි දැන් සාකච්ඡා කරගෙන යනවා. ඒ විධියට ගෙනාවොත් මීට වඩා අඩු මුදලකට ඒ දේවල් ලබා දෙන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ අමාත්‍යාංශය භාර ගෙන අවුරුද්දක පමණ කාලයක සිට මේ වැඩ කටයුතු කරනවා. අපි දකිනවා, ඔබතුමා පාර්ලිමේන්තුවට එනකොට පවා ලස්සන බතික් ඇඳුම් ඇඳගෙන එන ආකාරය. මම ඒ ගැන ඔබතුමා සමඟ කථා කර තිබෙනවා. මේ කර්මාන්තය සම්බන්ධයෙන් ඔබතුමා මුහුණ දී තිබෙන ගැටලු සහ ඒවාට පිළිතුරු සෙවීමේදී ඔබතුමාට ඇති බාධා මොනවාද කියා මම දැනගන්න කැමැතියි. අපි කැමැතියි, මේ වාගේ දේශීය කර්මාන්තයක් දියුණු වෙනවා දකින්න. අපි කැමැතියි, ඒකට උදවු කරන්න. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ කටයුත්තේදී middlemenලාගෙන් බාධා ඇති වෙනවාද? ඔබතුමා මේ අවුරුද්ද තුළ මේ කර්මාන්තය සම්බන්ධයෙන් මුහුණ දී තිබෙන ගැටලු මොනවාද කියාත් මම දැනගන්න කැමැතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. මේ කර්මාන්තයේ අපට තිබෙන ප්‍රධානම අර්බුදය තමයි, අමු ද්‍රව්‍යවල මිල අධිකභාවය.

විශේෂයෙන්ම බතික් කර්මාන්තයටත් ඒක බලපා තිබෙනවා. ඒ වාගේම අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයටත් ඒක බලපා තිබෙනවා. එම රෙදිපිළි විකුණා ගැනීම පිළිබඳව ගත්තාම, විශේෂයෙන්ම බතික් නිෂ්පාදන දැන් විශාල වශයෙන් මිලදී ගන්නවා. ජේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව තිබෙන්නේ පළාත් සභා යටතේ. අත්යන්ත්‍ර ජේෂ කර්ම ක්ෂේත්‍රයේ නිපදවන රෙදිපිළි විකුණා ගැනීමේදී යම් යම් අර්බුද -ගැටලු- මතු වී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නය අහපු එක හොඳයි. ගරු කථානායකතුමනි, සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලනවා, පුළුවන් තරම් අත්යන්ත්‍ර ජේෂ කර්ම ක්ෂේත්‍රයේ නිර්මාණය කරන රෙදිපිළි ගන්න කියලා. ඕනෑ තරම් රෙදිපිළි තිබෙනවා. සුදු පාටින් වුණත්, හොඳට අඳින්න පුළුවන් ඇඳුම් තිබෙනවා.

ඊළඟට අපි බලාපොරොත්තු වනවා, අත්යන්ත්‍ර ජේෂ කර්ම ක්ෂේත්‍රයේ මහපු, වියපු රෙදි ප්‍රචලිත කරන්න. මේ සුදු රෙද්ද වෙනුවට ලිනන් වාගේ රෙදි පිට රටින් ගෙන්වනවාට වඩා අපට මේවා දේශීයව නිපදවන්න පුළුවන් වාතාවරණයක් තිබෙනවා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා මේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න සහයෝගය ලබා දෙන්න කියලා. දේශීය දේවල් ඇඳලා අපිම වැඩේ පටන් ගත්තා නම්, ලංකාව පුරාම මෙය ප්‍රචලිත කරන්න පුළුවන්. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, අපේ කට්ටියත් අඳින්නේ පිට රටින් ගේන සිල්ක් වාගේ කඩා හැලෙන රෙදි නේ. ඒවා වෙනුවට ලංකාවේ නිෂ්පාදනය කරන - අත්යන්ත්‍රවලින් නිෂ්පාදනය කරන- ඇඳුම්, නැත්නම් ඒ රෙදි හෝ අපි භාවිත

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කරනවා නම් මෙම කර්මාන්තය තවදුරටත් දියුණු කරන්න පුළුවන්. මොකද, celebritiesලා වන ඔබතුමන්ලා මේවා ඇන්දාම අනෙක් කට්ටියත් ඇවිල්ලා අතගාලා බලනවා, "මේවා ලංකාවේද හදන්නේ, කොහේද හදන්නේ?" කියලා. මම කියන්නේ, ඒ කටයුත්ත පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාගෙන් පටන් ගනිමු කියලායි. අපේ මන්ත්‍රීවරියන් නම් එම රෙදිපිළි අඳිනවා. අපේ මේ සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියත් ඒවා අඳිනවා. ඒ වාගේම අපේ රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියත් අඳිනවා, තලතා අතුකෝරල මන්ත්‍රීතුමියත් අඳිනවා. මම නම් වශයෙන් කියන්න අවශ්‍ය නැහැ. පාර්ලිමේන්තුව නියෝජනය කරන අපේ මන්ත්‍රීතුමියන් 12දෙනාම අපේ ඒ දේශීය රෙදිපිළි අඳිනවා. ප්‍රශ්නය තිබෙන්නේ, මන්ත්‍රීවරු අඳින්නේ නැති එක. මන්ත්‍රීවරුනුත් national dress එක අඳිනකොට, දේශීය අත්යන්ත්‍ර රෙදිවලින් මහපුවා අඳිනවා නම්, ඒක මේ කර්මාන්තයට හොඳ ශක්තියක් වෙයි කියා මම හිතනවා. එම රෙදිපිළි විකුණා ගැනීම සඳහා මෙන්ම එම කර්මාන්තයේ ප්‍රවර්ධනයට එමඟින් වාතාවරණය සකස් වෙයි කියා අපි විශ්වාස කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා නිකම් දෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නිකම් දෙන්න පුළුවන් නම් ඉතින්,- *[බාධා කිරීම්]* නිකම්ම තමයි ඉල්ලන්නේ. පේනවා නේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -840/2020- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ඩෙංගු ව්‍යාප්තිය: මැඩපැවැත්වීම
## கொழும்பு மாவட்ட சேரித் தோட்டங்களில் டெங்கு நோய் பரவல்: தடுத்தல்
## SPREAD OF DENGUE IN URBAN DWELLINGS OF COLOMBO DISTRICT: PREVENTION

1647/2021

**4. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2020 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව හඳුනාගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව පැතිරෙමින් පවතින ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා මේ වනවිට ගෙන ඇති විශේෂ ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்தில் சேரித் தோட்டங்களைச் சார்ந்ததாக 2020ஆம் ஆண்டில் இனங் காணப்பட்ட டெங்கு நோயாளர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவுவாரியாக தனித்தனியே எத்தனையென்பதையும்;

(iii) கொழும்பு மாவட்டத்தில் சேரித் தோட்டங் களைச் சார்ந்ததாகப் பரவிவரும் டெங்கு நோயைக் கட்டுப்படுத்துவதற்கு இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள விசேட நடவடிக் கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the number of dengue patients identified in the urban dwellings of the Colombo District during the year 2020;

(ii) separately, the number according to each Divisional Secretary's Division; and

(iii) the special measures taken to prevent the spread of dengue disease in the urban dwellings of the Colombo District?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2020 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව හඳුනා ගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 348කි.

(ii) කොළඹ දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව සංඛ්‍යාව පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | වතු ආශ්‍රිතව හඳුනාගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව (2020) |
|---|---|
| කොළඹ | 45 |
| තිඹිරිගස්යාය | 24 |
| දෙහිවල | 95 |
| හෝමාගම | 00 |
| පාදුක්ක | 01 |
| කඩුවෙල | 00 |
| කොලොන්නාව | 30 |
| කැස්බෑව | 00 |
| කෝට්ටේ | 130 |
| මහරගම | 06 |
| මොරටුව | 02 |
| රත්මලාන | 13 |
| සීතාවක | 02 |
| **එකතුව** | **348** |

(iii) * රෝගීන් වාර්තා වීම පිළිබඳ දත්ත පද්ධති නිතිපතා විශ්ලේෂණය කර අවදානම් ප්‍රදේශ ඉලක්කකොට මදුරු මර්දන වැඩසටහන් දියත් කිරීම.

* කීට විද්‍යා සමීක්ෂණ සිදුකර වසංගත තත්ත්වයන් පුරෝකථනය කිරීම සහ එය මැඩ පැවැත්වීම සඳහා පියවර ගැනීම.

* වසංගත තත්ත්වවලදී ධූමායනය කිරීම.

* මෝසම් වර්ෂාවට පෙර ජනතා සහභාගිත්වය වැඩිකොට මදුරුවන් බෝ වන ස්ථාන ඉවත් කිරීම සඳහා යොමු කිරීම.

* ප්‍රජා බලගැන්වීම, රෝගය වැළැක්වීම සහ නිසි ප්‍රතිකාර ලබා ගැනීම පිළිබඳ පණිවුඩ ඉලෙක්ට්‍රොනික් සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සමාජගත කිරීම සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමින්, සායන තුළින් මෙන්ම ජංගම ප්‍රචාරක රථ මාර්ගයෙන්ද ජනතාව දැනුවත් කිරීම.

* ලෝක මදුරු වැඩසටහන සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන "වොල්බැකියා" නියමු ව්‍යාපෘතිය - Wolbachia Project - ක්‍රියාත්මක කිරීම. නුගේගොඩ සහ කොළඹ මහ නගර සභාවේ මට්ටක්කුලිය/මෝදර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසය තුළ පරිසරයට වොල්බැකියා බැක්ටීරියාව සහිත මදුරුවන් මුදාහරින ලදී. වොල්බැකියා ආසාදිත මදුරුවන් තුළ ඩෙංගු වයිරසය වර්ධනය වීම දුර්වල වේ. ඒ මඟින් ඩෙංගු වයිරසය මදුරුවන් හරහා සම්ප්‍රේෂණය වීම පාලනය වේ.

(ආ) පැන නොනඟී.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, කාලෝචිත ප්‍රශ්නයක් නිසා මේ සඳහා ඔබතුමියට හැකි ආකාරයෙන් පිළිතුරක් ලබා දෙයි කියා මම හිතනවා. ඔබතුමිය දන්නවා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා කොවිඩ් පාලනය සම්බන්ධයෙන් පසුගිය සතියේ යම් නීති රීති, අලුත් රෙගුලාසි වගයක් හඳුන්වා දුන් බව. ළඟදී පැවැත්වූ T 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී පවා නරඹන්නන්ට ඒ තරග බලන්න අවස්ථාව ලබා දුන්නා. ඊයේ-පෙරේදා බංග්ලාදේශයේ තිබුණු පාකිස්තානය හා බංග්ලාදේශය අතර T 20 තරග තුනම නරඹන්න ජනතාවට අවස්ථාව ලබා දුන්නා. ලංකාවේ පසුගිය සිකුරාදා පවත්වපු මහින්ද රාජපක්ෂ කුසලාන පාපන්දු තරගාවලියේත් අවසාන තරගය නරඹන්නට ජනතාවට අවස්ථාව ලබා දුන්නා. නමුත්, බටහිර ඉන්දීය කොදෙව් පිල සහ ශ්‍රී ලංකා පිල අතර අද ගාල්ලේ පවත්වන පළමු ටෙස්ට් තරගය නරඹන්න ජනතාවට අවස්ථාවක් ලබා දීලා නැහැ. මම හිතන විධියට එදා අවසර දීපු එක හොඳයි. මොකද, දැන් ලෝකයේ හැම රටක්ම සෞඛ්‍ය නීති රීතිවලට අනුව ක්‍රීඩා තරග නරඹන්න අවසර ලබා දීලා තිබෙනවා. ඒ නිසා බටහිර ඉන්දීය කොදෙව් පිල හා ශ්‍රී ලංකා පිල අතර ගාල්ලේ පැවැත්වෙන තරගය සඳහා නරඹන්නන්ට අවස්ථාවක් ලබා දෙන්න බැරිද?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු මන්ත්‍රීතුමා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අහලා ඒ ගැන මම උත්තරයක් දෙන්නම්. මොකද, විශේෂ හේතු ගැන සඳහන් කරන්න මට මේ අවස්ථාවේදී බැහැ. ඒ නිසා මම එතුමාගෙන් විමසා කරුණු කාරණා ඉදිරිපත් කරන්නම්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා අහනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සෞඛ්‍ය රාජ්‍ය ඇමතිතුමියනි, විශේෂයෙන්ම ඔබතුමියගෙන් පැහැදිලි කර ගැනීමක් සඳහා සහ අවධානය යොමු කරවීම සඳහා මා මේ අතුරු ප්‍රශ්නය අහනවා. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය තිබෙන්නේත් ඩෙංගු රෝගය සම්බන්ධයෙන්. එක පැත්තකින්, මා හිතනවා කොවිඩ් - 19 තත්ත්වය තුළ රෝහල්වල තිබුණු කාර්ය බහුල තත්ත්වය නිසා ඩෙංගු රෝගය සම්බන්ධයෙන් අවධානය අඩු වුණාද කියලා. ඒක කොළඹ විතරක් නොවෙයි, රට පුරාම ව්‍යාප්තවෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ප්‍රදේශය තුළ ගොවිතැන් කරන ගොවි මහත්ම මහත්මීන්ට, වගා කරන අයට මී උණ හැදිලා ජීවිතක්ෂයට පත් වෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ලංකාව පුරාම ගොවිතැන් කරන ප්‍රදේශවල මේ වනකොට මී උණ රෝගීන් ප්‍රමාණය විශාල වශයෙන් වැඩිවෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න ඕනෑ. කුඹුරට බහින්න කලින් ඔවුන්ට tablet එකක් දෙනවා. කොවිඩ් - 19 තත්ත්වය තුළ මේ සම්බන්ධ කරන දැනුවත් කිරීම් ප්‍රමාණවත් නැති නිසා වෙන්න ඇති, මී උණ හැදිලාත් විශාල ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද කියලා මම ඔබතුමියගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු කථානායකතුමනි, මා හිතන්නේ ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත් ප්‍රශ්නයක් මතු කළේ. මී උණත් විශාල මහජන සෞඛ්‍ය ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. නමුත් පසුගිය කාලයේ කොවිඩ් රෝගීන් වැඩි වීම හේතුවෙන් කොවිඩ් සඳහා වැඩි අවධානයක් යොමු කිරීම නිසා පොඩි පොඩි අතපසුවීම් සිදු වුණත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් හරහා විශේෂයෙන්ම ඒ ගොවි සංවිධාන දැනුවත් කරලා, කුඹුරට බහින්න කලින් doxycycline ප්‍රතිකාරය ගත්තොත් මී උණ හැදීම වළක්වා ගන්න පුළුවන්. ඒ ගැන අපේ අවධානය යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1830/2021- (2), ගරු චාමර සම්පත් දසනායක මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය: ආයෝජන අවස්ථා
## கைத்தறி நெசவுக் கைத்தொழில்: முதலீட்டு வாய்ப்புக்கள்
## HANDLOOM TEXTILE INDUSTRY: INVESTMENT OPPORTUNITIES

840/2020

**3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කය, අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන බවත්;

(ii) අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය තුළින් වැඩි වශයෙන් ආයෝජන අවස්ථා ලබා ගත හැකි බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තශාලා කිහිපයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) ඉහත අ(ii)හි සඳහන් ආයෝජන අවස්ථා සෘජුවම කර්මාන්තයේ නියැලෙන්නන්ට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டம் கைத்தறி நெசவுக் கைத் தொழிலுக்குப் பிரபல்யமானது என்பதையும்;

(ii) கைத்தறி நெசவுக் கைத்தொழிலின்மூலம் அதிக மான முதலீட்டு வாய்ப்புக்களைப் பெற்றுக் கொள்ள முடியும் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மட்டக்களப்பு மாவட்டத்தில் சில கைத்தறி நெசவுக் கைத்தொழிற்சாலைகளை நிர்மாணிப் பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) மேலே அ(ii)இல் குறிப்பிடப்பட்ட முதலீட்டு வாய்ப்புக்களை நேரடியாக கைத்தொழிலில் ஈடுபடுகின்றவர்களுக்குப் பெற்றுக்கொடுப் பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industries:

(a) Is he aware that -

(i) the Batticaloa District is well known for handloom textile industry; and

(ii) more investment opportunities are available in the handloom textile industry?

(b) Will he inform this House -

(i) whether steps will be taken to establish some handloom textile factories in Batticaloa District; and

(ii) whether steps will be taken to provide aforesaid investment opportunities stated in (a)(ii) to the individuals who are directly involved in the industry?

(c) If not, why?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) නැත.

නැඟෙනහිර පළාත් සභාවේ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් දැනට මඩකලපුව දිස්ත්‍රික්කයේ පේෂ කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන 37ක් පවත්වාගෙන යනු ලබන අතර එම මධ්‍යස්ථානවල සෑම වර්ෂයක් පාසාම පේෂ කර්මාන්ත පුහුණුව ලබන සංඛ්‍යාව 334කි. දැනට එම ප්‍රදේශයේ පේෂ කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යන නමුත් අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තශාලා පවත්වාගෙන යාමක් නොමැත. එසේම රජය විසින් මෙම ප්‍රදේශයේ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තශාලා ආරම්භ කරන්නේ නැති අතර, නව ආයෝජකයින් ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන්නේ නම් මේ සඳහා අවශ්‍ය සහාය ලබා දිය හැක.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1830/2021- (2), ගරු චාමර සම්පත් දසනායක මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

මීට කලිනුත් අවස්ථා දෙකකදී මා මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කළා, ස්ථාවර නියෝග 3 (2) යටතේ. ගරු කථානායකතුමනි, මේ සභාවේ ආසන පැනවීම ඔබතුමාට වරින් වර වෙනස් කරන්න පුළුවන්. විශේෂයෙන් ගරු පූජ්‍ය අතුරලියේ රතන හිමි, ඒ වාගේම ගරු අලි සබ්රි රහීම් කියන මන්ත්‍රීවරුන් දෙදෙනා විපක්ෂයේ ඉදිරි පෙළ ආසනවල ඉන්නේ.

එතුමන්ලා හැම දාමත් ආණ්ඩුවට ඡන්දය දෙනවා; ආණ්ඩුවත් එක්ක කටයුතු කරනවා. ඒ නිසා මම හිතන හැටියට මේ ආසන පනවන විධිය වැරදියි, ගරු කථානායකතුමනි. විපක්ෂයේ ඉදිරි පෙළ ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන් දෙදෙනෙක් ඉන්නවා කියන එක හරියට ඔත්තුකාරයෝ දෙන්නෙක් ඉන්නවා වාගේ. ඔබතුමාට මීට කලින් අවස්ථා දෙකක මම මේ කරුණ මතක් කළා. අතුරලියේ රතන හිමියන්ට ඉදිරි පෙළ අසුනක් ඕනෑ නම් ආණ්ඩු පක්ෂයෙන් දුන්නාට අපට ප්‍රශ්නයක් නැහැ. අලි සබ්රි රහීම් මන්ත්‍රීතුමා හැම දාමත් ආණ්ඩුවත් එක්ක ඉන්නේ. මේක ඔබතුමාගෙන් දිගින් දිගටම ඇහුවාට විසඳුමක් නැහැ. කරුණාකර මේ ප්‍රශ්නය විසඳලා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක පක්ෂවල තීරණයක්. ඒක අදාළ පක්ෂවලින් ගත්ත තීරණයක්. ඒකට අපට මැදිහත් වෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

අපේ නලින් බණ්ඩාර මැතිතුමා සම්ප්‍රදාය කියෙව්වොත් හොඳයි. ඕනෑම පක්ෂයක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඒ පක්ෂයෙන් එනවා නම්, සාමාන්‍යයෙන් ඉදිරි පෙළ ආසනයක් දෙන එක තමයි සාමාන්‍ය සම්ප්‍රදාය. එතුමා විපක්ෂයේ ඉඳලා ආණ්ඩුවට සහයෝගය දෙනවාද, නැද්ද කියන එක ඒ ගොල්ලන්ගේ පෞද්ගලික තීරණයක්. නමුත් ඔබතුමාට අයිතියක් නැහැ, ඒ ගොල්ලන් ආණ්ඩුවට සහාය දෙන හින්දා මේ පැත්තට තල්ලු කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා වුණත් හෙට සමගි ජන බලවේගයෙන් අයින් වෙලා පෞද්ගලිකව වෙනම පාර්ලිමේන්තුවට ආවොත් ඔබතුමාටත් ඉදිරි පෙළ අසුනක් තියෙයි. ඔබතුමාට අයිතියක් තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තු සම්ප්‍රදාය හොඳින් කියවලා ආවොත් ඒ ප්‍රශ්නයට පිළිතුරක් සොයා ගන්න පුළුවන් වෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, කලකට පෙර මුස්ලිම් මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ආණ්ඩුවට සහයෝගය දුන්නා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, ඒ අය ආණ්ඩු පක්ෂයේ ගොඩට දාන්න කියලා. විපක්ෂයේ, අපේ ගොඩට නොවෙයි. ඔබතුමා ඒ අනුව ඒ ගොල්ලන් වාඩි කෙරෙව්වා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් එක්ක. ඉතින්, මේ දෙපළ ඉන්නේ අපේ විපක්ෂයේ ගොඩේ. එහෙම ඉන්න බැහැ. ඔබතුමා මුස්ලිම් මන්ත්‍රීවරු සියලුදෙනාම ආණ්ඩු පක්ෂයේ ගොඩට දැම්මේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඒ පක්ෂවලින් ගත්ත තීරණයක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක වැරදියි. පළමුවැනි පේළියේ ඉන්න බැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මේ සම්ප්‍රදාය තීරණය කරන්නේ ගරු කථානායකතුමා විසින්. මේ සම්ප්‍රදාය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකුගේ ආසනය සම්බන්ධ තීරණය ගන්නේ ඔබතුමා. ඒක තමයි පාර්ලිමේන්තු ඉතිහාසය පුරා සිද්ධ වෙලා තිබෙන සම්ප්‍රදාය. අවුරුදු 70කට වැඩියි දැන් ඒකට. ඒක නොදැන නොවෙයි මේ කථා කරන්නේ. ඒ වාගේම ඒ ගැන නොදැන කථා කිරීමෙන් රට රවට්ටන්න පුළුවන්, රට රවට්ටපු කාලේ අමතක නිසා. මේ කථා කරන අයම මේ පැත්තේ ඉඳගෙන ආණ්ඩු කරපු කාලයේ, විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අද මම ඉන්න තනතුරේ ඉන්නකොට ටීඑන්ඒ එකේ සුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් විපක්ෂ නායක පත් කළා. ඒ මන්ත්‍රීවරුන්ට මුල් ආසන දීලා අපේ හිටපු අමාත්‍යවරු පවා දෙවැනි ආසන පේළියෙන් එහාට තල්ලු කළා.

එතුමන්ලාත් හැම දාම ඡන්දය දුන්නේ ආණ්ඩුව එක්ක. එදා නැඟිටලා වචනයක්වත් කිව්වාද ඒක සම්ප්‍රදාය විරෝධියි කියලා? ගරු කථානායකතුමනි, අපි එදා විපක්ෂ නායක ධුරය වෙනස් කරන්න කියලා කිව්වා. නමුත් අපි කවදාවත් ඒක සම්ප්‍රදාය විරෝධියි කියලා කිව්වේ නැහැ. එවකට හිටපු කථානායකතුමා තීරණය කරලා, ඒ වෙලාවේ ඒ පැත්තට විපක්ෂ නායකකම දීලා, මුල් පුටු පේළිය දුන්නා. ඒක හරියි කියලා ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා නැඟිටලා කථා කළා, සභානායක හැටියට. නමුත්, එතුමන්ලාත් හැම දාම ඡන්දය දුන්නේ ආණ්ඩුව එක්ක. එහෙම නම්, එදා කියන්න තිබුණානේ ගිහිල්ලා ආණ්ඩුව පැත්තේ ඉඳගන්න කියලා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
ලංකාවේ පළමුවෙනි වතාවට ආණ්ඩුවයි, විපක්ෂයයි - *[බාධා කිරීමක්]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
"ඉලෛ, ඉලෛ, ඉලෛ" කියන කථාවට ඒවා කරන්නේ. කිසිම සාධාරණත්වයක්, සත්‍යයක්, පදනමක්, ජොෂ්ඨත්වයක් හෝ පාර්ලිමේන්තු සම්ප්‍රදායක් ගරු කරලා නොවෙයි මේ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

හැසිරෙන්නේ. හැම දාම උදේට කථානායකතුමාට මොකක් හරි කරදරයක්, ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. ඒ වාගේ කනගාටුදායක තත්ත්වයට ලංකා පාර්ලිමේන්තුව පත් කරන්න එපා. විශේෂයෙන්ම විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම ඉල්ලා සිටිනවා එහෙම හැසිරෙන්න එපා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ඔබතුමා සත්‍යය ප්‍රකාශ කළා. *[බාධා කිරීමක්]*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - சுற்றுலாத்துறை அமைச்சர்)
(The Hon. Prasanna Ranatunga - Minister of Tourism)

2015දී ජනාධිපතිවරණයෙන් පස්සේ - *[බාධා කිරීමක්]* අපට බහුතරය තිබියදී අගමැතිකම දුන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයාට.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order. මගේ නම සඳහන් කළා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මම කථා කළේ වර්තමාන පාර්ලිමේන්තුවේ ඔබතුමා ආරම්භ කළ සම්ප්‍රදාය ගැන. මුස්ලිම් මන්ත්‍රීවරු අපෙන් අයින් වුණාම ඔබතුමා එතුමන්ලා අපේ ගොඩේ තිබ්බේ නැහැ, ආණ්ඩුවේ ගොඩට දැම්මා. අපි කියන්නේ මෙතුමන්ලාත් ආණ්ඩුවේ ගොඩට දාන්න කියලා. එච්චරයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාට ප්‍රකාශයක් කරන්න තිබෙනවා ලු.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! இன்று எங்களுடைய கிண்ணியாப் பிரதேசத்திலே குறிஞ்சாக்கேணி என்ற இடத்திலே ஓர் அனர்த்தம் நடைபெற்றிருக்கின்றது. குறிஞ்சாக்கேணிப் பாலம் இந்த அரசாங்கத்தினால் மீள அமைக்கப்பட்டுக்கொண்டிருக்கின்ற சந்தர்ப்பத்திலே, அதற்குப் பதிலாக அங்கு தற்காலிக ஏற்பாடாகச் செய்யப்பட்ட படகுப்பாதையொன்று விபத்துக்குள்ளாகியதால், இதுவரை 06 பேர்வரை இறந்திருப்பதாகத் தகவல் கிடைத்திருக்கிறது. இவர்களில் கூடுதலானவர்கள் பாடசாலை செல்கின்ற சிறிய மாணவ, மாணவிகள்! இன்று இது பாரியதொரு பிரச்சினை யாகக் காணப்படுகின்றது.

இதற்கு முன்னர் இந்தக் குறிஞ்சாக்கேணிப் பாலம் தொடர்பில் நான் இங்கிருக்கின்ற எங்களுடைய கௌரவ நெடுஞ்சாலைகள் அமைச்சர் அவர்களிடம் ஒரு கேள்வியை எழுப்பியிருந்தேன். அதாவது, இந்தப் பாலத்தை மீள நிர்மாணிப்பதற்கு முன்னர் இதற்கான பதிற்பாதையொன்றை நிர்மாணிக்கவேண்டிய கட்டாயம் இருக்கின்றது. அதை நிர்மாணிக்காமல் எப்படி நீங்கள் இந்த விடயத்தை ஆரம்பிக்கின்றீர்கள்? என்று கேட்ட சந்தர்ப்பத்திலே, இவ் விடயத்துக்குப் பொறுப்பான இராஜாங்க அமைச்சர் அவர்கள் அதை நக்கலாக எடுத்துக்கொண்டார். ஆனால், இன்று பல உயிர்கள் காவுகொள்ளப்பட்டிருக்கின்றன. இதற்கான தற்காலிக மாற்றுப் பாதைக்கு என்ன நடந்தது? இன்று அனர்த்தத்தை ஏற்படுத்தியிருக்கின்ற இந்தப் படகுப்பாதை யாருடைய அனுமதியுடன் இயங்கியது? இது சட்டப்படி இயங்கியதா அல்லது சட்டவிரோதமாக இயங்கியதா? இதற்கு யார் பொறுப்புக்கூற வேண்டும்? RDA பொறுப்புக்கூற வேண்டுமா அல்லது கிண்ணியா நகர சபை பொறுப்புக்கூற வேண்டுமா? என்பது தொடர்பில் கவனம்செலுத்தி, உரிய நடவடிக்கை எடுக்க ஆவன செய்யவேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

මම මහාමාර්ග අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ස්ථානයේ පාලම සෑදීමට ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලාගේ මාර්ග සංවර්ධන අධිකාරිය මුදල් අය නොකර මඟී ප්‍රවාහනය සඳහා ferry service එකක් දාන්න ලෑහැස්ති කරලා, ලබන මාසයේ ඉඳලා ඒක ක්‍රියාත්මක කරන්නට උත්සාහයක් තිබුණා.

නමුත් ඒ අතරතුරදී ප්‍රවාහනය කරන්න ලබා දුන් මේ ferry එකට කිසිම අනුමැතියක් නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව, මඟී ප්‍රවාහනය සඳහා මෙවැනි ප්‍රමිතියෙන් අඩු ferry එකකට ඉඩකඩ ලබාදීම තුළ තමයි, මේ ඛේදවාචකය සිදු වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, කරුණාකර ඔබතුමා ඒ පිළිබඳව පොඩ්ඩක් හොයා බලලා, අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ වාගේම සිද්ධියක් එක්දහස් නවසිය අනූ ගණන්වල මූතූර්වලත් සිද්ධ වුණා. ඒ සිද්ධියේදී 150දෙනෙකු මැරුම් කෑවා. කුරුඤ්ඤංකේණි කියන ප්‍රදේශයේ ඉඳලා පෙරිය කින්නියා කියන ප්‍රදේශයට කිලෝමීටරයක වාගේ දුරක් මුහුද හරස් කරලා යා යුතුයි. මේකට ඔබතුමන්ලා හොඳ පියවරක් අරගෙන තිබියදීත්, අවාසනාවට වාගේ මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව මඟී ප්‍රවාහනයට මෙවැනි ප්‍රමිතියෙන් තොර ferry එකකට අනුමැතිය ලබා දුන්නේ කොහොමද කියන එක අපට ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. කෙටියෙන් ඉදිරිපත් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට පෙර මේ කාරණය කියන්න මට සුළු වෙලාවක් ලබා දෙන්න, අද පාන්දර සිදු වූ සිද්ධිය පිළිබඳව කියන්න. කින්නියා සහ කුරුඤ්ඤංකේණි අතර පාරුවක් පෙරළීම නිසා 6දෙනෙක් මිය ගොස් තිබෙනවා. 11දෙනෙක් රෝහල්ගත වෙලා සිටිනවා. තුන්දෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා. මේ සිද්ධිය අද උදේ 7.30ට පමණ තමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අපේ ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාට මම මතක් කරන්න කැමැතියි, පසුගිය අප්‍රේල් මාසයේ 11වැනි දා ගරු නිමල් ලාන්සා රාජ්‍ය ඇමතිතුමා ගිහිල්ලා මේ ප්‍රදේශයේ පාලමක් ඉදිකිරීම සඳහා මුල් ගල් තියලා, ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න උත්සාහ දැරුවත්, ඒ වැඩ කටයුතු අඩාළ වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, ආරම්භ කරන්නට යෙදුණු ඒ කටයුත්ත කල් යවන්නේ නැතුව ඉක්මනින් කරන්නට කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

එම පාරුවේ 20දෙනෙක් හිටියා කියන ආරංචිය තමයි අපට ලැබුණේ. රාජ්‍ය මැදිහත්වීමෙන් විපතට පත්වුණු ඒ පවුල්වලට උපරිම සහන ටික, වන්දි ටික ලබා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම, ඒ පාරුව ක්‍රියාත්මක කරපු ආකාරය ගැනත්, එහි නීත්‍යානුකූලභාවය පිළිබඳවත් නිසි, විධිමත් පරීක්ෂණයක් පවත්වන්න කියන යෝජනාවත් මම මේ සභාවට ඉදිරිපත් කරනවා. එම සිදුවීමෙන් විපතට පත් පවුල්වල සියලු දෙනාට මේ ගරු සභාවේත්, අප සියලු දෙනාගේත් බලවත් කනගාටුව සහ ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### රක්ෂණ නියෝජිතයන්ට වැටුප් ක්‍රමයක් සහ සමාජ ආරක්ෂණ ක්‍රමයක්
### காப்புறுதி முகவர்களுக்கான சம்பளத் திட்டமும் சமூகப் பாதுகாப்புத் திட்டம்
### SALARY SCHEME AND SOCIAL SECURITY SCHEME FOR INSURANCE AGENTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, රක්ෂණ කර්මාන්තය තුළ සේවය සපයනු ලබන ප්‍රධානතම කණ්ඩායම වන්නේ රක්ෂණ ඔප්පු අළෙවි කිරීම තුළින් රක්ෂණ සමාගම් සඳහා නව ආයෝජන රැගෙන එන රක්ෂණ නියෝජිතයන්ය. රක්ෂණ සමාගම් විසින් රක්ෂණ නියෝජිතයන් "ස්වාධීන කොන්ත්‍රාත්කරුවන්" ලෙස අර්ථ ගන්වා සැලකීම තුළින් ඔවුන් සේවක අයිතිවාසිකම් සහ වරප්‍රසාද අහිමි පිරිසක් බවට පත් කර තිබෙනවා. මේ වනවිට රක්ෂණ කර්මාන්තයේ නියැලී සිටින්නේ 45,000ක් පමණ පිරිසක් වුවද, මේ වනවිට ලක්ෂ දෙකකට ආසන්න පුහුණු රක්ෂණ නියෝජිතයන් පිරිසක් රැකියාවෙන් ඉවත්වීමට ද මෙය ප්‍රධාන හේතුවක් වී තිබෙනවා. මෙම ක්ෂේත්‍රය තුළ නියැලී සිටින රක්ෂණ නියෝජිතයන් හා ඒ වාගේ කිහිප ගුණයක් වන ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ ආරක්ෂාව හා සුබසාධනය ඔවුන්ගේ රැකියාවට නීතිමය පිළිගැනීමක් නොමැතිවීම තුළ ගැටලු සහගත වී තිබෙනවා.

ඒ අනුව මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

(1) ජීවිත රක්ෂණ නියෝජිතයින් සඳහා ස්ථිර මූලික වැටුපක් හිමි නොවන නමුත්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත පදනම් කරගෙනම අනෙක් සමහර රක්ෂණ නියෝජිතයන් සඳහා මූලික වැටුප් ලබා දෙනවා. මෙසේ එකම පනතක් පදනම් කරගෙන එකම කාර්යය කරන දෙපිරිසකට දෙයාකාරයකට සලකන්නේ කෙසේද? ජීවිත රක්ෂණ නියෝජිතයින් සඳහා ද මූලික වැටුප් හිමි කර දීමට රජය පියවර ගන්නේද? එසේ නම්, එම පියවර මොනවාද?

(2) සේවක අර්ථසාධක අරමුදල් පනතේ "රක්ෂිත වෘත්තීන්" යන කොටසට "රක්ෂණ නියෝජිතයන්" යන්න ද ඇතුළත් වන සේ සංශෝධනය කිරීමට රජය කටයුතු කරන්නේද? ඒ සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද? මෙම නීති පාර්ලිමේන්තුව වෙත ගෙන ඒමට කටයුතු කරන්නේ කවදාද?

(3) මෙම රක්ෂණ නියෝජිතයන්ට සේවක අර්ථසාධක අරමුදල් හිමිකම - EPF - හෝ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල - ETF -, පාරිතෝෂික හිමිකම, කාර්මික ආරාවුල් පනත යටතේ වන ආරක්ෂාව, කාලීනව රටේ සිදු වන වැටුප් වැඩිවීම් හිමිකම, අය වැය සහන හෝ කම්කරු විනිශ්චය සභා මඟින් ලබා දෙනු ලබන සහන ලබා ගැනීමට හිමිකම නොමැති බව රජය දන්නේද? සෑම සේවකයෙකුටම හිමි විය යුතු ඉහත හිමිකම් රක්ෂණ නියෝජිතයන් සඳහා ද ලබා දීමට නිසි ක්‍රමවේදයක් සකස් කිරීමට රජය කටයුතු කරන්නේද? එසේ නම්, එම ක්‍රමවේදය කුමක්ද?

(4) මෙමඟින් EPF සහ ETF අරමුදල් සඳහා දායකත්වය සපයන සාමාජිකයන් සංඛ්‍යාව එකවර 45,000කට වැඩි පිරිසකගෙන් වැඩිකර ගැනීම තුළින් එම අරමුදල වර්ධනය කර ගැනීමට හැකියාව පවතින අතර, එමඟින් සිදු කරන ආයෝජන මඟින් දායකයන්ට වැඩි වාසි අත්කර දිය හැකි බව රජය නොදන්නේද? ඒ පිළිබඳව රජය අධ්‍යයනයක් කර තිබේද?

(5) රටේ ආර්ථිකයට දක්වන දායකත්වය සහ කර්මාන්තයක් ලෙස රක්ෂණ කර්මාන්තයට දක්වන දායකත්වය සැලකිල්ලට ගෙන මෙම පිරිස සඳහා ප්‍රමාණවත් සහ ස්ථිර සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක රැකවරණය ලබා දීම ජාතික අවශ්‍යතාවක් බව රජය පිළිගන්නේද? එසේ නම් මේ සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නීති සම්පාදනය සඳහා මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වන්නේ මන්ද?

මම ගරු අමාත්‍යතුමාගෙන් අවසාන වශයෙන් ඉල්ලීමක් කරනවා. ශ්‍රී ලංකාවේ මෙම ජීවිත රක්ෂණ කර්මාන්තය තුළ සේවය කරන 45,000කට වැඩි නිලධාරින්ගේ සේවක සුබසාධනය හා ආරක්ෂාව පිණිස පිහිටුවා ගත් සංගමයක් තිබෙනවා, "ජීවිත රක්ෂණ නියෝජිතයන්ගේ සංගමය" නමින්. අපේ ගරු කම්කරු අමාත්‍යතුමා වතාවන් කීපයකදී මේ කණ්ඩායම් හමුවෙලා තිබෙන බව මම දන්නවා. නැවත වරක් මේ සංගමයේ සාමාජිකයන් හා නියෝජිත පිරිස් හමුවෙලා, මේ අයගේ ඉල්ලීම් කාල වකවානු සහිතව ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියන කාරුණික ඉල්ලීමත් මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා, ගරු ඇමතිතුමනි.

ස්තුතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මේ ප්‍රශ්නය ඇසීම පිළිබඳව මම පළමුවෙන්ම ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වනවා. මොකද, මේ පිළිබඳව මමත්, මගේ අමාත්‍යාංශයත් මාස හයක් තිස්සේ ගන්නා ලද සාධනීය ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවස්ථාවක් මට ඔබතුමා ලබා දුන්නා.

විශේෂයෙන් මේ රක්ෂණ නියෝජිතයන් අතරින් ජීවිත රක්ෂණ නියෝජිතයන් සඳහා ස්ථිර වැටුපක් හිමි නොවන බව ඔබතුමා පිළිගෙන තිබෙනවා. එයට ප්‍රධාන හේතුව තමයි, රක්ෂණ ආයතන විසින් ජීවිත රක්ෂණ නියෝජිතයන් "ස්වාධීන ගිවිසුම්කරුවන්" - independent contractors - ලෙස සලකා කටයුතු කිරීම. ඒ අනුව ජීවිත රක්ෂණ නියෝජිතයන්හට මූලික වැටුපක් ගෙවීම වෙනුවට කොමිස් පදනම මත ගෙවීම් සිදු කරන බව නිරීක්ෂණය වෙනවා. එම නිසා අපට Wages Board එක යටතේ හෝ වෙනත් ක්‍රමයක් යටතේ හෝ ඔවුන්ට වැටුපක් නියම කිරීමට පුළුවන්කමක් නැහැ. ඔවුන් උපයන කොමිස් මුදලින් තමයි ඔවුන් ජීවත් වන්නේ. එම නිසා ඒ ව්‍යුහය මොන ආකාරයෙන් හෝ වෙනස් කර, ඔවුන් "සේවකයන්" බවට පරිවර්තනය කරන්න අපිට පුළුවන්ද කියන කාරණය පිළිබඳව නීතිමය ගැටලුවක් තිබෙනවා. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ සඳහන් කර ඇති වගන්තිවලින් පැන නඟින නෛතික අවහිරතා හේතුවෙන් කම්කරු දෙපාර්තමේන්තුවට මේ පිළිබඳව සෘජුව මැදිහත් වීමට බාධාවක් තිබෙනවා. එම තත්ත්වය පිළිබඳව මගේ අවධානය යොමු කිරීමෙන් අනතුරුව, අගතියට පත් වී ඇති ජීවිත රක්ෂණ නියෝජිතයන් අවස්ථා දෙකකදී -2021 ජූලි 21වන දින හා 2021 ඔක්තෝබර් 25 වන දින- අප අමාත්‍යාංශයට කැඳවා ඔවුන් සමඟ දීර්ඝව සාකච්ඡා කළා. ඒ සාකච්ඡා සඳහා රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු සමාගම් එක්ව පිහිටුවා ගත් සංගමයට ආරාධනා කළත්, ඔවුන් එයට සහභාගි නොවූ බැවින්, සාකච්ඡා මාර්ගයෙන් දෙපාර්ශ්වයට පිළිගත හැකි ස්ථිරසාර විසඳුමකට එළඹෙන්න බැරි වුණා. මොකද, රක්ෂණ සමාගම්වල හාම්පුතුන් මේ සාකච්ඡා සඳහා ඒමට අදිමදි කරනවා. මම අවසාන වශයෙන් හෙට දිනය දීලා තිබෙනවා; ඒ රක්ෂණ සමාගම්වල හාම්පුතුන්ට පැමිණ මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කිරීමට, ඒ පිළිබඳව යම් එකඟතාවක් ඇති කර ගැනීමට පුළුවන්ද කියා බලන්න. ඒ අවස්ථාව අපි ඔවුන්ට ලබා දිය යුතුයි.

ගරු විපක්ෂ නායකතුමනි, මේ පිළිබඳව අපට නීතිමය ප්‍රශ්න කිහිපයකුත් තිබෙනවා. මේ කාරණය පිළිබඳව රක්ෂණ නියෝජිතයන් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කළා. ඒ පැමිණිල්ල කම්කරු දෙපාර්තමේන්තුවෙන් විභාග කර, තීන්දුවක් ගෙන තිබෙනවා මේ රක්ෂණ නියෝජිතයන්ටත් EPF, ETF ගෙවන්න ඕනෑය කියලා. අප දෙන ලද ඒ තීන්දුව, රක්ෂණ සමාගම් හිමිකරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SCSPLA/408/2019 යටතේ අභියෝගයට ලක් කර තිබෙනවා.

මේ අර්ථ නිරූපණය අනුව ඔවුන් සේවකයන් හැටියට සලකා ඔවුන්ගෙන් සේවක අර්ථසාධක අරමුදල් එකතු කර ගන්න පුළුවන්ද, බැරිද කියන කාරණය දැන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ තිබෙනවා. ඔබතුමා දන්නවා, මෙය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ විනිශ්චයට භාජන වෙමින් පවතින කරුණක් බව. අපි ඒ නඩුවේ ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙන් ඉන්නවා. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙන තීන්දුව අපට අනික් පැත්තට හරවන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීමේදී මේ පාර්ලිමේන්තුවේ කවුරුත් එකතුවෙලා ඒකට සහයෝගය දුන්නොත්, එම නියෝජිතයන්ට සාධාරණය ඉටු කිරීම සඳහා අවශ්‍ය නීති ඇතුළත් Bill එකක් - legislation එකක් - ගේන්න මම සූදානම්. එහෙම නැත්නම්, EPF, ETF පිළිබඳ අණ පනත්වලට අවශ්‍ය සංශෝධන ගෙන ඒමට මම සූදානම් බවත් ප්‍රකාශ කරන්න කැමැතියි.

ජීවිත රක්ෂණ නියෝජිතයන්ගේ මේ ප්‍රශ්නය පිළිබඳව මගේ අමාත්‍යාංශය ඉතාම නම්‍යශීලීභාවයකින් යුතුව කටයුතු කරගෙන යනවා. නමුත්, පවතින නීති රාමුව තුළ, රක්ෂණ සේවාව පිළිබඳව නීතියක් තිබෙනවා, ඒ වාගේම අපි ලබා දුන් තීන්දුව අභියෝගයට ලක් කරලා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙනවා. අපි ඒ දෙක විසඳාගන්න ඕනෑ. ඒ දෙක විසඳා ගත්තාට පස්සේ අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයි. ගෘහ සේවිකාවන්ටත් EPF, ETF තිබුණේ නැහැනේ. ඒ සම්බන්ධයෙන් වන පනත මම දැන් ගෙනැල්ලා තිබෙනවා. එම නිසා, ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජය කම්කරු ජනතාවගේ සුබසාධනය සඳහා ගත යුතු පියවර අනිවාර්යයෙන්ම ගන්නවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගයත් අපට නොපැකිළව ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ සභාව තුළ බොහෝ දෙනෙකුට අහන්න ලැබෙන්නේ විපක්ෂය විසින් රජය පිළිබඳව කරනු ලබන විවේචන. නමුත්, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මම අහපු ප්‍රශ්නයට නිසියාකාරයෙන්, ඉතාම පැහැදිලිව, වැල් වටාරම් දොඩවන්නේ නැතුව මිනිසුන්ගේ පැත්තෙන් බොහොම සාධනීය පිළිතුරක් ලබා දීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒක දුර්ලභ දෙයක්. මගේ යුතුකම තමයි, වැරැදි විවේචනය කරනවා වාගේම, හොඳ දේට ස්තුතිය ප්‍රකාශ කිරීම. එම නිසා මේ අවස්ථාවේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ලබා දුන් හරාත්මක, ධනාත්මක, ගුණාත්මක, ප්‍රගතිශීලී පිළිතුර වෙනුවෙන් නැවත වතාවක් එතුමාට මගේ හද පිරි ස්තුතිය පුද කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා.

## ග්ලයිෆොසෙට් තහනම: කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## 'கிளைபோசேட்' மீதான தடை: கமத்தொழில் அமைச்சரினது கூற்று
## BAN ON GLYPHOSATE: STATEMENT BY MINISTER OF AGRICULTURE

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, පරිසර හිතකාමී කෘෂි කර්මාන්තයක් සඳහා මේ රජය තීරණයක් අරගෙන තිබෙනවා. එසේ තීරණයක් ගෙන තිබියදී ඊයේ දවසේ පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ග්ලයිෆොසෙට් තහනම ඉවත් කරමින් ගැසට් පත්‍රයක් නිකුත් කරලා තිබෙනවා.

මේක සම්පූර්ණයෙන්ම නීතිවිරෝධී ක්‍රියාවක්. ඒ නිසා එම පුද්ගලයා එම තනතුරෙන් ඉවත් කරන්න ඊයේ දිනයේදීම අපි උපදෙස් දුන්නා. ඒ වාගේම ග්ලයිෆොසෙට් තහනම නැවත පනවන්න අවශ්‍ය උපදෙස් දුන්නා. ඒ පුද්ගලයා විසින් මීට කලිනුත් රසායනික සමාගමකට අවශ්‍ය පරිදි පළිබෝධ නාශක ගෙන්වන්න කටයුතු කිරීම නිසා ඔහුට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්වෙනවා. රජය මේ තීන්දුව ගනිද්දී අපට අමාත්‍යාංශය වශයෙන් ලොකු අභියෝගයක් තිබෙනවා. රසායනික පොහොර සමාගම්, රසායනික පොහොර ආනයනකරුවන් අපේ අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ නිලධාරින් එක්ක පසුගිය කාලය පුරාම කටයුතු කරලා තිබෙනවා. මීට කලිනුත්, පළිබෝධනාශක ගෙන්වීමේ කටයුතුවලදී කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේ දී මේ පුද්ගලයා විසින් එක් සමාගමකට පක්ෂව කැබිනට් මණ්ඩලයට යෝජනා එවලා තිබුණා. දෙවැනි වරත් ඒ විධියටම එවලා තිබුණා. ඒ නිසා ඔහුට විරුද්ධව දැනටමත් විනය පරීක්ෂණයක් පැවැත්වෙනවා. ඒ නිසා පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා එම තනතුරෙන් ඉවත් කරන්න අවශ්‍ය උපදෙස් අපි ලබා දුන්නා. අවසාන වශයෙන්, ග්ලයිෆොසෙට් තහනම මේ රටේ ඉදිරියටත් ක්‍රියාත්මක වන බව මම සඳහන් කරන්න කැමතියි.

ස්තුතියි.

## විසර්ජන පනත් කෙටුම්පත, 2022
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2022
## APPROPRIATION BILL, 2022

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee. -*
[THE HON. SPEAKER *in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු සභාපතිතුමනි, ගරු මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මම, 1 වන උපලේඛනය, 2 වන උපලේඛනය සහ 3 වන උපලේඛනය සලකා බලන තෙක් 2 වන වගන්තියේ සිට 10 වැනි වගන්තිය දක්වා සලකා බැලීම කල් තැබිය යුතුයි යෝජනා කර සිටිනවා.

***2 සිට 10 තෙක් වගන්ති උපලේඛන සලකා බැලීමෙන් පසු ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*2ஆம் வாசகத்திலிருந்து 10ஆம் வாசகம் வரை அட்டவணைகள் பரிசீலிக்கப்படும்வரை ஒத்திவைக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 2 to 10 ordered to be postponed until after consideration of the Schedules.*

## පළමුවන උපලේඛනය
## පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්
## முதலாம் அட்டவணை
## பொதுச் சேவைகளுக்குக் கொடுக்கத்தக்க தொகைகள்
## FIRST SCHEDULE
## SUMS PAYABLE FOR GENERAL SERVICES

**1 වන ශීර්ෂය.- අතිගරු ජනාධිපති**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,309,980,000

**தலைப்பு 1.- அதிமேதகு சனாதிபதி**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபாய் 2,309,980,000

HEAD 1. - HIS EXCELLENCY THE PRESIDENT
Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 2,309,980,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ශීර්ෂ අංක 1 සහ 2, 4 සිට 11 දක්වා, 13,16 සිට 25 දක්වා වැය ශීර්ෂ අද දින සාකච්ඡාවට ගැනෙනවා. අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍ය කාර්යාලය, උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, අධිකරණ සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභා කාර්යාලය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය,

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය, පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය, මැතිවරණ කොමිෂන් සභාව, ජාතික විගණන කාර්යාලය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය, සීමා නිර්ණය කොමිෂන් සභාව යන ආයතන අද දින සාකච්ඡාවට භාජන කරනු ලබනවා. විවාදය පෙරවරු 10.00 සිට පස්වරු 5.00 දක්වා පැවැත්වෙනවා.

කපා හැරීමේ යෝජනාව, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

[පූ.භා. 10.44]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, "2022 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින, එනම් 2021.11.23 වන අඟහරුවාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලින් අදාළ අංක 1, 2, 4, 5, 6, 7, 8, 9, 10, 11, 13, 16, 17, 18, 19, 20, 21, 22 සහ 25 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහනේ සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ගරු සභාපතිතුමනි, අද පළමුවැනි දවසේ සාකච්ඡාවට භාජන කරන්නේ ස්වාධීන යැයි කියාගන්නා ආයතන. උදාහරණයක් වශයෙන් උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, අධිකරණ සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභා කාර්යාලය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව, ජාතික විගණන කාර්යාලය වැනි ආයතන ස්වාධීනයි කියා තමයි කියන්නේ. නමුත්, ඇත්තවශයෙන්ම දැන් මේ ආයතන ස්වාධීන නැහැ, ගරු සභාපතිතුමනි. මොකද, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මේ ආයතන සියල්ලම විධායකය යටතට පත් කර තිබෙනවා. 2015දී අපේ රජය බලයට පත් වුණායින් පසු අපි ජනතාවට දුන් පොරොන්දුව අනුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මේ ආයතන සියල්ලම ස්වාධීන කළා. විධායකයට බලයක් තිබුණේ නැහැ, මේ ආයතන පාලනය කරන්න. උදාහරණයක් වශයෙන්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබෙනකොට පත්වීමක්, උසස්වීමක් සම්බන්ධයෙන් මේ උත්තරීතර ආයතනවලට ජනාධිපතිතුමා නමක් යෝජනා කළාම ඒ නම ප්‍රතික්ෂේප කරන්න ස්වාධීන කොමිෂන් සභාවලට බලය තිබුණා. එහෙම ප්‍රතික්ෂේප කරලා ජනාධිපතිතුමාට කියනවා වෙන නමක් එවන්න කියලා. නමුත්, අද ඒ බලය නැහැ. අද මේ ආයතනවල පත්වීම්, උසස්වීම් ආදී සියලු දේ කරන්නේ විධායක ජනාධිපතිතුමා. ඒ නිසා අද මේ ආයතනවල ස්වාධීනත්වය නැතිවෙලා තිබෙනවා.

මේ ආයතනවල ඉන්නේ ඉතාම හොඳ, උගත්, බුද්ධිමත් අය. නමුත් නීතියෙන් ස්වාධීනත්වය නැත්නම් ඔවුන්ට වැඩ කරන්න අමාරුයි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය තමයි ස්වාධීන කොමිෂන් සභා සංකල්පය ඉස්සෙල්ලාම ගෙන ආවේ. එතුමියගේ ආණ්ඩුවට එදා බහුතරය නැති වනකොට ජනතා විමුක්ති පෙරමුණ තමයි කිව්වේ ස්වාධීන කොමිෂන් සභා ඇති කරන්න කියලා. ඒක හොඳ යෝජනාවක්. මම ස්තුතිවන්ත වෙනවා, ජනතා විමුක්ති පෙරමුණට, එදා ඒ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන. එතුමිය ඒක පිළිගෙන ස්වාධීන කොමිෂන් සභා ඇති කළා. නමුත් ඊට පස්සේ බලයට පත් වෙච්ච ආණ්ඩු ඒ ස්වාධීන කොමිෂන් සභා ඔක්කෝම අහෝසි කළා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවා. ඒ කොමිෂන් සභා අහෝසි කළා. පසුව අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එම කොමිෂන් සභා නැවත වරක් පත් කළා. ආයෙත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒවා අහෝසි කළා.

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමාත් මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ මම මේ කාරණය කියනවා. රටේ ස්වාධීන අධිකරණයක් නැති වුණාම ආයෝජකයෝ එන්නේ නැහැ. මෙතැන තිබෙන ප්‍රශ්නය ඒකයි. ආයෝජකයෝ එන්නේ නැහැ, ස්වාධීන අධිකරණයක් නැති වුණාම. උදාහරණයක් වශයෙන්, ආයෝජකයෙකු සහ ආණ්ඩුව අතර ප්‍රශ්නයක් ඇති වුණා කියමු. ආයෝජකයාට විශ්වාසයක් නැහැ, ආයෝජකයාට පක්ෂව තීන්දුවක් ලැබේ ද කියලා. අද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය පවා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හෙළා දැක තිබෙනවා. ඉතින් මේක අපේ රටට විශාල අපකීර්තියක්. අධිකරණය, නීතිපති දෙපාර්තමේන්තුව ආදියෙහි හොඳ නිලධාරින් ඉන්නේ. හැබැයි, ඒ අයට අවශ්‍ය නිදහස දෙන්න ඕනෑ, වැඩ කරන්න.

මම ඔබතුමාට කියන්න ඕනෑ, 2015 දී අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ අධිකරණයේ සමහර විනිශ්චයකාරවරුන් වැඩ කරපු හැටි. ඒ කාලයේ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා මොහාන් පීරිස් මහත්මයා. එතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හමු වෙලා කිව්වා, "මම ඔබතුමාට ඕනෑ නඩු තීන්දුවක් දෙන්නම්; මාව අයින් කරන්න එපා" කියලා. බලන්න! හිටපු ජනාධිපතිතුමා වරකාපොලදී ඒ පිළිබඳව කියලා තිබෙනවා. The article titled "President reveals why he removed Mohan Peiris" in the "Daily Mirror" online edition of 17th February, 2017 reported, I quote:

> "President Maithripala Sirisena revealed, yesterday, that the first action he took using his executive powers was to remove former chief justice Mohan Peiris, when he came and begged him......"

Begged him!

> "......not to remove him from his post..."

Mr. Peiris also said, "I will give any judgment you want". ඉතින් බලන්න! දැන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉන්නේ ඔබතුමන්ලාගේ පැත්තේ. මේකෙන් ගම්‍ය වෙන්නේ එතුමා අග්‍ර විනිශ්චයකාරතුමා කාලයේ දුන් සියලු තීන්දු ආණ්ඩුව කියන විධියට දීලා තිබෙන බව නේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන් ඉන්න විනිශ්චයකාරවරු මේක ගැන හිතන්න ඕනෑ. මේ වාගේ උත්තරීතර පුද්ගලයෙක් මෙහෙම කිව්වාම මට විශාල ලජ්ජාවක් ඇති වුණා. මමත් නීතිඥ මහත්මයෙක්; මගේ භාර්යාවත් නීතිඥ මහත්මියක්; අපේ දරුවෝ දෙදෙනාත් නීතිඥ මහත්වරු. අපටත්, අපේ පක්ෂයටත් අවශ්‍ය, ස්වාධීන අධිකරණයක්; ආණ්ඩුවට ආවඩන අධිකරණයක් නොවෙයි. ඒකයි අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවේ.

ගරු සභාපතිතුමනි. විනිශ්චයකාරවරු හැම දාම අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් සටන් කළා. මම ඒ අයට ස්තුතිවන්ත වෙනවා. මට මතකයි, අපි 1970 ගණන්වල නීති විද්‍යාලයේ හිටපු කාලය. ගරු අගමැතිතුමනි, ඔබතුමාටත් මතක ඇති. ඒ කාලයේ තිබුණු ආණ්ඩුව අධිකරණය පාලනය කරන්න හැදුවා. නමුත්, එවකට අග්‍ර විනිශ්චයකාරවරයා වූ වික්ටර් තෙන්නකෝන් මැතිතුමා ඒකට විරුද්ධව නැඟී සිටියා; එතුමා ආණ්ඩු බලයට යට වුණේ නැහැ. අපි අදත් එතුමා සිහිපත් කරනවා. ඒ වාගේම, 1977 දී කොමිෂන් සභාවක් පත් කරලා බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය නැති කරන්න යනකොට උසාවි ගියා. ඒ කොමිසමේ සිටි වෛද්‍යාලිංගම්, විමලරත්න, පර්සි කොලින් තෝමෙ ආදී අය කිව්වා, ඒ කොමිසම බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරන එක නීති විරෝධියි කියලා. එතුමන්ලා ශ්‍රේෂ්ඨ නඩුකාරවරු. පසුව පාර්ලිමේන්තුවට නීති ගෙනැල්ලා ඒක වෙනස් කළා. නමුත්, එදා බය නැතිව තීන්දුවක් දුන්නා. අන්න ඒක තමයි අපි අධිකරණයෙන් බලාපොරොත්තු වන්නේ. ඉතිහාසයට එක් වන්නේ ආණ්ඩුවලට ආවඩන අය නොවෙයි; ආණ්ඩු එක්ක හැප්පෙන අයයි. නීති විරෝධී වැඩවලට විරුද්ධව හැප්පෙන අය තමයි ඉතිහාසයට එකතු වෙන්නේ. නීති විරෝධී වැඩවලදී අහක බලාගෙන ඉන්න කට්ටිය යන්නේ ඉතිහාසයේ කුණු බක්කියට.

ගරු සභාපතිතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වූ කාලයේ අධිකරණයට ස්වාධීනත්වයක් තිබුණා. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එදා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. අපි එතුමාට කිව්වා, "ඔබතුමාට බලයක් නැහැ මේක කරන්න" කියලා. එතුමා මා එක්කත් අමනාප වුණා. ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබුණු සාකච්ඡාවකදී මම එතුමාට කිව්වා, "ඔබතුමා මේ වැඩේ කරන්න එපා. මෙය කරන්න බැහැ" කියලා. එතුමා කිව්වා, "මට බලය තිබෙනවා" කියලා.

මොකක්ද වුණේ? ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ විනිශ්චයකාරවරු එදා බය නැතිව තීන්දුව දුන්නා. නලින් පෙරේරා අග්‍ර විනිශ්චයකාරතුමා, ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා, ප්‍රසන්න ජයවර්ධන මැතිතුමා, සිසිර ද ආබෲ මැතිතුමා, විජිත් මලල්ගොඩ මැතිතුමා, බුවනෙක අළුවිහාරේ මැතිතුමා, මුර්දු ප්‍රනාන්දු මැතිතුමා භය නැතිව කිව්වා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ තීන්දුව වැරැදියි කියලා. අපට ඕනෑ ඒ වාගේ නිවැරැදි තීන්දු දෙන අය. හැබැයි, ඒ අය ඒ තීන්දුව දුන්නේ ඒ අයට එදා නිදහස තිබුණු නිසා.

ජනාධිපතිතුමාට ඕනෑ විධියට පත් කරන්නයි, අයින් කරන්නයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බැහැ. අපේ රටේ අධිකරණයේ හොඳ විනිශ්චයකාරවරු ඉන්නේ. අග්‍ර විනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු, නීතිපතිවරයා ආදි අය ඉතා හොඳ, උගත්, බුද්ධිමත් අය. නමුත් ඒ අයට නිදහස දෙන්න ඕනෑ. නීතියෙන් නිදහස දෙන්න ඕනෑ, නිදහසේ වැඩ කරන්න.

මම දැක්කා, අපේ සමගි ජන බලවේගයේ විරෝධතා ව්‍යාපාර තහනම් කරන්න යනකොට පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් බය නැතිව ආණ්ඩුවට විරුද්ධව තීන්දුව දුන් ආකාරය. අපි ඒවාට ගරු කරනවා. අපේ අභිප්‍රායයත් එයයි. අදත් මම කනගාටු වෙනවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කොහොම අනුමත කළාද කියලා හිතෙන කොට. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කළේ? බලතල බෙදා ගැනීම - separation of powers - අවශ්‍යයි. අපි නීති විද්‍යාලයේ ඉගෙන ගත් කාලයේ අපට separation of powers ගැන ඉගැන්නුවා. අපට ඉගැන්වූයේ ලලිත් ඇතුලත්මුදලි වාගේ අය; විශාරදයෝ. අධිකරණයයි, ව්‍යවස්ථාදායකයයි, විධායකයයි ගත් විට, එක ආයතනයක් අනෙක් ආයතනයට යටත් නැහැ, ගරු සභාපතිතුමනි. සමාන්තරව යන්නේ; they run parallel. නමුත්, අද ඒ තත්ත්වය තිබෙනවාද? අද ඒක නැහැ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයෙන් පැහැදිලිව කියා තිබෙනවා, අද ශ්‍රී ලංකාවේ බලතල බෙදා ගැනීමක් -separation of powers - නැහැ කියලා.

මම රජයට කියනවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා නම් ස්වාධීන කොමිෂන් සභාවල ස්වාධීනත්වය එමගින් නැවත ඇති කරන්න කියලා. අද අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කථා වෙනවා. ඒ හදනවා කියන ව්‍යවස්ථාව අපි දැකලාත් නැහැ. අප දන්නා කාලයක ඉඳලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හැදුවේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවකින්. මට මතකයි, සෝල්බරි සාමිවරයා ලංකාවට ආවාම සියලු දේශපාලන පක්ෂ, ඒ කාලයේ හිටපු සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ව්‍යවස්ථාව හදපු බව. එහෙම තමයි කරන්න ඕනෑ. එදා බණ්ඩාරනායක මැතිනිය නව රඟහලට සියලු දේශපාලන පක්ෂ කැඳවලා තීරණයක් ගත්තා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් ව්‍යවස්ථා කෙටුම්පතක් හදලා විශේෂ කාරක සභාවකට ඉදිරිපත් කළා. අද මේ ආණ්ඩුව ව්‍යවස්ථාවක් හදනවා. පාර්ලිමේන්තුව ඒ ගැන කිසිම දෙයක් දන්නේ නැහැ. ජනාධිපතිතුමාගේ නඩු කථා කරපු නීතිඥ මහත්වරුන් පිරිසක් ගෙන්වලා ව්‍යවස්ථාවක් හදන්න කියනවා. ඒක හරිද? මම අද අනාවැකියක් කියන්නම්. මේ විධියට ව්‍යවස්ථාව හැදුවොත්, ඒකත් reverse කරගන්න සිද්ධ වෙනවා. ඒක reverse කරගන්න සිද්ධ වෙනවා. මම දැක්කා, කෘෂිකර්ම ඇමතිතුමා ඊයේ රෑ ගහපු ගැසට් එකක් අද reverse කරනවා. ආණ්ඩුවක් නැහැ, මේ රටේ. අපේ විපක්ෂ නායකතුමා ඊයේ කිව්වා වාගේ ආණ්ඩුවේ ස්නායු පද්ධතිය විනාශ වෙලා. ආණ්ඩුවේ ස්නායු පද්ධතිය විනාශ වෙලා! එම නිසා අපි කියනවා, ව්‍යවස්ථාවක් හදනවා නම්, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශ්වාසයට ගන්න කියලා; අපිත් එක්ක සාකච්ඡා කරන්න කියලා. ඔබතුමා දන්නවාද, ඔය නීතිඥ කණ්ඩායම අපට ලියුමක් එවූ බව? ජනාධිපතිතුමාගේ නඩු කථා කරපු ඒ නීතිඥ මහත්වරු අපට ලියුමක් එව්වා, අපේ අදහස් ඉදිරිපත් කරන්න කියලා. ඒ අස්සේ පණිවුඩයකුත් තිබුණා. මොකක්ද, ඒ පණිවුඩය? ඒ තමයි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැර ඕනෑ දෙයක් ගැන කථා කරන්න කියන එක. පළාත් සභා ඡන්දය පවත්වනවා කියලා දැන් ප්‍රසිද්ධියේ කියනවා. නමුත් අපට පණිවුඩයක් එව්වා, "You can discuss anything other than the Thirteenth Amendment" කියලා. ඉතින් මෙහෙම ව්‍යවස්ථා හදන්න පුළුවන්ද? මම රජයට කියනවා, පාර්ලිමේන්තුව විශ්වාසයට අරගෙන විශේෂ කාරක සභාවක් හරහා ව්‍යවස්ථාව සකස් කරන්න කියලා.

පාස්කු ඉරුදින ප්‍රහාරය ගැනත් මම කියන්න ඕනෑ. කාදිනල් හිමිපාණන් වහන්සේ හැම දාම කියනවා, ජනාධිපති කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක වෙලා නැහැ කියලා. එතුමා එය හැම දාම - ඊයේත් කිව්වා, පෙරේදාත් කිව්වා.- කියනවා නේ. මම රජයෙන් ප්‍රශ්නයක් අහනවා. ගරු අගමැතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න එක හොඳයි.

ජනාධිපති කොමිෂන් සභාවේ තීන්දුව වෙනස් කරන්න ගරු වමල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් Cabinet Subcommittee එකක් පත් කළා. ඒ Cabinet Subcommittee එකේ වාර්තාව අපට දෙන්න කියලායි අපි ඉල්ලන්නේ, ගරු අගමැතිතුමනි. ගරු වමල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් Cabinet Subcommittee එකක් පත්කළා, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සොයන්න පත් කළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අධ්‍යයනය කරලා නිරීක්ෂණ දෙන්න කියලා. අපට එහි පිටපතක් දෙන්න පුළුවන්ද, ගරු අගමැතිතුමනි?

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற் படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing)
තිබෙනවා නම් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු අගමැතිතුමනි, තිබෙනවා. මම මේ ගැන පාර්ලිමේන්තුවෙන් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් අහන්න හැදුවා. අපේ පාර්ලිමේන්තුවේ staff එක පෙන්වා දීලා තිබුණා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකට ප්‍රශ්න අහන්න බැහැ කියලා. අලුත් ස්ථාවර නියෝගවල ඒක තිබෙනවා. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සොයන්න පත් කළ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව ගැන නිරීක්ෂණය කිරීමට වමල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරපු Cabinet Subcommittee වාර්තාව දෙන්න ඔබතුමා පොරොන්දු වුණා.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
තිබෙන්න එපා යැ, දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වාර්තාවක් තිබෙනවා. ජනාධිපතිතුමාගේ නීති උපදේශක TV එකේ interview එකකට හිටියා. එතැනදී රෝහණදීර මැතිතුමා පිළිගත්තා, එහෙම එකක් තිබෙනවා කියලා. අපට ආරංචියි, ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ වෙනස් කරලා අලුත් නිර්දේශ දීලා තිබෙනවා කියලා. අපට ඒක ආරංචියි. නඩු දමන විධිය බැලුවාම ඒක පෙනෙනවා. තෝර-තෝරා නඩු දානවා. එහෙම පුළුවන්ද? ජනාධිපති කොමිෂන් සභාවෙන් කියලා තිබෙනවා, මෙන්න මේ අයට නඩු දමන්න කියලා. එහෙම කරන්නේ නැතුව වමල් රාජපක්ෂ කොමිටියේ නිර්දේශ අනුව තෝරා ගත් අයට නඩු දමනවා.

ඊළඟට, නිලන්ත ජයවර්ධන කියන එක බලන්න. එතුමාටයි මේ තොරතුරු ඉස්සෙල්ලාම ආවේ. පාස්කු ප්‍රහාරය සිදු වෙන්න දවස් දහයකට කලින් තොරතුර ආවා. එහෙම තොරතුරු ලැබිලාත් ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණු එක හිතාගන්න පුළුවන්ද? එතුමා කියනවා, ජනාධිපතිතුමාට කිව්වේ නැහැ කියලා. අපි ඒක පිළිගනිමු කෝ. ජනාධිපතිතුමාට නොදැන්වීම වරදක් නොවෙයිද, ගරු අගමැතිතුමනි? නිලන්ත ජයවර්ධන ඒ පිළිබඳව ජනාධිපතිතුමාට නොදන්වා සිටීම දණ්ඩ නීති සංග්‍රහය යටතට ගැනෙන වරදක්. ඉස්සෙල්ලාම නඩු දාන්න ඕනෑ ඔහුට. එවකට ජනාධිපතිතුමා තමයි ආරක්ෂ ඇමති; නීතිය හා සාමය ඇමති. ජනාධිපතිතුමාට නොදන්වා සිටීම නිසා ඔහු තමයි පළමුවැනි විත්තිකාරයා වෙන්න ඕනෑ. නමුත් අද ඔහු නිදහස් කරලා. ඒ නඩුව ඇද වැටෙනවා. ඉස්සෙල්ලාම තොරතුරු ආපු කෙනාට නඩු දාන්න ඕනෑ. ඔහු ජනාධිපතිතුමාට කිව්වේ නැහැ කියන්නේ, ඒකත් බරපතළ වරදක්. ඔහු කොහොමද සාක්ෂිකාරයෙක් කරන්නේ? මේ නඩුව විසි කරන්න හදපු දෙයක්. ආණ්ඩුවට ඕනෑ මේ නඩුව විසි වෙනවා දකින්න.

අද මේ නඩුවේ සාක්ෂි විමසීම පටන් ගන්නවා කියලා ආරංචියි. අධිකරණයට බලය තිබෙනවා, විත්තිකරුවන් නම් කරන්න. අධිකරණයට ඕනෑ නම් පුළුවන් නිලන්ත ජයවර්ධන විත්තිකාරයෙක් කරන්න. අද ඔහු සාක්ෂිකාරයෙක් කරලා. ගරු සභාපතිතුමනි, ඔහු කිව්වා නේ ජනාධිපතිතුමාට කිව්වේ නැහැ කියලා. ඔහුගෙන් දුරකථනය ඉල්ලුවා. ඔබතුමා දන්නවාද, ඒ මාසයේම ඔහුගේ දුරකථන පණිවුඩ erase කරලා තිබුණා කියලා. ඒ ඔක්කෝම පණිවුඩ erase කරලා. ඒකම ඇති නේ. එහෙම erase කරන්නේ හංගන්න දෙයක් තිබෙන නිසා නේ. අපි අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න ඕනෑ. එකයි අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. ඉතිහාසයට එක් වන්නේ හරි දේ කරන අය. ආණ්ඩුවට ආවඩන අය ඉතිහාසයේ කුණු බක්කියේ තමයි සටහන් වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සභාපතිතුමනි, මම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක නේ. මම ගන්නවා, ඕනෑ වෙලාවක්.

හැම තිස්සේම අපි වැඩියෙන් බෙදා ගන්නවා නේ.

ගරු සභාපතිතුමනි, දැන් කාර්ය සාධක බලකායන් පත් කරනවා. ගරු අගමැතිතුමනි, ඇත්ත වශයෙන්ම එය ඇමතිවරුන්ට නිග්‍රහයක් නේ. සෑම අමාත්‍යාංශයකටම කාර්ය සාධක බලකායක් පත් කර තිබෙනවා. අධ්‍යාපනයට එහෙම කාරය සාධක බලකායක් පත් කර තිබෙනවා; සෞඛ්‍යයට පත් කර තිබෙනවා; කෘෂිකර්මයට පත් කර තිබෙනවා; අධිකරණයට පත් කර තිබෙනවා. ඒ කාර්ය සාධක බලකාය වැඩ කරන්නෙත් ජනාධිපතිතුමා එක්ක. එතකොට කැබිනට් මණ්ඩලයට මොකක්ද තිබෙන වැඩේ? කැබිනට් ඇමතිවරුන් දෙකේ කොළයට දාලා නේ. කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු බලය පාවිච්චි කරලා වැඩ කරනවාට අපි කැමැතියි; අපිත් ආසයි. මොකද, ඔවුන් දන්නවා මොකක්ද වෙන්නේ කියලා. නමුත් අද කැබිනට් ඇමතිවරු දන්නේ නැහැ, මොකක්ද වෙන්නේ කියලා. Task Force එක වැඩ කරන්නේ ජනාධිපතිතුමාත් එක්ක. මොකක්ද මේ? කැබිනට් මණ්ඩලය විශ්වාස කරන්නේ නැහැ, පාර්ලිමේන්තුව විශ්වාස කරන්නේ නැහැ. මේ විධියට රටක් පාලනය කරන්න පුළුවන්ද, ගරු සභාපතිතුමනි?

ඊළඟ එක තමයි, "එක රටක්- එක නීතියක්" සඳහා වූ කාර්ය සාධක බලකාය. මේ රටේ නීතිය අවුරුදු දහස් ගණනක් තිබිලා තියෙනවා. උඩරට සිංහල නීතිය දුටුගැමුණු රජතුමාගේ කාලයේ ඉඳන් තිබෙන්නේ. රෝම-ලන්දේසි නීතිය, පෘතුගීසි ඕලන්දක්කාරයන්ගේ කාලයේ ඉඳන් ආපු නීතිය. තේසවලමෙයි නීතිය අවුරුදු 1,500ක් පරණයි. මුස්ලිම් නීතිය අවුරුදු හත් අට සියයක් පරණයි. මේවා අහෝසි කරන්න පුළුවන්ද? අලුත් නීති පොදුවේ හදන්න පුළුවන්. නමුත්, පෞරාණික නීති එහෙම අහෝසි කරන්න බැහැ. එහෙම හැදුවත් ඒකට අධිකරණයෙන් අනුමැතියක් ලැබෙන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා. "එක රටක්-එක නීතියක්" කියලා කාර්ය සාධක බලකායක් පත් කළේ රට ගිනි තබන්න; ජාතිවාදය අවුස්සලා රට ගිනි තියන්න. මොකද, ආණ්ඩුවට ජාතිවාදය හැර අද වෙන කිසිම දෙයක් නැහැ, අද ඉස්සරහාට යන්න. ජාතිවාදය විතරයි මේ අයට තිබෙන එකම තුරුම්පුව.

අවසාන වශයෙන් Public Service Commission එක ගැන කථා කරන්න මම කැමැතියි. අපේ රාජ්‍ය පරිපාලන ඇමතිතුමා සභාවේ ඉන්නවාද? අද Office of the Public Service Commissionහි වැය ශීර්ෂයත් සාකච්ඡා කරනවා නේද? මොකද, මට SMS පණිවුඩ ගණනාවක් ආවා. ගරු සභාපතිතුමනි, අද උපාධිධාරීන් කම්කරුවන් හැටියට වැඩ කරනවා; so many graduates are working as labourers. - *[බාධා කිරීමක්]* හරි, හරි. But, there is a balance. ඔවුන් අපෙන් ඉල්ලීමක් කර තිබෙනවා, ඒ අයට උසස්වීම් ලබා දෙන්න කියලා. මේ ගැන ගරු අගමැතිතුමාගේ අවධානය මා යොමු කරවනවා. උපාධිධාරියෙක් වුණාම කම්කරුවෙක් විධියට වැඩ කරන්න අකැමැතියි නේ. ඔබතුමන්ලා ඒක පිළිගන්න ඕනෑ.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ඒ අය කවුරුවත් කම්රුවන් විධියට වැඩ කරන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නමුත්, එහෙම පිරිසක් ඉන්නවා. ඒ අය අපිට නිරන්තරයෙන්ම කථා කරනවා.

රටේ වර්තමාන තත්ත්වය ගැන රජය මොකක්ද කියන්නේ? මම කථාව අවසන් කරන්න කලින් කරුණු දෙකක් කියන්න ඕනෑ. අපි, මුදල් ඇමතිතුමා සභාවට එනතුරු බලාගෙන හිටියා. එතුමා පළමු දවසේ ඇවිල්ලා විනාඩි 4ක්, 5ක් ඉඳලා ගියා. ඊයේත් ආවා. හැබැයි, අපි අහපු ප්‍රධාන ප්‍රශ්න දෙකට උත්තර දුන්නේ නැහැ. අපි ඇහුවේ සරල ප්‍රශ්න දෙකක්. එකක් තමයි, ඩොලර් හිඟයට විසඳුම මොකක්ද කියන එක; what is the solution for this dollar

crisis? ඒකට උත්තරයක් නැහැ. ඊළඟ එක, ණය ගෙවන්නේ කොහොමද කියන එක. අපි අවුරුද්දකට ඇමෙරිකන් ඩොලර් මිලියන 6,500ක් ගෙවන්න ඕනෑ. ඒ ප්‍රශ්න දෙකට උත්තර නැහැ. කවුරුවත් ඒවාට උත්තර දුන්නේ නැහැ. මුළු රටම බලාගෙන ඉන්නවා, මොකක්ද කියන්නේ කියලා.

යහ පාලන ආණ්ඩුවේ මොන අඩු පාඩු තිබුණත් අන්තිම දවස වනතෙක් මිනිස්සු හොඳට කාලා බීලා හිටියා, ගරු සභාපතිතුමනි. එය, කාටවත් නැහැ කියන්න බැහැ. අපි අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පාලනය කළා. එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. පාස්කු ප්‍රහාරය නිසා, රටට ආරක්ෂාවක් නැහැ කියපු නිසා, මිනිස්සු කම්පනයට පත් වුණා. නමුත්, මිනිසුන්ට ප්‍රශ්න තිබුණේ නැහැ. ඕනෑ තරම් ඩොලර් තිබුණා. දැන් පැය 24න් කොහොමද ඩොලර් නැති වෙන්නේ? [බාධා කිරීමක්]

මම ඔබතුමාට කියන්න ඕනෑ, අපේ රජය බලයට පත් වූ පසු අපි කෝප් එකේ සභාපති ධුරය ජේවීපී එකට දුන් බව. අපි අපේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඒ කමිටුවට පත් කර ගත්තේ නැහැ. අපි ඒකේ සභාපති ධුරය ජේවීපී එකට දුන්නේ වැරදි හොයන්න. *[බාධා කිරීම්]* ජේවීපී එකට දුන්නේ වැරදි හොයන්න. අපි අපේ ආණ්ඩුවේ වැරදි හංගන්න ගියේ නැහැ. අපට ඕනෑ නම් අපේ මන්ත්‍රීවරයෙකුට ඒ කමිටුවේ සභාපති ධුරය දීලා ඒවා හංගන්න තිබුණා. නමුත්, අපි එහෙම කළේ නැහැ. අපි කෝප් එකේ සභාපති ධුරය විපක්ෂයට දුන්නා. කලින් ආණ්ඩුවලදීත් අපි ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහත්මයාට එම ධුරය ලබා දී තිබෙනවා.

අද මේ රට මුහුණපා තිබෙන ප්‍රශ්නවලට විසඳුම් නැහැ නේ? අපි මුදල් ඇමතිතුමාගෙන් ප්‍රශ්න ඇහුවාම එතුමා ඊයේ මොකක්ද කිව්වේ? ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි උතුරට රේල් පාර හැදුවේ කියා කිව්වා. අගමැතිතුමනි, ඒක ඔබතුමා 2015 වසරට කලින් කරපු එකක්. ඒවා තමයි එතුමා කිව්වේ. බුදුහාමුදුරුවොත් දේශනා කර තිබෙන විධියට අපි වර්තමානයේ ජීවත් වෙන්න ඕනෑ. කාලීන ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනෑ. අතීතය වැඩක් නැහැ, අනාගතය වැඩක් නැහැ. වර්තමාන ප්‍රශ්නවලට ආණ්ඩුව උත්තර දුන්නේ නැහැ.

ස්තුතියි, ගරු සභාපතිතුමනි.

[පූ.භා. 11.09]

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing)

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ හරවත්, සාරවත් කථාව අහලා එක පැත්තකින් අපට හිනා යනවා. මොකද, එතුමාට ඉතිහාසය අමතක වෙලා තිබෙන නිසා. මොකද, එතුමාත් හිටියේ අපේ පැත්තේ.

ඒ කෙසේ වෙතත්, කොවිඩ් වසංගතය හමුවේ රජයක් ලෙස අපි මූලිකත්වය ගත්තේ ජනතාව ආරක්ෂා කරන්නයි. ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ගන්න ඕනෑ හැම තීරණයක්ම අපි නිසි වෙලාවට ගත්තා කියලා අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මම මේ දේවල් කියන්නේ එම කටයුතු කළමනාකරණය කරන්න අග්‍රාමාත්‍ය කාර්යාලය කළ කාර්ය භාරය සිහිපත් කරන්නයි. කොවිඩ් වසංගතය ආරම්භයේදී අපේ රජය අත්‍යවශ්‍ය සේවා කටයුතු සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කළා. එම ජනාධිපති කාර්ය සාධක බලකාය අග්‍රාමාත්‍ය කාර්යාලයේ සිට අපගේ අධීක්ෂණය යටතේ කටයුතු කළා. ජනතාවගේ අත්‍යවශ්‍ය සේවා ඉටු කිරීමටත්, ජනතාවගේ ගැටලු විසඳීමටත් දවසේ පැය 24 පුරාම අග්‍රාමාත්‍ය කාර්යාලය කටයුතු කළ බව අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අපි පක්ෂ නායකයන් සමඟ අදහස් හුවමාරු කර ගත්තා. ජනතාවගේ අත්‍යවශ්‍ය සේවා සහ සෞඛ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කිරීමට අපි හැම අවස්ථාවකම මැදිහත් වුණා. වෛද්‍යවරු හා ආරක්ෂක හමුදාව ඒ වෙනුවෙන් තමන්ගේ යුතුකම් ඉටු කළා. ගරු සභාපතිතුමනි, කොවිඩ් වසංගතය නිසා ඇති වූ ආර්ථික අවපාතය තදින්ම රටට බලපා තිබෙන බව අපි දන්නවා. ව්‍යාපාර බොහොමයක් කඩා වැටිලා තිබෙනවා. මේ අවස්ථාවේ රජය සැලසුම් කරන්නේ කොවිඩ් වසංගතයෙන් වැටුණු ආර්ථිකය ගොඩ නඟන්නයි. ඒ අනුව තමයි මුදල් ඇමතිතුමා කෙටි කාලීන සහ දිගු කාලීන සැලසුම් ඇතුළත් අය වැයක් මෙවර ඉදිරිපත් කළේ. ජනතාවගේ පැත්තෙන් සිදු වන ආර්ථික සහ සමාජයීය සංවර්ධනයක් රටට අවශ්‍යයි. මේ අසීරු අවස්ථාවේදී ඒ අයට නැඟිටින්න පුළුවන් ආර්ථිකයක් ගොඩ නඟන එක තමයි අපේ බලාපොරොත්තුව.

ගරු සභාපතිතුමනි, 2019දී අපි භාර ගත්තේ කඩා වැටුණු ආර්ථිකයක්. ඒක මතක් කරන්න ඕනෑ. ඒ ආර්ථිකය ඔසවා තැබීමේ අපේක්ෂාව මෙවර අය වැය යෝජනාවල තිබෙනවා. සුපුරුදු පරිදි තමතමන්ගේ දේශපාලනය වෙනුවෙන් මෙවරත් වාද විවාද කරනවා අපි දැක්කා. විරුද්ධ පක්ෂය ඉදිරිපත් කරන යම් සාධනීය අදහස්වලට අපි සවන් දෙනවා. ඔබතුමන්ලා සාධනීය අදහස් ඉදිරිපත් කළොත්, අපි ඒවාට සවන් දෙන්න සූදානම්. අපි මේ වෙලාවේ රටේ අනාගතය වෙනුවෙන් සාමූහිකව තීන්දු තීරණ ගත යුතුයි. ජනතාව වෙනුවෙන් ඒ යුතුකම ඉටු කරන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ට හැකියාව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, නව ව්‍යාපාර ලියාපදිංචි කරන ව්‍යවසායකයන්ගෙන් 2022 වසර සඳහා කිසිදු ලියාපදිංචි ගාස්තුවක් අපි අය කරන්නේ නැහැ. අපේ රටේ තරුණ තරුණියන්ට මම ආරාධනා කරනවා, නව ව්‍යාපාරික අදහස්වලින් රටේ ආර්ථික සංවර්ධනය ගොඩ නඟන්න එකතු වෙන්න කියලා. ඒ වාගේම විදේශ විනිමය රටට ගෙන ඒමටත් දායක වෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අපි ජනතාවට පොරොන්දුවක් දුන්නොත්, ඒ පොරොන්දුව ඉටු කළ යුතුයි. වසර 25කට ආසන්න කාලයක් තිස්සේ නොවිසඳී තිබුණු ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව විසඳන්න අපි කටයුතු කරමින් සිටිනවා. මෙවර අය වැයෙන් අධ්‍යාපනය වෙනුවෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් අපි වෙන් කර තිබෙනවා. අපි මේ හැම දෙයම කරන්නේ රටේ අනාගතය වෙනුවෙන්. අභියෝග හමුවේ රට ගොඩ නැඟීමට අප දරන වෙහෙසට සියලුදෙනාගේ සහාය ලබා දෙනු ඇතැයි මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, විපක්ෂය ඉදිරිපත් කළ යෝජනා, විවේචන අපි ඉතා සාවධානව අහගෙන සිටියා. සමහර විවේචන අසාධාරණයි. සමහර විවේචනවල සාධාරණත්වයක් තිබෙනවා නම්, අපි ඒ විවේචන පිළිගෙන, ඒවා නිවැරැදි කර ගන්න ඕනෑම වෙලාවක සූදානම් බව මේ අවස්ථාවේදී මා මතක් කරනවා.

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැනත් කථා කළා. අපි දැන් ඒ සඳහා කෙටුම්පතක් සකස් කරගෙන යනවා. එය පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වෙත ඉදිරිපත් කර සාකච්ඡාවට භාජන කරන බවත් මේ අවස්ථාවේදී මා මතක් කරන්න ඕනෑ. ඒ පිළිබඳව රහසිගතව කිසි දෙයක් කරන්නේ නැහැයි කියන එකත් තමුන්නාන්සේලාට මා මතක් කරනවා. මම මීට වඩා කථා කරන්නේ නැහැ. අනික් මන්ත්‍රීවරුන්ටත් කාලය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු අගමැතිතුමනි, ඔබතුමා විශේෂ කාරක සභාවක් පත් කරනවාද?

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
තවම නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Sivagnanam Shritharan.

[மு.ப. 11.15]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தவிசாளர் அவர்களே, 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் தொடர்பான குழுநிலை விவாதத்திலே எனக்கும் பேசச் சந்தர்ப்பமளித்தமைக்காக நன்றி. ஜனாதிபதி மற்றும் பிரதம அமைச்சரின்கீழ் வரும் விடயங்கள் மற்றும் ஆணைக்குழுக்கள் தொடர்பிலே இன்று முக்கியமாக இங்கே பேசப்படுகின்றது. கௌரவ பிரதமர் அவர்களும் அருகிலே மூத்த அமைச்சர் கௌரவ தினேஷ் குணவர்தன அவர்களும் ஏனைய மூத்த அமைச்சர்களும் சபையிலே இருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில் நான் மிக முக்கியமான ஒரு விடயத்தை அவர்களுடைய கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

இந்த நாட்டிலே தமிழர்கள் வாழ்ந்த பிரதேசங்களிலும், அவர்கள் வாழுகின்ற பிரதேசங்களிலும் யுத்த காலத்திலே அவர்களுக்காகத் தங்களுடைய உயிர்களைத் தியாகம் செய்த தங்கள் பிள்ளைகளை, மாவீரர்களை அவர்கள் நினைவு கூர்ந்துவிடுவார்கள் என்று, அந்த ஞாபகார்த்த விழாவைத் தடுப்பதற்காக இப்பொழுது இலங்கையினுடைய பொலிசாரும் - இந்தப் பொலிஸ் ஆணைக்குழுவிற்குக் கீழே வருகின்ற பொலிசாரும் - இராணுவத்தினரும் ஒவ்வொரு துயிலும் இல்லங்களுக்கு முன்பாகவும் குவிக்கப்பட்டிருக்கின்றார்கள். ஒவ்வொரு முறையும் இந்தக் காலம் வருகின்றபொழுது இந்த நாட்டில் ஏன் இவ்வாறு இராணுவத்தைக் குவித்து, பொலிசாரைக் குவித்து, துயிலுமில்லங்களை நீங்கள் மறைக்கின்றீர்கள்? இவ்வாறு செய்வதன்மூலம் கலாசார ரீதியாக, பண்பாட்டு ரீதியாகத் தமிழர்கள் தம்முடைய மனங்களிலே நினைத்துக்கொண்டிருக்கின்ற தங்கள் வீரப் புதல்வர்களை மறக்கக்கூடிய ஒரு சூழல் வருமா அல்லது சிங்கள மக்கள் இதனை விரும்புகின்றார்களா?

கௌரவ பிரதமர் அவர்களே, 2016, 2017, 2018, 2019ஆம் ஆண்டுகளில்கூட இந்த மாவீரர் தினம் அனுஷ்டிக்கப்பட்டது. இந்த நாட்டினுடைய கௌரவ ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்கள் 2019ஆம் ஆண்டிலே ஜனாதிபதியாகப் பதவியேற்ற பின்னரும் 2019ஆம் ஆண்டு நவம்பர் மாதத்தில் மாவீரர் தினத்தை மக்கள் மிக அமைதியான முறையிலே தங்களுடைய பிள்ளைகளுக்காக விளக்கேற்றி அனுஷ்டித்தார்கள். அப்பொழுது எந்தவிதமான இடைஞ்சலும் இந்த நாட்டிலே இடம்பெற்றிருக்கவில்லை. தற்பொழுது இங்கே பல அமைச்சர்கள் விழாக்களை நடாத்துகின்றார்கள்; விளையாட்டுப் போட்டிகள் நடைபெறுகின்றன; இவ்வாறான நிகழ்வுகளில் ஈடுபடுபவர்களுக்கு எந்தவிதத்திலும் 'கொவிட்' தொற்று தடையாக இல்லை. ஆனால், துயிலும் இல்லங்களுக்குள் மட்டும்தான் 'கொவிட்' வரும் என அந்த இடங்களில் இராணுவத்தை நிறைத்து, பொலிஸாரை நிறைத்து, ஓர் அச்சுறுத்தலை உண்டுபண்ணுகின்ற ஒரு சூழ்நிலையில், இன்று யுத்தப் பிரதேசங்கள் போன்று வடக்கு, கிழக்குப் பிரதேசங்கள் காணப்படுகின்றன. தயவுசெய்து இந்த நிலைமையை மாற்றுங்கள்! முதலில் ஒரு புரிதல் வேண்டும், புரிந்துணர்வு வேண்டும்.

இந்த நாட்டிலே ஓர் இணக்கப்பாடு வேண்டும், இணக்க அரசியல் வேண்டுமென்றால் நீங்கள் மக்களுடைய மனங்களை வெல்லத் தயாராகவேண்டும். தமிழர்களாகிய நாங்கள் பாதிக்கப்பட்டிருக்கின்றோம். எங்களுடைய மக்கள் தங்களுடைய பிள்ளைகளை இழந்திருக்கின்றார்கள். ஆகவே, அவர்கள் தங்களுடைய பிள்ளைகளின் நினைவுகளில் இருந்து மீண்டுவருவதற்கான ஒரு வடிகாலாகவிருக்கின்ற இந்த வணக்க நிகழ்வுகளைத் தடுப்பதன்மூலம் நீங்கள் எதனை அடையப்போகின்றீர்கள்? அன்புக்குரிய சிங்கள மக்கள்கூட இதனை எதிர்க்கவில்லையே! கடந்த 2016, 2017, 2018, 2019ஆம் ஆண்டுகளிலே, இவ்வாறு தமிழ் மக்கள் துயிலும் இல்லங்களுக்குப் போகக்கூடாது, மாவீரர் தினத்தை நடாத்தக்கூடாது என்று எந்த ஒரு சிங்களப் பிரதேசத்திலும் சிங்கள மக்கள் யாரும் ஊர்வலம்கூட நடத்தவில்லையே! ஆகவே, இந்த நாட்டிலே தற்போது அரசாங்கத்திலே இருக்கின்ற ஜனாதிபதியிலிருந்து அமைச்சர்கள் வரை எல்லோரும் தங்களுடைய அரசியல் தேவைக்காகத்தான் இதனைச் செய்கின்றார்கள் என்ற விடயம் இப்பொழுது துலாம்பரமாகத் தெரிகின்றது. ஆகவே, இந்த நிலையிலிருந்து மாறுங்கள்!

அங்கு எத்தனையோ துயிலும் இல்லங்கள் இருக்கின்றன. கௌரவ பிரதம அமைச்சர் அவர்களே, உங்களுக்கு வசதி கிடைத்தால் வந்து பாருங்கள்! கொடிகாமம் துயிலும் இல்லத்திலே ஆயிரக்கணக்கான மாவீரர்கள் புதைக்கப்பட்டிருக்கிறார்கள். அதேபோன்று, முள்ளியவளை துயிலும் இல்லத்தில் புதைக்கப்பட்டிருக்கிறார்கள்; எல்லங்குளம் துயிலும் இல்லத்தில் புதைக்கப்பட்டிருக்கிறார்கள். அங்கெல்லாம் இராணுவத்தினர் முகாம் அமைத்து, தங்களுடைய சப்பாத்துக் கால்களோடு அதற்கு மேலால் நடந்துசெல்கிறார்கள், football விளையாடுகிறார்கள். உங்களுடைய குழந்தையொன்று அல்லது உங்களுடைய சிங்களப் படை வீரரொருவர் புதைக்கப்பட்ட இடத்திலே இராணுவத்தைச் சேர்ந்த தமிழர் ஒருவர் இவ்வாறு நடந்தால் உங்களுடைய இதயம் - மனம் - என்ன பாடுபடும்? என்பதை நீங்கள் இந்த நாட்டினுடைய தலைவராக, ஒரு தந்தையாக, இந்த நாட்டைச் சீரமைக்க நினைக்கின்ற ஒரு மனிதனாகச் சிந்தித்துப் பாருங்கள்! இங்கு வாழுகின்ற ஏனைய பிரஜைகளும் உங்களைப் போன்றவர்கள்தான் என்பதை நீங்கள் ஏற்றுக்கொண்டால், இந்த நாட்டில் நல்லிணக்கத்தை

மிக இலகுவாக ஏற்படுத்தலாம்; அமைதியைக்கூட மிகச் சுமுகமாக ஏற்படுத்தலாம்; இந்த நாட்டின் பொருளாதாரத்தைக் கூடக் கட்டியெழுப்ப முடியும். ஆகவேதான், நான் இந்த இடத்திலே இந்த விடயத்தைப் பதிவுசெய்கிறேன்.

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, இன்று காலையில் கூட இரண்டு பொலிஸார் - SI விக்கிரமசூரிய என்ற ஒருவரும் இன்னுமொருவரும் - தங்களைப் போக்குவரத்துப் பொலிஸார் என அறிமுகஞ்செய்து, என்னுடைய காரியாலயத்துக்குள் நுழைந்து, என்னுடைய பெயரையும் எனது மெய்ப் பாதுகாவலரின் பெயரையும் கேட்டிருக்கிறார்கள். இந்தக் கால கட்டத்தில் இவ்வாறான செயற்பாடுகள் ஏன் நடக்கின்றன?

கடந்த 3 நாட்களுக்கு முன்பு நீதிமன்றக் கட்டளையென்று கூறிப் பொலிஸாரினால் இது தொடர்பில் எனக்கு அறிவித்தலொன்று கொண்டுவந்து தரப்பட்டது. ஆனால், நீதிமன்றம் கட்டளை பிறப்பிக்கவில்லை. ஏனென்றால், நேற்று பருத்தித்துறை, சாவகச்சேரி, மல்லாகம் நீதிமன்றங்கள் அதனை நிராகரித்திருக்கின்றன. நீதிமன்றம் கட்டளை பிறப்பிக்காமலேயே, நீதிமன்றம் அறிவிக்காமலேயே பொலிஸார் 'நீதிமன்றக் கட்டளை' என்கிறார்கள். அதற்கு ஒரு வாக்கு மூலமும் பெற்று, கையெழுத்தும் வாங்கினார்கள். இது மிக மோசமான செயலாகும். இந்த நாட்டிலே சில நடவடிக்கைகள் பாதகமான சூழலை நோக்கிப் போய்க்கொண்டிருக்கிறன. தயவுசெய்து, அதைப் பற்றிச் சிந்தியுங்கள்! நீங்கள் இந்த நாட்டிலே அமைதியையும் சமாதானத்தையும் மக்களின் நிம்மதியான வாழ்வையும் கட்டியெழுப்ப வேண்டுமானால், இந்த நாட்டை அமைதிப் பூங்காவாக மாற்றவேண்டுமானால், இழந்தவர்களை நினைவுகூர்வதில், அதிலும் குறிப்பாகத் தங்களுடைய பிள்ளைகளை, மாவீரர்களை நினைவுகூர்வதற்கு எந்தவோர் இடையூறுமில்லை என்பதை அறிவியுங்கள்! அது இந்த நாட்டுக்கு மிகப் பொருத்தமானதாக அமையும்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The Hon. Weerasumana Weerasinghe will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் எத்தனையோ ஆணைக்குழுக்கள் இருக்கின்றன. இங்கே கௌரவ நிதி அமைச்சர் அவர்களும் இருக்கின்றார். நீங்கள் இந்த ஆணைக்குழுக்களுக்காகச் செலவிடுகின்ற நிதி எவ்வளவு? இதனால் என்ன இலாபம் இருக்கிறது? இந்த ஆணைக்குழுக்களால் இந்த நாடு என்ன இலாபத்தை அடைந்திருக்கின்றது? என்ன முன்னேற்றம் அடைந்திருக்கின்றது? இந்த ஆணைக்குழுக்கள் இந்த நாட்டைக் கட்டியெழுப்பியிருக்கிறதா? தயவுசெய்து சிந்தித்துப் பாருங்கள்! இது நீங்கள் சிந்திக்க வேண்டிய நேரம்.

நேற்றுக்கூட, நிதி அமைச்சர் கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்கள் குறிப்பிட்டார், கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக இருந்தபொழுது, வடக்கு மாகாணத்துக்குப் புகையிரத சேவையைச் செய்தோம்; மின்சாரத்தைப் பெற்றுத் தந்தோம்; 24 மணித்தியாலங்களிலே அதைச் செய்தோம் - இதைச் செய்தோம் என்று. நான் அதனை ஏற்றுக் கொள்கிறேன். ஆனால், 30 ஆண்டுகளுக்கு மேலாக நாங்கள் மின்சாரம் இல்லாமல் இருந்ததை நீங்கள் ஏற்றுக் கொள்கிறீர்கள்தானே! நாங்கள் பொருளாதாரத் தடைக்குள் வாழ்ந்தோம். யார் இந்தப் பொருளாதாரத் தடையை விதித்தார்கள்? பனங்களிகொண்டு எங்களுடைய துணிகளைத் துவைத்தோம். அங்கு சீமெந்து வரவில்லை, உணவுப் பொருட்கள் வரவில்லை, மின்சாரம் இருக்கவில்லை, புகையிரதம் வரவில்லை, எரிபொருட்கள் வரவில்லை, பசளைகள் வரவில்லை. இவ்வளவு நெருக்கடிக்குள்ளும் 5 இலட்சம் மக்கள் அந்த மண்ணிலே வாழ்ந்தார்கள்தானே! எப்படி வாழ்ந்தார்கள்? அவர்கள் மின்சாரம் இல்லாமல், புகையிரத வசதிகள் இல்லாமல் இருந்தார்கள். ஆனால், நிம்மதியாக இருந்தார்கள். இன்று, புகையிரதச் சேவை இருக்கின்றது; மின்சார வசதி இருக்கின்றது; இன்னும், நீங்கள் சொல்கின்ற அத்தனை வசதிகளும் ஏற்படுத்தப் பட்டிருக்கின்றன. ஆனால், மக்களுக்கு நிம்மதி இல்லை. அந்த மக்களால் நிம்மதியாக வாழ முடியவில்லை. ஏனென்றால், அவர்களைச் சுற்றி இராணுவத்தினரும் பொலிஸாரும் குவிக்கப்பட்டிருக்கிறார்கள். இலங்கையிலேயே 2 இலட்சத்துக்கு மேற்பட்ட இராணுவம் மற்றும் ஏனைய படைகள் குவிக்கப்பட்ட மாகாணங்களாக வடக்கு, கிழக்கு மாகாணங்கள் காணப்படுகின்றன. அதனால்தான் நாங்கள் இதனைக் குறிப்பிடுகின்றோம்.

நீங்கள் இந்த நாட்டில் அமைதி வரவேண்டுமென்று விரும்பவில்லையா? சமாதானம் வேண்டுமென்று விரும்ப வில்லையா? இந்த நாட்டிலே உள்ள மக்கள் ஒற்றுமையாக வாழவேண்டுமென்று விரும்பவில்லையா? நீங்கள் அவற்றை விரும்புகின்றவர்கள் என்றால், ஏன் விதண்டாவாதமாக இந்த விடயங்களை முன்வைக்கின்றீர்கள்? நான் உங்களிடம் திரும்பத் திரும்பச் சொல்வது, சிங்கள மக்கள் மிக மிக அருமையானவர்கள். அவர்கள் யாரும் இதனை எதிர்க்க வில்லை. சிங்கள மக்களுடைய அரசியல் வேறு; சிங்களத் தலைவர்களின் அரசியல் வேறு. அது இங்கு தெளிவாகத் தெரிகிறது. இனவாதத்தைத் தூண்டி, இனவாத அரசியலுக் கூடாகத்தான் இந்த நாட்டிலே நீங்கள் கோலோச்ச வேண்டுமென்று நினைத்தால் அது எந்தக் காலத்திலுமே நடைபெறப்போவதில்லை. ஆகவே, இந்த நாட்டிலே அமைதியைக் கட்டிவளர்க்க, நல்லிணக்கத்தை ஏற்படுத்த, முதலிலே இனவாத ரீதியான கருத்துக்களைக் கூறுவதை நிறுத்திக்கொள்ளுங்கள்! நல்லெண்ணத்தைக் கொண்டு வாருங்கள்! அந்த மக்களுடைய இழந்த உறவுகளை நினைவுகூர அவர்களுக்குச் சந்தர்ப்பத்தைக் கொடுங்கள்!

நான் நினைக்கின்றேன், கௌரவ பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக இருந்தபொழுது இவ் வாறான துயிலுமில்லங்களுக்குச் செல்கின்ற சந்தர்ப்பம் தடைப்பட்டிருந்தது என்று. ஆனால், இந்த நாட்டிலே மைத்திரிபால சிறிசேன அவர்கள் ஜனாதிபதியாக இருந்த பொழுது 2016ஆம், 2017ஆம், 2018ஆம் ஆண்டுகளில் அதற்கு அனுமதியளிக்கப்பட்டது. கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக வந்தபொழுது, 2019ஆம் ஆண்டிலும் அனுமதிக்கப்பட்டது. யாரும் தடுக்கவில்லை; எந்தவித இடையூறுகளும் இருக்கவில்லை; மக்கள் யாரும் நாட்டுக்கு விரோதமாகச் செயற்படவில்லை; அங்கு விடுதலைப் புலிகள் மீளக் கட்டியெழுப்பப்படவில்லை. ஆனால், இன்று என்ன நடக்கிறது? நீங்கள் ஏன் இதனைத் தடுக்கிறீர்கள்?

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

இறந்துபோன அந்த ஆத்மாக்களின் புதைகுழிகளின்மீது உங்களுடைய இராணுவம் சப்பாத்துக் கால்களால் மிதிக்கும் வரை இந்த நாட்டிலே அமைதியும் சமாதானமும் ஏற்படப் போவதில்லை; நல்லிணக்கம் ஏற்படப்போவதில்லை; நல்ல எண்ணங்கள் உருவாகப்போவதில்லை.

நேற்று முன்தினம்கூட யாழ்ப்பாணத்துக்கும் கிளிநொச்சிக்கும் ஞானசார தேரருடைய 'ஒரே நாடு, ஒரே சட்டம்' என்ற ஜனாதிபதி செயலணி சென்றிருக்கின்றது. நீதிமன்றத்தை அவமதித்ததற்காகச் சிறையிலே இருந்து பொதுமன்னிப்பு வழங்கப்பட்டு வெளியிலே வந்த ஒருவர், இன்று மொட்டந்தலைக்கும் முழங்காலுக்கும் முடிச்சுப் போடுகின்றார். "மாவீரர் துயிலுமில்லங்களுக்குச் செல்ல வேண்டும் என்று நீங்கள் கேட்கிறீர்கள். ஆனால், போதைவஸ்துகளுக்கு எதிராக ஏன் நீங்கள் பேசவில்லை?" என்று அவர் கேட்கிறார். நாங்கள் எத்தனையோ தடவை பேசியிருக்கின்றோம். கௌரவ பிரதம அமைச்சர் அவர்களே, கௌரவ நிதியமைச்சர் அவர்களே, நீங்கள் சற்றுச் சிந்தித்துப் பாருங்கள்! 2009ஆம் ஆண்டுக்கு முன்னர் வடக்கிலே யாராவது போதைவஸ்தால் பாதிக்கப்பட்டிருந்தார்களா? யாராவது போதைவஸ்து உட்கொண்டதாக நீங்கள் அறிந்திருக் கிறீர்களா? 'கஞ்சா' என்கின்ற சொல் வடக்கு, கிழக்கிலே 2009க்கு முன்னர் இருந்திருக்கிறதா? இதை யார் கொண்டுவந்தார்கள்? இது யாரால் நடைபெறுகின்றது? இராணுவம், பொலிஸ், கடற்படை, விமானப்படை என இவ்வளவு படைகளிருக்கின்றபோது, எவ்வாறு அங்கு போதைப்பொருட்கள் வந்து சேர்கின்றன? இதற்கான காரணம் என்ன? ஆகவே, ஓர் இனம் எவ்வாறு அழிக்கப்படுகிறது என்பதைப் பாருங்கள்! அதைக் கொண்டுவந்தவர்களே இன்னொரு வகையாகச் சொல்கிறார்கள், தமிழ் அரசியல் வாதிகள் இதனைக் கேட்பதில்லையென்று. நாங்கள் எத்தனையோ தடவை உங்களிடம் இந்த விடயங்களை முன்வைத்திருக்கிறோம். எத்தனையோ தடவை இதே பாராளுமன்றத்தில் பேசியிருக்கிறோம். நாங்கள் இந்தப் போதைக்கு எதிரானவர்கள்; போதைவஸ்துப் பாவனைக்கு எதிரானவர்கள். இதனை எந்தக் காலத்திலும் ஏற்றுக் கொள்ளாதவர்கள். விடுதலைப் புலிகளுடைய ஆட்சியிலே அந்த மண் இருந்தபொழுது, யாராவது ஒரு நபர் போதை வஸ்துக்கு அடிமையாக இருந்தார் என்று நீங்கள் கேள்விப்பட்டிருக்கின்றீர்களா? அல்லது 'கஞ்சா' என்கின்ற போதைப்பொருள் அங்கு வந்ததாக நீங்கள் கேள்விப்பட்டிருக் கிறீர்களா?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நீங்கள் கொஞ்சம் அமைதியாக இருங்கள்! நாங்கள் பேசிய பிறகு நீங்கள் பேசுங்கள்!

ஆகவே, இவ்வளவு விடயங்களும் நடந்த இந்த நாட்டிலே இப்பொழுது மட்டும் ஏன் போதைவஸ்து பற்றிப் பேசுகிறீர்கள்? இந்தப் போதைவஸ்தை யார் கொண்டு வருகிறார்கள்?

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, கௌரவ நிதியமைச்சர் அவர்களே, இந்த நாடு ஒரு நேர்மையான, நியாயமான, நிம்மதியான நாடாக இருக்கவேண்டும் என்பதைத்தான் நாங்களும் விரும்புகின்றோம். இந்த நாட்டுக்குள்ளே அதிகாரங்கள் பகிரப்பட்டு, நாங்களும் ஒரு தேசிய இனமாக, எங்களுடைய கலாசார, பண்பாட்டு அடையாளங்களோடு உங்களோடு சேர்ந்து வாழ விருப்பத்தோடு இன்றும் இருக்கிறோம். நாங்கள் பிரிவினை வாதிகள் அல்ல. நாங்கள் பிரிவினைகளுக்காக எப்பொழுதும் தூண்டப்பட்டவர்களும் அல்லர். பிரிவினைக் கோரிக்கை கொண்டுவரப்பட்டதற்குக் காரணமே உங்களுடைய பக்கத்திலிருந்துதான் எழுந்தது. அறவழிப் போராட்டங்களை நீங்கள் நிராகரித்ததால், உண்மைகளை நீங்கள் மறைத்ததால், உண்மையான உரிமைப் போராட்டங்கள் நிராகரிக்கப் பட்டதால், தமிழர்கள் ஆயுதம் ஏந்தவேண்டி வந்தது. உங்களுக்கு அருகிலேயிருந்து துள்ளுகிறவர்கள்கூட ஆயுதந் தூக்கித்தான் அரசியலுக்கு வந்தார்கள். ஆகவே, அதற்கான காரணங்களை நீங்கள் புரிந்துகொள்ளவேண்டும். [இடையீடு] இந்த அரசியல் ரீதியான பயணங்களுக்கெல்லாம் நாங்கள் எங்களுடைய காரணங்களைச் சரியான முறையிலே நேர்மையாகச் சொல்கின்றோம். [இடையீடு] சிலர் இந்த மண்ணிலே தங்களுடைய அரசியல் இலாபங்களுக்காகத்தான் இதனைக் கொண்டுசெல்கின்றார்கள். கௌரவ பிரதம அமைச்சர் அவர்களும் இங்கிருக்கின்றார். கௌரவ நிதியமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களும் இங்கிருக் கின்றார். [இடையீடு] ஆகவே, இந்த ஆணைக்குழுக்களுக் கூடாக அல்லது பிரதம அமைச்சருக்குரிய அதிகாரங் களுக்கூடாக இந்த நாட்டிலே செய்ய வேண்டிய விடயங்களை அமைதியான முறையிலும் நியாயமாகவும் நாங்கள் சொல்ல விரும்புகிறோம். இந்த மண்ணிலே நியாயம் கிடைக்க வேண்டும். எமது மக்கள் நிம்மதியாக வாழ்கின்ற சூழல் உருவாகவேண்டும். [இடையீடு]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
அது இல்லாதவரைக்கும் ஒரு நியாயம் கிடைக்கப் போவதில்லை என்பதைத்தான் இந்த இடத்திலே நாங்கள் வலியுறுத்துகிறோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் கேட்பது என்னவென்றால், பிரதம அமைச்சருக்குக் கீழே யிருக்கின்ற இந்தளவு விடயங்களையும் நீதியான முறையிலே, நியாயமான முறையிலே நடைமுறைப்படுத்துங்கள் என்பதைத் தான். அப்பொழுதுதான் இந்த நாட்டிலே அமைதியும் சமாதானமும் ஏற்படும். இந்த நாட்டுக்கு ஒரு கௌரவம் ஏற்படும். இந்த நாட்டுக்கான ஒரு நிலையான அபிவிருத்தி ஏற்படும்.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක කාරක සභා අවස්ථාවක්. ඇමතිතුමාට යම් කිසි චෝදනාවක් එල්ල කළාම ඇමතිතුමා නැඟිටලා ඒකට පිළිතුරු දෙනවා. කාරක සභා රීති තමයි මෙතැනට බලපාන්නේ. ඔබතුමා mike එක දුන්නේ නැහැ. ඇමතිතුමාට ගරු මන්ත්‍රීතුමා බරපතළ චෝදනාවක් කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමනි, එතුමා mike එක ඉල්ලුවේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උතුරු පළාත නියෝජනය කරන ඇමතිවරයාට බරපතළ චෝදනාවක් මේ කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Mike එක දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You have to give the mike. This is the Committee Stage.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நீங்கள் இங்கு பல விடயங்களைப் பற்றிச் சொன்னீர்கள். ஆனால், ஒன்றை ஏற்றுக்கொண்டிருக்கிறீர்கள். அதாவது, முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய காலத்தில் 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உதயம்' போன்ற அபிவிருத்தி வேலைத்திட்டங்களை எங்களுடைய இன்றைய நிதி அமைச்சர் அவர்கள் முன்வந்து செய்ததென்று சொன்னீர்கள். அதற்கு முன்னர் ஏன் செய்யவில்லை? அதற்கு நீங்கள் விடவில்லை! நீங்கள் அங்கு தடைகளைத்தான் ஏற்படுத்திக்கொண்டிருந்தீர்கள். பிரபாகரன் போதைவஸ்து வியாபாரத்தில் ஈடுபட்டது உங்களுக்குத் தெரியாமல் இருக்கலாம் அல்லது நீங்கள் அதை மறைக்கலாம். பொய்யான விடயங்களைச் சபையில் கூறவேண்டாம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Sivagnanam Shritharan, please continue with your speech.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தயவுசெய்து என்னுடைய நேரத்தில் என்னைப் பேசவிடுங்கள்! நான் அரசாங்கத்திற்கு வக்காலத்து வாங்குகின்ற கையாள் அல்ல. என்னுடைய பதவிகளுக்காக அரசாங்கத்திற்குக் கால்கழுவிப் பிழைப்பதற்காக நான் இங்கு வரவில்லை. அது யுத்தம் நடைபெற்றுக்கொண்டிருந்த காலகட்டமாக இருந்தது. இன விடுதலைக்காக ஓரினம் போராடிக்கொண்டிருந்தது. அந்த யுத்தம் நடந்தபொழுது அரசாங்கம்தான் திட்டமிட்டுப் பொருளாதாரத் தடைகளை விதித்திருந்தது. ஆகவே, தயவுசெய்து இந்த இடத்திலே அதுசம்பந்தமாகப் பேசுவதற்கு அனுமதிக்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Sivagnanam Shritharan, please wind up now.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் என்னுடைய நேரத்தில்தான் பேசிக்கொண்டிருக்கின்றேன். *[இடையீடு]* அந்தக் காலகட்டங்களை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். வெறுமனே வாயால் கத்திக்கொண்டு அல்லது கவச வாகனங்களில் பாதுகாப்பாகப் பயணம் செய்துகொண்டு இருந்தவர்கள் அல்ல, தமிழர்கள். *[இடையீடு]* அவர்கள் தாங்கள் வாழுகின்ற நிலத்தில் தங்கள் உரிமைக்காகப் போராடியிருந்தார்கள். தங்கள் உரிமைக்காகப் போராடிய அவர்களுடைய அந்தப் போராட்ட காலத்திலே நீங்கள்தான் - அரசாங்கம்தான் திட்டமிட்டுப் பொருட்களை அனுப்பவில்லை; நீங்கள்தான் தடுத்திருந்தீர்கள்! *[இடையீடு]* ஆகவேதான் நான் இந்த இடத்திலே அதனைப் பதிவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! Hon. Sivagnanam Shritharan, please wind up now.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
மிக முக்கியமாகத் தமிழர்கள் பொருளாதார ரீதியாக, அரசியல் ரீதியாக நசுக்கப்பட்ட காலம் போய், இப்பொழுது கூட நாங்கள் கேட்பது, தமிழர்களும் நீங்களும் நியாயமாக, கௌரவமாக இந்த நாட்டில் வாழவேண்டுமானால் ஒரு தீர்வை முன்வையுங்கள், நியாயமாக நடவுங்கள் என்பதைத்தான். *[இடையீடு]*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்குத் தரப்பட்டது கொஞ்ச நேரம்தான். அந்த நேரத்தில் என்னைப் பேசுவதற்கு அனுமதியுங்கள்! *[இடையீடு]* அதனை விடுத்து, மற்றவர் கேட்பதற்கெல்லாம் நேரம் கொடுத்தால் என்னால் எவ்வாறு பேசமுடியும்? இந்த ஆணைக்குழுக்களினாலும் சரி, பிரதம அமைச்சருக்குக்கீழ் வருகின்ற நிறுவனங்களினாலும்சரி, இந்த நாட்டிலே மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றவர்கள் தமிழர்கள் என்பதையும் நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

**ගරු කුලසිංහම් තිලීපන් මහතා**
(மாண்புமிகு குலசிங்கம் திலீபன்)
(The Hon. Kulasingam Dhileeban)
Sir, I rise to a point of Order.

இனவாதம் பற்றிப் பேசுகின்ற சிறீதரன் அவர்கள், மலையக மக்களை 'வடக்கத்தையார்' என்று பேசியதை மறுக்கவேண்டாம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.31]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය ඇතුළු ආයතන 25ක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ මොහොතේ, මට ලැබී ඇති කාලය සීමිත නිසා, අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව සහ එතුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව මගේ අවධානය යොමු කරනවා. මේ විවාදයේදී ගරු අග්‍රාමාත්‍යතුමා පිළිබඳව දිගින් දිගටම ප්‍රසාදය පළ වුණා. සියලුදෙනාම එතුමා කරන වැඩ පිළිවෙළ පැහැදිලි කළා. අතිගරු ජනාධිපතිතුමාට විවිධ චෝදනා එල්ල කළ නිසා, ගෙවී ගිය වසර දෙකක කාලය තුළ එතුමා කළ කටයුතු පිළිබඳව මට ලැබී ඇති කාලය තුළ අදහස් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 නොවැම්බර් මාසයේ 15වෙනි දා අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති ධුරයට පත් වෙනකොට එතුමාට තිබුණු බලාපොරොත්තුව තමයි, පිරිසිදු රාජ්‍ය පාලනයක් සහ ආදර්ශවත් වැඩ පිළිවෙළක් ගෙන යාම. ඒ තමයි එතුමාගේ වැඩ පිළිවෙළ. හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එතුමාගේ පළමුවන වසරේ වැය කළ මුදල රුපියල් බිලියන 3.07යි. වත්මන් ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එතුමාගේ පළමුවන වසරේ වැය කළ කළේ රුපියල් බිලියන 1.3යි. ජනාධිපති ලේකම් කාර්යාලයෙන්, ජනාධිපතිවරයාට වෙන් කරලා තිබෙන මුදලින් රුපියල් බිලියන 1.7ක මුදලක් මේ රටේ ජනතාව වෙනුවෙන් එතුමා ඉතිරි කර තිබෙනවා. මම ඒකයි කිව්වේ මේක ආදර්ශවත් රාජ්‍ය පාලනයක් කියලා.

හිටපු ජනාධිපතිවරයා වාහන 200ක් පාවිච්චි කළා. නමුත් වත්මන් ජනාධිපතිවරයා පාවිච්චි කරන්නේ වාහන 10යි. ඒ වාගේම වත්මන් ජනාධිපතිවරයා ජනාධිපති ලේකම් කාර්යාලය පාවිච්චි කරලා නැහැ, ජනාධිපති මන්දිරය පාවිච්චි කරලා නැහැ. ඒ විතරක් නොවෙයි, එතුමා පෞද්ගලික වාහන දෙකක් පරිහරණය කරනවා. ඒ පරිහරණය කරන වාහන දෙකට ඉන්ධන ගහන්නේ එතුමාගේ පෞද්ගලික සල්ලිවලින්. මම ඒ කාරණය පාර්ලිමේන්තුවේදී වගකීමකින් කියනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ අවුරුදු පහේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය 48යි, වත්මන් ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය 30යි. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ එක අමාත්‍යවරයෙකුට වාහන 10, 15, 20 ලබා දීලා තිබුණා. මම කියන්නම්, එවකට මහා මාර්ග ඇමතිවරයා දිස්ත්‍රික්කවලට බෙදපු වාහන ගණන. මම කියන්නම්, ලේකම්ලාට තිබුණු වාහන ගණන. අද කැබිනට් ඇමතිවරයෙකුට දීලා තිබෙන්නේ වාහන 3යි. එවකට සිටි එක ඇමතිවරයෙකුට ආරක්ෂාවට 15දෙනෙක්, 20දෙනෙක් හිටියා. අද ඇමතිවරයෙකුට ආරක්ෂාවට ඉන්නේ 4දෙනායි, නැත්නම් 5දෙනායි. ඒක තමයි ආදර්ශවත් රාජ්‍ය පාලනය. අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවෙලා අදට අවුරුදු 2යි. ගරු පාඨලී චම්පික රණවක මැතිතුමනි, ආණ්ඩුවේ කිසිම ඇමතිවරයෙකුට එක වාහනයක් ගන්න එතුමා අවසර දීලා නැහැ. ඔබතුමන්ලාගේ අවුරුදු 5 තුළ ඇමතිවරු ගත්ත අලුත් වාහන ටික බලන්න. වත්මන් ජනාධිපතිතුමා කිසිම කෙනෙකුට එක වාහනයක්වත් ගන්න අවසර දීලා නැහැ.

මේ වසර දෙකක කාලයේ මාස 24න් මාස 20ක් එතුමාට ගත කරන්න සිදු වුණේ කොවිඩ් - 19 පාලනයත් එක්කයි. ඔබතුමන්ලාට මතකයි නේ, එතුමා නොවැම්බර් 15 වන දා ජයග්‍රහණය කළා. චීනයේ පළමුවන කොවිඩ් ආසාදිතයා දෙසැම්බර් මාසයේ මැද හඳුනා ගන්නවා. 2020 මාර්තු මාසයේ අපේ රටේ පළමුවන කොවිඩ් ආසාදිතයා හඳුනා ගන්නවා. ඒ වනකොට මාස 4යි එතුමාට රාජ්‍ය පාලනය කරන්න පුළුවන් වුණේ. එතුමාට මේ කොවිඩ් වසංගතය මර්දනයට ප්‍රමුඛස්ථානය දෙන්න සිද්ධ වුණා. ඒ නිසා රට හදන එක පැත්තක තබා රටේ මිනිසුන් ජීවත් කිරීමේ වගකීම භාර ගැනීමට වත්මන් ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට සිදු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් වසංගතය පාලනය කරන්න එතුමා සෑම සතියකම සිකුරාදා දවස්වල රැස්වීමක් පවත්වා රාජ්‍ය නායකයන්ට කථා කරලා, විවිධ පාර්ශ්වවලට කථා කරලා මුදල් සොයාගෙන තමයි මේ රටේ ජනතාවට එන්නත්කරණය සිදු කළේ. අද මෙතැන ඉන්න වැඩි පිරිසක් ජීවත් වන්නේ එතුමාට පින් සිද්ධ වෙන්නයි. එතුමා ලබා දීපු එන්නත ගහගෙන තමයි මෙතුමන්ලා අද එතුමාට දොස් කියන්නේ. අද අපේ රටේ ජනගහනය මිලියන 22යි. සෞඛ්‍ය අමාත්‍යාංශය නිර්දේශ කරන්නේ වයස අවුරුදු 16ට වැඩි අයට මේ කොවිඩ් - 19 එන්නත දෙන්න කියලායි. රටේ ජනගහනයෙන් මිලියන 15.8කට කොවිඩ් එන්නතේ පළමු මාත්‍රාව දීලා තිබෙනවා. ඒ කියන්නේ, සියයට 98කට පළමු එන්නත දීලා තිබෙනවා. එන්නතේ දෙවැනි මාත්‍රාව දීලා තිබෙනවා, මිලියන 13.7කට. ඒ කියන්නේ, සියයට 84කට දෙවන එන්නත දීලා තිබෙනවා. මතක තබා ගන්න, ආසියානු කලාපයේ කොවිඩ් එන්නත් දෙකම සියයට 84කට දීපු රටක් තිබෙනවා නම් ඒ අපේ රටයි කියලා. ආසියානු කලාපයේ වෙනත් එවැනි රටක් තිබෙනවා නම් කියන්න. ඒ විතරක් නොවෙයි, මේ වන විට 112,000කට තුන්වන එන්නතත් ලබාදීලා ඉවරයි. මේ වසංගතය නැවතත් පැතිරෙයි කියන අභියෝගය දැනගත් නිසා මේ වනකොට ගාල්ල, හම්බන්තොට, මාතර, අනුරාධපුරය යන දිස්ත්‍රික්ක සියල්ලේත්, බස්නාහිර පළාතේත් අවුරුදු 60ට වැඩි සියලුදෙනාට තුන්වන එන්නත - booster dose එක - ලබාදෙන්න කියලා අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා. ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කිසිම රාජ්‍ය නායකයකුට විසඳන්න බැරි වුණු යුද්ධය අවසන් කළා වාගේම මේ රටේ මිනිසුන් ජීවත් කරවීම සඳහා කොවිඩ් - 19 වසංගතය පාලනය කරන්න රාජපක්ෂවරු කටයුතු කළාය කියන කාරණය තමුන්නාන්සේලා අමතක කරන්න එපා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ කාලයේ සියලුම ආයතන විකුණන්න සැලසුම් කළා. විවිධ රාජ්‍ය ආයතන එක්කත්, ලෝක බැංකුව එක්කත් කථා කරගෙන මේ ආයතන විකුණන්න කටයුතු කළා. ඔබතුමන්ලාගේ කාලයේ පාඩු ලැබූ ආයතන අද ලාභ ලබන ආයතන බවට පත් කරලා තිබෙනවා. ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. තමුන්නාන්සේලා ඒක විකුණුවා. තුට්ටු දෙකට ඉඩම් ටික විකුණලා, දලු ටික විකුණලා, ස්ටෝරු විකුණලා කරන්න ඕනෑ තක්කඩි හොරකම් ඔක්කොම කළා. මේ ආයතනය මට භාර දීලා අවුරුද්දයි වෙන්නේ. ඔබතුමන්ලාගේ කාලයේ මේ ආයතනය රුපියල් මිලියන 780ක පාඩුවක් ලැබුවා. අද ජනවසමේ පාඩුව රුපියල් මිලියන 82යි. ඒකටත් හේතුව රුපියල් 1,000 දක්වා පඩි වැඩි කිරීමයි. එහෙම නැත්නම් ජනවසම අද ලාභ ලබන ආයතනයක්. දෙසැම්බර් 31 වනකොට අපි ජනවසම ලාභ ලබන ආයතනයක් බවට පත් කරනවා. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන මිල්කෝ ආයතනය ඔබතුමන්ලා අපිට භාර දෙනකොට පාඩුව රුපියල් මිලියන 42යි. නමුත් අද එම ආයතනය රුපියල් මිලියන 711ක ලාභයක් ලබනවා.

අවුරුදු දෙකකට අපි රුපියල් බිලියනයක් ලාභ ලබා තිබෙනවා. ඒ, ජනාධිපතිතුමා එම ආයතනවලට නිවැරැදි පුද්ගලයන් පත් කරපු නිසායි. නිවැරැදි පුද්ගලයන් ඒ තැන්වලට පත් කරලා ඒ පාඩු ලැබූ ආයතන ලාභ ලබන ආයතන බවට පත් කරන්න එතුමා කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ වැඩිම අවධානය යොමු වෙච්ච මත් කුඩු සහ පාතාලය සම්බන්ධ සංඛ්‍යා ලේඛන මා ළඟ තිබෙනවා. ඔබතුමන්ලා 2015, 2016, 2017, 2018 අවුරුදුවල අල්ලලා තිබෙන වැඩිම මත්කුඩු quantity එක තමයි කිලෝග්‍රෑම් 730. නමුත්, 2019දී අපි ආවාට පසු 2020 වර්ෂය තුළ මත්කුඩු විතරක් කිලෝග්‍රෑම් 2,732ක් පොලිසිය විසින් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව අවුරුදු 4කදී අල්ලාගත්ත ප්‍රමාණය වගේ පස් ගුණයක මත්කුඩු අපි එක අවුරුද්දකදී අල්ලලා තිබෙනවා. අද මත්කුඩු සම්පූර්ණයෙන් පාලනය කරන්න කටයුතු කර තිබෙනවා. අද ඒවා ගැන කථා කරන්නේ නැහැ, මේකේ ඉන්න අයගේ කටේ මොනවා හැදිලාද මම දන්නේ නැහැ, මේ හොඳ ගැන කථා කරන්නේ නැහැ. අනාගතයේ ඉපදෙන්න ඉන්න දරුවන් වෙනුවෙන් මත්කුඩු පාලනය කරන්න වත්මන් ජනාධිපතිතුමා කටයුතු කරනවා. ඒවා ගැන මෙතුමන්ලා කථා කරන්නේ නැහැ.

එවකට පොලිසිය භාරව හිටපු ඇමතිවරයා කවුද? හිටපු අගමැතිතුමාගේ පක්ෂයේ සාගල මහත්මයා. එතුමා මොකද කළේ? එවකට හිටපු පාතාලයට උදවු කළේ කවුද? සාගල රත්නායක තමයි පාතාලයත් එක්ක ගනු දෙනු කළේ; පාතාලය රැක්කේ. පාතාලයට ආයුධ දෙන්න සියලු කටයුතු කළේ කවුද? සාගල රත්නායක හිටපු පොලිසිය භාර ඇමතිවරයා. හිටපු පොලිසිය භාර ඇමති පාතාලය මෙහෙයවනකොට පාතාලය සුනු විසුනු කළේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමායි කියන එක තමුන්නාන්සේලා අමතක කරන්න එපා. වෙනදා අපි රාත්‍රියට රූපවාහිනිය බලනකොට දකිනවා, වෑන්වලින් ඇවිත් වෙඩි තියපු හැටි; බස්වලින් ඇවිත් වෙඩි තියපු හැටි. අඩු ගණනේ සතියකට දවස් දෙක තුනක් අපි දකිනවා, පාතාලය විසින් මිනිසුන් මර්දනය කරන ආකාරය. අද එහෙම දෙයක් ඔබ දකිනවාද? අද පාතාලය දකිනවාද? අද පාතාලයේ සියලු අය රටින් පැනලා ගිහිල්ලා. පසුගිය ආණ්ඩුව කාලයේ ඇමතිවරු තමයි පාතාලය රැක්කේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඇමතිවරු එක්ක පාතාලය ගනුදෙනු කළා. අද පාතාලය සම්පූර්ණයෙන් නැති කරන්න වත්මන් ජනාධිපතිතුමා කටයුතු කර තිබෙන බව අමතක කරන්න එපා.

ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, අධිකරණය ගැන කථා කළා. ඔබතුමන්ලා අධිකරණය ගැන අපට කියන්න එපා. ඔබතුමන්ලා අධිකරණය සම්බන්ධව කටයුතු කළ හැටි අපට හොඳට මතකයි. තමුන්නාන්සේලා රාත්‍රී දොළහට උසාවි ඇරලායි අපේ ගරු අගමැතිතුමාගේ -මේ රටේ යුද්ධය අවසන් කරපු නායකයාගේ- ආදරණීය දරුවෝ ටික කඩුවෙල අධිකරණයට ගෙන ගියේ. රාත්‍රී දොළහට කඩුවෙල අධිකරණය ඇරලා -උසාවිය ඇරලා- නඩු අහලා ඒ අය රිමාන්ඩ් කෙරෙව්වා. ඔබතුමන්ලා රාත්‍රී දොළහට අරලියගහ මන්දිරයේ වෙනම හමු වුණා මතක ඇති. අරලියගහ මන්දිරයේ හමුවෙලා නඩු දාන්න ෆයිල් හැදුවා. රන්ජන් රාමනායක කියන අහිංසක මනුස්සයාව පාවිච්චි කරලා විනිසුරුවරුන්ට කථා කරලා නඩු දැම්මා. තමුන්නාන්සේලා මට විරුද්ධවත් විශේෂ අධිකරණයේ නඩුවක් දැම්මා. අදත් මම ඒ නඩුවට පෙනී හිටිනවා. කැරම් බෝඩ් ගෙනාවා කියලායි මට නඩු දැම්මේ. මම ගෙනාපු කෙහෙල් මල් කැරම් බෝඩ් එකක් නැහැ. කැරම් බෝඩ් ගෙනාවේ වෙන අමාත්‍යාංශයකින්. කැරම් බෝඩ් ගැන කථා කළේ වෙන අමාත්‍යාංශයකින්. මහින්දානන්ද අලුත්ගමගේට විරුද්ධව විශේෂ අධිකරණයේ නඩු දැම්මේ වෙන මොකුත් හින්දා නොවෙයි, කෝප් එකේදී බැඳුම්කර වංචාව එළියට ගත්ත නිසායි. කෝප් කමිටුවට හිටපු මහ බැංකු අධිපති එන්නේ නැතිව ඉන්නකොට මම තමයි ගෙන්වා ගත්තේ. එවකට කථානායක කරු ජයසූරිය මැතිතුමා අද සුදු රෙදි ඇඳගෙන කථා කරනවා. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා අද මේ ගරු සභාවේ හිටියා නම් කියාවි. සුනිල් හඳුන්නෙත්ති මහත්මයාට කිව්වා, මහ බැංකුවේ අධිපති කෝප් කමිටුවට ගෙන්වන්න එපා කියලා. මම තමයි එදා කෝප් එකට මහ බැංකු අධිපති ගෙන්නුවේ. ඒ නිසා මගෙන් පළිගන්න මට විරුද්ධව විශේෂ අධිකරණයේ නඩුවක් දැම්මා.

අපට ලජ්ජයි, රෙදි ඇඳගෙන පාර්ලිමේන්තුවේ ඉන්න. අපි පසුගිය ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට විරුද්ධව පැමිණිලි 14ක් දැම්මා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා මට තව වේලාව දෙන්නම් කිව්වා.

අපි "Top Ten" කියලා පැමිණිලි ගණනාවක් දැම්මා. තමුන්නාන්සේලා මතක තියා ගන්න, මේ ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු දෙකයි, අද වෙනකම් තමුන්නාන්සේලා එක්කෙනෙකුවත් කටඋත්තර ගන්නවත් ගෙන්වාගෙන නැහැ. අපටත් තිබුණා, අගමැතිතුමාට කියලා අරලියගහ මන්දිරයේ රැස්වීමක් තියලා, නීතිපති ගෙනැල්ලා, පොලිස්පති ගෙනැල්ලා තමුන්නාන්සේලාට විරුද්ධව නඩු දාන්න කියන්න. නමුත්, අපි එහෙම කළේ නැහැ. ඒක මතක තියා ගන්න.

මා ළඟ දැන් තිබෙනවා, "ෆයිල්" එකක්. මම හෙට ගිහින් කටඋත්තර දුන්නොත් තමුන්නාන්සේලාගේ ඉදිරි පෙළ කෙනෙක් ඇප නැතිව හිර ගෙදර යනවා. තනියම නොවෙයි, පවුල පිටින් හිර ගෙදර යනවා. නමුත්, අපි පළිගන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයාත් මේ ගරු සභාවේ ඉන්නවා. මට ඕනෑ නම් තව එක කටඋත්තරයක් දෙන්න පුළුවන්, එතුමාට විරුද්ධව. මාව ඝාතනය කරන්න කියලා රන්ජන් රාමනායක මහත්මයා දුරකථනයෙන් එතුමා එක්ක කථා කරනවා. ඒ පිළිබඳව මම කටඋත්තර දුන්නොත් ඒක හිටපු අගමැතිතුමාට හොඳ නැහැ. මම එතැනට යන්නේ නැහැ. මොනවා වුණත් එතුමා මේ රටේ හිටපු අගමැතිවරයෙක්. ඒ ගෞරවය හින්දා මම එහෙම කරන්නේ නැහැ. මට ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා කිව්වා, "ඉන්න ඕක අමතක කරලා දාන්න මහී" කියලා. ඒ නිසා මම ඒකෙන් එහාට ඒ කාරණාව අරගෙන ගියේ නැහැ. එහෙම තමයි අපි. අපි පළිගන්නේ නැහැ; දඬුවම් දෙන්න කියන්නේ නැහැ. නීතිය සාධාරණව ක්‍රියාත්මක වෙයි කියන එක කියනවා. හැබැයි, තමුන්නාන්සේලා හිතනවා එතකොට අපි නපුංසකයෝ කියලා. මේවාට පරීක්ෂණ තිබ්බේ නැහැ කියලා ඔබතුමන්ලා හිතනවා අපි නපුංසකයෝ කියලා. හැබැයි, මේ පරීක්ෂණ සාධාරණ විධියට, ප්‍රජාතන්ත්‍රවාදී විධියට පැවැත්වෙමින් යනවා. මතක තියා ගන්න, ඒවා නැවතිලා නොවෙයි. ජනාධිපතිතුමා ඒවාට බලපෑම් කරන්නේ නැහැ. අපේ අගමැතිතුමාට ගිහින් මේක කිව්වාම එතුමා කියනවා, "අනේ මේ ඒ ගොල්ලන් පළිඅරගෙන මොකද වුණේ? ඒ ගොල්ලන්ට ගෙදර යන්න වුණා නේ. මේ පළිගැනීම නවත්තමු" කියලා.

අපේ අගමැතිතුමා අපට කියන්නේ එහෙමයි. ජනාධිපතිතුමාට කිව්වාම එතුමාත් ඒකම තමයි අපට කියන්නේ. අපි නීතිපති කැඳවලා නඩු දාන්න කිව්වේ නැහැ; පොලිස්පති ගෙනැල්ලා නීතිය නමන්න කිව්වේ නැහැ; අධිකරණ විනිසුරුවරු ගෙනැල්ලා අධිකරණ තීන්දු ලියන්න කිව්වේ නැහැ; රාත්‍රී 12ට අධිකරණ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

විවෘත කළේ නැහැ. අධිකරණයේ ස්වාධීනත්වය ඉහළින්ම පවත්වාගෙන යන්න වත්මන් ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා කියා අපි කියන්න ඕනෑ.

අද සමහර අය ජනාධිපතිතුමා ගැන විවිධ විවේචන කරනවා. ජනාධිපතිතුමා පිස්සෙක් කියනවා. මොන තරම් අවාසනාවන්ත තත්ත්වයක් ද? මට පුළුවන්, වත්මන් විපක්ෂ නායකතුමා ගැන ගොඩක් දේවල් කියන්න. මට පුළුවන්, එතුමාගේ පෞද්ගලික ජීවිතය ගැන ගොඩක් දේවල් කථා කරන්න. නමුත්, අපි එතැනට වැටෙන්න හොඳ නැහැ.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කියන්නේ, මේ රටේ පහළ වුණු ගෞරවනීය රාජ්‍ය නායකයෙක්. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට පස්සේ පහළ වෙච්ච ඒ වාගේ එකම රාජ්‍ය නායකයා. අද ඔබතුමන්ලාට ඇඟිල්ලක් දිගු කරලා කියන්න බැහැ, ශත 5ක වංචාවක් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කළා කියලා. ඒ වාගේ ගෞරවනීය නායකයෙකුට, රට වෙනුවෙන් හොඳ ප්‍රතිපත්ති හදපු නායකයෙකුට විරුද්ධව මේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහරු ඒ විධියට කථා කරන එක ගැන මම කනගාටු වෙනවා. එතුමාගේ අවංකකම ගැන මා මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

අද පාරවල් දිගේ උද්ඝෝෂණ තිබෙනවා. නමුත්, එදා අපි උද්ඝෝෂණ කරනකොට මොකද කළේ? අපට කිතුල් ඇට දාලා ගැහුවා. අපේ කංචන මන්ත්‍රීතුමා, සේමසිංහ මන්ත්‍රීතුමා, -අපි- එනකොට කිතුල් ඇට දාලා ගැහුවේ. අපට ගඳ ගහන වතුර දාලා ගැහුවේ. බැටන් පොලුවලින් ගැහුවේ. බන්දුල මහත්මයලා කඩුවෙල උසාවියට අරගෙන ගියා. අපේ ආණ්ඩුවට අදට අවුරුදු 2යි. කොවිඩ් -19 වසංගතය තිබෙන වෙලාවේ උදඝෝෂණ විශාල ප්‍රමාණයක් තිබුණා. අපේ ආණ්ඩුව ඒ අයට එක බැටන් පොල්ලකින් ගහලා තිබෙනවාද? එක කඳුළු ගෑස් බවුසරයක් ගහලා තිබෙනවාද? එක වතුර බවුසරයක් ගහලා තියෙනවාද? ගරු චම්පික මන්ත්‍රීතුමනි, එහෙම ගහලා තියෙනවා නම් මට කියන්න. නැහැ, එහෙම ගහලා නැහැ. එහෙම තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. ගොඩක් අය හිතුවා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ආවාම එතුමා මිනිසුන්ට ගහයි, මිනිසුන්ට බණියි, එතුමා දරදඬු පාලකයෙක් කියලා. එහෙම පාලකයෙක් නොවෙයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. එතුමාට ඕනෑ නම්, බොහෝ දේ කරන්න තිබුණා. එතුමාට අදත් කරන්න බොහෝ දේ තියෙනවා. හැබැයි, එතුමා එහෙම දේශපාලන පළිගැනීම් කරන්නේ නැහැ; එතුමා උද්ඝෝෂණවලට ගහන්නේ නැහැ; එතුමා වතුර බවුසර් ගහන්නේ නැහැ. එතුමා මිනිසුන්ට ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්න අවශ්‍ය පරිසරය හදලා තිබෙනවා. එදා තමුන්නාන්සේලා උද්ඝෝෂණ කරපු වෙලාවේ ආණ්ඩුවට තිබුණා ඕනෑ නම් තමුන්නාන්සේලාගේ බස්වල ආපු අයට ඇන්ටිජන් පරීක්ෂණ ටිකක් කරන්න. එහෙම කළා නම්, එක්කෙනෙක්වත් එන්නේ නැහැ. අපේ ආණ්ඩුව එහෙමවත් කළේ නැහැ. අඩු ගණනේ නීතිය ඇතුළේවත් මොනවත් කළේ නැහැ. එහෙම තමයි අපේ ආණ්ඩුව. මේ රටේ ජනාධිපතිවරයා එවැනි නායකයෙක්. තමුන්නාන්සේලා ඒක අමතක කරන්න එපා.

අපි ඩීසල් බලාගාර මත රැඳිච්ච රටක්. හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා නොරොච්චෝලේ බලාගාරය හදලා, රුපියල් බිලියන ගණන් අද රටට ඉතුරු කරලා තියෙනවා. අපි පසුගිය අවුරුදු පහ තුළ දිගටම ඩීසල් බලාගාර මත රැඳුණා. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ unsolicited proposals සිය ගණන් තියෙනවා, අධික මිලට ගන්න. හැබැයි සියයට 70ක් පුනර්ජනනීය බල ශක්තිය මේ රටේ ස්ථාපිත කරන්න තීන්දු කරපු එකම රාජ්‍ය නායකයා තමයි, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා. ඒක අමතක කරන්න එපා. එතුමාට තිබුණා, ඩීසල් බලාගාරවලින් කටයුතු කරගෙන යන්න; ඒ කොමිස් ටික එන විධියටම කටයුතු කරගෙන යන්න. නමුත් එහෙම කළේ නැහැ. මේ රටේ අපිට නිකම් හම්බ වුණේ අව්වයි, වැස්සයි විතරයි. ජලයෙන්, අව්වෙන් සහ සුළඟින් අපට ප්‍රයෝජන ගන්න ඕනෑ නම්, අපේ රටේ තියෙන සම්පත් අපි ප්‍රයෝජනයට ගන්න ඕනෑ කියලා, සියයට 70ක් දක්වා පුනර්ජනනීය බල ශක්තිය වැඩි කිරීම සඳහා කටයුතු කරන්න ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කථා කළා. අද මේවා ගැන කථා කරන්නේ නැහැ. අද ගොඩක් අයගේ කටේ පිට්ටු. විපක්ෂය දන්නවා මේවා ගැන. තමුන්නාන්සේලා දැනගෙන අද කථා නොකර ඉන්නවා.

එතුමා පරිසර හිතකාමී කෘෂි කර්මාන්තයට යන්න තීන්දු කළා. ගොඩක් අය මේක නතර කරන්න හැදුවා. ඒ ඇයි කියා මට තේරෙන්නේ නැහැ. අනුරාධපුරයේ ගොවියෝ එදා වකුගඩුව එල්ලාගෙන, පාරට බැහැලා කිව්වා, වගාවලට රසායනික පොහොර එපා කියලා. හැබැයි, වකුගඩුව එල්ලාගෙන ආපු ඒ ගොවියෝ අද කියනවා, "අපට රසායනික පොහොර දෙන්න" කියලා. ගරු අගමැතිතුමනි, මොකක්ද අපි මේ සම්බන්ධයෙන් කරන්නේ? මේක මේ රටේ මිනිසුන්ට වස විසෙන් තොර ආහාර වේලක් ලබා දෙන්න හොඳ, අවංක චේතනාවෙන් ජනාධිපතිතුමා ගත්ත තීන්දුවක්. යැපුම් ආනයන ආර්ථිකයෙන් මිදිලා, නිෂ්පාදන ආර්ථිකයකට යන්න කෘෂිකර්ම ඇමතිවරයා හැටියට අද මම කටයුතු කරනවා. ඊළඟ වසර හතර තුළ අපි අල, ලූනු, මිරිස් ගේන්නේ නැහැ; අපි බීජ ගේන්නේ නැහැ. අපි ඒකට වැඩ පිළිවෙළක් හදලා ඉවරයි. ඔබතුමන්ලා එන්න, නාවලපිටියට. වර්ග අඩි 150,000ක මිරිස් බීජ ගම්මානය මම හදලා තියෙනවා. රටට අවශ්‍ය බීජ ඔක්කොම මම නාවලපිටියේ හදනවා. අපි දඹුල්ලේ, දිගන්පතන ගමේ රටට අවශ්‍ය ලූනු බීජ ඔක්කොම හදනවා; අපි නුවරඑළියේ සියලු අල බීජ ටික හදනවා. බීජ ආනයනය නවත්වනවා. අපි අල, ලූනු, මිරිස් ආනයනය නවත්වන්න, කිරිපිටි ආනයනය නවත්වන්න අවශ්‍ය පියවර අරගෙන ඉවරයි. ජනාධිපතිතුමාට තිබුණා, පිටරටින් බඩු ටික ගෙනැල්ලා, මුදලාලිලා ටික පෝෂණය කරන්න. හැබැයි එතුමාගේ සංකල්පය යැපුම් ආනයන ආර්ථිකයෙන් මිදිලා නිෂ්පාදන ආර්ථිකයක් කරා යෑමයි.

අපේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලානුරූප වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යමින් ගරු මහාමාර්ග ඇමතිතුමා මාර්ග කිලෝමීටර් ලක්ෂයක කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ නිසා අද ලංකාවේ හැම ගමකම හොඳ පාරවල් හැදිලා. අපේ ගම්වල මිනිසුන්ට කඩා ගත් තේ දලු ටික සාධාරණ මිලකට විකුණාගන්න බැරිව සිටියේ. දලු ලොරිය ඒ ගම්වලට යන්නේ නැති නිසා දලු ටික කරේ තබාගෙන එන්නේ. පැටවුම් කුලිය ගියාම, දලුවලට හම්බ වෙන මුදල කීයද? නමුත් අද අපේ ගමේ තේ වත්තට යන පාර කාපට් කරලා. අද දලු ලොරිය තේ වත්තටම යනවා; දලුවලට හොඳ මිලක් හම්බ වෙනවා. අද කිලෝමීටර් ලක්ෂ ගණනින් පාරවල් හදනවා.

"එක ගමකට එක නිවසක්" වැඩසටහන යටතේ අද වනකොට ගෙවල් 15,000ක් හදලා ඉවරයි. තමුන්නාන්සේලාගේ වත්මන් විපක්ෂ නායකතුමා වන සජිත් ප්‍රේමදාස මහත්මයාට නිවාස ඇමතිවරයා හැටියට ඒ අවුරුදු පහටම හදන්න පුළුවන් වුණේ ගෙවල් 7,220 යි. ඒකෙනුත් බොහෝ ඒවාට තමුන්නාන්සේලා දුන්නේ ආධාර. නොමිලේ හදා දුන්නේ ගෙවල් 2,700යි. නමුත් චම්පික රණවක මැතිතුමනි, මතක තබාගන්න, වත්මන් අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් මේ ආණ්ඩුව අවුරුදු

දෙකක් ඇතුළත ගෙවල් 15,000ක් හැදූ බව. තමුන්නාන්සේලාට ඒවා අමතකයි. ඒ විතරක් නොවෙයි, "සැමට ජලය" වැඩසටහන යටතේ හැම නිවසකටම ජලය දෙන්න අපි කටයුතු කරගෙන යනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට එවැනි වැඩ පිළිවෙළක් තිබුණාද? අද හැම ගෙදරකටම ජලය ලබා දෙන වැඩ පිළිවෙළ හදලා ඒ සියලු කටයුතු කරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා, නියමිත කාලය අවසානයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කාලය නැති නිසා, අවසාන වශයෙන් මම මේ කාරණය පමණක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් එතුමා ගත් තීන්දුව, ජාතික ආරක්ෂාවට මුල් තැන දෙමින් එතුමා ගත් තීන්දුව ඉතාම වැදගත්. අධිකරණ ක්ෂේත්‍රයේ වේගවත් ප්‍රතිසංස්කරණ, දූෂණයට තිත, ජනතාවට වග කියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්, රජයේ බදු ප්‍රතිපත්තිය ඇතුළු කාරණාවලට අදාළ කටයුතු ගණනාවක් එතුමා මේ කාලය තුළ ඉෂ්ට සිද්ධ කර තිබෙනවා. අප පත් කරගත් වත්මන් ජනාධිපතිතුමා සාම්ප්‍රදායික දේශපාලනයෙන් මිදුණු ප්‍රතිපත්තිගරුක දේශපාලන නායකයෙක්. ඒ නිසා ජනතාවට වාසි ගෙන දෙන දේ නොවෙයි, රටට හොඳ දේයි එතුමා ක්‍රියාත්මක කර තිබෙන්නේ. එතුමා මේ වසර දෙකක කාලය තුළ ගත් ක්‍රියා මාර්ග පිළිබඳ අපේ ප්‍රශංසාව එතුමාට පුද කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.49]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම, මා ගැනත්, ඒ වාගේම මා අගමැති කාලයේදී පොලීසිය භාර ඇමතිවරුන් වූ සාගල රත්නායක මැතිතුමා සහ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා සම්බන්ධවත් තිබෙන චෝදනා ඔක්කෝම මම ප්‍රතික්ෂේප කරනවා.

මම අද ආවේ එක වැය ශීර්ෂයක් ගැන කථා කරන්න. ඒ, පාර්ලිමේන්තුවේ වැය ශීර්ෂය. අපි අනෙක් කාරණා ගැන මීට පසුව එන අවස්ථාවලදී සාකච්ඡා කරමු. පාර්ලිමේන්තුව ගැන කථා කරද්දී පළමුවෙන්ම කිව යුතු කාරණයක් තිබෙනවා. කොවිඩ් වසංගතය මැද පාර්ලිමේන්තුව පවත්වාගෙන යෑමට ගන්නා උත්සාහය ගැන අපි පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාටත්, මේ කාර්ය මණ්ඩලයටත්, ඒ වාගේම පොලීසියටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අද උදේ විශේෂයෙන්ම කාන්තා මන්ත්‍රීතුමියන් ගැන ප්‍රශ්නයක් පැන නැඟුණා. මම ගරු කථානායකතුමාට යෝජනා කරන්න කැමැතියි, කාන්තා මන්ත්‍රීවරියන්ට යම්කිසි අපහාසයක්, නැත්නම් හිරිහැරයක් සිදු වුණොත්, ඒ කාරණය මේ සභාව තුළ සාකච්ඡාවට ගැනීමේ අයිතිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට ලබා දෙමු කියලා. වෙනත් මාර්ගවලට යන්නේ නැතුව, සභාපතිතුමිය ඇතුළු එම සංසදය මේ සභාව ඇතුළේ ප්‍රසිද්ධියේ, එහෙම නැත්නම් කථානායකතුමා මුණගැසී සාකච්ඡා කළා නම් ඒ කටයුත්ත වඩා ලෙහෙසියි කියා මම හිතනවා. මේ සැරේත් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිතුමියටත් මම විශේෂයෙන්ම ප්‍රශංසා කරන්න ඕනෑ.

මේ රටේ පාර්ලිමේන්තුවට තමයි නීති සෑදීමත්, මුදල් යෙදවීමත් කරන්න තිබෙන්නේ; විධායකය පාලනය කරන්නත් තිබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාවේ තිබෙනවා, නීති පැනවීමේ බලය ගැන. 148 වන ව්‍යවස්ථාවේ තිබෙනවා, මුදල් බලතල. 43 වන ව්‍යවස්ථාවේ තිබෙනවා කැබිනට් එක තමයි ජනරජය පාලනය කරන්නේ කියලා. එම 43 වන ව්‍යවස්ථාවේ තිබෙනවා, කැබිනට් මණ්ඩලයේ බලතල ගැන. විශේෂයෙන්ම 154උ - ඉංග්‍රීසි පරිවර්තනයේ 154G - ව්‍යවස්ථාවේ විශේෂයෙන්ම සඳහන් කර තිබෙනවා, I වන ලැයිස්තුව හැර අනෙක් හැම එකක්ම මධ්‍යම ආණ්ඩුව යටතේ සිදු වන්නේ කියලා. ඊට අමතරව, එයින් පිටට යන්නේ 33 ව්‍යවස්ථාවේ සඳහන් කර තිබෙන ජනාධිපතිවරයාට තිබෙන බලතල විතරයි. ඒවා සීමාසහිත බලතල. එහෙම නම් මේ සියල්ලම පාලනය කරන්නට සිදු වන්නේ කැබිනට් මණ්ඩලයට. ඇත්ත වශයෙන්ම, කැබිනට් මණ්ඩලය පාලනය කරන්නේ පාර්ලිමේන්තුව. අන්න එතැනයි අද ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වෙලා අවුරුද්දකට පසුව අපි දකිනවා, පාර්ලිමේන්තුවේ මේ බලතල ක්‍රියාත්මක කරන්න අවස්ථාව නැති වෙලා තිබෙන බව. එදා සිටියේ, පාර්ලිමේන්තුව තෝරන අගමැතිවරයෙක්; අගමැතිවරයා තෝරන කැබිනට් මණ්ඩලයක්. ඒ කැබිනට් මණ්ඩලය සමඟ ජනාධිපතිතුමා ක්‍රියා කිරීමයි එදා කළේ.

මම උදාහරණ දෙකක් දෙන්නම්. එකක්, පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව. එහි එක කොටසක් මේ සභාවට දීලා තිබෙනවා. අනෙක් ඒවා දෙන්න බැහැ කියනවා. මේ ගරු සභාවට අයිතියක් තිබෙනවා, සම්පූර්ණ කොමිෂන් සභා වාර්තා ටික අරගන්න; ඕනෑ අයට කියවන්න දෙන්න. ඒවා ලබා නොදෙන නිසා තමයි රටේ විශාල උද්ඝෝෂණ පැවැත්වෙන්නේ.

එක එක අංශවලින් කියනවා, "මේක සිදු වුණා, අරක සිදු වුණා." කියලා. ඒ කොමිෂන් සභා වාර්තාව ලබා දෙන්න. මොකද, ඒ කොමිසම පත් කරන්න ඉස්සෙල්ලා මේ ගරු සභාවේ අපි විශේෂ කාරක සභාවක් පත් කළා. එම කාරක සභාව ඒ ගැන සොයා බැලුවා. එම කාරක සභාව ඒ ගැන වාර්තාවක් දුන්නා. ඒ එක්කම, මේ කොමිසම පත් කරන්න කිව්වා. එහෙත් අද කියනවා, මේ අයට එය විශ්වාස කරන්න බැහැ කියලා. මම අගමැතිතුමාට කියනවා, මේ ගැන සොයා බලන්න කියලා. රජයේ නීතිඥවරුන්ට ඒ වාර්තාව බලන්න පුළුවන් නම්, ඇයි පක්ෂ නායකයන්ට බලන්න බැරි? මම අගමැතිවරයා හැටියට සිටියදී මේ ඔක්කොම දැනගෙන හිටියා. එම කොමිසමට කැඳවූ මන්ත්‍රීවරු හිටියා. ඒ නිසා එම සම්පූර්ණ වාර්තාව දෙන්න. මම හිතන විධියට එහි volumes 23ක් තිබෙනවා. ඒවා කියවන්න යයි අවුරුද්දක්වත්. එහෙත් ඒ වාර්තාව මේ සභාවට දුන්නාට පස්සේ ඒ කටයුත්ත එතැනින් ඉවරයි. ඒ කොමිෂන් සභා වාර්තාව මේ ගරු සභාවට දෙන්න තිබෙන එකක්.

දෙවනුව, මම New Fortress Energy ගිවිසුම ගැන කියන්න ඕනෑ. සමහරු ඒ ගිවිසුමට පක්ෂයි; සමහරු විරුද්ධයි. මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. අපට අයිතියක් තිබෙනවා, ඇත්ත

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

වශයෙන්ම ඒ ගිවිසුමෙන් කරුණු ලබා ගන්න; තොරතුරු ලබා ගන්න. එහි දාලා තිබෙන වගන්ති අනුව, තොරතුරු දෙන එක නවත්වා තිබෙන්නේ. එහෙම නම්, ඒක අපේ වරප්‍රසාද කඩ කිරීමක්. ඒ ප්‍රශ්නය මතු කර තිබෙනවා. සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ පැමිණීමෙන් පසුව පක්ෂ නායකයන් සමඟ කථා කරලා, ඊළඟ පියවර ගන්න ඕනෑ.

මේ ආණ්ඩු ක්‍රමය යටතේ අද කැබිනට් මණ්ඩලය තිබෙනවා; ඇමතිවරු යටතේ අමාත්‍යාංශ ලේකම්වරු ඉන්නවා; ඒ අය යටතේ අනික් සංස්ථා, ආයතන තිබෙනවා. එහෙම නම් ඒ හැම කෙනාම ඇමතිවරයෙකුට නැත්නම් කැබිනට් මණ්ඩලයට වග කියන්න ඕනෑ. ඒකෙන් පිට කොමිෂන් සභා කීපයක් තිබෙනවා. අද එය සිදු වෙන්නේ නැහැ. අද ඇත්ත වශයෙන්ම ඉන්නවා, ඇමතිවරුන්ට වග කියන්නේ නැති කණ්ඩායමක්. කැබිනට් මණ්ඩලයට වග කියන්නේ නැත්නම්, පාර්ලිමේන්තුවට වග කියන්නේත් නැහැ. හැම කෙනාම පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑ. ඒක වෙනත් නීතියකින් ඉවත් කර තිබෙනවා. අන්න ඒකයි සිදු වෙලා තිබෙන්නේ.

ජනාධිපති වැය ශීර්ෂය අද සලකා බැලීමට ගන්නා නිසා, ජනාධිපති කාර්ය සාධක බලකායන් ගැනත් විශේෂයෙන් කියන්න ඕනෑ. එවැනි කාර්ය සාධක බලකායන් ගණනාවක් පත් කර තිබෙනවා. මීට ඉස්සෙල්ලා ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඒ ගැන සඳහන් කළා. දැන් ඒවා පත් කරන්නේ කොහෙන්ද? ඒවා පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාව යටතේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (ඌ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන්නා වූ ද ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ඔහුට නියමිතව හෝ බලය ලැබී ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය."

මේ යටතේ පත් කරනවා මේ බලකායයන්. ඇත්ත වශයෙන්ම රටේ නීතිය අනුව, ඕනෑ එකක් ගැන හොයා බලා ජනාධිපතිතුමාට වාර්තා කරන්න නම් අපේ රටේ තිබෙනවා, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත. ඒ යටතේ ඕනෑම කොමිසමක් පත් කරන්න පුළුවන්; අවුරුද්දක් දෙකක් ක්‍රියාත්මක කරන්න පුළුවන්; ඕනෑම උපදෙසක් ලබා දෙන්න පුළුවන්. එහෙම නම්, මේ අයට අයිතිය නැහැ, ඒ යටතේ ක්‍රියා කරන්න. ක්‍රියාත්මක කරනවා නම් ක්‍රියාත්මක කරන්න වෙන්නේ විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ව්‍යවස්ථාව යටතේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ව්‍යවස්ථාව යටතේ තිබෙන්නේ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය ගැන. කාර්ය මණ්ඩලයක් හැටියටයි ක්‍රියා කරන්න තිබෙන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (1) යටතේ මෙසේ සඳහන් වනවා:

"ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ ලා සහ ඉටු කිරීමේ ලා තමාට සහාය දීම පිණිස තම මතය අනුව, අවශ්‍ය වන ලේකම්වරයන් පත් කිරීමට ද, අමාත්‍ය මණ්ඩලයේ අදහස් විමසා, වෙනත් නිලධරයන් සහ කාර්ය මණ්ඩලය පත් කිරීමට ද, ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීමට ද, ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය."

එක රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය ගැන කියනවා නම්, එම බලකාය පත් කරන කොට ඇමතිවරු දැනගෙන හිටියේ නැහැ. අධිකරණ ඇමතිතුමා ඒ ගැන ප්‍රශ්නයක් මතු කළා. ඊට පස්සේ තව ගැසට් එකකින් ඒක සංශෝධනය කළා. ඒ ගැනත් කැබිනට් මණ්ඩලය එක්ක සාකච්ඡා කරලා නැහැ.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා ලෙස ඉන්න කොට කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් දමපු බව මම දන්නවා. මෙහිදී එහෙම කිසිම පත්‍රිකාවක් නැහැ; සාකච්ඡා කරලා නැහැ. එහෙම නම් මේ සියල්ලම නීති විරෝධියි. මේ අය වෙනුවෙන් සතයක් වියදම් කරන්න බැහැ, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය යටතේ. එහෙම කළොත් ඒ වියදම් කරන නිලධාරියාට විරුද්ධව දඬුවම් කරන්න පුළුවන්. මේවා ක්‍රියාත්මක කරන්න බැහැ. මොකද, කැබිනට් මණ්ඩලය එක්ක සාකච්ඡා කරලා නැහැ. ඒකට හොඳ උදාහරණයක් තමයි, "එක රටක් - එක නීතියක්" යටතේ ඇති කරපු මේ වැඩසටහන. මේ ආකාරයට පාලනය ගෙන යෑම නිසා පාර්ලිමේන්තුවට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වන්නේ කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට වග කියන එකයි. නමුත් ඒක අද සිදු වෙන්නේ නැහැ නේ.

විශේෂයෙන්ම අද මේ රටේ විශාල ආර්ථික අර්බුදයක් තිබෙනවා. ඒ ගැන කැබිනට් මණ්ඩලයේ අදහස් තිබෙනවා; පාර්ලිමේන්තුවේ අදහස් තිබෙනවා. එහෙත්, තුන් දෙනෙකුගේ මතය උඩ පමණක් කටයුතු කරගෙන යනවාද? මේ රටේ අනාගතය පුද්ගලයන් තුන් දෙනෙකුට බාර දෙනවාද? මේ තත්ත්වය නැති කරන්න. කැබිනට් මණ්ඩලය එය බාර ගන්න. කැබිනට් මණ්ඩලයට බලතල තිබෙනවා නම් අපට පුළුවන් කැබිනට් මණ්ඩලයට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න. ඒක සිදු වන්නේ නැහැ.

අද වෙලා තිබෙන්නේ මොකක්ද? මහ බැංකු අධිපති ඉන්නේ කැබිනට් මණ්ඩලයට වඩා ඉහළින්. අන්න ඒකයි අද සිදු වෙලා තිබෙන්නේ. කැබිනට් මණ්ඩලයෙන් නැතිව මේ තීරණ ගන්නේ කොහොමද? මම අහන්නේ මේකයි. මුදල් ඇමතිතුමාට පුළුවන්ද, මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය ගැන සම්පූර්ණ විස්තරයක් කරන්න? අපි සියලුදෙනාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයෝ. We became a member of the International Monetary Fund under the Articles of Agreement adopted by the United Nations Monetary and Financial Conference at Bretton Woods in 1944. එයට අනුව, IMF එකේ වගකීම මොකක්ද? Article I of the Articles of Agreement states, I quote:

“To promote international monetary cooperation through a permanent institution …”

එහෙම නම් අපට IMF එකට යන්න වැඩක් නැහැ. අපි දැන් ගිහින් ඉවරයි. ඒක ඇතුළේ තමයි අපි ඉන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ගිවිසුමේ 4වන වගන්තියේ, Section 1. General obligations of members යටතේ අදහස් හුවමාරුවක් තිබෙනවා. It states, I quote:

“… principal objective is the continuing development of the orderly underlying conditions that are necessary for financial and economic stability, …"

".... to assure orderly exchange arrangements and to promote a stable system of exchange rates, …”

"(i) endeavour to direct its economic and financial policies toward the objective of fostering orderly economic growth with reasonable price stability, with due regard to its circumstances;”

ආර්ථිකයේ ස්ථාවරභාවයක් ඇති කරන්න, ස්ථාවර විදේශ විනිමය තත්ත්වයක් ඇති කරන්න තමයි අපි එකඟ වෙලා

තිබෙන්නේ. ඒ සඳහා එම ගිවිසුමේ 4වෙනි වගන්තියේ 3වන උප වගන්තිය යටතේ අදහස් හුවමාරුවක් කරගන්න තිබෙනවා.

අපි මේ විදේශ විනිමය සම්බන්ධයෙන් ගන්න යන පියවර මොකක්ද? දැනටමත් බැංකුව කියනවා, ඩොලරයේ අගය රුපියල් 202යි කියලා. නමුත් ඇත්තටම අපි දන්නවා, ඩොලරය රුපියල් 240යි කියලා. මුදල් අමාත්‍යාංශය ඒ සඳහා මොකක්ද යෝජනා කරන්නේ? රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ මේ සභාවට ඒ ගැන කරුණු ඉදිරිපත් කරන්න ගරු ඇමතිතුමාට පුළුවන්ද? දෙසැම්බර් මාසයේ IMF එක සහ රජය ඇති කර ගත් ගිවිසුමේ 4වෙනි වගන්තිය යටතේ අදහස් හුවමාරුවක් සිදු වෙනවා. ඒ අදහස් හුවමාරුවේදී සිදුවුණේ මොකක්ද කියා අපිට කියන්න පුළුවන්ද? ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවට අයිතියක් තිබෙනවා, විශේෂයෙන්ම විදේශ විනිමය හුවමාරු අනුපාතය - exchange rate එක - ගැන අහන්න. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කරන්න පුළුවන්ද? රාජ්‍ය මූල්‍ය කමිටුව දැනුවත් කරන්න පුළුවන්ද? මම කියනවා, ඒ තොරතුරු අපිට දෙන්න කියලා. එතකොට, IMF එකේ අදහසුත්, ආණ්ඩුවේ අදහසුත්, එකඟ වුණු කාරණාත්; එකඟ නොවුණු කාරණාත් එතැන තිබෙයි. මේ සියල්ලම ප්‍රසිද්ධියේ දෙන්න. මේ ගිවිසුම යටතේත්, ව්‍යවස්ථාව යටතේත් අපට එය ලබා දෙන්න යුතුකමක් තිබෙනවා. මම ඉස්සෙල්ලාම කියන්නේ, අපට ඒක ලබා දෙන්න කියලායි. මොකද ඒක අපට වැදගත් කාරණයක්. මේක හංගන්න බැහැ. ඒ පිළිබඳව ගන්නා පියවර කුමක්ද කියලා අපට මේ සභාවේ කථා කරන්න තිබෙනවා. මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ ඉඳලා ගියා. ගන්න යන පියවර මොකක්ද කියලා එතුමා අපට කියන්න ඕනෑ. මොකක්ද IMF එකත් එක්ක කරපු මේ සාකච්ඡාව? මේ රටේ විදේශ විනිමය පාලනය කරන්නේ කොහොමද? ඒ පිළිබඳව ස්ථාවරභාවයක් ඇති කරගන්නේ කොහොමද? ඩොලරය අද රුපියල් 240ට ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒක පාලනය කළේ නැත්නම් අපි ඉවරයි. IMF එකට ගිහින් තමයි ඒක කරන්න වෙන්නේ. වෙනත් යෝජනා තිබෙනවා නම් කියන්න. වැදගත්ම ප්‍රශ්නය මේකයි. අද මිනිසුන් මේ රට දිහා බලන්නේ, "කිසිම උපදෙසක් දෙන්න බැරිවුණා" යයි කියන අදහසින්; "මේක විසඳන්න බැරි වුණා" යයි කියන අදහසින්. ආණ්ඩු පක්ෂය පැත්තේ වුණත්, මේ පැත්තේ වුණත් කියන්නේ ඒකයි.

අගමැතිතුමා කියනවා තාප්පවල පින්තූර ඇඳපු අය දැන් රට යන්න හදනවා කියලා. ඇයි ඔවුන් රට යන්නේ? ඔවුන්ට ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් නැහැ. මේ පාර්ලිමේන්තුවට වෙනත් ආණ්ඩුවක් පත් කරන්න පුළුවන් කියලා විශ්වාසයකුත් නැහැ. අන්න ඒකයි, ඔවුන් රට යන්නේ. ඒකයි අපිට තිබෙන ප්‍රශ්නය. විශේෂයෙන්ම මේ ආර්ථික ප්‍රශ්නවලින් දේශපාලන පිපිරීමක් ඇති වෙන්න පුළුවන්. එතැන තමයි අපි සියලුදෙනාම හිරවෙන්න යන්නේ. ඒ නිසා පළමුවෙන්ම ගරු මුදල් ඇමතිතුමාට අපි කියනවා, IMF එකත් සමඟ ඇති කරගත් ගිවිසුමේ 4වෙනි වගන්තිය යටතේ තිබෙන අදහස් හුවමාරුවේ සියලුම විස්තර පාර්ලිමේන්තුවට දෙන්න කියලා. එතැන ඉඳන් විවෘතව අපි කථා කරමු. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනැල්ලා, අදහස් හුවමාරු කර ගනිමු. අපි බලමු, ඉදිරියට යන්න පුළුවන්ද කියලා. මම විශේෂයෙන්ම යෝජනා කරන්නේ ඒකයි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද සමරසිංහ මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.02]

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම ගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් මේ අවස්ථාවේ දී මගේ ප්‍රශංසාව පුද කරනවා.

අතිගරු ජනාධිපතිතුමා අවුරුදු දෙකක කාලයක් මේ රජයට නායකත්වය ලබා දීලා නොයෙකුත් අභියෝග මැද්දේ, නොයෙකුත් ප්‍රශ්න මැද්දේ මේ රට පාලනය කළා. මේ රට තුළ ඇති වුණු ප්‍රශ්නවලට පමණක් නොවෙයි, ජාත්‍යන්තරයෙන් ආපු ප්‍රශ්නවලටත් මුහුණ දීලා මේ රට පාලනය කරමින් රටට විශාල වැඩ කොටසක් කරන්නත් එතුමා සමත් වුණා. අගමැතිතුමා ගැන කථා කළත්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ගැන කථා කළත්, මම විශේෂයෙන්ම මේ පිළිබඳව කියන්න ඕනෑ. මම ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කැබිනට් මණ්ඩල දෙකක සේවය කරපු කෙනෙක්. 2006 ඉඳලා 2015 දක්වා මම එතුමා යටතේ කැබිනට් අමාතිකම් කිහිපයක් දැරුවා. ඒ වාගේම, යුද්ධයෙන් පසුව මානව හිමිකම් පිළිබඳ එතුමාගේ විශේෂ නියෝජිතයා හැටියටත් මාව පත් කළා. ඇත්ත වශයෙන්ම ඒ කාලයේ දීත් එතුමාගේ උපදෙස් ලබාගෙන, මඟපෙන්වීම් ලබාගෙන ජාත්‍යන්තරයෙන් ආපු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න මට අවස්ථාව ලැබුණාය කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

යුද්ධය කාලයේ මම ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සමඟත් බොහොම කිට්ටුවෙන් කටයුතු කළා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, මානුෂීය ආධාර පිළිබඳව උපදේශන කමිටුවේ සභාපතිවරයා හැටියටත් මාව පත් කළා. මම ඒ කාලයේ මාසයකට දෙවතාවක් ආරක්ෂක අමාත්‍යාංශයට ගිහිල්ලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සමඟත්, ඒ කාලයේ ජනාධිපතිතුමාගේ ප්‍රධාන උපදේශක හැටියට කටයුතු කළ බැසිල් රාජපක්ෂ මැතිතුමා සමඟත් සාකච්ඡා කළා. අපි එක පැත්තක තෝරාගත් තානාපතිවරු වාඩි කරවනවා, ඒ වාගේම අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නේවාසික නියෝජිතවරු සියලුදෙනාම ගෙන්වා ගන්නවා, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නියෝජිතයින් ගෙන්වා ගන්නවා, තව පැත්තකින් අපි දිසාපතිවරු, ත්‍රිවිධ හමුදාව නියෝජනය කරන නිලධාරින් වගේ රජයේ නිලධාරින් ඒකට වාඩි කර ගන්නවා. අපි අවුරුදු දෙකහමාරක් තිස්සේ මාස දෙකකට වතාවක් මානුෂීය ආධාර ලබා දීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත්තේ ඒ කමිටුව හරහායි. බැසිල් රාජපක්ෂ මැතිතුමා තමයි එදිනෙදා මානුෂීය ආධාර ලබා දීමේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම මෙහෙයවූයේ. මම මගේ ඇස් දෙකෙන්ම දැක්කා, ඒ දෙපළ වැඩ කළේ කොහොමද කියලා. ඒ කාලයේ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බොහොම පැහැදිලි නායකත්වයක් ලබා දුන්නා. ඒ නායකත්වය තිබුණේ නැත්නම් අපට කවදාවත් ඒ දරුණු ත්‍රස්තවාදය නැති කරලා මේ රටට සාමය උදා කරගන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

දැන් නොයෙකුත් අය කොවිඩ් වසංගතය ගැන කථා කරනවා. කොවිඩ් නොවෙයි, එදා එල්ටීටීඊ සංවිධානය නැති කළේ නැත්නම්; ප්‍රභාකරන්ව නැති කළේ නැත්නම්, අද මේ රට බෙදිලා. ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි ඒ සඳහා අපේ ත්‍රිවිධ හමුදාපතිවරුන්ට, ඒ වීර සෙබළුන්ට නායකත්වය දුන්නේ. අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තමයි එදිනෙදා කටයුතු සම්බන්ධීකරණය කළේ. ඉතින්, ඒ දෙපළ මේ රටට විශාල සේවයක් කර තිබෙනවා. අද අපට සාමය ලැබී තිබෙන්නේ ඒ දෙපළගේ විශාල කැපවීම නිසාය කියන එක මේ අවස්ථාවේ මම කෘතවේදීව සිහිපත් කරන්න කැමැතියි.

[ගරු මහින්ද සමරසිංහ මහතා]

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ළඟදී එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගිහිල්ලා ප්‍රකාශයක් කළා, එතුමා සමඟ සාකච්ඡා කිරීමට ජාත්‍යන්තරයේ සිටින ශ්‍රී ලංකා ඩයස්පෝරාවලට අත දිගු කරනවා කියලා. එම ප්‍රකාශය කරන අවස්ථාවේ එතුමා කිව්වේ නැහැ, තහනම් කරපු සංවිධානවල ඩයස්පෝරාව හමුවෙන්නේ නැහැ කියලා. එහෙම නැත්නම්, තහනම් නොකරපු සංවිධානවල ඩයස්පෝරාවල අය විතරයි හමුවෙන්නේ කියලා එතුමා කිව්වේ නැහැ. සමස්තයක් හැටියට ඩයස්පෝරාව සමඟ සාකච්ඡා කරන්න සූදානම් කියලා තමයි එතුමා කිව්වේ. ඇත්ත වශයෙන්ම අපි ඒක තව දුරටත් විග්‍රහ කරන්න වුවමනාවක් නැහැ. අපි ජාත්‍යන්තරයේ කාටද කථා කරන්න ඕනෑ කියන එකයි බලන්න ඕනෑ. මොකද, අද අපි ඩයස්පෝරාව ගැන කථා කරනකොට දෙමළ ඩයස්පෝරාව ගැන විතරක් නොවෙයි මේ කථා කරන්නේ. සිංහල, මුස්ලිම් ඩයස්පෝරා තිබෙනවා. විශේෂයෙන්ම බටහිර රටවල සිටින විශාල ව්‍යාපාරිකයෝ හැටියට, නැත්නම් ලොකු ලොකු රැකියා කරන අය හැටියට ඔවුන් විශාල මුදලක් හම්බ කරනවා.

මේ අය තවම ශ්‍රී ලංකාව දිහා බලන්නේ තමන්ගේ රට හැටියටයි; මව් බිම හැටියටයි. අපි ඒ අය සම්බන්ධ කර ගන්න ඕනෑ. ඒ වාගේම අපට අයහපත් දේවල්, අහිතකර දේවල් කරනවා කියන ඒ සංවිධානත් එක්ක කථා කළාට ප්‍රශ්නයක් නැහැ. කථා කළේ නැත්නම් අපි දන්නේ කොහොමද, ඒ ගොල්ලන්ගේ මතය මොකක්ද කියලා? මොකද, ඒ ගොල්ලනුත් ශ්‍රී ලාංකිකයෝ. ඒ අයත් එක්ක අපි යම් කිසි මට්ටමක කථාවක් කරන්නේ. ඒ සඳහා අපි පසුබිමක් සකස් කරලා සාකච්ඡාවක් කරන එක හොඳ පණිවුඩයක් කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියා. එතුමා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය ගැන කථා කළා. මානව හිමිකම් කවුන්සලය ඉතාම වැදගත් ස්ථානයක්. මානව හිමිකම් කවුන්සලයේ වෙන්නේ මොකක්ද කියන එක පිළිබඳ අපි නිතර නිතර පසුවිපරම් කරන්න ඕනෑ. අපි නොයෙකුත් අවස්ථාවලදී මානව හිමිකම් කවුන්සලයේ කටයුතුවලදී ජය අරගෙන තිබෙනවා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිතුමා වශයෙන් සිටියදී ශ්‍රී ලංකාවට එරෙහිව ගෙනා යෝජනාවක් අපි පරාජයට පත් කළා. හැබැයි, පසුගිය වකවානුවල අපි අන්ත පරාජයන්ටත් ලක් වුණා. මානව හිමිකම් මහ කොමසාරිස් කියන හැම දෙයක්ම ඇත්ත කියලා හිතන්නත් අපට බැහැ. මොකද, ඒ අයටත් නොයෙකුත් තැන්වලින් එන විවිධ පණිවුඩ, එහෙමත් නැත්නම් තොරතුරු අනුව තමයි සමහර වෙලාවලදී ඒ ප්‍රකාශ නිකුත් කරනවා අපි දැක තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි 5ක් දෙන්න පුළුවන් කියා කිව්වා.

අපි මානව හිමිකම් කවුන්සලය ගැන කථා කරනකොට, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ සාමාජික රටවල් 47 පිළිබඳ අපේ විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. කවුරුන් හෝ අපට විරුද්ධව යෝජනාවක් ගේනවා නම්, මේ රටවල් අපට - ශ්‍රී ලංකාවට- විරුද්ධයි කියලා හිතන්න හොඳ නැහැ. මේ, අපේ මිත්‍රයෝ. මේ අය, යෝජනාවක් ගෙනාවා කියලා ලංකාවට ආධාර නොකර ඉන්නේ නැහැ. සමහර රටවල් ආයෝජකයෝ හරහා, සෘජු විදේශ ආධාර හරහා තවමත් ලංකාවට විශාල මුදලක් ලබා දෙන්න කටයුතු කරනවා. ඇමෙරිකාව ගත්තාම, අපේ සමස්ත අපනයනයෙන් සියයට 25ක් යවන්නේ ඇමෙරිකාවට. අපි යුරෝපා සංගමයට විශාල ප්‍රමාණයක් අපනයනය කරනවා. අපට GSP Plus සහනය දීලා තිබෙන නිසා එය පදනම් කරගෙන market access එකක් ලැබිලා තිබෙනවා. ඉතින් මේ රටවල් තරහා කර ගන්න හොඳ නැහැ. මේ රටවල් එක්ක හොඳ සුහදතාවක් ගොඩ නහන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඒ අය අපට විරුද්ධව යෝජනාවක් ගේනවා නම්, අපි ඒ අයට දොර වහන්න හොඳ නැහැ. අපි ඒ අයත් එක්ක එක දිගටම කථා කරගෙන ගිහිල්ලා ලංකාවේ කරන වැඩ කොටස නිවැරදිව වාර්තා කරන්න ඕනෑ. ඒ වාගේම අපට තවත් බොහෝ දේවල් කරන්න තිබෙනවා. අපි දැන් ඒවා කරගෙන යනවා.

මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ කථාවේදී ඊයේ එතුමා පෙන්නුම් කර දුන්නා, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වශයෙන් කටයුතු කරන කාලයේදී උතුරු-නැඟෙනහිර කොච්චර සංවර්ධනයක් කළා ද කියලා. අපි තවමත් ඒ සංවර්ධන කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම ස්වාධීන කොමිෂන් කිහිපයක් පත් කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්න කොමිසමක් - Commission of Inquiry - පත් කර තිබෙනවා. Office for Reparations කියලා එකක් තිබෙනවා. Office on Missing Persons කියලා එකක් තිබෙනවා. දැන් මේවායේ කටයුතු කරගෙන යනවා. මේවායේ ප්‍රගතිය නියමිත වෙලාවට වාර්තා කර මීට වඩා තවත් ප්‍රගතියක් අපට පෙන්නුම් කරන්න පුළුවන් නම්, මම හිතන්නේ හුඟක් දුරට මේ ප්‍රශ්න නිරාකරණය කර ගන්න අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවසාන වශයෙන් දෙයක් කියන්න ඕනෑ. මේක පෞද්ගලික ප්‍රකාශයක්. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මගෙන් ඉල්ලීමක් කළා, ඇමෙරිකාවේ තානාපති හැටියට වැඩ භාර ගන්න කියලා. මම ඒ ඉල්ලීම භාර ගත්තා. මම තවත් දවස් දෙකකින්, තුනකින් පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා 29 වෙනිදා වෙනකොට ඇමෙරිකාව බලා පිටත් වෙන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම දැනට මාසයකට පමණ ඉහත දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිබුණු ඡන්දයකදී ඇමෙරිකාව විශාල ජයග්‍රහණයක් ලබාගෙන මානව හිමිකම් කවුන්සලයේ සාමාජිකයෙක් හැටියට පත් වුණා.

ඒ අය ලබන අවුරුද්දේ ජනවාරි පළමුවෙනිදා සාමාජිකත්වය භාර ගන්නවා. මානව හිමිකම් කවුන්සලයට ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයා හැටියට ගිහිල්ලා ලැබූ මගේ අවුරුදු 10ක අත්දැකීම්වලින් මට කියන්න පුළුවන්, එතැනට ගියාම ඇමෙරිකාව තමයි නායකත්වය ගන්නේ කියලා. ඒ නිසා ඇමෙරිකාව එක්ක අපේ සුහදතාව, සම්බන්ධතාව වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් හැටියටයි ඇත්ත වශයෙන්ම මම දකින්නේ. ආර්ථික වශයෙන් පමණක් නොවෙයි, දේශපාලන වශයෙනුත් අපි මීට වඩා හොඳ සම්බන්ධතාවක් ගොඩ නහන්න ඕනෑ කියන මතයේ තමයි අතිගරු ජනාධිපතිතුමාත් ඉන්නේ. ඉතින් මේ කටයුත්ත කරන්න තමයි මම යන්නේ. මා මෙවරත් මේ පාර්ලිමේන්තුවට පත් කළ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. මම අවුරුදු 27ක් එක දිගටම -නොකඩවා- මේ පාර්ලිමේන්තුවේ සේවය කර තමයි මේ ඉවත් වන්නේ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මගේ දේශපාලන

ජීවිතය අවුරුදු 33ක්. අවුරුදු 6ක් මම පළාත් සභාවේ ඇමතිවරයෙකු හැටියට කටයුතු කළා. අවුරුදු 27ක් මම මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. එම කාලය තුළ මම මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයත් හොබවා තිබෙනවා. ඒ කාලය තුළදී මම මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභා ගණනාවකට නායකත්වය ලබා දී තිබෙනවා. එය මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. මම මේ අත්දැකීම් ඉදිරියට තවත් වර්ධනය කර ගන්නවා. මම දේශපාලනයෙන් ඉවත් වන්නේ නැහැ. මම යන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීමක් මත රටට සේවයක් කරන්නයි. එහි සිට රටට සේවය කරන ගමන් නැවත වරක් මව් බිමට පැමිණ ඉදිරියටත් දේශපාලනය කරමින් කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට නායකත්වය ලබා දෙන්න මම සූදානමින් ඉන්නවා කියන කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.14]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි කථා කරනේන් රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයට අත්‍යවශ්‍ය, අනිවාර්යයෙන්ම එම ක්‍රියාවලියට වැදගත් ආයතන කිහිපයක් පිළිබඳවයි. විධායකය, අධිකරණය සහ ව්‍යවස්ථාදායකය කියන්නේ ඇත්ත වශයෙන්ම මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ අත්‍යවශ්‍ය කුලුනු 3ක්. හැබැයි, මේ වනකොට මේ කුලුනු 3 පිළිබඳවත්, සමස්ත දේශපාලනය පිළිබඳවත් ජනතාව අතර ඇතිවෙලා තිබෙන්නේ පුදුමාකාර අප්‍රසාදයක්. විශේෂයෙන්ම ව්‍යවස්ථාදායකය ගැන කථා කරනකොට පාර්ලිමේන්තුවේ සිටින 225දෙනාටම හෙණ ගහන්න කියලා තමයි අද ජනතාව කියන්නේ. ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියක දේශපාලනය සහ දේශපාලනඥයන් ගැන මෙපමණ අවිශ්වාසයක් සහ පිළිකුලක් ඇති වන එක අතිශයින්ම භයානක කාරණයක්. මේ පිළිබඳව අපි බැරෑරුම් ලෙස සිතිය යුතුයි. විශේෂයෙන්ම මෙයට පාදක වන ප්‍රධාන හේතුවක් වන්නේ පාර්ලිමේන්තුව තුළ අපි හැසිරෙන විධියත්, අපි එකිනෙකාට සලකන විධියත්, ගෞරව කරන විධියත්. ඒ දේවල් ගැන මේ වනකොට ජනතාව බොහෝ අප්‍රසාදයෙන් සිටින්නේ. සමාජ මාධ්‍ය දෙස බලනකොට, සමාජ මාධ්‍යයේ කියන දේවල් දෙස බලනකොට ඒ පිළිකුල කොච්චර දුරට ගිහිල්ලාද කියන එක අපට තේරුම් ගන්න පුළුවන්. එක්සත් ජාතීන් විසින් නොවැම්බර් මාසයේ 25 වෙනිදා සිට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීම පිළිබඳ දින 16ක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒකට අපේ කාන්තා සංසදයේ සිටින සියලු මන්ත්‍රීවරියන් සම්බන්ධයි කියා මා සිතනවා. විවිධ අවස්ථාවලදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව කථා කරන්න අපට ආරාධනා ලැබී තිබෙනවා. අවාසනාවකට හේතු වෙලා තිබෙන්නේ එම ප්‍රචණ්ඩත්වය පිළිබඳ අපට මේ පාර්ලිමේන්තුවේදීත් කථා කරන්න සිදුවීමයි. මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරියන් 12දෙනාටත් එවැනි ප්‍රචණ්ඩත්වයකට -විශේෂයෙන් වාචිකව- මුහුණ දෙන්න සිදු වෙලා තිබීම පිළිබඳව මේ කාලයේ කථා කරන්න සිද්ධ වීම අවාසනාවක් කියලා මා සිතනවා.

මෙතැනදී මම එක පුද්ගලයෙක් ගැන නොවෙයි කථා කරන්නේ. සමස්තයක් හැටියට ගත්තාම, අපේ මේ පාර්ලිමේන්තුව තුළම අපි දකිනවා, කාන්තාවන්ට ඉතාම පහත් විධියට, හිංසාකාරී විධියට කථා කරන භාෂාවත්, පාවිච්චි කරන වචනත්. අවාසනාවකට මේක ඒ විධියට වචන පාවිච්චි වන පළමුවන වතාවත් අවසාන වතාවත් නොවෙයි. අපට එය පිළිගන්න වෙනවා. විශේෂයෙන්ම අපේ රටේ පාර්ලිමේන්තුවේ සහ දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය ඉතාම අඩු බව ජාත්‍යන්තර මට්ටමිනුත් කථා කරන අවස්ථාවක මෙවැනි සිද්ධි පාර්ලිමේන්තුව තුළ සිද්ධ වෙනකොට දේශපාලනය ගැන තිබෙන පිළිකුළ එන්න එන්න වැඩි වෙන එක තමයි සිද්ධ වෙන්නේ. මෙතැනදී මම එක මන්ත්‍රීවරයෙකුට විතරක් නොවෙයි, ඒ චෝදනාව කරන්නේ. එතුමාට අනුබල දෙන, එතුමාට අනුමත කරන, එතුමාට අත්පුඩි ගහන අපි කවුරු වුණත් ඒ සියලුදෙනාම ඒ වගකීම භාර ගන්න ඕනෑ. ඒ මේ පාර්ලිමේන්තුව තුළ ඇති වෙලා තිබෙන සංස්කෘතිය. ඒ සංස්කෘතිය තමයි අපේ ජනතාව දැන් පිළිකුල් කරන්නේ; ප්‍රතික්ෂේප කරන්නේ. ඒ පණිවුඩයට අපි ඇහුම්කන් දෙන්නේ නැත්නම්, ඒ ප්‍රතික්ෂේප කිරීමට ඇහුම්කන් දෙන්නේ නැත්නම්, ජනතාව විසින් මේ සංස්කෘතියට කරන ඒ විවේචන, මේ දේශපාලන සංස්කෘතියට කරන විවේචනය සහ ඒ පිළිබඳ ඔවුන්ගේ තිබෙන පිළිකුළ අපි තේරුම් ගන්නේ නැත්නම්, අපි ඒක වෙනස් කරන්නේ නැත්නම් ඇත්තටම මොකක්ද ඇති වැඩේ? මේ අවස්ථාවේ අපි මේ ගැන දරන වගකීම මොකක්ද කියලා මම හිතන හැටියට අපි 225දෙනාම හිතන්න ඕනෑ. මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, කාන්තා සංසදයේ සභාපති ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියට. එතුමිය ඉතාම අමාරු මොහොතක වුණත්, අපි වෙනුවෙන් සහ මේ රටේ සමස්ත කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටීම ගැන මම එතුමියට ස්තුතිවන්ත වෙනවා. නමුත් මෙය අපි, මන්ත්‍රීවරියන් 12දෙනාගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මේක මේ මන්ත්‍රීවරු 225දෙනාගේම ප්‍රශ්නයක්. වචනයකින්වත්, බැල්මකින්වත් එවැනි හැසිරීම් අනුමත කරනවා නම්, ඒකට අපි 225දෙනාම වගකියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මම හිතන හැටියට අපි පිළිබඳවත්, අපි දරන වරප්‍රසාද පිළිබඳවත් ජනතාව අතර විශාල කම්පනයක් තිබෙනවා; පිළිකුළක් තිබෙනවා. මම පොඩි උදාහරණයක් ගන්නම්. ඊයේ ඡන්දය ඉවර වෙලා අපි එළියට යනකොට වාහන තදබදයත් එක්ක එතැන ඇති වෙනවා පොඩි කලබල ස්වභාවයක්. නමුත් එතැනදී වුණත්, මේ පාර්ලිමේන්තු පරිශ්‍රය ඇතුළේ වුණත් අපි වාහනය එළියට ගන්නකොට සමහර මන්ත්‍රීවරුන්ගේ වාහන පාර්ලිමේන්තුවේ අර තණකොළ උඩින් ගිහිල්ලා තමයි අනික් වාහනය පසු කරගෙන යන්නේ. නැත්නම් lane එකේ වැරදි පැත්තෙන් ඇවිල්ලා ඉස්සරහට දාන්න හදනවා. මේක ඇතුළේවත් අපට සංවරව යම්කිසි විධියක නීතියක් පිළිපදින්න බැරි නම් එළියේ කොහොමද?

ඒ වගේම මෙතැන වරප්‍රසාද ගැන කථා කරනකොට, අපි ජනතාවට වඩා විශේෂයි, අපි ජනතාවට වඩා උඩින් ඉන්නේ කියන පණිවුඩය යන එක තමයි හරිම භයානක. ඒක ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ කොහොමටවත් පිළිගන්න පුළුවන් දෙයක් නොවෙයි. නමුත් අඩු තරමින් අපට රටේ නීතියට ගරු කරන්න බැරි නම් ඇති වැඩේ මොකක්ද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කියන්නේ රටේ නීතියට උඩින් ඉන්න අය නොවෙයි. අපිත් මේ රටේ නීතියට අවනත වෙන්න ඕනෑ. හැබැයි, නීතිය කඩ කරලා ඒ වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරනකොට මොනම ආණ්ඩුවක් වුණත් ඒක පළිගැනීමක් හැටියට අර්ථ කථනය කරනවා නම්,

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

කොහොමද ඒක අපි අනුමත කරන්නේ? ඕනෑ කෙනෙක්, කවුරු වුණත්, මොන ආණ්ඩුවක්, මොන දේශපාලන පක්ෂයක් නියෝජනය කළත් පළමුව අපි රටේ නීතියට ගරු කරන්න ඕනෑ. "එක රටක් - එක නීතියක්" කියන එක යටතේ අපි සියලුදෙනාටම බලපාන නීතියක් තිබෙනවා. ඒකට අපි ගරු කරන්නේ නැත්නම්, කවුරු හරි ඒ නීතිය කඩ කරනවා නම්, ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නට රටේ අධිකරණ පද්ධතියක් තිබෙනවා. අධිකරණ පද්ධතිය ක්‍රියාත්මක වෙනකොට කොහොමද ඒක පළිගැනීමක් වෙන්නේ? අපි ඒක පළි ගැනීමක් හැටියට අර්ථ කථනය කරනවා නම්, ඒක අතිශයින්ම භයානකයි. ඒ හරහා අපි දෙන පණිවිඩය මොකක්ද? අපි මොකක්ද ඒකෙන් සන්නිවේදනය කරන්නේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, ආණ්ඩුවත් එක්ක සම්බන්ධ කවුරුවත් අධිකරණය ඉස්සරහට ගේන්න බැහැ, ඔවුන් නීතිය කඩ කළත් ඔවුන්ට චෝදනා කරන්න බැහැ, ඔවුන්ට මොකක් හරි investigation එකක් කරන්න බැහැ, ඒක පළිගැනීමක් වෙනවා කියලා අපි කියනවා. එහෙම වෙන්නේ කොහොමද? මොකද, මේ රටේ පාර්ලිමේන්තුවටවත්, ආණ්ඩුවටත් සම්බන්ධ නැති මිනිස්සු වැරදි කරනකොට ඒ ගොල්ලන්ට ඒ excuse එක නැහැ නේ. ඒ ගොල්ලන්ට කියන්න බැහැ නේ, "පොලීසිය අපෙන් පළිගන්නවා" "ආණ්ඩුව අපෙන් පළිගන්නවා" කියලා. එතකොට, මේ 225දෙනාට විතරක් ඒක පළිගැනීමක් වෙන්නේ කොහොමද ?

අපි කවුරු වුණත් මොකක් හරි වැරැද්දක් කළොත්, ඒක අධිකරණය ඉදිරියේ පරීක්ෂා විය යුතුයි. ඊට පස්සේ, අපේ වරදක් නැත්නම් අධිකරණයෙන් අප නිදහස් කරයි. අඩු ගණනේ ඒ ක්‍රියාවලියවත් සිද්ධ වෙන්න ඕනෑ. ඒ ක්‍රියාවලියට අපි බාධා කරනවා නම්, ඒ ක්‍රියාවලියට යන්න දෙන එකත් පළිගැනීමක් හැටියට දකිනවා නම් මොකක් ද ඇති වෙඩේ? "එක රටක් - එක නීතියක්" ගැන කථා කරන්න ඉස්සෙල්ලා, අපි සියලුදෙනාම මේ වරප්‍රසාද කියන එක තේරුම් අරගෙන තිබෙන විධිය ගැන නැවත වතාවක් හිතන්න ඕනෑ. අපට වරප්‍රසාද තිබෙනවා කියන්නේ, අපි ජනතාවට වඩා ඉහළින් ඉන්නවා කියන එක නොවෙයි. ඒකෙන් කියන්නේ ජනතාවගෙන් ඈත්වෙලා වෙනම කොට්ඨාසයක් හැටියට ඉන්නවා කියන එක නොවෙයි. විශේෂයෙන්ම මේ රටේ තිබෙන නීතිය අපේ රටේ වාසය කරන සියලුදෙනාටම එක සේ බලපානවා කියන එක අපි මුලින්ම පිළිගන්න ඕනෑ.

මේ විවාදයට අදාළව මට තව කියන්න ඕනෑ දෙයක් තිබෙනවා. අපේ රටේ ස්වාධීන කොමිෂන් සභා කිහිපයක් තිබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළත් ඒ පිළිබඳව සඳහන් වෙනවා. මේ ස්වාධීන කොමිෂන් සභා පත් වුණු ඉතිහාසය පිළිබඳව මීට කලිනුත් මේ ගරු සභාවේදී අපි කථා වෙලා තිබෙනවා. ඒ ස්වාධීන කොමිෂන් සභා අතිශයින්ම වැදගත් වෙනවා, අපේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය, ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීම සහ යම්කිසි විධියකට නැවත වතාවක් ජනතාව තුළ අපේ දේශපාලනය සහ රජය ගැන යම්කිසි විශ්වාසයක් ඇති කරන්න. නමුත්, දැන් ඒවා පිළිබඳව විශාල ප්‍රශ්න රාශියක් මතුවෙලා තිබෙනවා. ඒවායේ ස්වාධීනත්වය පිළිබඳව, ඒවාට මිනිස්සු පත් කරන ක්‍රියාවලිය පිළිබඳව, ඒවාට ක්‍රියාත්මකවීමට තිබෙන නිදහස පිළිබඳව ප්‍රශ්න රාශියක් මේ වන විට පැන නැඟිලා තිබෙනවා. විශේෂයෙන්ම මේ වන විට අපේ රටේ මානව හිමිකම් කොමිසමට සභාපති කෙනෙක් නැහැ. මම හිතන විධියට මාසයකට අධික කාලයක් ගත වෙලාත්, තවම එම සභාපති ධුරය පුරවලා නැහැ. හිටපු සභාපති resign වෙලා, ඔහුගේ කාලය අවසන් කරලා තිබෙනවා. නමුත්, තවමත් අලුත් කෙනෙක් පත් කරලා නැහැ. මේක ඉතාම වැදගත් ස්වාධීන කොමිෂන් සභාවක්. මානව හිමිකම් කොමිෂන් සභාව කියන්නේ මේ රටට විතරක් බලපාන දෙයක් නොවෙයි. මේ රටේ මානව හිමිකම් සංස්කෘතිය සහ මානව හිමිකම් රැක ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ ජාත්‍යන්තරය වුණත් විමසුමෙන් ඉන්නේ, අපේ මානව හිමිකම් කොමිසම ක්‍රියාත්මක වෙන විධිය ගැන. මානව හිමිකම් කොමිසමේ සභාපති ධුරය තවම පුරවලා නැහැ කියන්නේ, මම හිතන විධියට බරපතළ වැරැද්දක්. මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා, එම සභාපති ධුරය පුරවනකොට ඉතා කල්පනාකාරීව සුදුසු කෙනෙක් පත් කරන්න කියලා. ජනාධිපතිතුමාට තමයි ඒ පත් කිරීමේ බලය තිබෙන්නේ. එම නිසා මේ තනතුරට පත් කිරීම ඉතාම කල්පනාකාරීව කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මොකද, මෙම කොමිසම හැල්ලුවට ලක් වෙන විධියට හෝ එම කොමිසමේ තිබෙන බලතල යම්කිසි විධියකට compromise වෙන විධියට ඒ පත්වීම සිද්ධ නොවිය යුතුයි. ඉස්සරහට අපට මානව හිමිකම් සම්බන්ධයෙන් විශාල අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙන බව අපි දන්නවා. ඒක අපේ ඉතිහාසය පුරාම අපට සිද්ධ වෙන දෙයක්. එවැනි අවස්ථාවලදී මානව හිමිකම් කොමිසමේ සභාපති ධුරය කියන්නේ අතිශයින්ම වැදගත් තනතුරක්. එම තනතුරට ඇත්තටම කාගෙන්වත් චෝදනා ලබන්න බැරි, සුදුසු පුද්ගලයෙක් පත් විය යුතුයි කියන එක මම අවධාරණය කරනවා.

ඒ වාගේම, අපේ තිබෙන ස්වාධීන කොමිෂන් සභා දැන් වෙනකොට ඇත්ත වශයෙන්ම දේශපාලනඥයන්ගේ යාලුවන්ට යම්කිසි ත්‍යාග පිරිනමනවා වාගේ දෙයක් විධියටයි අපට පේන්නේ. තමන්ගේ හිතවතුන් විවිධ තනතුරුවලට පත් කිරීම දේශපාලනඥයන්ගේ patronage system එක තවත් පුළුල් කරන එකක් බවට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තුළින් මේ ස්වාධීන කොමිෂන් සභාවල ස්වාධීන බවත්, ඒ නිලධාරීන්ට ක්‍රියාත්මක වීමේදී තිබෙන නිදහසත් ඉතාම බැරෑරුම් ලෙස දුර්වල වෙනවා. ඒ නිසා ස්වාධීන කොමිෂන් සභාවල වැදගත්කම නැවත වතාවක් අපි සිහිපත් කළ යුතුයි.

විශේෂයෙන්ම අපි ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනකොට අපිට කියන්න පුළුවන්, "ඔව්, දැන් අපිට අරගළ කරන්න නිදහස තිබෙනවා. අපිට ස්ට්‍රයික් කරන්න නිදහස තිබෙනවා. අපිට කවුරුවත් ඇවිල්ලා ගහන්නේ නැහැ. කවුරුවත් බවුසර්වලින් වතුර ගෙනැල්ලා ගහන්නේ නැහැ" කියලා. එහෙම තමයි ඒක විය යුත්තේ. ඒක එහෙම වෙන්නේ නැත්නම් ඒක තමයි ප්‍රශ්නය. ඒ ගැන අපි වැඩියෙන් කියන්න ඕනෑත් නැහැ, ඒක මහ ලොකු දෙයක් වෙන්න ඕනෑත් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී රටක වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන්, ජනතා අරගළ වෙනුවෙන් පාරට බහින්න අයිතියක් තිබෙනවා. වතුර පාරවල්වලට යට නොවී ඉන්න අයිතියක් තිබෙනවා. පොලිස් බැට නොකා ඉන්න අයිතියක් තිබෙනවා. ඒක වරප්‍රසාදයක් නොවෙයි; ඒක අයිතියක්. ඒක තහවුරු කිරීම ඕනෑම රජයක, ඕනෑම ආණ්ඩුවක වගකීමක් වෙනවා. එය එසේ නොවනවා නම් තමයි ප්‍රශ්නය. එසේ වෙනවා නම්, ඒක තමයි සාමාන්‍ය තත්ත්වය. අසාමාන්‍ය තත්ත්වය කියන්නේ, ප්‍රජාතන්ත්‍ර විරෝධී විධියට දේවල් සිද්ධ වෙන එක. එම නිසා අපිට තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය ගැන හිතනකොට, අපේ ප්‍රජාතන්ත්‍රවාදය රැකගන්නා සංස්කෘතියත්, අපේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන ආයතනවල ස්වාධීනත්වයත්, නිදහසත් ගැන තමයි, අපට විශේෂයෙන්ම කථා කරන්න තිබෙන්නේ. එහිදී පාර්ලිමේන්තුවේ අපි 225දෙනා මේ ගරු සභාවේ හැසිරෙන විධිය තුළින් ජනතාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි ඇති කරන කලකිරීම ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව කරන විශාලම අභියෝගය වෙන්න පුළුවන්.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.00 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. **1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The Hon. Rohitha Abegunawardhana.

[අ.භා. 1.00]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී අද කථා කරන වැය ශීර්ෂ අතරින් අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මීට වසර දෙකකට පෙර අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හැටනව ලක්ෂයක ජනතා වරමින් මේ රටේ ජනාධිපති ධුරයට පත් වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ හිටපු විධායක ජනාධිපතිවරු ගත්තාම, පළමු විධායක ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා. ඊට පසු හිටියා ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා, ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. මේ කියන සියලු ජනාධිපතිවරු එක්ක සංසන්දනාත්මකව බැලීමේදී, වත්මන් ජනාධිපතිතුමා දේශපාලන ධාරාවක -ප්‍රාදේශීය සභාවකවත්- හිටපු නැති කෙනෙක් වුණත් එතුමා මේ රටේ නව වෙනසක් ඇති කරපු නායකයෙක්. එය මුලින්ම ඔප්පු කළේ, එතුමාගේ දේශපාලන වේදිකාවේ. එතුමා එදා ජනාධිපති අපේක්ෂකයා හැටියට කටයුතු කරද්දී තමන්ගේ ප්‍රතිවාදී අපේක්ෂකයාගේ නම එකම දේශපාලන වේදිකාවකවත් කිව්වේ නැහැ. ඒක ඉතාම හොඳ, වැදගත් ගුණාංගයක්. මොකද, අපි පුරුදු වෙලා තිබෙන්නේ හැම වෙලාවේම ප්‍රතිවිරුද්ධ කෙනාට මඩ ගහන්න, නොයෙකුත් දේවල් කියන්න. ඒ සම්ප්‍රදායෙන් ඉවත් වෙලා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නව සම්ප්‍රදායක් කරා, නව දේශපාලන ප්‍රවාහයකට මේ රට අරගෙන ගියාය කියන එක අපි පිළිගන්න ඕනෑ. ඒ නිසා තමයි එතුමාට ජනතා ආශිර්වාදය ලැබුණේ. ඒ ලැබුණු ජනතා ආශිර්වාදයත් එක්ක එතුමා බලයට ආවට පස්සේ මොකක්ද කළ වෙනස? එතුමාට ඕනෑ කර තිබුණා, ජනතාවට අලුත් දෙයක්, අලුත් දේශපාලන වැඩ පිළිවෙළක් පෙන්වන්න.

ඡන්දයක් අවසාන වුණාට පස්සේ ඒ පත් වෙන රාජ්‍ය නායකයාගේ ඡායාරූපයක් - photo එකක් - රාජ්‍ය ආයතනවල එල්ලන පුරුද්දක් ඉතිහාසයේ ඉඳලාම තිබුණා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණු ගමන් කිව්වා, රාජ්‍ය ලාංඡනය විතරක් රාජ්‍ය ආයතනයේ තබන්න. මගේ ඡායාරූපයක් - photo එකක් - එල්ලන්න එපා කියලා. රාජ්‍ය නායකයෙක් හැටියට එතුමා හොඳ පණිවුඩයක් ලබා දුන්නේ. මොකද, සමහර වෙලාවට ආණ්ඩු මාරු වුණාට පස්සේ හිටපු රාජ්‍ය නායකයාගේ photo එක ගලවලා පොඩි කරලා, අලුත් රාජ්‍ය නායකයාගේ photo එක එල්ලනවා. අන්න! ගැටුමක මුල. නමුත්, දැන් එහෙම දෙයක් නැහැ. මේවා සාමාන්‍ය ජනතාව අගය කළ යුතු දේවල්. එතුමා ජනාධිපති ධුරයට පත්වන විට ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන 928ක් තිබුණා.

ඒ වාහන 928න් සැහෙන ප්‍රමාණයක් වෙනත් අමාත්‍යාංශවලට ලබා දීලා එතුමාගේ ජනාධිපති ලේකම් කාර්යාලය තුළ දැනට පාවිච්චි කරන්නේ වාහන 386යි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපති කාර්යාලයේ තිබෙන වාහන 542ක් ස්වේච්ඡාවෙන් අනෙකුත් ආයතනවලට ලබා දීලා තිබෙනවා. මේවා අගය කළ යුතු දේවල්. ඊළඟට, තවත් කාරණයක් තිබෙනවා. ඒ මොකක්ද? එතුමා නිල නිවාසයක් පාවිච්චි කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාට ජනාධිපති මන්දිරය තිබෙනවා. නමුත් එතුමා ජනාධිපති මන්දිරයට ගියේ නැහැ. නුගේගොඩ පැඟිරිවත්තේ තිබෙන එතුමාගේ නිවස ඉතාම කුඩා නිවසක්. එතැන තමයි එතුමා ඉන්නේ.

මම මේ වෙලාවේ තව කාරණයක් කියන්න ඕනෑ. මම මේ කාටවත් වෛර කරනවා හෝ කාටවත් ද්වේෂසහගත ලෙස කථා කරනවා නොවෙයි. ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. මගේ පෞද්ගලික අදහස මම කියන්න ඕනෑ. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නිල නිවාසය තිබියදීත් තවත් නිල නිවාස දෙකක් එකතු කරලා නිල නිවාසයක් හැදුවා. මම ඒකට විරුද්ධ ඇයි? ජේ.ආර්. ජයවර්ධන මහතාගෙන් පටන් අරගෙන, හිටපු ජනාධිපතිවරු සියලු දෙනාම තිබෙන නිල නිවාසයට අමතරව නිල නිවාස හැදුවා නම් අවසානයේ මොකක්ද වෙන්නේ? ජනාධිපතිවරු සියයක් හිටියා නම් රටේ නිල නිවාස සියයක් තිබෙනවා. ඒ කියන්නේ තිබෙන නිල නිවාසවලට අමතරව. එන එන ජනාධිපති කියයි "නැහැ, මම වෙනම එකක් හදනවා. මට ඒකේ ඉන්න ඕනෑ" කියලා. එහෙම කියලා වෙනම නිල නිවාසයක් හදනවා. මේ සම්ප්‍රදාය සාධාරණද, අසාධාරණද කියන එක ජනතාව තමයි තීන්දු කරන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ සම්ප්‍රදායට තිත තැබුවා. එතුමා බොහොම සරලව ඒ වගකීම ඉටු කළා.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළිනුත් එතුමා තමන් කවුද කියන එක බොහොම පැහැදිලිව පෙන්නුවා. එතුමාට ලැබුණේ බොහොම අභියෝගාත්මක කාලයක්. එතුමා අපේ හිටපු ජනාධිපතිවරු සියලු දෙනාටම වඩා වැඩි අභියෝගයක් භාර ගත්තු ජනාධිපතිවරයෙක්. ගෝලීය වසංගතයකට මුහුණ දීලා, ආර්ථික වශයෙන් වැටුණු රටක් ගොඩගන්නේ කොහොමද කියන අභියෝගයට එතුමාට මුහුණ දෙන්න සිදු වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රට ආර්ථික වශයෙන් වැටුණා කියන්නේ ඇයි? පාස්කු ප්‍රහාරය සිද්ධ වෙලා, 2015 - 2019 ආණ්ඩුව ආර්ථිකය විනාශ කරලායි අපට රට භාර දුන්නේ. එලෙස භාර දුන්නේ අංශභාගය හැදිච්ච රෝගියෙක්. ආර්ථිකය paralyze වෙලා තිබුණේ. අංශභාගය හැදිච්ච - paralyze වුණු - රෝගියෙකුට කොවිඩ් හැදුණොත් කොහොම වෙයිද? නමුත්, අංශභාගය හැදිච්ච කෙනාට තේ දැන් කොවිඩ් හැදුණේ. ඒකනේ ආර්ථිකය ගැන කථා කරන්න වෙන්නේ. වෙන රටවලට කොවිඩ් හැදීම, ශක්තිමත් කෙනෙකුට කොවිඩ් හැදුණා වාගේ.

අද අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කළා, අධිකරණයේ ස්වාධීනත්වය ගැන. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක අධිකරණයේ ස්වාධීනත්වය ඇති වුණා කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ අධිකරණයේ ස්වාධීනත්වය තිබුණා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ අධිකරණයේ ස්වාධීනත්වය නැහැ" කියා එතුමා කිව්වා. එතුමා මේ

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

වෙලාවේ සභාවේ නොසිටියත් මම එතුමාට මේ කාරණය කියන්න කැමැතියි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ අධිකරණයේ ස්වාධීනත්වය තිබිලාත් කටයුතු සිදු වුණේ කොහොමද? අපි ගනිමු, පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රී දුමින්ද සිල්වා මහත්මයා සම්බන්ධ කාරණය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා සම්බන්ධ නඩුව අධිකරණයේ විභාග වන අවස්ථාවේදී මේ සභාව නියෝජනය කරපු හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් මොනවාද කළේ? ශානි අබේසේකර කියන නිලධාරියා සහ රන්ජන් රාමනායක කියන හිටපු නියෝජ්‍ය ඇමතිවරයාගේ කථාවල හඬ පට අපි ඇහුවා; ඒ සංවාදවලට ඇහුම්කන් දුන්නා. ඊට පස්සේ අපට අහන්න ලැබුණේ මොකක්ද? ඒ, හිටපු නියෝජ්‍ය ඇමතිවරයා අධිකරණයේ ඉන්න නඩුකාරතුමිය එක්ක ඒ නඩුව ගැන කථා කරන ආකාරයයි. කථා කරලා කියනවා, "මගේ පැතුමත්, ඔබේ පැතුමත් -එකම පැතුම- දුමින්ද සිල්වා හිරේ යවන එක" කියලා. මෙහෙම වෙන්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබියදී නේද? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අධිකරණයේ ස්වාධීනත්වය ඇති වුණා කියපු කිරිඇල්ල මන්ත්‍රීතුමාගෙනුයි මම මේ කාරණය අහන්නේ. ඒ විධියට නියෝජ්‍ය ඇමතිවරයෙක් ඒ නඩුව සම්බන්ධයෙන් නඩුකාරතුමියට කථා කරනවා නම්, ඒ නඩුව මෙහෙයවන පොලිස් නිලධාරියා ඒක පාර්ශ්විකව තමන්ගේ චේතනාවෙන්ම ඒ නඩුවට අදාළ පුද්ගලයා හිරේ යවන්න පුළුවන් අවශ්‍යතාව ඉටු කරනවා නම්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ අධිකරණයේ ස්වාධීනත්වයක් තිබිලාද? නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේවා, නම් විතරයි. මේවා, නම්වලට විතරක් සීමා කරගත්ත ඒවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියලා පාර්ලිමේන්තුව ඇතුළේ ලියවිල්ලක් හදාගන්න එක නොවෙයි අධිකරණයේ ස්වාධීනත්වයට හේතු වන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ කාල වකවානුව තුළ තමයි වර්තමාන මුදල් අමාත්‍ය, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාව කඩුවෙල උසාවියට ගෙන යන්නේ. හේමපාල මහෙස්ත්‍රාත්තුමා රාත්‍රී 8.30 වෙන කල් කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණය විවෘත කරගෙන හිටියා.

අධිකරණය විවෘත කරගෙන සිටිද්දී එදා අපි ගියා බැසිල් රාජපක්ෂ මැතිතුමා එක්ක, ඒ උසාවියට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උසාවියට ගිහින් ඉන්න කොට, ඔබතුමා ඔය ආසනයේ ඉන්නවා වාගේ එතුමා තමාගේ ආසනයේ ඉඳගෙන නඩුව ඇහුවා. අපේ නීතිඥවරු පෙනී සිටියා. ඒ අතරේ අපට ඇහුණා, නඩුකාරතුමාගේ කාමරය ඇතුළේ තිබෙන telephone එක නාද වෙනවා. අනේ, එතකොට නඩුව භාගෙට අහමින් හිටපු හේමපාල නඩුකාර උන්නාන්සේ දිව්වා, කාමරයට. දුවලා ගිහින් telephone call එකට ඇහුම් කන් දීලා ඇවිත් කිව්වා, "බන්ධනාගාරගත කරනවා" කියලා. අන්න ස්වාධීනත්වය! එහෙම ස්වාධීනත්වයක් කොහේද තිබෙන්නේ?

අද අපි අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේදීත් අපට බොහොම පැහැදිලිව කියන්නේ, "අධිකරණය ස්වාධීන විය යුතුයි" කියලායි. එවැනි තත්ත්වයක් තුළ අප අපේ වගකීම රට වෙනුවෙන් ඉටු කරනවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, මේ රට මේ වැටී තිබෙන තත්ත්වයෙන් අනිවාර්යයෙන් ගොඩ ගන්නා නායකයා බව මතක් කරමින්, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Next, the Hon. Tissa Attanayake. You have 17 minutes.

[අ.භා. 1.09]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය, උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු, ජාතික විගණන කාර්යාලය ඇතුළු වැය ශීර්ෂ ගණනාවක් පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ ඉතාම වැදගත් කාරණා කීපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම වැය ශීර්ෂ සාකච්ඡා කරන අවස්ථාව ඉතාම වැදගත් අවස්ථාවක්. මේ තීරණාත්මක අවස්ථාවේ මෙම වැය ශීර්ෂවලට වෙන් කර තිබෙන මුදල්වලින් ඒ අදාළ කටයුතු මේ රටේ ක්‍රියාත්මක කිරීම හරහා අප යම් ප්‍රතිඵලයක් ලබාගෙන තිබෙනවාද යන්න සමාලෝචනය කරන්න මේ සාකච්ඡාව හොඳ අවකාශයක් සපයනවා කියා මා හිතනවා.

මේ අවස්ථාවේ මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණා කීපයක් තිබෙනවා. ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව පත් වෙලා දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. ජනාධිපති පදවිප්‍රාප්තියේ අවුරුදු දෙක සැමරීමත් ඊයේ පෙරේදා සිදු වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා මේ රටේ ජනතාව මූලික වශයෙන් බලාපොරොත්තු වුණේ මොනවාද? ජනතාව බලාපොරොත්තු වූ මූලික කාරණා කීපයක් තිබුණා. එකක් තමයි, රටේ ජාතික ආරක්ෂාව. විශේෂයෙන්ම රටේ ජාතික ආරක්ෂාව හීන වීම පිළිබඳව, ඡන්ද පැවැති කාල සීමාව තුළ විශාල ප්‍රචාරයක් රට තුළ ගෙනිච්චා. දෙවැනි එක, රටේ ස්ථාවරත්වය. ඒ කියන්නේ, දේශපාලන ස්ථාවරත්වය. දේශපාලන ස්ථාවරත්වය පිළිබඳව බොහෝ දේවල් එදා දේශපාලන වේදිකාවේ කථා කළා. තුන්වැනි එක, රටේ කාර්යක්ෂමතාව. ඒක නිසා තමයි ඒකට වචනයක් යෙදුවේ, ජනාධිපතිවරණය system change එකක් කරන්න අවස්ථාවක් කර ගන්නවා කියලා. නමුත්, මේ කාරණා සම්බන්ධයෙන් මේ රටේ ජනතාවට යම් තරමින් හෝ සෑහීමකට පත් වෙන්න පුළුවන් පරිවර්තනයක් අද රට තුළ සිදු වෙලා තිබෙනවාද, නැද්ද කියලා අපි නැවත හැරිලා බලන්න ඕනෑ. විශේෂයෙන්ම "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන යෝජනා මැකී යන දර්ශනයක් බවට අද පත් වෙලා තිබෙනවා කියා මම හිතනවා. ඒ දුන් පොරොන්දු කඩාගෙන වැටිලා. ඒ වාගේම, මේ කාල සීමාව තුළ පොදු මහ ජනතාවගේ විශ්වාසය බිඳ වැටිලා. මම ඒ කියපු මූලික කාරණා තුනෙන් එකක්වත් සාර්ථකව ක්‍රියාත්මක කරන්න තරම් හැකියාවක් මේ කාල සීමාවේ ලැබිලා නැහැ. විශේෂයෙන්ම මේකට අදාළ වෙනවා, බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව දේශපාලන වේදිකාවේදී කරපු කථාත්. බැඳුම්කර ගනුදෙනුව, එවකට පැවැති යහ පාලන ආණ්ඩුවට විරුද්ධව දැඩි ලෙස දෝෂාරෝපණ එල්ල කරපු ගනුදෙනුවක්. ඒක වංචාවක්, දූෂණයක්, හොරකමක් යැයි ප්‍රකාශ කරමින් එදා ජනතාවට කිව්වේ, "බැඳුම්කර ගනුදෙනුවේ හොරු ටික අල්ලා නීතිය ක්‍රියාත්මක කරනවා" කියලායි. එහෙම තමයි කිව්වේ. නමුත් මොකක්ද වුණේ? බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව විමර්ශනය කරලා, බැඳුම්කරයට අදාළව සිදු වුණු වංචාව බිලියන 12ක්, 13ක් කියලා තමයි තක්සේරු කරලා තිබුණේ. ඒ තක්සේරු කළ මුදල බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ පාර්ශ්වයන්ගෙන් අයුතු ඉපැයීම් කියන චෝදනාව යටතේ තහනම් කර තබා ගන්න මහ බැංකුවට පුළුවන්කම ලැබුණා; ඒ විධියට බිලියන 12ක් විතර තහනම් කර තියා ගන්න පුළුවන් වුණා. මුදල් ඇමතිතුමා මෙවර අය වැය ඉදිරිපත් කරමින් කිව්වා, ඒ බැඳුම්කර ගනුදෙනුවෙන් අයුතු ඉපැයීම් යටතේ රඳවා තබාගෙන තිබෙන මුදලින් රුපියල් බිලියන 8.5ක් අය වැය හිඟය පියවා ගන්න යොදාගන්න, එහෙම

නැත්නම් භාණ්ඩාගාරය වෙත මාරු කරන්න ක්‍රියා කරනවා කියලා. දැන් ඒ කටයුත්ත එහෙම සිදු වන කොට අපි අහන ප්‍රශ්නය මේකයි. පසු ගිය කාලයේ මේ ආණ්ඩුවටත් චෝදනාවක් එල්ල වුණා නේ. පසු ගිය ආණ්ඩුව කාලයේ එම ආණ්ඩුවට බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ චෝදනාව එල්ල වුණා වාගේම, මේ ආණ්ඩුවටත් එල්ල වූ බරපතළම චෝදනාව තමයි, සීනි බදු වංචාව. මේ වංචාව නිසා රුපියල් බිලියන 15.9ක අලාභයක් රජයට සිදු වුණා කියලා දැන් බරපතළ ලෙස චෝදනා කරනවා.

බැඳුම්කර ගනුදෙනුව නිසා සිදු වූ අලාභය පිළිබඳව චෝදනා කරන කොට, බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ පාර්ශ්වවලින් රුපියල් බිලියන 13ක් පමණ රඳවා තබා ගන්න පුළුවන්කම ලැබුණා. හැබැයි සීනි බදු වංචාව පිළිබඳ චෝදනාව එල්ල වුණාම, එයින් රජයට කරපු පාඩුව වන රුපියල් බිලියන 15.9ක මුදල සීනි ආනයනය කළ අදාළ පාර්ශ්වයන්ගෙන් අරගෙන රඳවා තබා ගන්න කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ තුළින් මේ රටේ ජනතාවට ශුද්ධ පාඩුවක් සිදු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලන්න අද රටේ තත්ත්වය. රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව ජාත්‍යන්තරය ඉදිරියේ සිදු වන කථා බහ, අප ඉතාම හැල්ලු වන ආකාරයේ කථා බහක්. ඊයේ පෙරේදා පුවත් පතක තිබෙනවා මම දැක්කා, ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ ෆිච් ආයතනය නිකුත් කළ වාර්තාවක්. මොකක්ද, එම වාර්තාවේ කියන්නේ? ණය ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකාව "B" මට්ටමේ සිට "CCC" මට්ටමට දාලා තිබෙනවා. ඒ කියන්නේ, අපි තව එක මට්ටමක් පහළට වැටුණොත්, ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් වන ෆිච් ආයතනය නිකුත් කළ වාර්තාව අනුව රට බංකොලොත් තත්ත්වයට වැටීම සිදු වෙනවා. මේක ඉතාම නරක තත්ත්වයක්. එතකොට අපි තල්ලු වෙලා තිබෙන්නේ කොතැනටද? රට ඉස්සරහට යෑමකට නොවෙයි, රට බරපතළ කඩා වැටීමකට තල්ලු වෙනවා. රට ජාත්‍යන්තරය ඉදිරියේ හැල්ලු වෙනවා. මේක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා අපට මොකක්ද තිබෙන අනතුර? බරපතළම අනතුර තමයි විදේශ ප්‍රාග්ධන වෙළෙඳ පොළට ප්‍රවේශ වීමේදී අපට බරපතළ පාඩු සිදු වීම. මුදල් ඇමතිතුමා අය වැය කථාවේදී කිව්වා, අපේ ණය ගෙවීමේ අනුපාතය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 115ත් ඉක්මවා යනවා කියලා. මේක හොඳ තත්ත්වයක් නොවෙයි. ඉතින් මේවා පාලනය කිරීමට පසු ගිය අය වැය තුළින් හෝ ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය තුළින් දක්වා තිබෙන ප්‍රතිචාරය කුමක්ද? මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. අපි වගකීමක් නොමැතිව, ඒ වාගේම වග වීමක් නොමැතිව විවිධාකාරයේ පියවරවලට ගිහින් තිබෙනවා. ඒ නිසා මෙයින් ප්‍රදර්ශනය වන්නේ ඉතාම නරක තත්ත්වයක් බව අපි කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රජය බලයට එන්න පසුගිය කාල සීමාවේ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර සිදුවීම පාවිච්චි කළේ කොහොමද? එදා ඒ අය කිව්වා, "ජාතික ආරක්ෂාවේ ලොකු හිඩැසක් තිබුණා. එම ප්‍රහාරය එදා යහ පාලන ආණ්ඩුවට වළක්වා ගන්න හැකියාව තිබුණා. හැබැයි ඒක වළක්වා ගන්න ක්‍රියා කළේ නැහැ. අනාගතයේදී එවැනි දේ සිදු නොවෙන්න ක්‍රියා කරනවා. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වුවන්ට නිසි දඬුවම් දෙන්න අවශ්‍ය පියවර ගන්නවා" කියලා. හැබැයි, වත්මන් ආණ්ඩුව ඒ පිළිබඳව ගත් පියවර සම්බන්ධයෙන් අද තිබෙන කථා බහ කුමක්ද? ඒ පිළිබඳ අද තිබෙන කථා බහ ඉතාම නරකයි. ඇයි ඒ? ඒ සිද්ධිය පිළිබඳව ගත් ක්‍රියා මාර්ග ගැන අප නොවෙයි, මැල්කම් රංජිත් කාදිනල්තුමා කරන ප්‍රකාශ දිහා බලන්න. උන්වහන්සේ ඊයේ පෙරේදා මාධ්‍යයකට ප්‍රකාශයක් කර තිබුණා, පාස්කු ඉරිදා ප්‍රහාරය ආගමික උන්මාදය නිසා සිදු කළ එකක් නොව, බලය අල්ලා ගැනීම වෙනුවෙන් සහ බලය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් ගත් උත්සාහයක් කියලා. ආණ්ඩුව පැත්තෙන් ගත්තාම, ඒක බරපතළ චෝදනාවක්. ඒ විතරක් නොවෙයි. විශ්‍රාමික නීතිපති දප්පුල ද ලිවේරා මහත්මයාගේ ප්‍රකාශය ගෙන බලන්න. ඒ ප්‍රකාශය හරහාත් කියැවෙන්නේ ඉතාම නරක පණිවුඩයක්. ඒ ප්‍රහාරය ගැන සොයන්න පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කළා; ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කළා; අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ කළා. ඒවායින් හෙළි වෙච්ච කාරණා පදනම් කරගෙන නියම වගකිව යුත්තන් සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ආණ්ඩුව ප්‍රමාද වන්නේ ඇයි කියා අපි ආණ්ඩුවෙන් ප්‍රශ්න කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ වැය ශීර්ෂ ගැන කථා කරන කොට අපට කියන්න කාරණා කිහිපයක් තිබෙනවා. මේ කාල සීමාවේ රටේ ඇත්තටම ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? විශ්වාසය කඩ වීමක්ද? එහෙම නැත්නම් විශ්වාසය තහවුරු වීමක්ද? මහ ජනතාව බලාපොරොත්තු වුණු පළමුවැනි දේ තමයි මේ රටේ කාර්යක්ෂමතාව වැඩි කිරීම. කාර්යක්ෂමතාව වැඩි කරලා මහ ජනතාව වෙනුවෙන් යහපත් රාජ්‍ය තන්ත්‍රයක් ගොඩ නැඟීම සඳහා ආණ්ඩුව උපාය මාර්ගිකව පියවර ගත්තේ නැහැ. ඒ වෙනුවට කළේ මොකක්ද? සිවිල් පාලනය ශක්තිමත් කිරීම වෙනුවට කළේ, සිවිල් පාලනය තුළ තවදුරටත් හමුදා පාලනයක් ඇති කරන ස්වරූපය පෙන්වමින් විශ්‍රාමික හමුදා නිලධාරින් රාජ්‍ය ප්‍රධානින් හැටියට පත් කිරීමයි. මම විශ්වාස කරනවා, ජනතාවගේ බලාපොරොත්තු බිඳ දමන්නේ නැතිව, යුද්ධයෙන් පසුව ප්‍රජාතන්ත්‍රවාදී සිවිල් පාලනය ශක්තිමත් කරන වැඩ පිළිවෙළකට අවතීර්ණ වෙන්න හැකියාව තිබුණා කියලා. හැබැයි, අවාසනාවට වාගේ එවැනි තැනකට ආණ්ඩුව ගියේ නැහැ.

රාජ්‍ය ආයතන 30කට, 40කට පත් කරලා තිබෙන්නේ හමුදා නිලධාරින්. ඒ වාගේම රාජ්‍ය ආයතන ගණනාවක පාලනයේ බලධාරින් වෙලා තිබෙන්නේ ඔවුන්. මේ කාල සීමාව තුළ සිවිල් පාලනය පිළිබඳ තිබෙන විශ්වාසය කඩා වැටී තිබෙනවා. මේ තුළින් අපි බලාපොරොත්තු වුණු අපේක්ෂාව ඉටු වී තිබෙනවාද? විශේෂයෙන්ම යුද්ධයෙන් පස්සේ ජාත්‍යන්තරයත් බලාපොරොත්තු වුණා, අපේ සිවිල් පාලනයත්, ප්‍රජාතන්ත්‍රවාදයත් ශක්තිමත් කරයි කියලා. නමුත් පසුගිය කාලය තුළ ඒ කිසිවක් සිදු නොවී රට ආපස්සට යන්නට පටන්ගෙන තිබෙන බව මම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව කථා කරනවා. ඇත්තටම දැන් රටේ මූලික ප්‍රශ්නය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොවෙයි. රටේ මිනිසුන්ට අවශ්‍යවෙලා තිබෙන්නේ, කොවිඩ් - 19 වසංගතයෙන් පස්සේ වැටී තිබෙන රට යළි ගොඩගන්න වේගවත් ක්‍රියාදාමයකට අවතීර්ණ වෙන්නයි. මිනිසුන්ට දරා ගන්න බැරි මට්ටමකට ජීවන බර වැඩිවෙලා තිබෙනවා. කන බොන දේවල් සොයා ගන්න බැරි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. රැකියා, ආදායම් මාර්ග බිඳ වැටී තිබෙනවා. අපේ අපනයන ආදායම අඩුවෙලා තිබෙනවා. ඩොලර් හිඟය නිසා මුළු ආර්ථිකයම කඩාගෙන වැටෙන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒවාට තමයි අපි විසඳුම් සොයන්න ඕනෑ. මේ අවස්ථාවේ දී ඒ වෙනුවට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කථා කිරීම පවා හාස්‍යජනක කාරණයක් කියලා මා හිතනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සකස් කළ යුතු අවස්ථාවන් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති කළ යුතු වෙනස්කම් ගැන අපි කථා කළ යුතු අවස්ථාවන් තිබෙනවා. දැන් මේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනෙන්න හදන්නේ කොහොමද? පාර්ලිමේන්තු සම්ප්‍රදායට පයින් ගහලා. සාමාන්‍යයෙන් මෙවැනි සංශෝධන ගෙනෙනවා නම්, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවා නම්, එසේ කළ යුත්තේ පෙර තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමගාමීව එහි තිබෙන ප්‍රතිපාදනවලට අනුවයි. එහි තිබෙන වගන්තිවලට අනුව තමයි

[ගරු තිස්ස අත්තනායක මහතා]

ක්‍රියා කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව තුළ මහජන නියෝජිත සභායක් ලබා ගන්නේ නැතුව, බාහිර පාර්ශ්වයන් හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමට උත්සාහ කිරීම හරහා මේ රටේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්වලට යම් බාධාවක් සිදු වනවා. තමන්ගේ හිත මිතුරන් හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරමින්, මෙය තමයි රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියලා, බලහත්කාරයෙන් රට තුළට එය ඔබ්බවන්න උත්සාහ කරනවා නම් ඒක කවදාවත් සාර්ථක වන දෙයක් නොවෙයි. විශේෂයෙන්ම මහජන නියෝජිතයන් හරහා එවැනි ප්‍රවේශයක් ඇති කර ගන්නේ නැතුව, මෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට මූලික තැන දීලා ක්‍රියා කරනවා නම්, එයින් අපට පැහැදිලි වන එකම කාරණය තමයි, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට යළි වතාවක් හිස ඔසවන්න ඉඩ දෙන්නේ නැතුව ඒ සඳහා වෙනත් ගජ මිතුරු ක්‍රියාදාමයකට අවතීර්ණ වෙන්න උත්සාහ කරනවා කියන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව එනකොට මිනිස්සු විශ්වාස කළා, යම් ආකාරයක විද්වත් පාලනයක් ඇති කරයි කියලා. ඔබතුමන්ලාට මතක ඇති, "වියත් මඟ", "එළිය" වැනි බොහෝ සංවිධාන හදාගෙන රට පුරා ගිහින්, පෙර ආණ්ඩුව ක්‍රියාත්මක කරපු දේවල්වලට එහා ගිය විද්වත් තාක්ෂණික රාජ්‍ය පාලනයක් ඇති කරනවා කිව්වා. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන්නේ මොකක්ද? ඒකේ තිබෙනවා, තාක්ෂණික රාජ්‍ය පාලනයක් ඇති කරනවාය කියලා. අද කෝ මේ නිර්වචනය? අමාත්‍යාංශ බෙදීමේ සිට විෂයයන් බෙදීම දක්වා අද ගැටලු සහගත තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. පසුගිය දවස්වල මම කමිටුවකට සහභාගි වුණා. ඒ කමිටුවේ සිටි ඇමතිතුමා දන්නේ නැහැ, තමන්ට තිබෙන විෂයයන් තවත් කෙනකුට තිබෙනවාය කියලා. මෙය විද්‍යාත්මක බෙදීමක්ද? තාක්ෂණික රාජ්‍ය පාලනයක්ද මේ තිබෙන්නේ? දැන් මෙය මහජන විවේචනයට ලක්වෙන්න පටන්ගෙන තිබෙනවා. ජනතාව විශ්වාස කළේ, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව විද්වත් පාලනයක්, තාක්ෂණික රාජ්‍ය පාලනයක් ඇතිවෙයි කියලායි. කලින් සිදු වුණු අඩුපාඩු හදාගෙන, ඒ වෙනුවට මේ රටේ ජනතාවට තවත් කාර්යක්ෂම සේවයක් "වියත් මඟ" හරහා, "එළිය" හරහා කරන්න රටේ ජනතාවට පොරොන්දු වුණත්, එහෙම සිදුවෙලා නැහැ. අවුරුදු දෙකක් ඇතුළත මේ දේවල් එහෙම පිටින්ම කඩා වැටිලා තිබෙන බව තමයි අපට පෙනෙන්නේ.

මා හිතන විධියට, රාජ්‍ය ආයතන ගණනාවකට වියත් මඟේ නිලධාරින් පත් කළා. ඒ අය සභාපතිවරුන් වශයෙන් පත් කළා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වශයෙන් පත් කළා. ඒවායේ ප්‍රතිඵල කෝ? ඒවායේ ප්‍රතිඵල නැහැ. ඒවා තවදුරටත් බංකොලොත් වුණු රාජ්‍ය ආයතන බවට පත්වෙලා තිබෙනවා. අපි අහනවා, මේවා ගැන කිසියම් ආකාරයක විමර්ශනයක් කරලා තිබෙනවාද කියලා. මේවා සම්බන්ධයෙන් කිසිම විමර්ශනයක් කරලා නැහැ. එහෙම නම්, මේ වසර දෙකක කාලය ඇතුළත අපි මේ සාකච්ඡා කරන විෂයයන් සම්බන්ධයෙන් කිසියම් තක්සේරුවකට ඇවිල්ලා, ඒවා සාධනීයයි කියන්න පුළුවන්කමක් නැහැ.

ඊළඟට, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලන්න. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොකක්ද කිව්වේ? විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ රටේ අසීමිත බලතල ජනාධිපතිවරයාට පවරා ගනිමින්, රට සමෘද්ධිමත් දේශයක් කරා මෙහෙයවන්න නායකත්වය දෙනවාය කියලා කිව්වා. නමුත් මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජනතා අපේක්ෂාවක් නොවෙයි.

එය ජන වරමට පරිබාහිරව, පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩි ගණන වැඩි කර ගනිමින් සම්මත කර ගත්තා. දැන් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා බලාපොරොත්තු වුණු අපේක්ෂා ඉෂ්ට වීමක් තිබෙනවාද? විශේෂයෙන්ම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා මූල්‍ය වගකීම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

තව කරුණක් ගැන මම කියන්න ඕනෑ. "කොවිඩ් - 19 ඉටුකම සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල" කියලා එකක් ඇති කළා. මේ 'ඉටුකම' අරමුදලේ මූල්‍ය විනය, වගකීම, පාර්ලිමේන්තුවට තිබෙන බැඳීම යන මොකුත් තිබෙනවාද? පුවත් පතක මේ ගැන සඳහන් වෙලා තිබෙනවා මම දැක්කා. රුපියල් බිලියන 1.7ක් 'ඉටුකම' අරමුදලට ලැබුණා කියලා එහි සඳහන් වෙලා තිබුණා. ඒවා වියදම් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුව වග කියන්න ඕනෑ නැද්ද? ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මේ අරමුදල හැදුවා නම්; එහි සිටින්නේ ආණ්ඩුවේ නිලධාරින් නම්, රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුව ක්‍රියා කරන්න ඕනෑ. නමුත් අවාසනාවකට එසේ සිදුවෙලා නැහැ. මේ ගනුදෙනු පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම බරපතළ වරදක් හැටියට අපි දකිනවා. මේ වරද පමණක් නොවෙයි. මේ ආකාරයේ කාරණා ගණනාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැතිවරණ කොමිසම ගැනත් මම වචනයක් කථා කරන්න ඕනෑ. ඇත්තටම ලංකාවේ මැතිවරණ කොමිසම පිළිබඳ අදහස වසර ගණනාවක සිට ඇවිත් තිබෙනවා. මැතිවරණ දූෂණ පාලනය වෙන්න මේ කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය තවදුරටත් වර්ධනය කර ගන්න ඕනෑ. අපේ මැතිවරණ කොමිසමට තිබෙන බලතල මදි කියලා මම විශ්වාස කරනවා. මේක ඉන්දියාවේ මැතිවරණ කොමිසමට සමානව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මැතිවරණ සමය තුළ මැතිවරණ දූෂණ නොමැති, නිදහස් හා සාධාරණ මැතිවරණයකට පාර කපන තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. මොකද, බාහිර පාර්ශ්වවලින් මැතිවරණයට කිසියම් ආකාරයක බලපෑමක් සිදු නොවන ආකාරයට කටයුතු කරන්න ඕනෑ. ඒකට මොකක්ද කරන්න තිබෙන්නේ? දේශපාලන වශයෙන් යම්, යම් ක්‍රියාවන් පාලනය කිරීමේ බලය ඔවුන්ට තිබෙන්න ඕනෑ. මාධ්‍ය වෙන්න පුළුවන්; රාජ්‍ය තන්ත්‍රයේ මැදිහත්වීම් වෙන්න පුළුවන්; බාහිර බලපෑම් වෙන්න පුළුවන්, මේ කුමන ආකාරයේ මැදිහත්වීමක් සිදු වුණත් එය වළක්වා ස්වාධීන මැතිවරණයක් තහවුරු කිරීමේ බලය මැතිවරණ කොමිසමට තිබෙන්න ඕනෑ.

දේශපාලන පක්ෂ මැතිවරණවල දී විවිධ ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරනවා. එම ප්‍රතිපත්ති ප්‍රකාශන පිළිබඳව යම් ආකාරයක සමාලෝචනයක් කරමින්, ඒවා පිළිබඳව මැතිවරණ කොමිසමේ නිර්දේශ ලබා දෙන්න පුළුවන් වෙන්න ඕනෑ. නැත්නම් සුරංගනා කථා වාගේ ලොකු පොත් ලියලා මහ ජනතාවට ඉදිරිපත් කරනවා. හැබැයි, ඒවා එකක්වත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නේ නැහැ. එහෙම වුණාම, මැතිවරණ ප්‍රකාශයකින් ඉදිරිපත් කරපු කාරණා ආණ්ඩුවක් හැටියට ඉෂ්ට කරලා නැහැ කියලා, තමන්ට සාධාරණය ඉෂ්ට කර ගැනීම වෙනුවෙන් ඡන්ද දායකයාට අධිකරණයට යන්න බලයක් තිබෙන්න ඕනෑය කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන්, ජාතික විගණන කාර්යාලයෙන් ඉටු කරන සේවාව ගැනත් මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මේක ඉතාම වැදගත්. විගණකාධිපති කාර්ය භාරය අපි ඉතාම ඉහළින් අගය කරන්න ඕනෑ. හැබැයි, විගණකාධිපතිතුමා තමන්ගේ කාර්ය භාරය ඉතාම විශිෂ්ට ලෙස ඉටු කළත්, එතුමන්ලා ඉදිරිපත් කරන සමහර කාරණා පිළිබඳව ගන්නා ඊළඟ පියවර පැහැදිලි නැහැ. මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක්. එතැනදී විගණන නිලධාරින් රාජ්‍ය

ආයතන, දෙපාර්තමේන්තු ගැන බොහෝ කරුණු කාරණා ඉදිරිපත් කරනවා. හැබැයි, අවාසනාවට එයින් එහාට ඇති වන තත්ත්වය ගැන ඉතාම කනගාටුයි. මේ සම්බන්ධයෙන් යම් පදනමක් ඇති කරලා, වංචා කරන, දූෂණ කරන අයට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Next, the Hon. Kanchana Wijesekera. You have seven minutes.

[අ.භා. 1.27]

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට කෙටි කාලයක් ලැබී තිබෙන නිසා අපේ මන්ත්‍රීවරුන් කථා කරපු කාරණා පිළිබඳව මම දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කරන්න යන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පෙර කථා කළ ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමාගේ කථාවට මම ඇහුම්කන් දුන්නා. එතුමා සඳහන් කළා, නීතියේ සාධාරණත්වයක් නැහැ කියලා. ඒ වාගේම අධිකරණයට හා අනෙකුත් කොමිෂන් සභාවලට අද දේශපාලන වශයෙන් තිබෙන බලපෑම පිළිබඳව එතුමා සඳහන් කළා. මම එතුමාට මතක් කරනවා, එතුමා අවුරුදු පහක් විපක්ෂයේ සිටි කාලයේ, 2015 බලයට පත් වෙච්ච කණ්ඩායම -අද එතුමා නියෝජනය කරන කණ්ඩායම- එදා එතුමා බන්ධනාගාරගත කළේ දේශපාලන පළිගැනීම්වලට ලක් කරලායි. අද එවැනි තත්ත්වයක් නැහැ. එතුමාට මතක ඇති, එතුමා අද නියෝජනය කරන කණ්ඩායමේ පිරිස එදා එතුමාට කූට ලේඛන නිර්මාණය කළා කියලා නඩු දැම්මා. එතුමා ඇදගෙන ගිහින් අවුරුද්දකට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාරගත කළා. එතුමා විතරක් නොවෙයි, එදා විපක්ෂය නියෝජනය කළ අද ආණ්ඩුව නියෝජනය කරන බහුතර මන්ත්‍රීවරුන්ට ඒ ක්‍රියාදාමයට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඔබතුමන්ලා මොන විධියට කිව්වත් අද අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ එහෙම තත්ත්වයක් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමා කිව්වා, අද මේ කොමිෂන් සභා ස්වාධීන නැහැ කියලා. අපට මතකයි, එදා ස්වාධීනයි කියා ඔබතුමන්ලා නම් කළ කොමිෂන් සභා හැසිරුණු ආකාරය. ඔබතුමන්ලාට අවශ්‍ය පිරිස් ඒවාට පත් කර ගත්තා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත් කර ගත්තා. එදා රන්ජන් රාමනායකගේ හඬ පට එළියට නොඑන්න අදටත් ජනතාවට අවබෝධයක් නැති වෙනවා, ඒ ස්වාධීන යැයි කියපු කොමිෂන් සභා පිළිබඳව. එදා රන්ජන් රාමනායක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය එක්ක, නඩු අහපු විනිශ්චයකාරවරු එක්ක ගනුදෙනු කළ ආකාරය අපි දැනගත්තා. ඔබතුමන්ලා එදා ස්වාධීනයි කියපු ආයතනවලට දේශපාලන නියෝජිතයන් පත් කර ගෙන දුමින්ද සිල්වාගේ නඩුව, බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ නඩුව, අපේ ඇමතිවරුන්ට විරුද්ධව තිබුණු අනෙකුත් චෝදනා සම්බන්ධව බලපෑම් කරන්න උත්සාහ කළා. අරලියගහ මන්දිරය එදා මේ ස්වාධීන කොමිෂන් සභාවලට පත්කළ නියෝජිතයන්ගේ හමුවීම් මධ්‍යස්ථානය කර ගත්තා. අනුර කුමාර දිසානායක මහත්මයා දූෂණ විරෝධී පෙරමුණේ සභාපතිවරයා බවට පත් කරලා, ජනතා විමුක්ති පෙරමුණත් ඒකට සම්බන්ධ කර ගත්තා. එදා පාර්ලිමේන්තුවේ නිල වශයෙන් සිටි විපක්ෂය වූ TNA එකත් ඒකට සම්බන්ධ කර ගත්තා. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය ඇතුළු ඒ හතරගොල්ලම එකට එකතුවෙලා තමයි මේ රටේ නීතියේ ආධිපත්‍යය බිඳීම සඳහා ඒ කටයුත්ත කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ සභාවේදී බොහෝ දෙනෙකු ජනාධිපතිතුමාගේ පත් කිරීම් පිළිබඳව කථා කළා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි අභියෝග කරනවා, ඔබතුමන්ලා පුළුවන් නම් කියන්න, එතුමා බලයට පත් වුණාට පස්සේ අධිකරණයට පත් කර තිබෙන මහෙස්ත්‍රාත්වරු, වෙනත් විනිසුරුවන් අතරට සුදුසුකම් නැති කිසිවකු හෝ පත් කර තිබෙනවාද කියලා. සුදුසුකම් අනුව, එතුමන්ලාගේ අත්දැකීම් අනුව, ජ්‍යෙෂ්ඨත්වය අනුව තමයි එතුමා මේ සියලු පත්වීම් කළේ. ඒ කාරණය අපි ඉතාම වගකීමෙන් මේ ගරු සභාවට මතක් කරනවා. අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අභියෝග කරනවා, නීතිපතිවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කළ විනිසුරුවන්, එහෙමත් නැත්නම් වෙනත් අධිකරණවලට පත් කළ විනිසුරුවන් අතර ජ්‍යෙෂ්ඨත්වයෙන් තොර, පිටින් පත් කළ කෙනෙකු ඉන්නවා කියලා පුළුවන් නම් පෙන්වන්න කියලා. එතුමන්ලාට එහෙම පෙන්වන්න පුළුවන්කමක් නැහැ. නමුත්, බොරුවට චෝදනා කරන්න මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරනවා.

අද ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා එතුමන්ලාගේ උද්ඝෝෂණයක් වෙනුවෙන් භය නැතිව විනිශ්චයකාරවරු කිහිපදෙනෙකු තීන්දු දුන්නා කියලා. එතකොට එතුමන්ලාට විරුද්ධව තීන්දු දුන් විනිශ්චයකාරවරු භය වෙලාද ඒ තීන්දු දුන්නේ? ඒක අධිකරණයට කළ අපහාසයක් නොවෙයිද? නඩුකාරවරු කිහිප දෙනෙක් එතුමන්ලාට පක්ෂව තීන්දුව දුන්නාම ඒ අය භය නැහැ. එතකොට අනෙක් අය භය වෙලාද ඉන්නේ? එවැනි දේවලට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න එපා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා නීතිඥයෙක්, එතුමා නීතිඥ වෘත්තියේ ඉඳගෙනත් අද අධිකරණය හෑල්ලු වෙන ආකාරයට කථා කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා තවදුරටත් කිව්වා, එතුමන්ලාගේ කාලයේ පත් කළ කොමිෂන් සභා ගැන. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බැඳුම්කර වංචාව වූ අවස්ථාවේ එතුමන්ලා ඒක වහගන්න මොකක්ද කළේ? ඒක ගැන හොයන්න ජනාධිපති කොමිසමක් පත් කළාද? ඒක COPE එකට ගෙනාවාද? නැහැ. එතුමන්ලා පත් කළා, පිටිපන කමිටුව. 'පිටිපන' කියන්නේ කවුද? එතුමන්ලාගේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ හිටපු නීතිඥවරයෙක්; සාමාජිකයෙක්. එතුමාගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කරලා බැඳුම්කර වංචාවක් සිද්ධ වෙලා නැහැ කිව්වා. අද පාර්ලිමේන්තුවේ නැති සුජීව සේනසිංහ ලවා එදා පොත් ලියෙව්වා. මේ, ඒ අය එදා කළ දේවල්.

එදා COPE එකේ සභාපතිවරයා හැටියට ඩිව් ගුණසේකර මැතිතුමා වාර්තාව එළිදක්වන්න හදනකොට, ඊට පැය 24කට ඉස්සෙල්ලා එවක ජනාධිපති වූ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලවා පාර්ලිමේන්තුව විසිරෙව්වා. අන්න, ඔබතුමන්ලා කටයුතු කළ ආකාරය. අද කියනවා, COPE එකේ සභාපති ධුරය එතුමන්ලා විපක්ෂයේ සුනිල් හඳුන්නෙත්ති මහත්මයාට දුන්නා ලු. අපි දන්නවානේ, ජනතා විමුක්ති පෙරමුණයි, TNA එකයි එදා

[ගරු කංචන විජේසේකර මහතා]

ආණ්ඩුව වෙනුවෙන් කළ කාර්ය භාරය. එතුමන්ලා එදා විපක්ෂය නියෝජනය කළේ නැහැ. එතුමන්ලා විපක්ෂයේ ඉඳගෙන ආණ්ඩුව නියෝජනය කළා. එදා COPE එක නියෝජනය කළ සාමාජිකයන්ට ඉල්ලා අස්වෙන්න කියා අලුත් සාමාජිකයන් පත් කරලා, ඒ සාමාජිකයන් ලවා footnotes දම්මලා සියල්ල යටපත් කළා.

දැන් එතුමන්ලා පාස්කු ඉරිදා ප්‍රහාරය ගැනත් කථා කරනවා, හරියට නිකම් පාස්කු ඉරිදා ප්‍රහාරය අපේ ආණ්ඩුව කළා වාගේ. පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන ඔබතුමන්ලා මොකක්ද කළේ? හිටපු අගමැතිතුමාත් ඒක ගැන කිව්වා. එතුමා මොකක්ද කිව්වේ? පාස්කු ඉරිදා ප්‍රහාරය වුණාට පස්සේ මොකක්ද පළමුවෙන්ම කළේ? පරීක්ෂණ පවත්වන්න පාර්ලිමේන්තු නියෝජිතයන් පත් කළා. ඒ කාරක සභාවේ සාමාජිකයන් විධියට නොහිටියේ පොදු ජන පෙරමුණේ මන්ත්‍රීවරු විතරයි. එක්සත් ජාතික පක්ෂය, TNA එක, ජේවීපී එක නියෝජනය කරන මන්ත්‍රීවරු හත් දෙනෙකු සාමාජිකයන් විධියට නම්කරගෙන විශේෂ කාරක සභාවක් පත් කළා. විශේෂ කාරක සභාවක් පත් කරගෙන මාස තුනක් මේක කල් ඇද්දා; හුඟක් දේවල් යට ගැහුවා. අන්තිමට වාර්තාවක් දුන්නා. ඒ වාර්තාවේ කොහේවත් මහ මොළකාරයෙක් ගැන කියනවාද? දැන් එතුමන්ලා කියනවා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමායි විතරයි ඒ ගැන දැනුවත් කර තිබුණේ, අපි දන්නේ නැහැ කියලා. මේ, පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන වාර්තා වූ දෙයක්.

රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහත්මයා 2018.05.19වෙනි දින -පාස්කු ඉරිදා ප්‍රහාරය වෙන්න මාස 11කට පෙර- රහස්‍ය වාර්තාවක් එවනවා. ඒක කාටද එවන්නේ? රංජිත් මද්දුම බණ්ඩාර මහත්මයාට. එතුමා තමයි එවකට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එම රහස්‍ය වාර්තාව **සභාගත*** කරනවා.

එම වාර්තාවෙන් නිලන්ත ජයවර්ධන මහත්මයා කියනවා, "ජාතික තව්හිද් ජමාත් සංවිධානයේ නායක Mohammed Cassim Mohammed Sahran යන අය විසින් පවත්වාගෙන යනු ලබන ASSHEIKH ZAHRAN HASHIM - .... නමැති සමාජ ජාල ගිණුම හරහා 2018.05.16 දින ජිහාද් සම්බන්ධව වීඩියෝ පටයක් නිකුත් කරමින් නබිතුමා ඉස්ලාමය ලොව පුරා ව්‍යාප්ත කරමින් අන්‍යාගමිකයන්ට එරෙහිව යුද්ධයක් සිදුකළ බවත්, එම යුද්ධය ජිහාදය ලෙස අර්ථ දක්වන බවත්, වර්තමානයේ මෙරට සිටින උලමාවරුන් මෙම ජිහාදය නොදන්නා බවටත් සඳහන්ව ඇත." කියලා.

ඔබතුමන්ලා අද උදේ කිව්වා, "නිලන්ත ජයවර්ධන මොකටද සාක්ෂිකාරයෙක් කරලා තියෙන්නේ, එතුමා විත්තිකරුවෙකු කරන්න" කියලා. නිලන්ත ජයවර්ධන මහත්මයා එම වාර්තාවෙන් මොනවාද නිර්දේශ කරන්නේ? එතුමා මොකක්ද කියලා තියෙන්නේ? "මෙම අන්තවාදී දේශකයා විසින් 2016 වර්ෂයේ සිට IS සංවිධානයේ මතවාදය සාධාරණීකරණය කරමින් අන්‍යාගමිකයන් ඝාතනය කරමින් ඉස්ලාම් රාජ්‍යයක් ඇති කළ යුතු බවට ප්‍රචාරණයන් සිදු කිරීමත්, 2017.03.10 දින කාත්තන්කුඩි ප්‍රදේශයේදී ජාතික තව්හිද් ජමාත් සංවිධානයේ පිරිසක් විසින් ඉස්තිහාද් අහ්ලුල් සුන්තුල් වල් ජමාත් සංවිධානයේ පිරිසකට පහරදීමේ සිද්ධියට අදාළව -ප්‍රධාන සැකකරු- අධිකරණය මඟ හරිමින් සැඟව සිටිමින් යම් කලහකාරී ක්‍රියාවක් සඳහා මුස්ලිම් තරුණයන් පෙළඹවීමේ අදහසින් මෙවැනි ප්‍රචාරණයන් සිදු කිරීමත් සැලකිල්ලට ගෙන මොහු පොලීසියේ විශේෂ අංශයක් හරහා අත්අඩංගුවට ගෙන සමාජගත කිරීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව නිරීක්ෂණය වේ." කියලා එම වාර්තාවේ සඳහන් වෙනවා.

රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට මේ නිරීක්ෂණය දෙන්නේ පාස්කු ප්‍රහාරයට අවුරුද්දකට ඉස්සෙල්ලා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පාර්ලිමේන්තුව පාවිච්චි කරලා ඔබතුමන්ලා පාස්කු ප්‍රහාරය ගැන අසත්‍ය ප්‍රචාර කරන්න එපා. පාස්කු ප්‍රහාරය පිළිබඳව ඔබතුමන්ලා එළියේ කථා නොකරන්නේ ඇයි? අපි ඔබතුමන්ලාට අභියෝග කරනවා, පුළුවන් නම් අපිත් එක්ක සංවාදයකට එන්න කියලා. දැන් පාස්කු ප්‍රහාරය පිළිබඳව නිවැරදි වාර්තා ඉදිරිපත් කර තිබෙනවා. පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බලා විමර්ශනය කිරීමට පත් කළ කොමිෂන් සභාවේ වාර්තාව අද වනවිට සභාගත කර තිබෙනවා. ජනාධිපතිතුමා ඒක ඉදිරිපත් කර තිබෙනවා. ඒ වෙනුවෙන් අපි විවාදයක් පවත්වමු. ඔබතුමන්ලා එළියට ඇවිත් කථා කරන්න. ඒකට පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා ප්‍රචාරය කරලා ආවේ නැහැ, "මම ගිහිල්ලා මිරිහානේ ඉඳලා රාජ්‍ය පාලනය කරනවා" කියලා. එතුමා කිව්වේ නැහැ, "මම වාහන තුනෙන් යන ජනාධිපතිවරයා වෙනවා" කියලා. නමුත්, එතුමා ක්‍රියාවෙන් ඒ සියලු දේම සරලව පෙන්වූවා. මේ රටේ තිබෙන වියදම් කප්පාදු කරමින් එතුමා කටයුතු කළා. එතුමාගේ වැය ශීර්ෂයට වෙන් කර තියෙන්නේ සියයට 1.3යි. ඉතිහාසයේ ජනාධිපතිවරයකුට වෙන් වූ අඩුම මුදල මෙවර වෙන් කර තියෙනවා. අගමැතිවරායත්, ජනාධිපතිවරයාත් තමන්ගේ වියදම් කප්පාදු කරගෙන, මේ රටේ ජනතාව වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ පිළිබඳව අපි එතුමන්ලාට ස්තුතිවන්ත වන්න ඕනෑ. එන්නත් ලබා දීම වෙන්න පුළුවන්, මේ රටේ ආර්ථිකය හදන වැඩ පිළිවෙළ වෙන්න පුළුවන්, එතුමන්ලා ගන්න ප්‍රවේශයට අපේ ස්තුතිය පළ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Rauff Hakeem. You have 12 minutes.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
I have 15 minutes, Sir.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
I am sorry. Due to the delay in time earlier, it has been reduced to 12 minutes.

[1.37 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Deputy Chairman, thank you very much for giving me this opportunity to make some intervention on the Votes belonging to institutions coming under the Executive President of this country.

First of all, let me reply to the issue raised by the Hon. Kanchana Wijesekara. පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන විවාදයකට ලැහැස්ති වෙන්න, ඒ විස්තර ටික අරගෙන එන්න

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කියලා එතුමා අපට කිව්වා. ඊට කලින්, කරුණාකර අපට ඒ තිබෙන වෙළුම් 22 භාර දෙන්න. ඒක කියෙව්වාට පසු අපට ඕනෑ තරම් විවාද කරන්න පුළුවන්. ඒකයි අපට වුවමනා වෙලා තිබෙන්නේ. ඒ වෙළුම් 22 ලැබුණා නම් අපටත් ඒ විවාදයට එන්න පුළුවන්.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Hon. Deputy Chairman, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. State Minister Kanchana Wijesekera.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Hon. Member, I am not disturbing you. විපක්ෂය නියෝජනය කරන ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු විටින් විට පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලා, ඔවුන් දන්නා කරුණු කියලා, මෙම ගරු සභාවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරනවා. අපි ඉල්ලා සිටින්නේ, අපි දන්නා කරුණු කියන්නම්, ඔබතුමන්ලා දන්නා කරුණුත් කියන්න කියලායි. ලැබිලා තිබෙන තොරතුරුත් එක්ක ඔබතුමන්ලා පිටතදී අපිත් එක්ක විවාදයකට එන්න. ඒකට ඕනෑම රූපවාහිනී නාළිකාවක් තෝරා ගන්න. හැබැයි, ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු එන්නේ නැහැ. හරින් ප්‍රනාන්දු, මනුෂ මන්ත්‍රීතුමන්ලා ඒකට බයයි. එතුමන්ලා එන්නේ නැහැ. පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන කෑ ගැහුවාට එතුමන්ලා එළියට ගිහිල්ලා මේක ගැන කථා කරන්නේ නැහැ.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
ගරු රාජ්‍ය ඇමතිතුමා, අපි කියන්නේ වෙන මොකුත් නොවෙයි. අපිත් ඒකට ලැහැස්තියි. ඒ වෙළුම් ටික අපට ලබා දුන්නා නම්, අපට ඒක කරන්න පුළුවන් කියලායි මම කියන්නේ. ප්‍රවේශයක් හැටියට මුලින්ම මගේ කථාවේ මේ කොටසට මම අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම, the Bar Association of Sri Lanka -

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. State Minister, what is your point of Order?

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Hon. Member, may I ask you a question? I am not going to disturb you. You were a part of the Select Committee that was appointed by the Parliament to look into the Easter attacks. What were your observations? What was the conclusion that you came to? Did you find a -

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Deputy Chairman, it is good that he raised this question. What we found was that there were serious shortcomings in the way the country's entire intelligent infrastructure operated. There had been various problems. That is the very reason why this whole thing got so messed up. There were so many agencies, so many people sending notes to different -

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Hon. Member, I tabled a letter which was written to your former Minister in charge of the police force. It had been communicated to him by the Chief of State Intelligence Service that this was going to happen in 2018, one year before the Easter Attacks, but you all failed to take action on that.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Not only that, letters sent to the Attorney General's Department had not been looked into for more than 10, 15 months. That is a fact which we discovered. Anyway, let us not go into all those horrible details.

Now, let me move on to this point. One of the institutions that comes under the President is the Human Rights Commission of Sri Lanka. This is a very important Commission. Already, the Chairman of the Commission had resigned and the Bar Association of Sri Lanka has written to the President asking him to appoint a distinguished person to this office, saying that the person should be one who is distinguished in the field of Human Rights and law and be acceptable to a wider cross section of the Sri Lankan community. That is a very important matter, Sir, because I already know that two names have been sent and both of them, I am sure, are not people who have achieved some eminence in the field of law or know sufficient enough to be holding that office. That is an important issue. Then, also the normal practice is to see that the ethnic diversity in this country is reflected in the entire Commission, but there is no Muslim who is part of this Commission, as of now. Therefore, that practice which has been there previously has also got to be taken into account and I am told that the Hon. Douglas Devananda had raised that issue at the meeting of the Parliamentary Council. The Human Rights Commission is not a place for you to appoint your political cronies and people who will be your sycophants, trying to come and take on your own political ideology or carry on your own agenda. The Human Rights Commission has to be a very independent Commission. And this move will also have serious international ramifications. We already have several problems. In fact, we have had very distinguished people holding office as its Chairperson: O.S.M. Seneviratne, retired Supreme Court Judge, Faisz Musthapha, prominent senior lawyer, Radhika Coomaraswamy, Justice Pathmanathan Ramanathan, Justice Ananda Coomaraswamy, Justice Priyantha Perera and finally, Prof. Deepika Udagama. Those were very

[ගරු රවුෆ් හකීම් මහතා]

distinguished people regarding whom we have had no problems at all. I have no issues with Dr. Jagath Balasuriya but he was a Member of Parliament representing a political party. That is not the way to adorn an important independent Commission. Of course, he has now resigned. He is a very distinguished politician; he is not a controversial politician and I have my respect for him. In fact, because of the conduct of the former Commissioners, our Human Rights Commission has been rated as an "A" status Human Rights Commission by rating agencies like the Global Alliance of National Human Rights Institutions. So, for an important institution like that, you should not be appointing political cronies. Please see to it that this again will not become a tool in the hands of very divisive and partisan people holding positions in such Commissions.

Coming to the other issue, the President had recently appointed a Task Force again. This President is quite famous for appointing commissions and task forces, publishing gazettes and then reversing them. So, this has become a practice. For the last two years, we have seen this drama being enacted. On this issue of "One country, one law" and the Task Force appointed on that, I would like to advert to certain issues and then refer to certain controversies regarding that. I have spoken about this earlier too. Regarding the chairmanship of this Task Force, there is a serious problem. In this regard, what we must understand is this. I believe that in the past, in 1956, when the Sinhala Only Act was enacted, when the *swabhasha* problem was raised and that entire issue was taken up to virtually deprive or punish one community, the Tamil community, the whole problem burst into a different dimension. Today, what do we see? එක රටක්-එක නීතියක් කියන මුවාවෙන් ඇති කර තිබෙන මේ කොමිසම පිළිබඳව විශාල ආන්දෝලනයක් රට තුළ තිබෙනවා. මේකේ ඇත්ත පරමාර්ථය මොකක්ද කියලා අපි සොයා බැලිය යුතුයි. මේක ස්වභාෂා ව්‍යාපාරය වාගේම, මේ රටේ විශාල ප්‍රශ්නයකට මුල පිරෙන තවත් වැයමක් කියලා මේ රට තුළ ආන්දෝලනාත්මක තත්ත්වයක් තිබෙන බව මා කියා සිටිය යුතුයි. ඒකට මම මේ කාරණා ටිකත් පෙන්නුම් කළ යුතුයි.

ඉංග්‍රීසි බස පිළිබඳව 1956දී ඇති වුණු ප්‍රශ්නයේදී, ඒ තුළින් වෙනත් ආකාරයකින් ද්‍රවිඩ ජනතාවගේ භාෂා අයිතිය උදුරා ගැනීමේ උත්සාහයක් පැවතුණා. ඒ වාගේම තමයි දැන් මුස්ලිම් ජනතාව ඉලක්ක කරගෙන "One country, one law" කියන මුවාවෙන් කරන මේ කටයුත්ත. මේ කටයුත්තේ ඇත්ත පරමාර්ථය කුමක්ද? සමහරු මේක තේරුම් අරගෙන තිබෙන්නේ නීතිය කාටත් සමානව බලපැවැත්විය යුතුයි කියන සංකල්පයක් මුලට තියාගෙන තමයි මේක කරන්න යන්නේ කියලා. එහෙම නොවෙයි. එහෙම යම් අසමානතාවක් තිබෙන බව වංචනිකව පෙන්නුම් කරමින් කරන ව්‍යාපාරයක් හැටියටයි මේක මම දකින්නේ. මොකද, කවුරුත් පිළිගන්නවා, රටේ කාටත් සමානව බලපවත්වන නීති පද්ධතියක් තිබිය යුතුයි කියලා. එහෙම නීති පද්ධතියක් මේ රටේ නැතුවද අපි දැන් ජීවත් වෙන්නේ?

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියලා තිබෙන්නේ මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පටන් ගන්නකොටම තිබෙනවා, "ස්වස්ති" කියා. ඊළඟට, "...නිදහස, සමානාත්මතාව, යුක්තිය මූලික මානව අයිතිවාසිකම් හා අධිකරණයේ ස්වාධීනත්වය සකල ජනතාවට සහතික කරන්නාවූත් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා...." යනුවෙන් සඳහන් වෙනවා. නැවතත්, "...ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීතර නීතිය ලෙස මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙයින් සම්මත කොට පනවම්හ." යනුවෙන් සඳහන් වෙනවා. මේ තුළින් මොකක්ද ගම්‍ය වෙන්නේ? රටේ උත්තරීතර නීතිය අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බව මේ තුළින් ඉතා පැහැදිලියි. ඒක කාටත් පොදුයි; කාටත් සමානයි.

ඒ වාගේම තමයි පුරවැසිභාවය ගැන කියන කථාව. පුරවැසිභාවය ගැන කියන කථාව බලන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ විධියට සඳහන් වෙනවා: "...ඒ තැනැත්තා සියලු කාර්ය සඳහා 'ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්' යනුවෙන් පමණක් විස්තර කරනු ලබන්නේ ය. (3) පුරවැසි තත්ත්වය අත්කර ගනු ලැබූ ආකාරය, එනම්, පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යනු සලකා කවර වූ හෝ කාර්යයක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙසෙසා නොදැක්විය යුත්තේ ය." කියලා. Every citizen is equal. That is what the Constitution says. So, what is this whole issue of "One country, one law"?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு ரவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

අපේ දණ්ඩ නීති සංග්‍රහය 1883 වර්ෂයේ සාදන ලද්දක්. ඒ වාගේම අපරාධ නඩු විධාන සංග්‍රහය 1898; සිවිල් නඩු විධාන සංග්‍රහය 1889; සාක්ෂි ආඥාපනත 1895. ඒ වාගේ මේ රටේ විවිධ නීති තිබෙනවා. අපේ සිවිල් නීතිය තුළ රෝම ලන්දේසි නීතිය තිබෙනවා. අපේ නීති පද්ධතිය තුළ රෝම ලන්දේසි නීතිය යටතේ පවත්වන සංකල්ප තිබුණා. ඇත්තටම දකුණු අප්‍රිකාවට සහ ශ්‍රී ලංකාවට විතරයි ඒවා බලපාන්නේ. නෙදර්ලන්තයේ පවා දැන් රෝම ලන්දේසි නීතිය නැහැ. ඒ විධියට විදේශකයන්ගේ නීතිය තමයි වැඩියෙන්ම අපි ළඟ තිබෙන්නේ; ඉංග්‍රීසි නීතිය. අපේ තිබෙන දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය වැනි හැම නීතියකම විදේශ නීතිවලින් උපුටා ගත් කොටස් තමයි තිබෙන්නේ. නමුත් එක ජන කොටසකගේ පෞද්ගලික නීති පිළිබඳව තිබෙන නොයෙක් ප්‍රශ්න අරගෙන ජනතාව අතර අවශ්‍ය නැති කුතුහලයක් ඇති කිරීමේ, විරසකයක් ඇති කිරීමේ, ඒ අයිතිවාසිකම් උදුරා ගැනීමේ උත්සාහයෙන් නිතර නිතරම වෛරය, ක්‍රෝධය වැපිරෙන කථා කියන හිමිනමක් සභාපතිත්වයට පත් කරලා කරන්න යන මේ ව්‍යායාමය, 1956දී සිදු වූ දේ වාගේ මුස්ලිම් ජනතාවගෙන් පළිගන්න කරන වැයමක් හැටියටයි අපි දකින්නේ කියන කාරණය සඳහන් කරමින්, මට මේ කරුණු කිහිපය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The next speaker is the Hon. Douglas Devananda. You have nine minutes.

[பி.ப. 1.49]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, உலகளாவிய ரீதியில் மனித குலமே இன்று கொரோனா எனும் கொடிய தொற்று நோயின் சவாலைச் சந்தித்து வருகிறது. இந்த இடர்காலத்தை எதிர்கொள்ளவேண்டிய சூழலில் இருந்து எமது இலங்கைத் தீவும் விடுபட்டுவிட முடியாது. உலக வல்லரசுகளே இன்று பொருளாதார நெருக்கடிக்குள் அகப்பட்டிருக்கும் இவ்வேளையில், வளர்முக நாடாகிய இலங்கைத் தீவு மட்டும் எம்மாத்திரம்! இன்றைய சூழலில் இன்னொரு தரப்பினர் இங்கு ஆட்சிபீடத்தில் இருந்திருந்தால் எமது நாடு இன்னும் மிக மோசமான பொருளாதார நெருக்கடிக்குள் சிக்குண்டு போயிருக்கும். ஆனாலும், வல்லமை பொருந்திய ஆட்சி யொன்று - உறுதியான தலைமைத்துவமாக ஜனாதிபதியும், சிறந்த ஆளுமைமிக்க வழிகாட்டியாகப் பிரதமரும், ஆரோக்கியமான திட்டமிடல் அனுபவமிக்க ஒரு நிதி அமைச்சரும், அவர்களுக்குப் பக்கத் துணையாக நாமும் - இன்று ஆட்சிபீடத்தில் இருப்பதால் இலங்கைத் தீவு இன்றைய இடர் காலத்திலும் முடிந்தளவு பாதுகாக்கப்பட்டு வருகின்றது.

இன்றைய சூழ்நிலையில் எமது அரசாங்கத்தால் முன்வைக் கப்பட்டிருக்கும் வரவு செலவுத்திட்டமானது முன்னேற்ற கரமானது என்பதை நான் கூறிவைக்க விரும்புகின்றேன். இத்தகைய சூழலிலிருந்து ஒளிமயமான ஒரு சூழலை நோக்கி இலங்கைத் தீவை ஜனாதிபதி அவர்கள் தலைமைதாங்கி வழிநடத்திச் செல்வார் என்ற நம்பிக்கை எமக்குண்டு. எத்தகைய தடைகளையும் சவால்களையும் அரசியற் குழப்பங் களையும் எதிர்கொண்டு அழகிய எங்கள் இலங்கைத் தீவில் சமூகப் பொருளாதார அபிவிருத்தியைக் கட்டியெழுப்ப எமது ஆட்சி திடசங்கற்பம் பூண்டுள்ளது. சகல இன, மத, சமூக மக்களும் சரிநிகர் சமன் என்ற சமத்துவச் சிந்தனையை நடைமுறைப்படுத்தவே "ஒரே நாடு, ஒரே சட்டம்" என்ற திட்டத்தை ஜனாதிபதி அவர்கள் பிரகடனம் செய்திருக்கிறார். "மருண்டவன் கண்ணுக்கு இருண்டதெல்லாம் பேய்" என்பார்கள். அவ்வாறான நிலை மாறி, பரந்த வெளிச்சம்கூட மருண்டவன் கண்ணுக்குப் பேயாகத் தெரியும் காலமாக இது மாறிப்போயிருக்கிறது. காட்சிகளை நிறம் மாற்றிக் காட்டும் அரசியற் கண்ணாடிகளைக் கழற்றிவிட்டு, நிஜங்களை நிஜங்களாகவே பார்ப்பதற்குச் சகல அரசியற் கட்சிகளும் முன்வரவேண்டும். ஆகவே, "ஒரே நாடு, ஒரே சட்டம்" என்ற திட்டத்தின்கீழ் சகல மக்களும் அரசியல், சமூக, பொருளாதார சமத்துவத்தைப் பூரணமாக அனுபவிக்கும் காலத்தை நாம் உருவாக்குவோம். வெறும் அரசியல் புரளிகளுக்கும் வெற்று அரசியற் கூச்சல்களுக்கும் எல்லாக் காலத்திலும் எல்லா மக்களும் ஏமாந்துபோய்விடமாட்டார்கள். ஆகவே, இன, மத, கட்சி பேதங்களின்றிச் சகல மக்களையும் வழிநடத்தச் சகல கட்சிகளும் முன்வர வேண்டும்.

எமது தேசத்தின் மக்களது ஆரோக்கியமான வாழ்க்கையை முன்வைத்து மேன்மைதங்கிய ஜனாதிபதி அவர்கள் எடுத்து வருகின்ற முயற்சிகளை ஒரு மக்கள்நேய நோக்கமுடை யனவாகவே நான் பார்க்கின்றேன். இரசாயன உரம் மற்றும் விவசாய உள்ளீடுகள், சுத்தமற்ற குடிநீர் என்பவற்றின் காரணமாக எமது நாட்டில் ஒரு வருடத்தில் சுமார் 10,000க்கும் அதிகமான மரணங்கள் ஏற்படுவதாகவும், 125,000க்கும் அதிகமானவர்கள் சிறுநீரக நோயாளர்களாக மாறிவருவ தாகவும் தகவல்கள் தெரிவிக்கின்றன. இத்தகைய நோய்களற்ற சமூகத்தை உருவாக்குவதற்கு ஒரு பக்கத்தில் இந்த இயற்கை உரப் பயன்பாடு வழிவகுப்பதுடன், மறுபக்கத்தில் அதிகள விலான அந்நியச் செலாவணியை மீதப்படுத்துவதற்கும் எம்மால் இயலுமாகின்றது. இத்தகைய முயற்சிகள் தேசிய உற்பத்தியை ஊக்கப்படுத்துவதற்கும் வழிவகுக்கின்றன என்ப தையும் நாம் உணர்ந்துகொள்ள வேண்டும். அதே நேரத்தில், "அனைவருக்கும் சுத்தமான குடிநீர்" என்ற திட்டத்தின் முன்னெடுப்புகளும் நோயற்ற நாடாக இலங்கை யினை மாற்ற வழிவகுக்கும்.

இந்த வரவு செலவுத்திட்டத்திலே நில வேளாண்மைக்குப் போதிய நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. இது விதைத்த நிலத்தை உழுது, ஊருக்கும் பேருக்கும் படம் காட்டும் தேர்தல் நடாகமல்ல. உழைக்கும் உழவர்கள் தொழுதுண்டு வாழாமல், உழுதுண்டு வாழும் வாழ்வியல் உரிமைக்காகவே அந்த நிதியொதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. அதுபோல், நீர் வேளாண்மைக்குப் போதிய நிதி ஒதுக்கீடு செய்யப் பட்டிருக்கின்றது. இது, படகுச் சவாரி செய்து படம் காட்டி அரசியல் பிழைப்பு நடத்துவதற்காக அல்ல. நீர் வளங்கள் அனைத்தையும் தம் வாழ்வின் நலனுக்காக, நாட்டின் முன்னேற்றத்திற்காக எமது மக்கள் பயன்படுத்திப் பயனுற வேண்டும் என்பதற்காகவே அந்த நிதி ஒதுக்கீடு செய்யப் பட்டிருக்கின்றது.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, அரசியலில் மட்டுமன்றி அபிவிருத்தியிலும் சமத்துவம் கேட்டுத்தான் நாம் அன்று உரிமைப் போராட்டத்தில் ஈடுபட்டிருந்தோம். அந்த வகையில், எமது உரிமைப் போராட்ட வழிமுறையை மாற்றி, தேசிய நல்லிணக்கப் பாதையில் பயணிக்கத் தொடங்கி யிருந்தாலும் அபிவிருத்தியில் சமத்துவம் என்ற எமது எண்ணங்களும் ஈடேறியே வருகின்றது. யுத்தம் நடந்து முடிந்த காலத்தில் இன்றைய பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்கள் அன்று ஜனாதிபதியாக இருந்தபோதும் இன்றைய நிதிய மைச்சர் பசில் ராஜபக்ஷ அவர்கள் அன்று பொருளாதார அபிவிருத்தி அமைச்சராக இருந்தபோதும் 'வடக்கின் வசந்தம்' என்றும் 'கிழக்கின் உதயம்' என்றும் தமிழ்பேசும் மக்களுக்கு அபிவிருத்தியில் சமவுரிமை வழங்கப்பட்டதை நான் இங்கு நினைவுபடுத்த விரும்புகிறேன்.

அதுமட்டுமன்றி, தேவைக்கேற்ற நிதி ஒதுக்கீடு என்ற வகையில், ஏனைய எட்டு மாகாணங்களையும்விட வட மாகாணசபைக்கு அதிகமான நிதி ஒதுக்கப்பட்டிருந்ததையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகிறேன். ஆனாலும், "ஆடத்தெரியாதவன் அரங்கு கோணல்" என்ற மாதிரி, வட மாகாணசபையின் ஆளுமையற்ற தலைமைகளால் அது வடக்கு மக்களின் வாய்க்கு எட்டாமற்போனதையும் நாம் மறந்துவிடக்கூடாது.

தேசிய உற்பத்திகளை அதிகரிக்கக்கூடிய அனைத்து வழிகளையும் மேற்கொள்வதற்கும் அந்த உற்பத்திகளைத் தரமான உற்பத்திகளாக மேற்கொள்வதற்கும் நாம் முன்வர வேண்டும். குறிப்பாக, எமக்குப் போதியளவில் தரமான வளங்கள் உள்ளன. அவற்றின் பயன்பாட்டை வளமாக்கிக் கொள்வதற்கான உழைப்பிருந்தால் இந்த நாடு அனைத்து விதமாகவும் தன்னிறைவு காணும் என்பதைத் தெரிவித்துக் கொண்டு, விடைபெறுகிறேன்.

மத்தியில் கூட்டாட்சி! மாநிலத்தில் சுயாட்சி! என்ற எங்களுடைய தாரக மந்திரம் தொடரும் என்பதையும் கூறிக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The next speaker is the Hon. Mujibur Rahuman. You have 14 minutes.

[අ.භා. 1.55]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින 2022 අය වැය කාරක සභා අවස්ථාවේ ජනාධිපති, අග්‍රාමාත්‍ය වැය ශීර්ෂ වාගේම ස්වාධීන කොමිෂන් සභා කිහිපයක වැය ශීර්ෂ පිළිබඳවත් අපි කථා කරනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියක් වන ඊවා වනසුන්දර මහත්මිය 2014 ජූලි මාසයේ 06 වැනි දින "දේශය" පුවත් පත සමඟ පැවැත් වූ සාකච්ඡාවක දී මෙහෙම කියලා තිබෙනවා.

"දවසක් හැන්දෑවක ජනාධිපතිතුමා මට දුරකථනයෙන් කථා කළා. කථා කරලා කීවා ඊවා, අද හවස ඔයා වැඩ ඇරිලා යන ගමන් මෙහෙ එනවද කියලා. මම ඇහුවා ඇයි සර් කියලා. නෑ නෑ ඉතින් එන්නකො කියලා සර් කීවා. මම කීවා එහෙනම් සර් මට වෙලාවක් දෙන්න කියලා. නෑ නෑ වෙලාවක් අවශ්‍ය නෑ ඔයා වැඩ ඇරිලා එන ගමන් එන්නකො කියලා ජනාධිපතිතුමා උත්තර දුන්නා.

මම කීවා හරි සර් මම 4.30ට මෙහෙන් එන්නම් කියලා. මම 4.45 වෙද්දි අරලිය ගහ මන්දිරයට ගියා. ගිහින් ඉන්නවා ඉන්නවා ජනාධිපතිතුමා නෑ. ඊට ඉස්සරින් දවසෙ කොහෙදෝ රටක ඉඳන් තමා එතුමා ඇවිත් තියෙන්නේ. මම ඉතින් තේ එහෙමත් බීලා වාඩිවෙලා ඉද්දි ජනාධිපතිතුමා ලහි ලහියේ පඩිපෙළ බැහැලා ආවා. ඇවිත් අයියෝ සමාවෙන්න ඊවා ඇත්තටම මට හොඳටම නින්ද ගියා කියලා සුපුරුදු මිත්‍රශීලීත්වයෙන්ම කථා කළා.

ඊවා.... මේ ....මේ .... කියලා දෙතුන් පාරක් කියලා මම ඔයාව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියක් ලෙස දානවා, ඔයා කැමතියි නේද කියලා මගෙන් එක්වරම ඇහුවා. ඒ වෙලාවේ මගේ හිත මට කීවා ඊවා ඔයාට හැමදාම ඕනෑ වුණේ විනිසුරුවරියක් වෙන්න. දැන් මේ කෙනෙක් ඔයාගේ ඉස්සරහ ඉඳලා කියනවා ඔයාට විනිසුරුවරියක් වෙන්න කියලා. මම කල්පනා කළා මම හා කියනවද බෑ කියනවද කියලා. මට හිතුණා මගේ හීනයක් සැබෑ වෙන්න යන්නෙ කියලා. වෙන කෙනෙක් දෙයක් ඇහුවනම් මම කියන්නේ මම හෙට මගේ මහත්තයාගෙන් අහලා උත්තරයක් දෙන්නම් කියලා. මම සාමාන්‍යයෙන් ඕනෑ දෙයක් 'අප්පච්චිගෙන්' අහනවා.

ඒත් මට ඒ වෙලාවේ හිතුණා මගෙන් මේ ප්‍රශ්නයකට උත්තරයක් ඉල්ලන්නේ රටේ නායකයා. ඒ වගේම මගේ මිත්‍රයෙක්. එතුමා මගෙන් මෙහෙම අහන්නේ මොකක් හෝ හේතුවක් නිසානේ කියලා. මම කීවා 'හරි සර් මම කැමතියි' කියලා."

ඔන්න, එතුමිය කියපු කථාව.

ඒ හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරිය තමයි දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවෙලා ඉන්නේ. එම කොමිෂන් සභාව මේ ගරු සභාවේ ඉන්න ආණ්ඩුවේ මැති ඇමතිවරුන් බොහෝ දෙනෙකුගේ නඩු 45ක් අද වනකොට ඉල්ලා අස් කරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ හැම නඩුවක්ම මේ රටේ දූෂණ, වංචා සම්බන්ධයෙන් කටයුතු කරන්න පිහිටුවා තිබෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විසින් පවරපු නඩු. මෙතුමිය එහි සභාපති වුණාට පස්සේ නඩු 45ක් ඉල්ලා අස් කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පසු ගිය දා -මීට මාසයකට කලින්- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ඉල්ලා අස් කර ගත් ඒ නඩුවල විස්තර ටික ඉල්ලුවා. කියන්න ලජ්ජයි, මාසයක් වනවා, තවම ඒ විස්තර ටික අපට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට ලබා දුන්නේ නැහැ. එහෙමයි අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිතුමිය ඇතුළු කණ්ඩායම වැඩ කරන්නේ. එහෙම නම් අපි එතුමියගෙන් අහනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා සලකපු එකට කළගුණ - කෘතගුණ- සලකන්නද, ආණ්ඩුවේ මැති-ඇමතිවරුන්ගේ නඩු ටික ඉල්ලා අස් කර ගන්නේ කියලා?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරියක් වශයෙන් සිටි එතුමිය අහිංසක මිනිසුන්ගේ බදු මුදලින් පඩියක් ලබමින්, අද මේ විධියට දේශපාලනඥයන්ගේ වුවමනා එපාකම් ඉෂ්ට කිරීම ගැන එතුමිය ලජ්ජා වෙන්න ඕනෑ. අද ග්‍රාම නිලධාරියාට, විදුහල්පතිතුමාට, පොලීසියේ ඉන්න රාළහාමිට දමන නඩු ඉල්ලා අස් කර ගන්නවාද? ඒ, එක නඩුවක්වත් තාක්ෂණික කරුණු කියා ඉල්ලා අස් කරගෙන නැහැ. නමුත් දේශපාලන නායකයන්ට දාපු හැම නඩුවක්ම තාක්ෂණික කාරණා කියා ඉල්ලා අස් කරගෙන තිබෙනවා. ඒ නඩු නැවත දමන්න පුළුවන්. තාක්ෂණික කාරණා කියා මෙතුමන්ලා කියන්නේ මේ කොමිසමේ තුන් දෙනාම අත්සන් කරන්න ඕනෑ නිසායි. නමුත් එක් කෙනෙක් අත්සන් කරලා තමයි නඩුව දාලා තිබෙන්නේ. එහෙම නම් දෙවියනේ! නඩු ඉල්ලා අස් කර ගත්තා නම් තුන් දෙනාම අත්සන් කරන නඩුව දමන්න කෝ. ඇයි, නඩු නොදා ඉන්නේ? අපට තවම ඒ සම්බන්ධයෙන් තොරතුරු ලබා දුන්නේ නැහැ. අපි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ මේ නඩුවල විස්තර ටික ඉල්ලුවා. ඒ ගොල්ලන්ට ඒ ටික තවම දෙන්න බැරි වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දැන් මාසයක කාලයක් ගතවෙලා තිබෙනවා. ඒ ටිකත් හංගාගෙන ඉන්නවා.

මොන ආණ්ඩුව තිබුණත්, මේ කොමිෂන් සභා ටික ස්වාධීනව වැඩ කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, ජනාධිපතිතුමාට තිබුණු බලතල කප්පාදු කර, පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිලධාරින් පත් කිරීමේ බලය ලබා දුන්නේ ඒකයි. නමුත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා -නීතියේ ආධිපත්‍යය හදන්න ආපු එක්කෙනා, මේ රටේ ස්වාධීන අධිකරණයක් හදන්න ආපු එක්කෙනා- මොකක්ද කළේ? විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒ සියලු දේවල් කප්පාදු කර දැම්මා.

**ගරු විමල් වීරවංශ මහතා (කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ஸ - கைத்தொழில் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Industries)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

What is your point of Order, Hon. Minister?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. හිටපු අග්‍රාමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවේදී පිළිගත්තා දිල්රුක්ෂි ඩයස් මැතිනිය එතුමාගේ පෞද්ගලික හිතවතියක් කියලා. එතුමාගේ පවුලේ අයත් එක්ක හැම මාසයකටම එක වතාවක් දිවා භෝජන සංග්‍රහයකට සහභාගි වෙනවා කියලා. එතකොට,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
It is not a point of Order.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු විමල් වීරවංශ ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්නේ, අපේ ආණ්ඩුවක් තිබුණත්, කොයි ආණ්ඩුවක් තිබුණත් මේ රටේ ස්වාධීන අධිකරණ, ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියායි. ඒකට මොන නායකයා ඇඟිලි ගැහුවත් මම විරුද්ධයි. ඒකයි මගේ ස්ථාවරය. ඒකයි මම ඔබතුමන්ලාට කියන්නේ. ඔබතුමන්ලාගේ නායකයා ආවේ මේ රටේ නීතියේ ආධිපත්‍ය හදනවා කියලායි; ස්වාධීන කොමිෂන් සභා ඇති කරනවා කියලායි. අන්තිමට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා කොමිෂන් සභාවලට නිලධාරීන් පත් කිරීමේ බලය එතුමා අතට ගත්තා. හිටපු ජනාධිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරියක් ලෙස ඊවා වනසුන්දර මහත්මිය -එතුමාගේ හිතවතිය, නීති විද්‍යාලයේ හිතවතිය - පත් කළා. වර්තමාන ජනාධිපතිතුමා එතුමිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හැටියට පත් කළා. එම නිසා තමයි අද නඩු 45ක් ඉල්ලා අස්කර ගන්න පුළුවන් වුණේ. ගරු ඇමතිතුමනි, ඒකයි අපි කියන්නේ.

අපි දැක්කා මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කියනවා දේශපාලන පළිගැනීම් කරන්නේ නැහැ, ඒ නිසා එතුමන්ලා දමපු ඒ නඩු ටිකට මොකුත් කරන්නේ නැහැ කියලා. එහෙම කියන්න එපා. දේශපාලන පළිගැනීම් කියලා එකක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ දේශපාලන නායකයෝ හොරකම් කරනවා නම්, වංචා කරනවා නම්, මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිත කරනවා නම් කොයි පැත්තේ හිටියත් ඒවාට දඬුවම් දෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි පෙනී සිටින්නේ. ඒක පළිගැනීමක් නොවෙයි. ඒ නිසා පළිගැනීම් කියලා හොරකම් ලඝු කරන්න යන්න එපා. "පළිගැනීම්" කියන එකත් එක්ක ජනතාවගේ මුදල් අවභාවිත කිරීමට එරෙහිව කටයුතු කිරීම සමාන කරන්න එපා. කවුරු හෝ හොරකම් කරලා තිබෙනවා නම්, වංචා සිද්ධ වෙලා තිබෙනවා නම් ඒකට අධිකරණයෙන් තීන්දු දෙයි. කවුද නිවැරදි -නිර්දෝෂී- කියලා අධිකරණයෙන් තීන්දු දෙයි. එහෙම නැතිව දමපු නඩු ඉල්ලා අස් කර ගන්න එක ගැන මේ රටේ නිදහස් අධිකරණයකට, නිදහස් කොමිෂන් සභාවකට, ස්වාධීනව වැඩ කරන සභාවකට එකඟ වෙන්න බැහැ. ඒකට ප්‍රතිවිරුද්ධයි.

ඊළඟට මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳව අපි බලමු. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මානව හිමිකම් කොමිෂන් සභාව කියන්නේ, මේ රටේ ප්‍රතිරූපය. ඒ වාගේම තමයි ආණ්ඩුවට විරුද්ධව එන චෝදනා රාශියක් එන්නේ මානව හිමිකම් කොමිෂන් සභාවට. නමුත් ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ රාජ්‍ය ඇමතිවරයෙකුගේ පියා වන ජගත් බාලසූරිය මැතිතුමා මානව හිමිකම් කොමිසමේ සභාපති හැටියට පත් කළා. එතුමා ආණ්ඩුවට විරුද්ධව එන චෝදනා විභාග කරයිද? එතැනට කවුරුවත් යන්නේත් නැහැ. එහෙම කරන්න එපා. දැන් එතුමා ඉල්ලා අස්වෙලා තිබෙනවා. එම නිසා අලුත් කෙනෙක් පත් කරන්න යනවා. ඒ අලුත් කෙනාත් ජනාධිපතිතුමාගේ යාළුවෙක් කියලා අපට ආරංචියි. එහෙම කරන්න එපා. එහෙම කළොත් මේ රටේ තිබෙන ගෞරවය, මේ රටේ මානව හිමිකම් පිළිබඳ ලෝකයා අපි දිහා බලන විදිය -ඒ සියලු දේවල්- වෙනස් වෙනවා. එම නිසා මේ කොමිෂන් සභා ටිකට ස්වාධීනව වැඩ කරන්න ඉඩ දෙන්න; ඒකට අවශ්‍ය පරිසරය හදන්න; ආණ්ඩු මාරු වුණත්, අපි බලයට ආවත් ඒවාට ඇඟිලි නොගහන විදියට නීති - රීති ගේන්න. ඒ විදියට නීති - රීති ගෙනැල්ලා මේ රටේ ජනතාව වෙනුවෙන් ස්වාධීනව වැඩ කිරීමේ බලය ගොඩ නඟන එක තමයි ඔබතුමන්ලාගේ කර්තව්‍ය විය යුත්තේ. නමුත්, ඔබතුමන්ලා ඒ කර්තව්‍ය කරන්නේ නැතිව හැම කොමිසමක්ම අද ජනාධිපතිතුමාගේ කකුල්වලට, එතුමාගේ සපත්තුවලට යටපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනාධිපතිතුමා දැන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා. එතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 9වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "... නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට අප කටයුතු කරන්නෙමු. මහජනතාවගේ මෙන් ම විවිධ දේශපාලන සහ බහුජන සංවිධානවල යෝජනා ලබා ගෙන නව ව්‍යවස්ථාව බිහි කිරීම සඳහා පාර්ලිමේන්තුවේ සියලු ම පක්ෂ නියෝජනය කරන තේරීම් කාරක සභාවක් පත් කිරීමට කටයුතු යොදනු ලැබේ"

මේකට තමයි එතුමා ජනවරම ගත්තේ. නමුත් කොහොමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන්න යන්නේ? පසුගිය කාලයේ එතුමාගේ නඩු කථා කරපු නීතිඥවරු ටික දාලා එතුමා ව්‍යවස්ථාවක් හදනවා. එතැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව දැනුවත් විශාරද අය කවුරුවත් නැහැ. පසුගිය කාලයේ එතුමාට නඩු ටිකක් තිබුණා. ඒක අපි ඔක්කෝම දන්නවා නේ. ඒ නඩු කථා කරපු ලංකාවේ ප්‍රවීණ නීතිඥවරු ටිකක් හිටියා. අන්න, ඒ නීතිඥවරු ටික එකතු කරලා මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන්න කමිටුවක් පත් කරලා තිබෙනවා. එහෙම පුළුවන්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න? එහෙමනම්, එතුමාගේ ජනවරමට හාත්පසින්ම වෙනස් විදියට තමයි එතුමා වැඩ කරන්නේ.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවලින් සමන්විත කමිටුවක් හදනවා කියලා. එතුමා ඒක කරන්නේ නැහැ. එතුමා ඒක කරන්නේ නැතුව වෙන දෙයක් කරනවා. ඒ විදියට වෙන දෙයක් කරන්න ගිහිල්ලා -කාර්ය සාධක බලකායක් පත් කරන්න ගිහිල්ලා- ලොකු අවුලක් ඇති කළා. අන්තිමට අධිකරණ ඇමතිතුමා ගිහිල්ලා "මම ඉල්ලා අස්වෙනවා" කියපු ගමන්, ඒක පොඩ්ඩක් reverse එකට ගියා. ඒකනේ ඇත්ත කථාව. එතුමා ඉල්ලා අස්වෙනවා කියපු ගමන් පොඩ්ඩක් reverse එකට ගියා. ඒක පොඩි reverse එකක්. ඒ හින්දා අධිකරණ ඇමතිතුමාටත් තව කොච්චර කාලයක් මේ ආණ්ඩුව ඇතුළේ ඉන්න පුළුවන් වෙයිද කියලා අපි දන්නේත් නැහැ. මොකද, ජනාධිපතිතුමා වැඩ කරන්නේ, කැබිනට් මණ්ඩලයෙන් අහලාවත්, අගමැතිතුමාගෙන් අහලාවත් නොවෙයි. ජනාධිපතිතුමාගේ ලෝකයේ ඉන්නවා එතුමා එක්ක ඉන්න උදවිය ටිකක්. අන්න ඒ උදවියත් එක්කයි ජනාධිපතිතුමා වැඩ කරන්නේ. ඒවා කැබිනට් මණ්ඩලය දන්නේත් නැහැ. අධිකරණ ඇමතිතුමාගේ විෂය ක්ෂේත්‍රයට ලබා දුන් පත්වීම් පිළිබඳව අධිකරණ ඇමතිතුමා දන්නේත් නැහැ, කැබිනට් මණ්ඩලය දන්නේත් නැහැ. එතුමා හැම අමාත්‍යාංශයකටම මේ වාගේ කාර්ය සාධක බලකායක් පත් කරලා තිබෙනවා. කවුරුවත් දන්නේ නැහැ. ඒක තමයි මම කිව්වේ, අද යන්නේ වෙන තැනකට කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව විශේෂ කාරණයක් තිබෙනවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ හිටපු විධායක අධ්‍යක්ෂ තුෂාන් ගුණවර්ධන මහත්මයා සමාජ මාධ්‍ය හරහා විශාල හෙළිදරව්වක් කළා. අපි දන්නවා, තුෂාන් ගුණවර්ධන මහත්මයාට එතැනින් යන්න සිද්ධ වුණු බව. එතුමා සුදු ලූනු වංචාව ඇල්லුවා; සීනි වංචාව ඇල්ලුවා; මේ රටේ හොරකම් කිහිපයක් ඇල්ලුවා. ජනාධිපතිතුමා තමයි එතුමා පත් කළේ. ජනාධිපතිතුමා පත් කළත්, වැඩ කරන්න ගියාම එතුමාට වැඩ කරන්න දුන්නේ නැහැ. ඒ නිසා එතුමා අයින්වෙලා ගියා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

LP gasවල සංයුතිය වෙනස් කරලා තිබෙනවා කියලා අද එතුමා කියනවා. ප්‍රොපේන් තිබෙන්න ඕනෑ සියයට 20යි, බියුටේන් තිබෙන්න ඕනෑ සියයට 80යි. ඒක තමයි කිලෝග්‍රෑම් 12.5ක ගෑස් සිලින්ඩරයක තිබෙන්න ඕනෑ සංයුතිය. අද වෙනකොට ඒ සංයුතිය වෙනස් කරලා ඒවා සියයට 50 බැගින් දාලා තිබෙනවා. ප්‍රොපේන් සියයට 50ක් සහ බියුටේන් සියයට 50ක් දාලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එසේ දැමීම තුළින් මේ රටේ පාරිභෝගිකයා සූරා කනවා කියලා එතුමා කියලා තිබෙනවා. එතකොට, ගෑස් එක ඉක්මනට ඉවර වෙනවා කියලා එතුමා කියනවා. අපි ගෑස් එක මාසයක් පාවිච්චි කළා නම්, දැන් පාවිච්චි කරන්න පුළුවන් දින 20යි. මෙතැන විශාල කොල්ලකෑමක් සිද්ධ වෙනවා. ඒකටත් වඩා බරපතළ දෙයක් තිබෙනවා. එතුමා කියන විධියට ඒ බරපතළ දේ තමයි, ප්‍රොපේන් වැඩි නිසා ගෑස් ලීක් වෙලා බෝම්බයක් වාගේ පිපිරෙන්න පුළුවන් කියන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෑස් ලීක් වෙලා ඊයේ පෙරේදා Racecourse එකේ පිපිරීමක් සිදු වුණා. ඒ වාගේම, වැලිගම පිපිරීමක් සිදු වුණා. මේ දවස් ටිකේම ගෑස් ටැංකි පිපිරුණු බව අපට මාධ්‍ය තුළින් අහන්න ලැබුණා. ඒ වාගේම එතුමා කියනවා, "මම ජනාධිපතිතුමාට මේ වංචාව ගැන දන්වා තිබෙනවා" කියලා. මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

ඒ විතරක් නොවෙයි. ගෑස් සිලින්ඩර පිපිරෙන්න පුළුවන් කියලා එතුමා බන්දුල ගුණවර්ධන ඇමතිතුමාටයි, රාජ්‍ය ඇමතිතුමාටයි ජූලි මාසයේ 7වැනි දා ලිපියකින් දන්වා තිබෙනවා. එතුමා මේ භයානක අනතුර ගැන කියලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම නම් අද පිපිරෙන බෝම්බයක් එක්කයි හැම ගෙදරකම ඉන්න අයට ජීවත් වෙන්න වෙලා තිබෙන්නේ. ඒ වටිනා මිනිස් ජීවිතවල වගකීම භාර ගන්නේ කවුද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම කථාව අවසාන කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

තුෂාන් ගුණවර්ධන මැතිතුමා කියනවා, මේ වංචාව ගැන e-mail හරහා ජනාධිපතිතුමාට කියා තිබෙනවා කියලා. ඒ වාගේම බන්දුල ගුණවර්ධන ඇමතිතුමාටත් දන්වා තිබෙනවා කියලා එතුමා කියනවා. එහෙම නම්, ගෑස් සිලින්ඩර පිපිරිලා මැරෙන හැම ජීවිතයකම වගකීම තමුන්නාන්සේලා භාර ගන්න ඕනෑය කියන එක කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
** ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
** Document not tendered.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Yes, Hon. Wimal Weerawansa?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඊවා වනසුන්දර මැතිනිය ඉලක්ක කරගෙන යම් කිසි විවේචනයක් එල්ල කළා. ඔබතුමා පිළිගන්න, ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා, එතුමාගේ දේශපාලන කටයුතුවල හිටපු කෙනෙක් තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කළේ කියලා. *[බාධා කිරීම්]* නැහැ, නැහැ. මට මගේ පැහැදිලි කිරීම කරන්න ඉඩ දෙන්න.

නමුත්, එතුමා අගවිනිසුරු තනතුර භාර ගත්තාට පස්සේ ජයවර්ධන ජනාධිපතිතුමා කියන හැම එකටම එකඟවෙලා නැහැ. සමහර විට ඒවාට විරුද්ධව තීන්දු දීලා තිබෙනවා. ඒ නිසා යම් කිසි කෙනෙක්,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Thank you, Hon. Wimal Weerawansa. Next, the Hon. Mahinda Amaraweera. You have seven minutes.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට රජය වෙනුවෙන් මේක පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. කාරක සභා අවස්ථාවේ ඒ සඳහා අවසර තිබෙනවා. කාරක සභා අවස්ථාවේ අපට ඒ අවස්ථාව තිබෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Johnston Fernando, what is your point of Order?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාරක සභා අවස්ථාවේ ඇමතිවරයෙකුට පැහැදිලි කිරීම් කරන්න අවස්ථාව තිබෙනවා. ඒක තමයි කාරක සභා අවස්ථාව කියන්නේ. එම නිසා විමල් වීරවංශ ඇමතිතුමාට එතුමාගේ පැහැදිලි කිරීමට ඉඩ දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Wimal Weerawansa.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මම ඔබතුමාත් එක්ක විවාදයකට යන්න නොවෙයි හදන්නේ. මම තේරුම් කර දීමක් මේ කරන්නේ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එතුමාගේ

දේශපාලන කටයුතුවල හිටපු කෙනෙක් අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කළා. හැබැයි, ඒ ආණ්ඩුවේ ගමනට විරුද්ධව එතුමා තීන්දු දීලා තිබෙනවා.

ඒ පත් කරන කෙනාට යම්කිසි හිතවත්කමක් තිබෙන්න පුළුවන්. තනතුරුවලට තරහකාරයන් පත් කරන්නේ නැහැ. ඒ හිතවත්කම තිබූ පමණින් අදහස් වෙන්නේ නැහැ, ඒ අය ඒ පත්වීම දීපු ආණ්ඩුවේ හරි හෝ වැරැදි හැම දෙයක්ම අනුමත කරනවා කියලා. එහෙම දෙයක් එහිදී බලාපොරොත්තු වෙන්න බැහැ. අනෙක, ඊවා වනසුන්දර විනිශ්චයකාරතුමිය කියන්නේ ඉතා කීර්තිමත් විනිශ්චයකාරතුමියක්. ඒ නිසා මේ ගරු සභාවෙන් එළියේ ඉන්න අය ඉලක්ක කරගෙන චෝදනා එල්ල කරන කොට කරුණාකර සාධාරණ වෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාටත් කලින් කිව්වේ, මේ ස්වාධීන-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Let us not make this a debate, Hon. Member.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
No, not a debate. I am explaining. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
We have already discussed this and there was an answer given by the Minister.- *[Interruption.]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
I have the right. - *[Interruption.]* He expressed his view. Now, it is my turn. Please, allow me.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
You have already made -*[Interruption}*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
No, you cannot say that. Then, how come he spoke?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Actually, the Hon. Minister answered that.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Give me a minute. I have to explain.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කිව්වේ මේ රටේ එදා ඉඳන්, එනම් ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ඉඳන්, සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ඉඳන්, ආර්. ප්‍රේමදාස මහත්මයාගේ ඉඳන්-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, you cannot turn this into a debate. Thank you.

The next speaker is the Hon. Mahinda Amaraweera, you have seven minutes.

Order, please! Before he starts, the Hon. (Mrs.) Kokila Gunawardene will take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) KOKILA GUNAWARDENE *took the Chair.*

[අ.භා. 2.12]

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා අද මේ විවාදයට සම්බන්ධ වූ වෙලාවේ රජයට චෝදනා ගණනාවක් එල්ල කළා, විවිධ පත් කිරීම් සම්බන්ධව. ඒ පත් කිරීම් සම්බන්ධ අතීතය ගැන කථා කරන්න ගියොත්, හැමදාම වාගේ මෙවැනි පත්වීම් සිදු කර තිබෙන බව අපට පිළිගන්න වෙනවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ඉඳලාම මේ ආකාරයෙන් පත් කිරීම් රාශියක් සිදු කර තිබෙනවා. නමුත්, අපට වැදගත් වන්නේ පත් කිරීම් නොවෙයි, සාධාරණව ක්‍රියාත්මක වීම.

රජයේ වෙන්න පුළුවන්, විරුද්ධ පක්ෂයේ වෙන්න පුළුවන්, දේශපාලන අධිකාරියේ වෙන්න පුළුවන්, නිලධාරින් වෙන්න පුළුවන්, වැරැද්දක් සිද්ධ කරනවා නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙන්න පුළුවන්, අනෙක් කොමිෂන් සභා වෙන්නත් පුළුවන්, ඒ සියල්ලට මැදිහත් වෙලා දඬුවම් ලබා දීම ස්වාධීනව කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා; අපට ඒ පිළිබඳ විශ්වාසයක් තිබෙනවා. අල්ලස් කොමිසමේ දැන් ඉන්න සභාපතිතුමිය වෙන්න පුළුවන්, ඒ වාගේම අනෙක් සාමාජිකයන් වෙන්න පුළුවන් ඒ අයගෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ වංචාවට, දූෂණයට විරුද්ධව පියවර ගැනීම. ඒකට ආණ්ඩු පක්ෂයේ ද, විරුද්ධ පක්ෂයේ ද කියන ප්‍රශ්නය ඇති වන්නේ නැහැ. එතුමියට වුණත් ඒ කටයුතුවලට බාධාවක් නැහැ, ජනාධිපතිතුමා නිර්දේශ කරලා පත් කළාට. ජනාධිපතිතුමා හොරුන්, වංචාකරුවන් නිදහස් කරන්න කියලා කිසිම වෙලාවක ඉල්ලීමක් කරන්නේ නැති බව මම දන්නවා. ඒ ස්වාධීනත්වය එතුමා ලබා දෙනවා. ඒ වාගේම එතුමා එය ආදර්ශයෙන්ම පෙන්නුම් කරනවා. එතුමාට මොන තරම් චෝදනා එල්ල වුණත්, වංචාව, දූෂණය එතුමාට, එතුමාගේ චරිතයට අදාළ වන්නේ නැහැ කියන කාරණය අපට පැහැදිලිව කියන්න පුළුවන්.

වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට බලය ලැබෙන කොට වෙන කිසිම රාජ්‍ය නායකයෙකුට නොලැබුණු තත්ත්වයක් තමයි රටේ ඇති වුණේ. පසුගිය අවුරුදු දෙකෙන් වැඩිම කාලයක් රට වහලා තිබුණේ. රට විතරක් නොවෙයි,

[ගරු මහින්ද අමරවීර මහතා]

ලෝකයම වහලා තිබුණේ. මේ කොරෝනා වසංගතය නිසා අපේ රටේ ජනතාව විශාල ලෙස පීඩාවට පත් වුණා. අපේ රටේ ප්‍රශ්නයක් වුණා නම් අපට වෙනත් රටකින් උදව් ගන්න තිබුණා. නමුත් ඒ රටවලත් මේ තත්ත්වයම ඇති වුණා. ඒ නිසා අද වන විට භාණ්ඩ මිල ඉහළ යෑම, භාණ්ඩ ගෙන ඒමට තිබෙන සීමා ආදි සියල්ල රජයේ කටයුතුවලට බාධාවක් වෙලා තිබෙනවා.

අපි මේ වන විට විදේශ විනිමය පිළිබඳ විශාල ප්‍රශ්නයකට මුහුණ දෙනවා. අපි ඒක අවංකව පිළිගන්න ඕනෑ. ශ්‍රී ලංකා ද, යූඑන්පී ද, පොහොට්ටුව ද, සමඟි ජන බලවේගය ද කියලා නොවෙයි, මේ රටේ අපි හැමෝටම මේ ආර්ථික අර්බුදයට මුහුණ දෙන්න දැන් සිදු වෙලා තිබෙනවා; මේ ඩොලර් හිඟයට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය විසඳුවේ නැත්නම් එහි ප්‍රතිවිපාකය එන්නේ ජනතාවට. ලබන අවුරුද්ද වන විට, 2023 වන විට මේ අර්බුදයෙන් ගොඩ එන්න අපි සාමූහික ප්‍රයත්නයක් දරන්න ඕනෑ. ඒ සඳහා අපි ජාත්‍යන්තර බැඳීම් ඇති කරගෙන සියලු පාර්ශ්ව එකතු වෙලා එකට හිටියොත් මේ රට ගොඩ ගන්න අපහසුතාවක් නැහැ කියන එකත් මා සඳහන් කරන්න කැමැතියි.

ජනාධිපතිතුමා, මේ තිබෙන වසංගතයෙන් මිදීම සඳහා එන්නත්කරණය ප්‍රමුඛ කාර්ය බවට මේ වන විට පත් කරගෙන තිබෙනවා. අද වන විට පළමු එන්නත දීලා, දෙවන එන්නත දීලා, තුන්වන එන්නතත් -බූස්ටර් එන්නතත්- ලබා දෙන තැනට ඇවිත් තිබෙනවා.

ඒ සඳහා අතිවිශාල මුදලක් වැය කරන්න රජයට සිදු වෙලා තිබෙනවා. මුදල් හිඟය තිබුණත්, මොන ප්‍රශ්න තිබුණත් ඒ එන්නත් ගෙන්වන එක කිසිම ආකාරයකින් නතර කරලා නැහැ. එක පැත්තකින්, ඩොලර් හිඟ වෙන්න ඒකත් එක හේතුවක් වෙන්න පුළුවන්. ඒ මොන තත්ත්වයක් තුළ වුණත්, අඩු පාඩුවක් නොවන විධියට එන්නත්කරණ වැඩ පිළිවෙළ දියත් කරලා, සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් රට විවෘත කරලා, විදේශ රටවල සේවයට යන අය පිටත් කරලා ඒ විදේශ විනිමය මේ රටට ගෙන්වාගෙන රට යථා තත්ත්වයට පත් කිරීම තමයි එතුමාගේ වගකීම බවට පත් වෙලා තිබෙන්නේ. එතුමා ඒ වගකීම ඉෂ්ට කරමින් යනවා. ඒ වාගේම තමයි, එතුමා රාජ්‍ය නායකයා විධියට ආදර්ශයක් දීලා තමයි ජනාධිපති ධුරයේ වැඩ පටන්ගත්තේ. එතුමාට ලැබුණු වාහන, එතුමාට ලැබුණු නිල නිවාස, කාර්ය මණ්ඩල ආදි සියල්ල අවම කරමින් රාජ්‍ය නායකයා විධියට එතුමා ලොකු ආදර්ශයක් දීලා තිබෙනවා.

එතුමා මේ වන විට කළ කාර්යයන් කිහිපයක් කියන්න මා කැමැතියි. එකක් තමයි, පුනර්ජනනීය බලශක්තිය වර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ. මේ ගැන බොහෝ රටවල් කථා කළා; ලංකාවේත් විවිධ අවස්ථාවල කථා කළා. නමුත් එය ක්‍රියාත්මක වුණේ නැහැ. හදන්න නියමිතව තිබුණු ගල් අඟුරු බලාගාරය පවා දැනටමත් නතර කර තිබෙනවා. තවත් ගල් අඟුරු බලාගාර මේ රටේ හදන්නේ නැහැ. වර්ෂා ජලයෙන් ජල විදුලිය ලබා ගැනීමටත්, ඊට අතිරේකව සුළං බලයෙන්, සූර්ය බලයෙන් විදුලිය ලබා ගැනීමටත් ප්‍රමුඛතාව ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. අප මීට පසුව විදුලිය ලබා ගන්නේ ඒ ආකාරයට. ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, ඒ සඳහා වෙනම රාජ්‍ය අමාත්‍යාංශයක් නිර්මාණය කරලා එය ප්‍රමුඛතම කාර්යයක් බවට පත් කර තිබෙනවා. පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා එතුමාගේ කැපවීම පිළිබඳව පරිසර අමාත්‍යවරයා විධියට මම ප්‍රශංසා කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිගරු ජනාධිපතිතුමාගේ රජය ගත් තවත් පියවරක් තමයි මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ වූ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මුදල් අත් පත් කර ගැනීමේ වැඩ පිළිවෙළ. ඒ පිළිබඳව අය වැය කථාවේදීම ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා. ඒ පිළිබඳ අපේ විශාල ඇගැයීමක් තිබෙනවා. ඒ මහ බැංකු බැඳුම්කර සිදුවීම ඇති වූ වෙලාවේ මම තමයි අල්ලස් කොමිසමට ගිහින් පැමිණිලි කළේ; ඒක රටට හෙළිදරව් කළේ. ඊළඟට ඒ කාරණය COPE එකට ආවා. ඒ ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කළා. ඊට අදාළ කටයුතු දිගින් දිගටම ගෙන ගියා. එහි ප්‍රතිඵලයක් විධියට ඒ මුදල් අය කරගන්න ගත් ක්‍රියා මාර්ගය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු මුදල් ඇමතිතුමාටත් අපගේ ප්‍රශංසාව පළ කරනවා. එම ගනුදෙනුවේ මහ මොළකරු වෙච්ච, ප්‍රධාන චූදිතයා වෙච්ච අර්ජුන් මහේන්ද්‍රන් මේ රටට ගෙන ඒමේ වැඩ පිළිවෙළ නතර කරනවා කියලා සමහරු කිව්වත්, අපි එය නතර කරන්නේ නැහැ. ඔහු අනිවාර්යයෙන් මේ රටට ගෙන ඒම දක්වා ම කටයුතු කරන්න අතිගරු ජනාධිපතිතුමා අධිෂ්ඨාන කරගෙන ඉන්නවා. හැබැයි, ඒකට සහයෝගය ලබාදෙන්න පුළුවන් කෙනෙක් තමයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමා දන්නවා අර්ජුන් මහේන්ද්‍රන් ඉන්නේ කොහේද කියලා. ඒ තොරතුර ලබා දුන්නොත්, අනිවාර්යයෙන් ඔහු මේ රටට ගෙනැල්ලා ඔහුටත් දඬුවම් ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා කියන එකත් මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට නියමිත කාලය අවසාන වන මේ වෙලාවේ දිගින් දිගටම කථා කරමින් මම ඔබතුමියට කරදරයක් කරන්නේ නැහැ.

මා අවසාන වශයෙනුත් කියන්නේ මෙයයි. අපට විවේචන තිබෙනවා. අපේ යම් යම් අඩු පාඩු තිබෙනවා. ජනාධිපතිතුමා බලයට පත් වී දැනට අවුරුදු 2ක් ගතවෙලා තිබෙනවා. ආපස්සට හැරී බලා මේ අවුරුදු දෙකක කාලය තුළ අත් හැරුණු දේවල්, අඩු පාඩු වෙච්ච දේවල් පිළිබඳව සොයා බලා නිවැරැදි ගමනක් යන්න කාලය තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි මේ රට ප්‍රපාතයට යන්න කිසිසේත් ඉඩ දෙන්නේ නැහැ; ඒ වාගේම රට ආපස්සට යන්න ඉඩ දෙන්නේත් නැහැ. වරදක් සිදු වෙනවා නම්, ඒක පෙන්වා දෙන්නත් අපි පසුබට වන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා කෙරෙහි විශ්වාසය තබාගෙන මේ රජයට එකතු වුණා වාගේම අපි එතුමාට සහයෝගය ලබා දුන්නා. මේ රට ඉදිරියට ගෙන යන්නත් අපි එතුමාට ශක්තිය ලබා දෙනවා කියන කාරණයත් සහතික කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.20]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ඉතා වැදගත් විවාදයක් පැවැත්වෙන මේ මොහොතේ වචන ස්වල්පයක් කථා කරන්නට හැකිවීම පිළිබඳව මම සතුටු වෙනවා.

ඔබතුමන්ලා දන්නවා, අපි විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දුන්නාට පසු 1977 සිට, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පාලන කාලයේ සිට මේ විධායක ජනාධිපති ක්‍රමයේ බලතල පිළිබඳව විශාල විවේචනයක් තිබුණු බව. විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව කථා කරන කොට අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ

කාරණයක් තිබෙනවා. අපේ යහ පාලන රජය කාලයේ පාර්ලිමේන්තුවේ අපි සියලු දෙනා පාහේ එකතු වෙලා විධායක ජනාධිපති ක්‍රමයේ පවතින බලතල අඩු කිරීමට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා.

අපේ අමාත්‍යවරුන් කිහිප දෙනෙකුම කිව්වා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ මෙහෙමයි පත්වීම් දුන්නේ, ඒ කාලයේ එහෙමයි කළේ කියලා. අපි රටක් හැටියට, ජාතියක් හැටියට කාලයත් එක්ක වෙනස් වෙලා තියෙනවා. 1977දී යම් වැරැද්දක් සිදු වෙලා තිබෙනවා නම්, 2021දීත් ඒ වැරැද්ද කරන්න ඕනෑ කියන නීතියක් නැහැ. ඒ හින්දාම තමයි අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසි වතාවක්ම වෙනස් කළේ. නමුත් විධායක ජනාධිපති ක්‍රමයේ ඒ බලතල අඩු කළ යුතුයි කියන සම්මත පිළිගැනීමක් තිබෙනවා. ඒ සම්මත පිළිගැනීමත් එක්ක තමයි පසුගිය අවුරුදු පහ, හයේ අපි මේ රටේ කටයුතු කළේ. නමුත් අද ඉතාම කනගාටුයි කියන්න, "එක රටක් - එක නීතියක්" වාගේ දේවල් මවලා ජනතාව රවට්ටලා අපේ විධායක ජනාධිපති ක්‍රමයට දැවැන්ත බලයක් ලබා දුන්නා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා විධායක ජනාධිපති ක්‍රමය ඉතා ශක්තිමත් කර ගත්තා. ඒ නිසා ස්වාධීන කොමිෂන් සභාවල ස්වාධීනත්වය සම්පූර්ණයෙන්ම කෙලෙසුනා. අද ස්වාධීන කොමිෂන් සභා කියන දේ තිබෙන්නේ නමට පමණයි. ඇත්තටම විධායකය තමන්ට ඕනෑ විධියට තමයි මේ ස්වාධීන කොමිෂන් සභා සම්පූර්ණයෙන්ම මෙහෙයවන්නේ.

නමුත් අපි පසුගිය කාලේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හදලා, කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ ආණ්ඩු පක්ෂය, විපක්ෂය මේ සියල්ලම එකතු වෙලා පාර්ලිමේන්තුව තුළින් තමයි ඒ ආයතනවලට නියෝජිතයන් පත් කළේ. නමුත් අද එවැනි තත්ත්වයක් උදාවෙලා නැහැ. පාර්ලිමේන්තුව නිකම් seal එකක් බවට පත් වෙලා තිබෙනවා. අද මේ කටයුත්ත කෙරෙන්නේ තනිකරම විධායකයට අවශ්‍ය විධියට. අන්න ඒක තමයි මෙතැන තිබෙන ප්‍රධාන ගැටලුව.

මා මිත්‍ර මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ කථාවේ දී ප්‍රකාශ කළා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවේ ලොකු ගැටලුවක් තිබෙනවාය කියන කාරණය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවේ තිබෙන ලොකුම ගැටලුව තමයි පසුගිය කාල සීමාව තුළ, ඒ කියන්නේ, පසු ගිය අවුරුදු එකහමාර දෙක තුළ මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ නඩු හතළිස් පහකට ආසන්න සංඛ්‍යාවක් ඉල්ලා අස් කරගෙන තිබීම. එතකොට මේ ස්වාධීන ආයතනය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව තිබෙන්නේ අල්ලස් චෝදනාවලට ලක්වෙච්ච අයගේ නඩු විභාග කරලා දඬුවම් කරන්න ද, එහෙම නැත්නම් ඒවා ඉල්ලා අස් කර ගන්නද කියන සැකය රටක් හැටියට ජනතාවට තිබෙනවා. අන්න ඒ ගැටලුවට අපි මුහුණ දෙන්න ඕනෑ. ඒ ගැටලුවට ප්‍රධානම හේතුවක් තමයි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක විධායකයට තිබුණු බලතල වැඩිවීම නිසා ඒ ස්වාධීන ආයතනයේ තිබෙන ස්වාධීනත්වය අඩුවීම. ඒක පිළිගත යුතුයි. මේ නඩු ඉල්ලා අස් කර ගන්නේ යම් තාක්ෂණික - technical - දෝෂ නිසා නම්, ඒ තාක්ෂණික දෝෂ නිවැරදි කරලා නැවත නඩු පවරන්න ඕනෑ. නමුත් ඒ නඩු පැවරීමේ ප්‍රමාදයක් තිබෙන බව අපි දකිනවා; රටේ ජනතාව දකිනවා. ඇත්තටම මේ තත්ත්වය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවේ පමණක් නොවෙයි අද ඇති වෙලා තිබෙන්නේ. මේ තත්ත්වය අනෙක් ස්වාධීන කොමිෂන් සභාවලත් අපි දැකලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු ප්‍රසිද්ධියේ මාධ්‍ය ඉස්සරහා ජාතික පොලිස් කොමිෂන් සභාව විවේචනය කරනවා, මට ඕනෑ පොලිස් ස්ථානාධිපතිතුමා ගන්න බැරි වුණා කියලා. එහෙම නැත්නම් තවත් අය චෝදනා කරනවා, මට ඕනෑ පොලිස් ස්ථානාධිපතිතුමා නොවෙයි, අනෙක් ඇමතිට ඕනෑ පොලිස් ස්ථානාධිපතිතුමා තමයි මගේ බල ප්‍රදේශයට ගත්තේ කියලා. ඒ, ස්වාධීනත්වයත් කෙලෙසිලා තිබෙනවා. එම ස්වාධීන ආයතන, එම ස්වාධීන කොමිෂන් සභා විනාශ වෙලා තිබෙනවා. මේ ආකාරයට ඉතාම ගැටලුසහගත තත්ත්වයකට මේ රට පත් වෙලා තිබෙනවා. අනෙකුත් ස්වාධීන කොමිෂන් සභා ගත්තත් එහෙමයි. භයානකම කාරණාව තමයි නීතිපති දෙපාර්තමේන්තුවට ඇති වෙලා තිබෙන තත්ත්වය. ඔබතුමා දන්නවා, නඩු ගණනාවක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් අධිකරණයට යොමු කරලා තිබෙන බව. නීතිපති දෙපාර්තමේන්තුවෙන් අධිකරණයට යොමු කරපු නඩු, නීතිපති දෙපාර්තමේන්තුවම ඉල්ලා අස් කර ගන්න තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. එදා නීතිපතිතුමා තමයි අද අග්‍රවිනිශ්චයකාරතුමා. එතකොට, එදා අග්‍රවිනිශ්චයකාරතුමා අනුමැතිය ලබා දුන් ඒ නඩු ටික නීතිපති දෙපාර්තමේන්තුවෙන් අද ඉල්ලා අස් කර ගන්නවා.

එතකොට මේක ගැටලු සහගත තත්ත්වයක් නොවෙයි ද? එවැනි ප්‍රශ්නයක් තිබෙනකොට, අද රටේ ඇති වෙලා තිබෙන මේ ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටලුසහගත තත්ත්වය දෙස ජාත්‍යන්තරයත් බලාගෙන ඉන්නවා. දැන් GSP Plus සහනාධාරය අපට අහිමිවීමේ ප්‍රධානම හේතුව ඒ කාරණාව තමයි. එතකොට ජාත්‍යන්තර වශයෙන් අපට යම් යම් ගැටලු තත්ත්වයක් ඇති වුණොත්, ඒකට මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ. තමුන්නාන්සේලා ගත්ත තීන්දු තීරණ නිසා තමයි අද ජාත්‍යන්තරය අපේ රටට ඇඟිලි ගහන්නේ. ජාත්‍යන්තරයට ඇඟිලි ගහන්න පුළුවන් විධියට තීන්දු තීරණ අරගෙන, ජාත්‍යන්තරය ඇඟිලි ගහනවා කියලා කෑ ගහලා අනුකම්පාව ලබා ගත්තාට වැඩක් නැහැ. ඒ නිසා එවැනි තත්ත්වයක් උදා නොවන ආකාරයට අපි කටයුතු කරන්න ඕනෑ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ යම් අඩු පාඩුවක් තිබුණා නම්, ඒවායේ නිවැරදි කිරීම්, සංශෝධනය කිරීම් කළ යුතුයි කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා. නමුත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ යම් යම් වෙනස් කිරීම් සිදු කරනවා කියන්නේ, ආපහු පිටුපස්සට ගිහින් ඒක සම්පූර්ණයෙන්ම නැති කරන එක නොවෙයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු ඒ වැරදි නිවැරදි කිරීමට කටයුතු කළා නම්, යම් අඩු පාඩුවක් තිබිලා ඒවා නිවැරදි කරන්න කටයුතු කළා නම්, අපි විපක්ෂයක් හැටියට ඒකට සම්පූර්ණ සහයෝගය දෙනවා. නමුත්, ඒක නොවෙයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. අද සම්පූර්ණයෙන්ම එක පුද්ගලයෙකුට ඕනෑ විධියට තමයි මේ කටයුතු කරන්නේ. හැබැයි, "එක රටක්-එක නීතියක්" ලු. මේකේ "එක රටක්-එක නීතියක්" නැහැ. ඇත්තටම "එක රටක්-එක නීතියක්" කියන වචන දැන් දූෂණය කරලා තිබෙන්නේ. "එක රටක්-එක නීතියක්" කියලා දෙයක් දැන් නැහැ. ඇමතිතුමනි, දැන් "එක රටයි-නීති හැටයි." එක රටයි, නීති හැටයි. ඒක තමයි වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලාට එක නීතියක්; විපක්ෂයට තව නීතියක්.

පසුගිය කාලයේ අපි කොළඹ විරෝධතාවක් සූදානම් කර තිබියදී ඒකට සෞඛ්‍ය නීති රීති දාලා, පොලීසිය යොදවලා ඒකට කරන්න ඕනෑ බලපෑම් සියල්ලම කළා. පාස්කු ප්‍රහාරය එල්ල කළාට පසු දිනයේ ලංකාව පුරාම barriers දාලා තිබුණා. අපි ඒක දැක්කා නේ. ඒ වන විට අනුරාධපුරයට 2,000කට එන්න කියලා උපන්දින සාදයක් පවත්වා තිබුණා. ඊළඟ දවසේ දවල් කෑමටත් එහෙමයි. *[බාධා කිරීමක්]* ඔබතුමා ඒකට ගියාද නැද්ද මම දන්නේ නැහැ. සමහරවිට ඔබතුමාට ආරාධනාවක් ලැබෙන්නත් නැතිව ඇති. ඊළඟ දවසේත් 2,000කට දවල් කෑම දීලා තිබුණා. මා මිත්‍ර නාමල් රාජපක්ෂ මැතිතුමා ප්‍රේක්ෂකයන් තුන්දාහක්, හාරදාහක්, පන්දාහක් ගෙන්වලා 'අගමැති මහින්ද රාජපක්ෂ කුසලානය' නමින් පාපන්දු තරඟාවලියක් පැවැත්වුවා. එහෙම නම් ඒකටත් අවසරයක් නැහැ, -

**ගරු නාමල් රාජපක්ෂ මහතා (තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ - இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரும் அபிவிருத்தி ஒருங்கிணைப்பு மேற்பார்வை அமைச்சரும் டிஜிட்டல் தொழில்நுட்பம் மற்றும் தொழில்முயற்சி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Namal Rajapaksa - Minister of Youth and Sports, Minister of Development Coordination and Monitoring and State Minister of Digital Technology and Enterprise Development)

Madam, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා මගේ නම සඳහන් කළා.

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා ද, cricket matchesවලටයි, ක්‍රීඩා තරගවලටයි සෙනඟ එන එක නවත්වන්න කියලා? *[බාධා කිරීමක්]* - නැහැ, ඔබතුමා ඉල්ලීමක් කරනවාද නැද්ද කියලා විතරක් කියන්නෙ කෝ. දැන් ඔබතුමා ඒක නේ සඳහන් කළේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මම කථා කරන්නේ, "එක රටක්-එක නීතියක්" ගැන.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඇහුවේ, ක්‍රීඩා තරග නරඹන්න ප්‍රේක්ෂකයන්ට අවසර දෙන එකට විරුද්ධ ද නැද්ද කියලායි. විරුද්ධ ද නැද්ද කියන්න. ඔව් ද, නැද්ද?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

දැන් කොටින්ම කිව්වොතින්, මේ පාර්ලිමේන්තුවේත් තිබෙන්නේ නීති දෙකක්. "එක රටක්-එක නීතියක්" කියන එක ඉස්සෙල්ලාම මේ පාර්ලිමේන්තුවේ ඇති කරන්න. මේ පාර්ලිමේන්තුවේත් එක නීතියක් නැහැ. මේ පාර්ලිමේන්තුවේත් ආණ්ඩු පක්ෂයේ අයට එක නීතියක්; විපක්ෂයේ මට එක නීතියක්. මෙතැන දී ඉතා පැහැදිලිව මම කියන්නේ මෙයයි. "එක රටක්-එක නීතියක්" තිබෙනවා නම්, අපේ විපක්ෂය සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයටම ආණ්ඩු පක්ෂයෙන් සංවිධානය කරන දේවල් සම්බන්ධයෙනුත් ඒ විධියටම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒක ක්‍රීඩා උත්සවයක් ද, කඨින පෙරහැරක් ද, birthday party එකක් ද කියන එක අපට අදාළ නැහැ. ඒකයි මම කියන්නේ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. සරල ප්‍රශ්නයක් ඇහුවේ. ඔව් ද, නැද්ද කියලා කියන්න කෝ. ඔබතුමන්ලා උද්ඝෝෂණ කරනවා. ක්‍රීඩා තරගවලට සෙනඟ එන එකට ඔබතුමන්ලා ඉරිසියා කරන්න එපා. මොකද, උද්ඝෝෂණයයි, ක්‍රීඩා තරගයි කියන්නේ දෙකක්. මේ දෙක පටලවා ගන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු ඇමතිතුමනි, කඨින පෙරහැරක් ද, ක්‍රීඩා උත්සවයක් ද, උද්ඝෝෂණයක් ද කියන ප්‍රශ්නය නොවෙයි මෙතැන තිබෙන්නේ. ජනතාව එකතු වෙනවා ද නැද්ද කියන ප්‍රශ්නයයි මෙතැන තිබෙන්නේ. එතකොට, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කියනවා එවැනි අවසරයක් ලබා දීලා නැහැ කියලා. අපි එවැනි දෙයක් කළා නම්, පොලීසියෙන් අප අත්අඩංගුවට ගන්නවා. ඊට පස්සේ නඩු දානවා. එතකොට අපට උසාවි යන්න වෙනවා. නමුත් ඔබතුමන්ලාට එහෙම වෙන්නේ නැති ප්‍රශ්නයක් තමයි අපට තිබෙන්නේ. ඒක නිසා කරුණාකරලා මේක විවාදයක් කර ගන්න එපා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා සම්පූර්ණයෙන්ම ගරු සභාව නොමඟ යවනවා. ක්‍රිකට් තරගාවලියකට වෙන්න පුළුවන්, football match එකකට වෙන්න පුළුවන්, vaccine doses දෙකම ගහපු, fully vaccinated කෙනෙකුට තමයි, පිට්ටනියකට එන්න අවසර දෙන්නේ. එතුමන්ලා මිනිස්සු ගෙනැල්ලා බොන්න දීලා උද්ඝෝෂණය කරනකොට vaccines ගහපු අය පමණක් ගේන්නේ නැහැ. කරුණාකරලා සභාව නොමඟ යවන්න එපා, ජනතාව නොමඟ යවන්න එපා. මොකද, ක්‍රීඩා තරගාවලියක් බලන්න සෙනඟට එන්න අවසර දීලා තිබෙන්නේ vaccine doses දෙකම ගත්, fully vaccinated අයට පමණයි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු ඇමතිතුමනි, මමත් ක්‍රීඩා කරපු, ක්‍රීඩාවට ආසා කරන පුද්ගලයෙක් කියලා ඔබතුමාත් දන්නවා. ඒ ගැන විවාදයක් නැහැ. *[බාධා කිරීමක්]* නමුත්, මෙතැන අවසර ලබා දීලා තිබෙන්නේ ක්‍රීඩාව පවත්වන්න. නමුත්, ඒකට ප්‍රේක්ෂකයන්ට - spectatorsලාට - ඒමට අවස්ථාවක්- *[බාධා කිරීමක්]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Madam Presiding Member, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ හරින්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අපේ ඇමතිතුමාගේ නම සඳහන් කරපු නිසා තමයි අවස්ථාව දෙන්න වුණේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

නම සඳහන් කළාට විසි පාරක් නම සඳහන් කළාද? එක පාරක් නම සඳහන් කරන්න ඇති. ඒක හරි, කමක් නැහැ.

එහිදී අවසර ලබාදී තිබෙන්නේ ක්‍රීඩාව පවත්වන්න. හරිද? එම නිසා එතැන ක්‍රීඩා තරගය පවත්වන්න පුළුවන්. නමුත්, ක්‍රීඩා තරගය පවත්වනවා කියලා ප්‍රේක්ෂකයන් දහස් ගණනක් ගේන්න බැහැ. *[බාධා කිරීමක්]*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ )
(The Hon. Wimal Weerawansa )

I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා හිතාගෙන ඉන්නේ කට කැපෙන්න බීලා ගෙනාවාම fully vaccinated කියලා. එහෙම vaccines දෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
දැන් මෙහෙම දෙයකුත් තිබෙනවා නේ. මෙතැන ආණ්ඩුව විවේචනය කරලා, ජනාධිපති විවේචනය කරලා, බොරුවට මාධ්‍ය සාකච්ඡා පවත්වලා, "බොරු ටෝක්" ගොඩක් දාලා- *[බාධා කිරීමක්]*

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ක්‍රිකට් තරගාවලිවලටත් සියයට 35ක් fully vaccinated අයට එන්න සෞඛ්‍ය අමාත්‍යාංශය අවසර දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා ප්‍රශ්නයක් අහපු නිසායි උත්තරය දුන්නේ. නැත්නම් ඔබතුමාට පව් වැඩේ. ඔබතුමා නොමඟ ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කරුණාකරලා මෙතැනදී අසාධාරණයක් කරන්න එපා. මේ රටේ ජනතාව මේක බලාගෙන හිටියාම තේරෙයි, "එක රටක්-එක නීතියක්" මේ පාර්ලිමේන්තුවේත් නැහැ කියන එක. හරිද? ඒක මේ පාර්ලිමේන්තුවේත් නැහැ. තමුන්නාන්සේලාට එක නීතියක්, අපට තව නීතියක්. එතකොට අහිංසක අපේ මිනිස්සුන්ට මොන එක රටක් - එක නීතියක්ද? ඒකයි මම කිව්වේ, ආණ්ඩු පක්ෂයට එක නීතියක්, අනෙක් අයට තව නීතියක් කියලා. මේක තමයි යථාර්ථය. මේ පාර්ලිමේන්තුවේ වෙන දේම තමයි, පාර්ලිමේන්තුවෙන් පිටතත් වෙන්නේ. විපක්ෂය යම් විරෝධතාවක් කළා නම්, ඒවාට බාධා එල්ල කළා නම්, ඒ හේතුවම බලපානවා, ආණ්ඩු පක්ෂයෙන් සංවිධානය කරන දේවලටත්. ඒ නිසා මම මෙතැනදී කියන්නේ, ආණ්ඩු පක්ෂයෙන් සංවිධානය කරන දේවලට එහෙම දෙයක් නැහැ කියලායි. ඒක තමයි අද අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් වෙලා තිබෙන්නේ.

මම කථා කරමින් හිටියේ නීතිපති දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳවයි. අපට පැහැදිලිවම දකින්න ලැබෙනවා, ආණ්ඩු පක්ෂයට හිතවත් මැති-ඇමතිවරුන්ගේ නඩු, ආණ්ඩු පක්ෂයට හිතවත් පුද්ගලයන්ගේ නඩු ඉල්ලා අස් කරගෙන තිබෙන බව. ඒ වාගේම ව්‍යාපාරිකයන්ගේ නඩු ඉල්ලා අස් කරගෙන තිබෙනවා. එතකොට, එතැන ගැටලුවක් තිබෙනවා නේ. තාක්ෂණික හේතු මත නම් මේ නඩු ඉල්ලා අස් කරගෙන තිබෙන්නේ, ඒ තාක්ෂණික දෝෂ නිවැරදි කරලා නැවත නඩු පවරන්න පුළුවන්. නමුත්, ඒ නඩු නැවත පවරන්නේ නැති ප්‍රමාදයක් තිබෙනවා. එහෙම වෙන්නේ දේශපාලන හේතු නිසාය කියන සැකය මේ රටේ ජනතාවට, අපට තිබෙනවා. ඒ ගැන විවාදයක් නැහැ. ඒකට ප්‍රධානම හේතුව මොකක්ද? අද ඒ ස්වාධීන යැයි කියන ආයතන පත් කිරීමේ ඉඳලාම ස්වාධීනත්වය දූෂණය වෙලා තිබෙනවා. එදා පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් තමයි ඒ කටයුතු කළේ. ස්වාධීන කොමිෂන් සභාවලට සාමාජිකයන් පත් කළේ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන්. හැබැයි, අද එහෙම දෙයක් වෙන්නේ නැහැ.

මීට ටික වෙලාවකට කලින් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කිව්වේ, කෝල් එකක් දීලා එන්න කියලා, වැඩ ඇරිලා එන ගමන් එන්න පුළුවන්ද කියලා අහලා, ඒ ආවාම තේ එකක් එහෙම බීලා පත්වීමක් දෙනවා කියලායි. ඔන්න ඔහොම තමයි අද පත්වීම් ලබා දෙන්නේ. ඒ කටයුත්තේ ගැටලු තත්ත්වයක් තිබෙනවා. හැබැයි, මෙතැන භයානක දෙයක් තිබෙනවා. අපි තමුන්නාන්සේලා මේ ගැන විවාද කරයි. නමුත්, GSP Plus සහනාධාරය මේ හේතු නිසා නැති වුණොත්- *[බාධා කිරීමක්]* මට නාමල් රාජපක්ෂ ඇමතිතුමා විනාඩි තුනක් ලබාදෙයි, බාධා කළාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට අමතර මිනිත්තුවක කාලයක් ලබා දීලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අමතර කාලයත් දැන් අවසානයි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මේ ගැටලු නිසා අපේ රටේ ජනතාවට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ කරුමය තමුන්නාන්සේලා ගෙවනවා නම් කමක් නැහැ. මේ කරුමය ගෙවන්නේ මේ රටේ මිලියන 22ක ජනතාව නේ. අන්න ඒක නේ ගැටලුව. අද ඇති වෙලා තිබෙන තත්ත්වය ඒක නේ. අද ජනතාව ජීවත් වෙන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. GSP Plus සහනාධාරයත් නැති වෙලා කර්මාන්තශාලා ටික වැසී ගෙන ගියොත් මොකක්ද වෙන්නේ? එතකොට මේ රටේ ජනතාවට තමුන්නාන්සේලාගේ ගෙවල්වලද රැකියාව කරන්න වෙන්නේ? අද ජනතාවට ජීවත් වෙන්න විධියක් නැහැ. කෑම ටික කන්න, එළවලු ටිකක් ගන්න විධියක් නැහැ..

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.යූ.එම්. අලි සබ්රි මැතිතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.36]

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. පසුගිය කාලය තුළ ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට කරපු පත්කිරීම් සියල්ලක්ම ගරු අග්‍රවිනිශ්චයකාරතුමා සහ නීතිපතිතුමා විසින් recommend කරපු අයගෙන් තෝරා ගෙන ඒ ක්ෂේත්‍රය තුළ ඉන්න අයගෙන් කුසලතා පූර්ණ අය තමයි පත් කර තිබෙන්නේ. පසුගිය ආණ්ඩුව පූර්ණ කාලීනව දූෂණ මර්දන කමිටුවක් කියලා එකක් දාගෙන ඒකට නීතිපති දෙපාර්තමේන්තුවේ පුද්ගලයනුත් සම්බන්ධ කරගෙන කවදාවත් නොතිබුණු විධියට තෝරලා, බේරලා, පෙරළා මිනිසුන්ට නඩු දැම්මා. ඊට ගැළපෙන විධියට අලුතින් උසාවි හැදුවා; නීති සංශෝධනය කළා. ඒ නඩු දානකොට දාන්නේ

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

නඩුවේ තිබෙන කරුණු මත නොවෙයි, පුද්ගලානුබද්ධව. ඒ නඩු, ඒ කාලයේ ඇහුවත් නිදහස් වෙනවා; ඊට පසුව වුණත් නිදහස් වෙනවා.

පසුගිය ආණ්ඩුව කාලයේ ජනාධිපතිතුමා පත් වීමට පෙරම ජොන්ස්ටන් ඇමතිතුමාගේ නඩුව කුරුණෑගලදී දිනෙන් දිනම ඇහුවා. අහලා, එතුමා නිදොස්කොට නිදහස් කළා. ඒකට කවුරුවත් බලපෑම් කළාද? ඊට පස්සේ ගාමිණී සෙනරත් මහත්තයා ඇතුළු තවත් කිහිප දෙනෙකුට විරුද්ධව විශේෂ අධිකරණයේ දැමූ පළමුවැනි නඩුව තිබුණා. මම ඒකට පෙනී සිටියා. දවස් 58ක් ඒ නඩුව ඇහුවා. එතුමා සියලු චෝදනාවලින් නිදොස්කොට නිදහස් කළා. ඒ, පසුගිය ආණ්ඩුව කාලයේ. දේශපාලන හේතු මත බොරු නඩු දානකොට අනිවාර්යයෙන්ම නිදහස් වෙනවා තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්ත වශයෙන්ම ඒ කිසිම නඩුවක චෝදනාවක් නැහැ. වංචාවක් වුණා කියලා කොහේවත් සාකච්ඡා වෙන්නේත් නැහැ. එකක, ලිත ගැහුවා කියලා තිබෙනවා. තව එකක, දුප්පත් මිනිසුන්ට ෂීට් බෙදුවා කියලා තිබෙනවා. තවත් එකක, ප්‍රාදේශීය සභාවලට බට දුන්නා කියලා තිබෙනවා. තවත් එකක, සිල් රෙදි බෙදුවා කියලා කියනවා. හැම නඩුවකම කියනවා, නඩු දාලා චෝදනාවට ලක් කරපු පුද්ගලයන් රුපියලක්වත් අයුතු ලෙස පාවිච්චි කරලා නැහැ කියලා. නීතිඥයකු වශයෙන් මට කියන්න පුළුවන්, එවැනි නඩු ඇහුවත් අනිවාර්යයෙන් සියයට 99ක්ම නිදොස්කොට නිදහස් වෙන එක තමයි වෙන්නේ කියලා. නීතිපතිතුමා බලනවා ඇති, හැම දාම නඩු දාලා පරදිනවා නේද කියලා. ඒ ගැන කල්පනා කරලා බලලා සමහර නඩු නිදහස් කරනවා ඇති. ඒවාට අපේ කිසිම සම්බන්ධයක් නැහැ. ඒවාට අපි කිසිම විධියකට මැදිහත් වෙලාත් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Madam Presiding Member, I rise to a point of Order.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
කිසිම point of Order එකක් නැහැ. නිදහස් කරන්න දීපු order එකකට අපි කිසිම ආකාරයකට මැදිහත් වෙලාත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මහතා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු ඇමතිතුමනි, උසාවියෙන් නිදහස් කරනවා නම්, ඒක වෙනම කථාවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරය භාර ගත්තේ 2019 නොවැම්බර් මාසයේ. ඒ වෙනකොටත් ලංකාව අභියෝග රැසකට මුහුණ දී අවසන්. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලය තුළ යුද්ධය මැද සියයට 6.2ක සාමාන්‍යයක පැවැති ආර්ථික වේගය, යහ පාලන කාලය අවසන් වන විට සියයට 2.4කට කඩා වැටුණා. ඒ කාලයේදී යුද්ධයක් පැවැතියේත් නැහැ.

ඒ කාලය තුළ රට ආර්ථිකමය වශයෙන් වැටුණා පමණක් නොවෙයි, බුද්ධි අංශ විසින් 97 වතාවක් දැනුම් දී තිබියදීත් වළක්වා ගත යුතුව තිබූ පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට අපොහොසත් වීම හේතු කොටගෙන රට විශාල අර්බුදයකට ඇද දැමුණා. ආයෝජන නැවතුණා. මිනිසුන්ගේ සිත් තුළ තිබුණු බලාපොරොත්තු කඩා වැටුණා. ජනතාව අතර තිබුණු සාමයට, සංහිඳියාවට මරු පහරක් වැදුණා. විදේශ සංචාරකයන්ගේ පැමිණීම ශීඝ්‍ර ලෙස පහළ වැටුණා. ගොවි ජනතාවට තමන්ගේ නිෂ්පාදන සඳහා සහතික මිලක් නොතිබීම හේතු කොටගෙන ඔවුන් ආර්ථික වශයෙන් වාගේම විශාල වශයෙන් මානසිකව බිඳ වැටුණා. ඒ කාලයේ ගොවීන් තම ණය ගෙවා ගත නොහැකි තත්ත්වයකට පත් වුණා. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා රජය භාරගෙන කෙටි කාලයක් තුළ ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වයක් ලබා දීලා, බුද්ධි අංශ ශක්තිමත් කරලා, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කළ හැකි සියල්ල ඉටු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කරලා, ඒ කටයුතු ශක්තිමත්ව ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය යාන්ත්‍රණය මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරලා තිබෙන්නේ.

කඩා වැටුණු ආර්ථිකය ගොඩනැංවීම සඳහා පෞද්ගලික අංශය හවුල් කොටගෙන ආයෝජන පුළුල් කිරීමට, නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කිරීමට, පෞද්ගලික අංශය දිරිමත් වන ආකාරයේ වැඩසටහන් දියත් කර ගැනීමට වැඩසටහන් රාශියක් දියත් කර තිබෙනවා. උදාහරණයක් ලෙස වැට් බද්ද අඩු කළා. ආදායම් බද්දත් අඩුකොට තිබෙනවා. විදුලි සංදේශ බද්ද අඩු කළා. ඒ සියල්ලෙන්ම බලාපොරොත්තු වුණේ, Madam Chairperson, to give an impetus to a struggling and sluggish economy and to promote investment.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you have two more minutes.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
How many minutes?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Two more minutes.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
Altogether, how many minutes have been allotted to me?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Seven minutes for you.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
I am just starting my speech. - *[Interruption]* Anyway, I will continue.

එවන් වකවානුවක තමයි වත්මන් ජනාධිපතිතුමාගේ ධුර කාලයේ මාස තුනක් යන විට අපි කවුරුත් බලාපොරොත්තු නොවූ, අප කිසිවෙකුට පාලනය කරගත නොහැකි වූ ලෝකයේ සුපිරි බලවතුන් පවා දණ ගැස්සූ කොරෝනා උවදුරට මුහුණ දීමට සිදු වුණේ. කොරෝනා හේතු කොටගෙන ශ්‍රී ලංකාවට ලැබෙන දේශීය ආදායම් මෙන්ම විදේශීය විනිමය ද කඩා වැටුණු බව අපි හැමෝම දන්නා කාරණයක්.

අපේ රටේ ගුවන් තොටුපළවල් වසා දමන විට, විදේශ සංචාරකයන්ගේ පැමිණීම සියයට 100ක් නැති වෙලා ගියා. ඒ හේතුව නිසා විතරක් 2020 වසරේදී ආර්ථිකයට විදේශ විනිමය ලෙස වූ පාඩුව ඇමෙරිකානු ඩොලර් බිලියන හතරකට ආසන්නයි. රට අභ්‍යන්තරයේ ආදායම, රට වසන විට - lockdown කරන විට - ක්‍රමක්‍රමයෙන් අඩු වන බව අපි සියලුදෙනාම දන්නවා. රටේ විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා ආනයනය සීමා කරන විට ඒ හා සාපේක්ෂව රේගුව හරහා ලැබෙන ආදායම ද අඩු වන බව අප වටහා ගත යුතුයි. ඒ හා සමගාමීව බදු ආදායමේ අඩු වීමක් මෙන්ම, සුරාබදු ආදායමේ අඩු වීමක් ද පැහැදිලිවම දැක ගන්නට හැකියි. එවන් අභියෝගාත්මක පරිසරයක් තුළ විවිධ ක්ෂේත්‍රවල අප ඇති කරගෙන ඇති ප්‍රගතිය දෙස සහ ගන්නා ලද තීන්දු තීරණ පිළිබඳව මැදිහත් සිතින්, උපහාස, අපහාස ඉවත් කොට සාධනීය ලෙස සලකා බලන විට ප්‍රායෝගිකව භූමියේ පවතින තත්ත්වය තුළ අපට සෑහීමකට පත් විය හැකි බව සාධාරණ මිනිසකුගේ කෝණයෙන්, පක්ෂ පාට භේදයකින් තොරව රට ගැන හිතන ඕනෑ කෙනෙකුට පෙනෙනු ඇති. ඒ සම්බන්ධයෙන් මා තෝරාගත් ක්ෂේත්‍ර කිහිපයක අපි ඇති කරගෙන ඇති ප්‍රමිතිය හා ලබා දී ඇති ප්‍රමුඛතාව පිළිබඳව වචන කිහිපයක් සඳහන් කළ යුතු වනවා.

එක පැත්තකින් රාජ්‍ය ආදායම දේශීය හා විදේශීය වශයෙන් කඩා වැටෙද්දී, විදේශීය බලවතුන්ගේ ආර්ථිකය පවා දැඩි ලෙස පීඩාවට ලක් වෙද්දී, වියදම් වැඩිවීමේ අතිවිශාල අභියෝගයකට අපේ රටට මුහුණ දෙන්න සිදු වුණා. කොවිඩ් තත්ත්වය මධ්‍යයේ ආර්ථිකය කඩා නොවැටී රැකගෙන රාජ්‍ය සේවයට එක දිනක් හෝ වැටුප් නිසි වෙලාවට නොගෙවා නොසිට, සෞඛ්‍ය ක්ෂේත්‍රයට හා එන්නත්කරණයට ආයෝජනය කිරීම නිසා ආදායම අඩු වෙද්දී, වියදම වැඩි වීමේ ප්‍රවණතාවක් ඇති බව අප වටහා ගත යුතුව තිබෙනවා. කුමන පක්ෂයක් බලයේ සිටියද රාජ්‍ය පාලනය හා කළමනාකරණය යන්නෙන් අදහස් කරන්නේ රජයට හා භාණ්ඩාගාරයට ලැබෙන ආදායම කළමනාකරණය කර ගැනීම සඳහා, එය වියදමට ගළපා ගැනීම සඳහා කටයුතු කිරීමයි. එම නිසා කෙටි කාලීනව ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු වී ගැලරිය අමන්දානන්දයට ලක් කරන්නට, සටන් පාඨ ගොඩනඟන්නට නොව, කෙටිකාලීන, ජනප්‍රිය ලොසින්ජර් බෙදීමේ රාජ්‍ය කළමනාකරණය වෙනුවට දීර්ඝ කාලීනව රට සංවර්ධනයට යොමු කරන වැඩ පිළිවෙළකට යොමු කිරීමට පක්ෂ විපක්ෂ අපි සියලුදෙනාම එක්විය යුතු කාලය පැමිණ තිබෙන බව මා ප්‍රකාශ කරනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ මෙන්ම ක්‍රියාවෙන්ද අධ්‍යාපනය සඳහා විශේෂ ප්‍රමුඛතාවක් ලබා දී තිබෙනවා. අධ්‍යාපනය තුළින් පමණක් රටට දීර්ඝ කාලීන, තිරසාර සංවර්ධනයකට හා අභිවෘද්ධියට මඟ පාදන බව වටහාගෙන තිබෙනවා. ඒ සඳහා දැවැන්ත ආයෝජන සිදු කරමින් තිබෙනවා. වසර 28ක් පුරා විසඳන්නට බැරි වෙච්ච ගුරු වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා අභියෝග මැද ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ මුදල් ඇමතිතුමා ප්‍රමුඛ රජය මිලියන තිස්දාහක මුදලක් අය වැයෙන් වෙන් කර තිබෙනවා. මේ අභියෝගාත්මක කාලය තුළ තමන් ගැන පමණක් සිතන්නේ නැතුව, දීර්ඝ කාලීනව රටේ ස්ථායිතාව හා වර්ධනය පිළිබඳ සිතා බලා, මෙම අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල පෙරළියක් සහ විප්ලවයක් ඇති කිරීමට අප වගබලා ගත යුතු වනවා.

ශ්‍රී ලංකාව තුළ තිබෙන, මා පෙර සඳහන් කළ ආර්ථික අභියෝග තුළ වුවද, අතිගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ජනතාවගේ සෞඛ්‍යයට මුල් තැන ලබා දුන්නා. වරින් වර වෙනස් වන, වරින් වර තීව්‍ර වන, වරින් වර ස්වරූපය වෙනස් කරන රුදුරු වයිරසයේ අභියෝග මැද රට ආරක්ෂා කර ගැනීම සඳහා සහ ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා සෞඛ්‍ය අංශයට අතිවිශාල ආයෝජනයක් කිරීමට රජය කටයුතු කර තිබෙනවා. මේ වනකොට එන්නත්කරණය අතින් අපි දියුණු රටවල් හා සමානව හෝ ඊට වඩා ඔබ්බට ගිහින් තිබෙනවා. Booster shot එකකුත් ලබා දෙන තත්ත්වයට අපි පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි රටක් වශයෙන් ආඩම්බර විය යුතුයි. විවිධ රටවලින් අපට උකහාගත හැකි අත්දැකීම් හා පාඩම්වලින් රාජ්‍ය අංශයේ දූෂණය හා නාස්තිය අඩුකොට, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඇති හොඳම මෙවලමක් ලෙස තාක්ෂණය හඳුනාගත හැකියි.

ඉතිහාසයේ පෙර නොවූ විරූ ලෙස ජනාධිපතිතුමා පෞද්ගලිකවම ඩිජිටල්කරණය සඳහා විශාල දායකත්වයක් හා උනන්දුවක් දක්වන බව පැහැදිලිවම පෙනෙන්නට තිබෙනවා. අන්තර්ජාල පහසුකම් ලංකාව පුරා තීව්‍රකොට පාසල් අධ්‍යාපනය සඳහා අභියෝගාත්මක කාලයක් තුළ එය සම්බන්ධ කර ගැනීම, රාජ්‍ය ආයතන ඩිජිටල්කරණයට ලක්කොට සේවා සැපයීම වඩාත් කාර්යක්ෂම කිරීම, ශ්‍රී ලංකා රේගුව, බැංකු ජාල, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, සමාගම් මැදුර, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඇතුළු අධිකරණ පද්ධතිය ක්‍රම ක්‍රමයෙන් ඩිජිටල්කරණය කිරීම සඳහා පෙර නොවූ විරූ ලෙස විශාල ප්‍රයත්නයක් දරන බව සහ ඒ සඳහා ආයෝජනය කරන බව ඉතා ආඩම්බරයෙන් කියන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාල වේලාව නැති නිසා මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරනවා.

ඇමෙරිකාවේ හිටපු ජනාධිපති හැරී ට්‍රෲමන් මහතා කළ ප්‍රකාශයකින් මම මගේ කථාව අවසන් කරනවා.

"Let us keep our eyes on the issues and work for the things we all believe in. Let each of us put our country ahead of our party, and ahead of our own personal interests". එනම්, "අප ප්‍රායෝගිකව මුහුණ දෙන සැබෑ අභියෝගවලට නෙත් යොමු කරමු. අපි විශ්වාස කරන දර්ශනය වෙනුවෙන් පෙනී සිටිමු. අප අපගේ පක්ෂයට පෙර රට ගැන හිතමු. අප අපගේ ආත්ම ලාභය හා අපේක්ෂාවන්ට පෙර රටේ පොදු යහපතට ප්‍රමුඛත්වය දෙමු."

බොහොම ස්තුතියි.

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

විවිධ රටවල් තම ඉතිහාසය තුළ මෙවැනි අභියෝගාත්මක තත්ත්වලවලට මුහුණ දී තිබෙන බව ඉතිහාසය අධ්‍යයනය කරන විට හොඳින් පැහැදිලියි. ඇමෙරිකාව 1930දී විශාල ආර්ථික අවපාතයකට ලක් වුණා. මුළු ලෝකයම දෙවන ලෝක යුද්ධයෙන් පසුව ආර්ථිකව කඩා වැටුණා. 1998 වර්ෂයේ එවකට Tiger Economies ලෙස විරුදාවලිය ලබා තිබූ මැලේසියාව, තායිවානය ඇතුළු සම්පූර්ණ ආසියානු කඳවුරට අයත් රටවල් සියල්ලක්ම කඩා වැටුණා. කොරියාව 1998 වර්ෂයේ ආර්ථික අවපාතයට ලක් වී සම්පූර්ණයෙන්ම බංකොලොත්භාවයේ අභිමුඛයට පැමිණුණා.

කෙසේ වෙතත්, එකී රාජ්‍යයන්හි සියලුදෙනා පුරවැසියන් ලෙස එක්සත්ව එක්සිත්ව තම තමන්ගේ යුතුකම් ඉටු කරමින් දැඩි කැපවීමෙන් කටයුතු කරමින් ආත්මාර්ථය ඉවත්කොට පරාර්ථකාමී ලෙස රට දෙස බලා කටයුතු කිරීම හේතුකොට ගෙන ඔවුන්ට ඉතා කෙටි කලකින් යළිත් එම ආර්ථික අවපාතයෙන් ගොඩ ඒමට හැකියාව ලැබුණා.

එම නිසා අපි සියලුදෙනාම මේ අවස්ථාවේදී පක්ෂ පාට භේදවලින් තොරව, පදනම් විරහිත චෝදනා හා ප්‍රතිචෝදනාවලින් ඉවත් වී හුදු පුස් සටන් පාඨ හා ගැලරිය පිනවන ඉල්ලීම් වෙනුවට දීර්ඝ කාලීනව රට සංවර්ධනයට යොමු කළ හැකි යෝජනා හා විවේචන ඉදිරිපත් කළ යුතු කාලය එළැඹී ඇති බව මම අවංකව විශ්වාස කරනවා.

[2.47 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Madam Chairperson, I wish to make a few comments with regard to four Commissions: the National Police Commission, the Delimitation Commission, the Human Rights Commission of Sri Lanka and the Election Commission.

Madam, we are aware that the Delimitation Commission has suggested and is, in fact, about to take steps to annex an area which comprises 600 families in the Kebithigollewa Divisional Secretary's Division and an area which comprises 430 families from the Padaviya Divisional Secretary's Division, a total of 1,030 families from the North-Central Province, with the Vavuniya North Pradeshiya Sabha Division. These are all Sinhalese families. If this decision or the idea by the Delimitation Commission goes ahead, it will entirely change the demography of the Vavuniya North Pradeshiya Sabha Division. I think that is not a thing which ought to be done. I have raised this matter several times before. My Colleagues have also raised it. In fact, we have asked for an appointment to meet the Hon. Namal Rajapaksa with regard to this issue. That decision must be stopped immediately. Nothing must be done to change the demography of areas, Madam. I think that is something that the Delimitation Commission must keep in mind. In fact, one of the most important aspects that they must address themselves to is the fact that they must try and maintain demographies, especially considering the sensitive nature of the North and the East.

A similar situation took place in 2017 where 1,600 families from the Anuradhapura District were annexed to the Vavuniya North and as a result, five new Sinhalese Pradeshiya Sabha Members, till then never electable, got elected. So, I think it is very obvious. This happened also during the previous Government. We are not just blaming this Government, but what I am saying is that that sort of change in demographies is unacceptable. We hope that at least this Government brings in certain policies to maintain the *status quo*.

The second matter is with regard to the Human Rights Commission and the National Police Commission. Madam, you are aware of Sri Lanka's track record with regard to the police. Sri Lanka, I think, is number two in the world with regard to complaints of torture and such is the horrendous nature in which, unfortunately, the police conduct investigations. That is not something which is to be proud of. Because of the rampant nature of the way in which these investigations take place and the police act, what happens is, victims go and make complaints to the Human Rights Commission because obviously, when you go and make such complaints to the police itself, they do not accept those. So, when we go to the Human Rights Commission - I have personally experienced this - or when several victims whom we have directed to go to the Human Rights Commission to make complaints go there, the Commission is very reluctant to take such complaints and investigate.

It is only under extreme pressure, where the victims have some sort of political overtones, that the Commission eventually agrees to take down a complaint, but once the complaints are taken down, nothing happens. A good example is the previous HQI of the Jaffna Police Station. He is notorious not only for violations under the Convention Against Torture and other Cruel Inhuman or Degrading Treatment or Punishment Act, but also for being so corrupt. There had been numerous complaints that had been made, but no actions were taken. On the contrary, he has, in fact, as of last month, got a promotion. That is the rather appalling state with regard to the complaints the Human Rights Commission receives.

With regard to policing, we have - I do not know whether I can use the term "honourable" - anyway, the Hon. Minister of Public Security. There was an incident that took place to my Colleague, the Hon. Selvarajah Kajendren, who is an Hon. Member of this Parliament. The Hon. Selvarajah Kajendren wanted to pay his respects to a former member of the LTTE, but was not making it out to be an LTTE issue or did not try to encourage people to gather. He wanted to pay respects. He has been doing that repeatedly every year and likewise, he went alone. The OIC turned up there with a phone in one hand - this arrest came on the media - talking to the Minister concerned where the Hon. Selvarajah Kajendren was openly told - it can be heard through media video footages - that it was illegal for him to pay his respect when the Government has, in fact, announced that everyone can pay their respect provided that it is not to encourage the LTTE's identity. When the Hon. Selvarajah Kajendren went there, there were no banners or anything else and there was no fanfare. He was only going to light a lamp, where you had the OIC

talking to the Minister concerned and telling the Hon. Kajendren that he would be arrested if he lights a lamp. The Hon. Kajendren was subsequently arrested. There was no court order, he was arrested and at the time of arrest, the media covered it, where the OIC said that it was because he was purporting to remember an LTTE cadre. He was taken to the police station after the arrest, statements were recorded and ultimately, the Hon. Kajendren was released on police bail, not for trying to commemorate a fallen LTTE cadre, but because apparently, he had violated COVID rules. This is a blatant act where the OIC of that area should have been investigated by the National Police Commission and punished! It is an Hon. Member who had been treated in this way. He was manhandled and the OIC should have been punished, but to date, no action has been taken. This is what is happening to an Hon. Member of Parliament. You can just imagine what the situation is with regard to the thousands and thousands of victims who make complaints with absolutely no recourse to justice.

Finally, Madam, I wish to make a few comments with regard to the Election Commission. During the course of the previous Government, the Constitutional Council was apparently neutral. I said "apparently" because the chief Opposition party at that time was part of the Government and likewise, even the JVP, we all know, was very close to the Government. Definitely the chief Opposition party was part of the Government. There can be no doubt about that.

So, when you look at the composition of the previous Constitutional Council, of course, you would realize that it was completely lopsided. One has to call into question those appointments since the Council was not appointed as it was supposed to be appointed under the Seventeenth Amendment, which would have definitely made it independent. There were certain Amendments that were made under the Nineteenth Amendment, but even though it could have been independent, certainly the political realities of Parliament were such that I do not know whether it could be called "independent". But anyway, the Election Commission was appointed by that Constitutional Council and one of the Commissioners of the Election Commission made it a point to take up a public position that called for boycotting an election. Boycotting a particular election must be completely disregarded and the people must, in fact, go and exercise their franchise. I think it was completely wrong for a member of the Election Commission to make that call because if a citizen wants to boycott an election, if he feels that he wants to protest at a certain election or does not feel that any of the options in that election are desirable, then he must be able to take up a political position as such. In India, for example, when you go to the elections, there is one option which says "none of the above". Unless you have some way in which you can clearly state that you do not want to be a party to this sort of election process, boycotting is not an illegal position.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member you have two more minutes.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Yes, I am winding up Madam.

It is, in fact, a highly democratic act to call for a boycott and exercise a boycott. When there was a public call for a boycott like what our party did during the last Presidential Election, for a Commissioner to sit in that office and contradict that position, I think, is completely wrong. So, once the Election Commission must ideally encourage people to vote, if there is a position that is being taken by any political movement, party or an activism which says that a boycott must be called for, then I think the Election Commission must be silent on the question of a boycott and must explain it to the people that that is also an option.

So, these are some of the things, I think, the Government must take into consideration in the course of this Budget, in allocating funds and maybe, in bringing amendments to the relevant Acts, but the way in which the Human Rights Commission has been acting and the National Police Commission's total inaction with regard to complaints of police brutality and torture are also things that must be addressed. Those are matters that go to the very fundamental nature of the citizen's security.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. ගරු සාගර කාරියවසම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.00]

**ගරු සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙනුත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධයෙනුත් විපක්ෂය මේ ගරු සභාවේ කථා කරනවා අපි අහගෙන සිටියා. මමත් නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු රජයේ අධිනීතිඥවරයෙක්. වසර 7ක් එහි සේවය කරලා තිබෙනවා. ඇත්තටම නීතිපති දෙපාර්තමේන්තුව කියන්නේ, අධිකරණය කියන්නේ, අපි බොහොම ගරු කරන, බොහෝදෙනා ආදරය කරන ආයතන දෙකක්. නීතිපති දෙපාර්තමේන්තුවේ ගෞරවය කෙලෙසුවේ, නීතිපති දෙපාර්තමේන්තුව දූෂණය කළේ කවුද කියන ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ විපක්ෂයයි.

අපි දන්නවා, පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ හිටපු සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත් මැතිතුමා අරලියගහ මන්දිරයට කැඳවලා, විරුද්ධවාදීන්ට බොරු නඩු පවරන්න එතුමාට බලපෑම් කළේ කොහොමද කියලා. ඒ විතරක් නොවෙයි. නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු අතිරේක සොලිසිටර් ජනරාල්වරියක් වන දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මියටත් බලපෑම් කළා. එතුමිය බලපෑමට ලක් කළේ කොහොමද කියලා එතුමිය මේ රටේ ජනතාවට කියනවා අපි දැක්කා. අල්ලස් හෝ දූෂණ චෝදනා

[ගරු සාගර කාරියවසම් මහතා]

විමර්ශන කොමිෂන් සභාව තුළින් බොරු නඩු පවරා විරුද්ධවාදීන්ට අඩන්තේට්ටම් කරන්න, ඔවුන් මැඩලන්න, බොරු නඩු පවරන්න කියලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මෙහෙය වූයේ කොහොමද කියලා එතුමිය කිව්වා. මේවාට ඕනෑ කරන පිළිතුරු යහ පාලන රජය කාලයේම මේ රටේ ජනතාවට ලැබුණා. පසුගිය කාලයේ පැවරූ නඩු එකක්වත් ඇත්ත නඩු නොවෙයි; සාධාරණ නඩු නොවෙයි. තමන්ගේ විරුද්ධවාදීන් මැඩලන්න ඕනෑ නිසා බොරු නඩු නිර්මාණය කරලා කටයුතු කළා. නීතිපති දෙපාර්තමේන්තුවට බලපෑම් කරලා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට බලපෑම් කරලා විරුද්ධවාදීන්ට එරෙහිව බොරු නඩු ගොනු කෙරෙව්වා. ඒකේ පෙරහැර යන්න පටන් ගත්තේ, කසකාරයන් ගියේ යහ පාලන ආණ්ඩු පාලන කාලයේදීමයි.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාට විරුද්ධව පවරපු බොරු නඩුව තමුන්නාන්සේලාට මතක ඇති. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පැවැති කාලයේදීමයි නඩුව ඇහුවේ. ඒ නඩුවේ තීරණය මොකක්ද? නිදොස් කොට නිදහස් කළා. ඒ වාගේම තමුන්නාන්සේලාගේ පාලන කාලයේ තව බොරු නඩුවක් පැවරුවා, හිටපු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත් මහතාට විරුද්ධව. තමුන්නාන්සේලාගේ කාලයේදීමයි ඒ නඩුවත් ඇහුවේ. ඒ නඩුවේ තීරණය මොකක්ද? නිදොස් කොට නිදහස් කළා. දැන් මේ සිද්ධ වෙමින් යන්නේ, එදා සිද්ධ වූ වැරැද්ද නිවැරදි කිරීමයි. මෙහිදී කිසිම වරදක් වෙන්නේ නැහැයි කියන එක අපි ඉතා විශ්වසනීයත්වයෙන් කියනවා. තමුන්නාන්සේලා නඩු පැවරුවේ කොහොමද කියලා මේ රටේ ජනතාවට තවම මතකයි. රාත්‍රී 12.00 වන කල් උසාවි විවෘත කරලා තබා ගත්තා. අපට මතකයි, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කොහොමද අත් අඩංගුවට ගත්තේ කියලා. අපට මතකයි, තමුන්නාන්සේලා මහ ලොකුවට "දූෂණ, වංචා" කියමින් පවරපු නඩු මොනවාද කියලා. ලිත් වගයක් අච්චු ගැහුවාය කියලා නඩුවක් පැවරුවා. ප්‍රාදේශීය සභාවලට ගැල්වනයිස් බට බෙදුවාය කියලා නඩුවක් පැවරුවා. සමෘද්ධිලාභීන්ට රුපියල් 2,500ක් වැනි මුදලක් ගෙව්වාය කියලා නඩුවක් පැවරුවා. මෙන්න මේවා තමයි පවරපු නඩු. මෙවැනි බොරු නඩු පැවරුවාම ඒ චෝදනාවලින් නිදහස් කරන්නේ නැතුව, ඒ චෝදනාවලින් නිදොස් කරන්නේ නැතුව, මේ රටේ අධිකරණ, මේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙන මොනවා කරන්නද කියන ප්‍රශ්නය තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගෙන්ම අහගන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කථා කරන්න කාලය මදි.

ඒ විතරක් නොවෙයි. මේ ගරු සභාවේදී ඊවා වනසුන්දර මහත්මිය සම්බන්ධයෙන් යම් කාරණයක් කිව්වා. එය ඉතාම කනගාටුදායකයි.

ඊවා වනසුන්දර මහත්මිය කියන්නේ, අපේ අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ batchmate කෙනෙක් බව අපි දන්නවා. හැබැයි, එතුමිය විතරක් නොවෙයි, දින පනස්දෙකේ ආණ්ඩුවේ එතුමාට විරුද්ධව තීන්දුව දීපු හිටපු අගවිනිසුරු නලින් පෙරේරා මහත්මයා, ඒ වාගේම හිටපු අගවිනිසුරු කේ. ශ්‍රී පවන් මහත්මයා යන සියලුදෙනා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමකාලීනයෝ. ඔබතුමන්ලාගේ නායකතුමාට ඒ වාගේ සමකාලීනයෝ නැති වීම ගැන අපි කනගාටු වෙනවා. නමුත් ඒකට කරන්න දෙයක් නැහැ. නමුත් එහෙමයි කියලා නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ඉතාම අවංක, ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු ඉතාම අවංක විනිසුරුවරියකට, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මේ විධියට අපහාස කරන්න එපා කියන ඉල්ලීම මම තමුන්නාන්සේලාගෙන් කරනවා.

මේ රටේ නීතිය විනාශ කළේ, මේ රටේ නීතිය වල් වැද්දුවේ, මේ රටේ නීතිය නැති කළේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මිසක් වෙන කවුරුවත් නොවෙයි. අද මේ සිදු වෙමින් පවතින්නේ, ඒ කාලයේ සිදු කරපු වැරැද්ද නිවැරැදි කිරීම මිසක් වැරැදි දෙයක් කිරීම නොවෙයි. ඒක හොඳට තේරුම් ගන්න. තමුන්නාන්සේලා වැරැදි විධියට නඩු දැම්මා නම්, වැරැදි කළා නම්, බොරු නඩු පැටලුවා නම්, ඒ නඩුවලින් අනිවාර්යයෙන් ඒ පුද්ගලයන් නිදහස් වෙන්න ඕනෑ. ඒ නිදහස් වීමේ කාර්යය තමයි අද සිදු වෙන්නේ. මේක මේ රටේ ජනතාව තේරුම් අරගෙන තිබෙනවා. නමුත් විපක්ෂයේ ඉන්න තමුන්නාන්සේලාට ඒක තේරුම් ගන්න තරම් බුද්ධියක් නැති වීම ගැන අපි කනගාටු වෙනවා. මේ රටේ ශ්‍රේෂ්ඨ ආයතන වන, මේ රටේ මිනිස්සු ගරු කරන ආයතන වන නීතිපති දෙපාර්තමේන්තුවට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සහ අධිකරණ පද්ධතියට අපහාස කරන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම මම තමුන්නාන්සේලාගෙන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) KOKILA GUNAWARDENE *left the Chair and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

[අ.භා.3.07]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ඇවිල්ලා අවුරුදු දෙකක කාලයක් ගතවෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාව විශාල බලාපොරොත්තුවකින් තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ලබා දුන්නේ. අවුරුදු දෙකක් ගතවෙලා එතුමාගේ දෙවැනි පදවි ප්‍රාප්තිය සමරන අවස්ථාවේ හැටනව ලක්ෂය ඇතුළු මේ රටේ ජනතාවට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක පෙන්වන කාටූන් එකක් දැන් මා අතේ තිබෙනවා.

මේ කාටූනයෙන් පෙන්වන්නේ, ජනාධිපතිතුමා දෙවැනි පදවි ප්‍රාප්තිය සමරන අවස්ථාවේ එතුමා කේක් එකේ තිබෙන ඉටිපන්දම්වලට පිඹින විට ගරු අග්‍රාමාත්‍ය, මහින්ද රාජපක්ෂ මැතිතුමා බලාගෙන සිටින අයුරු සහ රටේ ඉන්න ජනතාවගේ ඔළුව ගිනි අරගෙන එළියට දුවන ආකාරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි මම මෙය **සභාගත** කරනවා.*

මේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු දෙකක් ගතවෙලා තිබෙනවා. ඔබතුමන්ලා ප්‍රකාශ කළා, ඉතා ඉක්මනින් මේ රටේ හරිත කෘෂිකර්ම යුගයක් ආරම්භ කරනවා කියලා. අපිත් බලාගෙන හිටියා, මොන ආකාරයටද ඒ හරිත කෘෂිකර්මය ආරම්භ කරන්නේ කියලා. අය වැයෙන් රුපියල් මිලියන 4,000ක් වෙන් කරලා තිබෙනවා, හරිත කෘෂිකර්මයට. ඒ මුදල්වලට මොකක්ද වෙන්නේ කියන එක අපි මේ අවස්ථාවේදී GR ආණ්ඩුවෙන්- Reverse Gear ආණ්ඩුවෙන් - අහන්න ඕනෑ. මොකද, ඊයේ රාත්‍රියේත් ගැසට් එකක් ගහලා, ඒ ගැසට් එක අද වෙනකොට reverse කරගෙන තිබෙනවා. ඒකට වගකිව යුතු නිලධාරින් අස් කරන්න ආණ්ඩුව පියවර ගෙන තිබෙන බවක් අපට දැන ගන්න ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලන්න ඕනෑ මේ රටේ ජනතාවට අද ඇත්තටම මුහුණ දෙන්න වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියලා. එළවලු ගන්න, මාසයේ අන්තිම වෙනකොට එන බිල් ටික ගෙවන්න අද ලැබෙන පඩිය මදි. ජීවත් වෙන්න ඒ ලැබෙන මුදල් මදි. විරැකියාව සියයට 5.7දක්වා වැඩි වෙලා තිබෙනවා. උද්ධමනය දිහා බලනකොට අපිත් කල්පනා කරනවා, කොහොමද අපි ඒක calculate කරන්නේ කියලා. මොකද, දවසින් දවස උද්ධමනය වෙනස් වෙනවා.

ඒ වාගේම රජයට එකතු වන බදු ප්‍රමාණය සියයට 9.2කින් පහළ බැහැලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය ණය ප්‍රමාණය 2020 වෙනකොට සියයට 111 දක්වා විතර වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ඩොලර් බිලියන 46.7ක් අපට ගෙවන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එන අවුරුද්දේ ඩොලර් බිලියන 5ක පමණ ණය අප ගෙවිය යුතු වනවා. අපි කොහොමද මේ ණය ගෙවන්න යන්නේ? අපි මේ ණය ගෙව්වේ නැත්නම් මේ රටට මොකක්ද වෙන්නේ කියන එකත් මේ අවස්ථාවේ අපි කල්පනා කරන්න ඕනෑ.

අපට විදේශවලින් ලැබෙන ආධාර සියයට 50කට වැඩිය අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම, Moody's ශ්‍රේණිගත ආයතනයේ ratings Caa2 දක්වා අඩු කරලා තිබෙනවා. S&P ශ්‍රේණිගත ආයතනයේ ratings CCC plus දක්වා අඩු කරලා තිබෙනවා. අය වැයෙන් පසුව අනිවාර්යයෙන්ම ගෙවිය යුතු බදු වැඩි වෙනවා. ඒ වාගේම bank charges අනිවාර්යයෙන්ම වැඩි වෙනවාය කියන එකත් මේ අවස්ථාවේ කනගාටුවෙන් වුණත් මේ සභාවට දැනුම් දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසුගිය සෙනසුරාදා වන විට තිබුණු සීනි මිල සහ එළවලු මිල පිළිබඳ සටහනක් සකස් කරගෙන ආවා. අද වෙනකොට සීනි මිලත් වැඩි වෙලා තිබෙනවා. අපි සීනි වංචාවට විරුද්ධව පැමිණිල්ලක් කළා, සමගි ජන බලවේගය හැටියට. ඒකටත් තවම වෙච්ච දෙයක් නැහැ කියන එක කනගාටුවෙන් වුණත් මේ ගරු සභාවට කියන්න වෙනවා. බඩු මිල දිහා බැලුවාම, අද වනවිට කැරට් කිලෝ එකක් රුපියල් 480යි. ලීක්ස් කිලෝ එකක් රුපියල් 600යි. බෝංචි කිලෝ එකක් රුපියල් 480යි. බණ්ඩක්කා කිලෝ එකක් රුපියල් 480යි. මාළු මිරිස් කිලෝ එකක් රුපියල් 600යි. නුවරඑළියේ ආර්ථික මධ්‍යස්ථානය මේ වන විට වහලා. ඒක කවදා අරිනවාද කියන එක පිළිබඳවත් ආරංචියක් නැහැ. හාල් මිල බැලුවාම රුපියල් 98ට තිබුණු නාඩු සහල් කිලෝ එකක් මේ වනවිට රුපියල් 140ක් දක්වා වැඩි වෙලා. ව්‍යාපාරිකයන් L/C ඇරගන්න බැරුව ඉන්නේ. පිටරට යන්න ඩොලර් ඉල්ලනකොට බැංකුවලින් ඩොලර් ලැබෙන්නේ නැහැ. ඉතා නරක, අමාරු තත්ත්වයකට ලබන අවුරුද්දේ මේ රටේ ජනතාවට මුහුණ දෙන්න වෙනවාය කියන එක අපට කියන්න වෙනවා.

මේකට විසඳුම මොකක්ද? අපට අවශ්‍යයි ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවයක්. - economic diplomacy - විදේශ රටවල් එක්ක කථා කරලා අපට අවශ්‍ය මුදල් ලබා ගන්න ඕනෑ. අවශ්‍ය නම් IMF එකත් එක්ක කථා කරන්න පුළුවන්. මම දන්නවා ඒ ගැන කැබිනට් මණ්ඩලයේ පැවැති සාකච්ඡාවකදී, කැබිනට් මණ්ඩලයේ බහුතරයක් IMF එකත් එක්ක කථා කිරීමට විරුද්ධ වූ බව. නමුත්, අපි රටක් හැටියට අනාගතයට මුහුණ දෙන්න නම් අපට අනිවාර්යයෙන් IMF එකත් එක්ක කථා කරන්න සිදු වෙනවා කියන එක රජයට අවධාරණය කරන්න මා කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවමත් මේ රටේ මිනිස්සු කියනවා "සර් ෆේල්" කියලා. හැබැයි, ආණ්ඩුවේ සමහර මැති ඇමතිවරු කියනවා කොරෝනා වසංගතය නිසා තමයි ලංකාවට මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි අනෙකුත් රටවල තත්ත්වය පෙන්වා දෙන්න. ඉන්දියාව ගත්තොත්, මේ කොරෝනා කාලය තුළ ඉන්දියාවේ විදේශ සංචිත වැඩි වෙලා තිබෙනවා. කොරෝනා වසංගත තත්ත්වය ආරම්භ වන කොට ඉන්දියාවේ විදේශ සංචිත තිබුණේ ඩොලර් බිලියන 437යි. එය ඩොලර් බිලියන 641ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. කොරෝනා වසංගතය ආරම්භයේදී බංග්ලාදේශයට විදේශ සංචිත ලෙස තිබුණේ ඩොලර් බිලියන 32යි. දැන් ඒ ප්‍රමාණය ඩොලර් බිලියන 47 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි සිංගප්පූරුවත්. හැබැයි, ලංකාවේ තත්ත්වය මොකක්ද? අපට විදේශ සංචිත ලෙස ඩොලර් බිලියන 7.9ක් තිබුණා. දැන් වන කොට ඩොලර් බිලියන 1.5ක් වාගේ තමයි අපේ ආණ්ඩුවට, මහ බැංකුවට ඉතිරි වෙලා තිබෙන්නේ.

'Yugadanavi Agreement' එක තවමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. එම නිසා මම ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගෙන් අහන්න කැමැතියි, ඒ Agreement එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා මේ රටේ ජනතාවට හෙළිදරව් කරන්නේ කවදාද කියලා. දැන් හැමදාම වාගේ මුදල් අච්චු ගහනවා. දැන් වන කොට රුපියල් කෝටි 290,000කට වැඩි ප්‍රමාණයක මුදල් රජය අච්චු ගහලා තිබෙනවා.

මේ රටේ උද්ධමනය පිළිබඳව කථා කරලා වැඩක් නැහැ. උද්ධමනය දවසින් දවස වැඩි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි දරිද්‍රතාව දිහා බැලුවත්. ලෝක බැංකු වාර්තාව අනුව මේ රටේ දරිද්‍රතාවෙන් පෙළෙන පිරිස ලක්ෂ 5කින් වැඩි වෙලා තිබෙනවා. මේවාට විසඳුම් සොයන්න රටක් හැටියට අප එකතු වෙන්න ඕනෑ කියන එක තමයි මා නිතරම ප්‍රකාශ කරන්නේ. මම ඒ මතයේ ඉන්නවා. රටක් හැටියට අපි ගොඩ නැඟෙන්න ඕනෑ. එහෙම නොවුණොත් මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න ඊළඟ පරපුරට මොකක්ද වෙන්නේ කියන ප්‍රශ්නය මේ අවස්ථාවේදී මා අහනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු මයන්ත දිසානායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා GSP Plus පිළිබඳව ප්‍රකාශ කළා. එතුමා කිව්වා, යුරෝපා හවුලේ නියෝජිතයන් හමු වූ අවස්ථාවේ, ලංකාවට GSP Plus සහනය අනිවාර්යයෙන් දිගටම ලබා දෙන්න, ඒක අහිමි කරන්න එපා කියලා එතුමා ප්‍රකාශ කළ බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න තව ගොඩක් කාරණා තිබුණත් මා ළඟ තිබෙන අනෙක් කාටූන් දෙකත් පෙන්වා කෙටියෙන් කරුණු ඉදිරිපත් කරලා මගේ කථාව අවසන් කරන්න මා කැමැතියි. Budget එක ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා -මේ කාටූන් එකේ දැක්වෙන පරිදි- මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇවිල්ලා හොඳ අය වැයක් ඉදිරිපත් කරලා මේ රටේ ජනතාවට සහන ලබා දෙයි කියලායි. රටේ ජනතාව බලාගෙන හිටියා හොඳ කෑම වේලක් හම්බ වෙයි කියලා. නමුත් මොකක්ද වුණේ? ඒ සියලු දේවල් රටේ ජනතාවට අහිමි වුණා. කරුණු කියන්න කාලය මදි නිසා මම අනෙක් කාටූන් එකත් පෙන්වන්නම්. මෙයින් පෙන්වන්නේ ලංකාවේ ජනතාව මහ මුහුදේ ගිලෙන ආකාරය. මුදල් අමාත්‍යතුමාගේ උත්තරයත් මේ කාටූන් එකෙන් පෙන්නුම් කෙරෙන බව මා මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි මම දැන් මේ මුද්‍රිත කාටූන් තුන **සභාගත*** කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මන්ත්‍රීතුමා, ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.17]

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් වැය ශීර්ෂ කීපයක් යටතේ අදහස් දක්වන්න අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. මම සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ කථාවක් කරද්දී හැම තිස්සේම උත්සාහ ගන්නවා, අනාගතවාදීව කථා කරන්න. නමුත් අද විපක්ෂයේ කථා ඇහුවාම, අනාගතවාදීව කථා කරනවාට වඩා පසුගිය කාලයේ එතුමන්ලා ආණ්ඩු කරපු ආකාරය පිළිබඳව වුට්ටක් මතක් කරලා දීම හොඳයි කියලා මම කල්පනා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 මහ මැතිවරණයේදී එතුමන්ලාගේ ප්‍රධාන සටන් පාඨය වුණේ, "දූෂණයෙන් තොර රටක්" කියන එකයි. එතුමන්ලා වැඩියෙන්ම මාකට් කළේ "දූෂණයෙන්, හොරකමින් තොර රටක්" කියන සටන් පාඨය. හැබැයි බලයට ඇවිත් මාස තුනක් යන්න කලින් මේ රටේ ඉතිහාසයේ වෙච්ච ලොකුම හොරකම, ලොකුම වංචාව කරන්න මේ විපක්ෂයේ අය එදා සමත් වුණා.

ඊළඟට, එදා එතුමන්ලා මාකට් කළා, ප්‍රජාතන්ත්‍රවාදය. එතුමන්ලා වේදිකාවල "ප්‍රජාතන්ත්‍රවාදය" කියන වචනය පට්ට පතුරු ගැහුවා. හැබැයි එතුමන්ලා ඊට පස්සේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් නැති කළා; විනාශ කළා. පසුගිය ආණ්ඩුව කාලයේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේයි, විපක්ෂයේයි දෙකේම අයිතිය එතුමන්ලා ලබා ගත්තා. ආණ්ඩු පක්ෂයේ තනතුරුයි, විපක්ෂයේ තනතුරුයි එතුමන්ලා එකතු වෙලා බෙදා ගත්තා. විපක්ෂ නායක තනතුර දෙමළ ජාතික සන්ධානයට ලබා දුන්නා. විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක තනතුර ජනතා විමුක්ති පෙරමුණට ලබා දුන්නා. මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඒකාබද්ධ විපක්ෂයේ අපට අඩුම තරමින් අපේ රැස්වීමක් පවත්වන්න කමිටු කාමරයක්වත් පසු ගිය පාලන කාලයේ ලබා දුන්නේ නැහැ.

එදා එතුමන්ලා ස්වාධීන මැතිවරණ කොමිසමත් මාකට් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මැතිවරණ සිතියම අකුළන්න කරන්න පුළුවන් හැම කටයුත්තක්ම පසු ගිය ආණ්ඩුව කාලයේ එතුමන්ලා කළා. මැතිවරණ පවත්වන්නේ නැතිව කල් දමන්න කටයුතු කළා. තුනෙන් දෙක ඇතිව පනත් කෙටුම්පත් සම්මත කරගන්න හෙලිකොප්ටරයෙන් මන්ත්‍රීවරුන් ගෙන්වනතුරු, ඡන්දය ගන්න එක හිටපු කථානායකතුමා ප්‍රමාද කළා. ඒ වාගේම, පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා එවකට හිටපු පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයා -මම නම කියන්නේ නැහැ- ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතට එතුමාම විරුද්ධ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය ඉතිහාසයේ පළමුවැනි වතාවට වෙච්ච දෙයක්.

ඊට පස්සේ, එතුමන්ලා මාකට් කළා, ස්වාධීන අධිකරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මා අමුතුවෙන් ඒ ගැන මතක් කරන්න ඕනෑ නැහැ. විනිසුරුවරුන්ට දුරකථනවලින් කථා කරලා, කාටද නඩු දාන්නේ, කවුද හිර කරන්නේ, ඇප දෙන්න එපා ආදී බලපෑම් මේ ගරු සභාව නියෝජනය කළ මන්ත්‍රීවරු එදා එළිපිට ලජ්ජාවක්, හිරිකිතක් නැතිව කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කථා කළා විතරක් නොවෙයි, ඒ කථා පටිගත කරලා - record - ගෙදරත් තබාගත්තා.

ඒ වාගේම, එදා එතුමන්ලා පොලිස් කොමිසම මාකට් කළා. පොලිස් කොමිසම මාකට් කළාට, එතුමන්ලාට හිතුණු හිතුණු විධියට පොලිස් නිලධාරින් මාරු කරපු විධිය කොමිෂන් සභාවේ වාර්තාවල සඳහන්ව තිබෙනවා. එදා පොලිස්පතිතුමා ප්‍රසිද්ධියේ මාධ්‍ය ඉස්සරහා නීතිය නමන හැටි මාධ්‍යයට කියපු හැටි අදත් අපට මතක් වෙනවා.

එතුමන්ලා වැඩියෙන්ම මාකට් කරපු තවත් එකක් තමයි, යහ පාලන මූලධර්ම. ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන අධිකරණ කොමිසම ආදි කොමිෂන් සභා එතුමන්ලා ලෝකයට පෙනෙන්න බොහොම ලස්සනට මාකට් කළා. හැබැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තිබියදී, එයට පටහැනිව, එයට විරුද්ධව එතුමන්ලා අරලිය ගහ මන්දිරයේ අටවා ගත්තා, "දූෂණ විරෝධී කමිටුව" නමින් කමිටුවක්. එහිදී එතුමන්ලාගේ පක්ෂ නියෝජනය කරපු සියලු අය එකතු වෙලා කාටද නඩු දාන්නේ, කවුද හිරේ දාන්නේ, කාටද ඇප දෙන්නේ, කවුද FCID එකට ගෙන්වන්නේ කියලා තීන්දු කළා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ස්ථාවර රටක්" කියන කාරණය එතුමන්ලා එදා මාකට් කළා. ස්ථාවර රටක් කියන එක මාකට් කරලා, ඉන් පස්සේ අන්තවාදී ත්‍රස්තවාදී කණ්ඩායම් මේ රට තුළ ක්‍රියාත්මක වනතුරු බකන්නිලාගෙන හිටියා; බෝම්බ පුපුරනකල් බලා සිටියා; මිනිසුන් මැරෙනකල් බලා සිටියා. ඒ නිසා ආරක්ෂාව කඩාගෙන වැටුණා; ආර්ථිකය කඩාගෙන වැටුණා. මුළු ලෝකයම වෙසක් සමරද්දී 2019 වර්ෂයේ අපේ ලංකාවට වෙසක් සමරන්න ලැබුණේ නැහැ. කොවිඩ්-19 වසංගතය නිසා නොවෙයි. එහෙම වුණේ, අන්තවාදී ත්‍රස්තවාදී වසංගතය නිසා සහ එතුමන්ලාගේ පාලනයේ තිබුණු දුර්වලකම් නිසා බව අපි මතක් කරන්න ඕනෑ.

ඒ යුගයේ අපට ඇසළ පෙරහැර පවත්වන්න අවස්ථාව හම්බවුණේ නැහැ, පොසොන් උත්සවය සමරන්න අවස්ථාව හම්බවුණේ නැහැ, කතෝලික ජනතාවට ඉරිදා පල්ලි යන්න හම්බවුණේ නැහැ, මුස්ලිම් ජනතාවට සිකුරාදා පල්ලි යන්න හම්බවුණේ නැහැ කියන එකත් මම එතුමන්ලාට මතක් කරන්න ඕනෑ. මුළු ලෝකයම ඉදිරියට දුවද්දී, අන්තවාදී ත්‍රස්තවාදය නිසා ඒ වෙලාවේ අපේ රට lockdown කරන්න සිද්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා භාර ගත්තේ අන්න එහෙම රටක් කියන එක අපි අමතක නොකළ යුතුයි. අද වෙනකොට ගෝලීය වසංගතයක් තිබියදීත් එතුමා රට හරි මාර්ගයට ගනිමින් ඉන්නවා. එතුමාට අවශ්‍ය ශක්තිය අපි දෙන්න ඕනෑ. මේ ගෝලීය වසංගතයට රට මුහුණ දෙන විධිය ගැන අපි සතුටු වෙන්න ඕනෑ. ඒ වාගේම එන්නත්කරණය සම්බන්ධයෙන් රට ලබාගෙන තිබෙන ප්‍රගතිය සම්බන්ධවත් අපි සතුටු වෙන්න ඕනෑය කියන කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.23]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2022 අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ ජනාධිපති, අග්‍රාමාත්‍ය කාර්යාලය ඇතුළු ස්වාධීන කොමිෂන් සභාවල වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ, විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. ජනාධිපති වැය ශීර්ෂයට අදාළ ප්‍රතිපාදන අඩු කරලා, ජනාධිපතිතුමා ආදර්ශයක් ලබා දීලා තිබෙනවා. එතුමාගේ ඒ ක්‍රියාව අපි අගය කරනවා. ඒ වාගේම අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජයේ සිටින අමාත්‍යවරුන් කණ්ඩායම එයින් ආදර්ශයක් ලබා ගත්තාද කියන ප්‍රශ්නය අපට නඟන්නට වෙනවා. එතුමා ක්‍රියාත්මක කළ වැඩසටහන්වලින් එකම සාර්ථක වැඩසටහන විධියට අපට කියන්නට පුළුවන් වන්නේ, එතුමාගේ වැය ශීර්ෂයට අදාළ ඒ වියදම අඩු කරගත් එක ගැනයි.

ජනාධිපතිතුමා දිගින් දිගටම කථා කරන්නේ විප්ලවීය වෙනසක් මේ රට තුළට ගෙනෙන එක ගැන. ජනාධිපතිතුමා විප්ලවීය වෙනස්කම් කිහිපයක් ගෙනෙන්න උත්සාහ කළා, අපි දැක්කා. මිල පාලනය පිළිබඳව විප්ලවීය වෙනසක් ගෙනාවා. ඒ මිල පාලනය පිළිබඳ විප්ලවීය වෙනසට අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක රටේ ජනතාව දන්නවා. රසායනික පොහොර නතර කරලා හරිත කෘෂිකර්මයක් ඇති කරන විප්ලවීය වෙනසක් ගෙනාවා. ඒකෙන් අද රටේ කෘෂිකර්මාන්තයට, ගොවි මහත්වරුන්ට මොනවාද වෙලා තිබෙන්නේ කියන එක රටේ ජනතාව දන්නවා. දැන් එතුමා තවත් බරපතළ කාරණයක් අතට අරගෙන තිබෙනවා. 'එක රටක් - එක නීතියක්' කියන විප්ලවීය වෙනස ඇති කරන්නට හදනවා. ඒ වාගේම, අලුත් ව්‍යවස්ථාවක් හදලා, අලුත් ඡන්ද ක්‍රමයක් ඇති කරනවා කියනවා. මම මුලින් කියපු මිල පාලනයට වාගේම, කෘෂිකර්මයට අදාළ පොහොර සම්බන්ධයෙන් එක රැයින් ගැසට් ගැහුවා. නැවත ගැසට් කිහිපයක් ගහලා කලින් ඒවා ඉවත්කර ගත්තා.

අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන එක වාගේම, අලුත් ඡන්ද ක්‍රමයක් ගෙනෙන එක ඒ තරම් ලේසි දෙයක් නොවෙයි, ඉතාම බරපතළ දෙයක්. ඒ නිසා රටට අලුතින් ව්‍යවස්ථාවක් ගෙනෙනකොට, අලුත් ඡන්ද ක්‍රමයක් ගෙනෙනකොට තිබෙන බරපතළකම ගැන අපි විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ.

අපි දන්නවා, මේ රට තුළ ජනවාර්ගික ප්‍රශ්නයක් තිබෙන බව. 2009 වෙනකොට මේ රට දෙකට බෙදී තිබුණාය කියන එක අපි පිළිගන්නට ඕනෑ. උතුරයි, දකුණයි අතර සම්බන්ධයක් තිබුණේ නැහැ. ඒ ප්‍රශ්නය අවසන් කරලා දකුණ සහ උතුර යාබද කරන්නට මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා ජනාධිපතිවරයා වශයෙන් දේශපාලන නායකත්වය ලබා දෙනකොට, ජෙනරල් සරත් ෆොන්සේකා මැතිතුමා හමුදා නායකත්වය ලබා දුන්නා. ඒ නිසා රටේ භූමිය එකතු වුණා. භූමිය එකතු කිරීමේදී ඒ රජය සාර්ථක වුණා. ඒ වුණාට රට තුළ සිටින කඳුකර දමිළ ජනතාව ඇතුළු උතුරේ සහ දකුණේ සිටින සිංහල-දමිළ-මුස්ලිම් ජනතාවගේ, කතෝලික ජනතාවගේ හිත් එකතු කරන්නට, එහෙම නැත්නම් ශ්‍රී ලාංකිකයන් හැටියට එක ධජයක් යටතට ගෙනෙන්නට අසමත් වුණා. ඒක කරගන්න බැරි වුණා. පසුගිය යහපාලන රජය කාලයේදීත් රට තුළ ජාතීන් අතර එකමුතුභාවයක් ඇති කරලා, ශ්‍රී ලාංකිකයන් හැටියට එක්සත්වීමේ පදනම හදන්නට උත්සාහ කළා.

ඒ පදනම හදාගෙන යනකොට, ඒ පදනම කඩා දමලා, ජාතීන් අතර විරසකයක් ඇති කරලා, ආගම් අතර ගැටුමක් ඇති කරලා, මේ රට තුළ සිටින ජාතීන් අතර ඇවිළෙන තත්ත්වයක් ඇති කරපු අය එක්ක තමයි අද "එක රටක්-එක නීතියක්" කියන බල ඇණිය හදලා තිබෙන්නේ කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. මේ රටේ සිටින සහෝදර සිංහල ජනතාව ඇතුළු ද්‍රවිඩ, මුස්ලිම් ජනතාව මේ කාරණය සම්පූර්ණයෙන් හෙළා දකින බව අපි කියන්න ඕනෑ.

පාර්ලිමේන්තුවට අමතරව වෙනත් කණ්ඩායමක් යොදාගෙන ව්‍යවස්ථාවක් හදාගෙන යෑම කොයි තරම් යුක්ති සහගතද කියන එක අපි හිතන්නට ඕනෑ. මම කලිනුත් කියපු ආකාරයට ජාතීන් අතර තිබෙන ප්‍රශ්න, ජාතීන් අතර තිබෙන අවබෝධයක් නැතිකම කියන මේ තත්ත්වය නැති කරගෙන මේ රට එක්සේසත් කරලා, අපි ශ්‍රී ලාංකිකයන් කියන තැනට අපේ රට ගෙන එන්න ඕනෑ. දිගින් දිගටම බලය පාවිච්චි කරලා, ව්‍යවස්ථාවක් හදලා මේ තුළට රිංගවා ගන්නට උත්සාහ කිරීම කරන්න බැරි දෙයක් බව අපි කියන්න ඕනෑ.

අපි මේ ව්‍යවස්ථාව සමඟ අලුත් ඡන්ද ක්‍රමයක් ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අලුත් ඡන්ද ක්‍රමය පිළිබඳව කථා කරනකොට විධායක ජනාධිපති ක්‍රමයට මොකද

[ගරු වේලු කුමාර් මහතා]

වෙන්න යන්නේ, පාර්ලිමේන්තුවට තිබෙන බලතලවලට මොකද වෙන්න යන්නේ කියන එක අපි දැනගන්න ඕනෑ. මේ කරුණු දෙක පදනම් කරගෙන අපි අලුත් ඡන්ද ක්‍රමයක් පිළිබඳව කථා කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ Electoral Reforms සඳහා Select Committee එකක් පත් කර තිබෙනවා. නමුත් පාර්ලිමේන්තුවට පිටින් ඉඳගෙන ව්‍යවස්ථාව හදන කණ්ඩායම වෙනම යෝජනා ලබා ගන්නවා. ඒ නිසා අපට මේ රජයේ වැඩ කටයුතු පිළිබඳව විශ්වාසයක් තබා ගන්න බැරි තත්ත්වයක් තමයි අද වනකොට උදාවෙලා තිබෙන්නේ.

දැන් මේ රටේ ආර්ථික, සමාජ, දේශපාලන ප්‍රශ්න ඇති වීමට හේතුව 1978 ඉදිරිපත් කරපු Proportional Representation - PR System එක කියලා කථාවක් හදන්න බලනවා. ඒ වෙනුවට අලුත් ක්‍රමයක් හැටියට දැන් පැරැණි කේවල ක්‍රමය ගෙනෙන්න බලනවා. එහෙම නැත්නම් "Mixed-Member Proportional Representation" කියන මිශ්‍ර ක්‍රමයක් ගෙනෙන්න බලනවා. පසුගිය කාලයේ පළාත් පාලන ආයතනවලට මිශ්‍ර ක්‍රමයක් ගෙනාවා. ඒ ගෙනාපු මිශ්‍ර ක්‍රමයෙන් පත්වන සභික සංඛ්‍යාව දෙගුණ වුණා. ඒ නිසා සාමාන්‍යයෙන් තිබුණු ඵලදායීතාවත් ලබා ගන්න බැරි, ස්ථාවරභාවය නැති කර ගත්ත තත්ත්වයක් තමයි අද වනකොට ඒ සභාවල ඇතිවෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අලුත් ඡන්ද ක්‍රමයක් හදනවා නම් මේ රටේ සිටින සියලු ජාතීන්ට වාගේම මත ප්‍රකාශ කරන අයටත් ඒකට අවකාශයක් තිබෙන ක්‍රමයක් ඉදිරිපත් කරන්න ඕනෑ.

මේ ඡන්ද ක්‍රමය පිළිබඳව කථා කරන කොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. ලෝක ප්‍රසිද්ධ හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ සමාජ, දේශපාලනය පිළිබඳ මහාචාර්යවරියක වන පිපා නොරිස් මහත්මිය මෑතකදී පරීක්ෂණයක් කරලා තිබෙනවා. පිපා නොරිස් මහාචාර්යවරිය එතුමියගේ වචනයෙන්ම මෙහෙම සඳහන් කරනවා:

> ".... 'kinder and more gentle' to the demands of marginalized minority representation".

එතුමිය ප්‍රජාතන්ත්‍රවාදී රටවල් 35ක ඡන්ද ක්‍රමය පිළිබඳව සිදු කළ surveysවලින් suggest කරනවා, ethnic minorities are less satisfied with democracy and fairness of the election outcome in majoritarian system. ඒ කියන්නේ, ප්‍රධාන පක්ෂවල නැත්නම් ප්‍රධාන බලවේගවල ප්‍රධානත්වයෙන් කේවල ක්‍රමයට වඩා ගැඹුරු ක්‍රමයකට යනකොට, මේ marginalized minorities නියෝජනය කරන ජනතාවට satisfaction එකක් ලබා දෙන්න බැහැ කියන එකයි. අද වනකොට විවිධ මත දරන පක්ෂ විශාල ගණනාවක් මේ පාර්ලිමේන්තුව තුළ සිටින බව අපි දන්නවා. විවිධ මත දරන පක්ෂ ඉන්නවා. ආණ්ඩු පක්ෂයේත් ඉන්නවා, විපක්ෂයේත් එවැනි පක්ෂ විශාල සංඛ්‍යාවක් තිබෙන බව අපි දකිනවා.

ජාතික නිදහස් පෙරමුණ, කොමියුනිස්ට් පක්ෂය, පිවිතුරු හෙළ උරුමය, මහජන එක්සත් පෙරමුණ ආදී වශයෙන් ඒවා කියාගෙන යන්න පුළුවන්. ඒ වාගේම TNA එක, ACMC එක, SLMC එක, TPA එක තිබෙනවා. මේ ඔක්කෝම විවිධ මත දරන සුළු ජන කොට්ඨාස නියෝජනය කරන පක්ෂ. මේ සැමටම පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ගේ මතය ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබී තිබෙන්නේ සමානුපාතික ක්‍රමය නිසායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙනවා. එම නිසා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්න මට තව විනාඩියක කාලයක් දෙන්න.

විවිධ මත දරන කොට්ඨාස ඔක්කෝම අයින් වෙලා, හේදිලා ගිහිල්ලා ප්‍රධාන පක්ෂ විතරක් මෙතැනට ඇවිල්ලා විධායක බලතල තියාගෙන ක්‍රියා කරනවා. ඒ වාගේම "එක රටක් - එක නීතියක්" කියලා කමිටුවකට සභාපතිවරයෙකුත් දමා ගෙන නැවතත් මේ රට තුළ අසමඟිය ඇති කරමින්, ගොඩ නඟන්න බැරි තත්ත්වයකට මේ රට පත් කරනවාය කියන එක කනගාටුවෙන් වුණත් අපට කියන්න වෙනවා. තවත් එක කාරණයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ ආර්ථික තත්ත්වය එක වචනයකින් කියලා ඉවර කරන්න පුළුවන්. පසුගිය කාලයේ ප්ලේන්ටියක් රුපියල් 15යි. අද උණුවතුර වීදුරුවත් රුපියල් 15ක් වන තත්ත්වයට මේ රට පත් වෙලා තිබෙනවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.34]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට අද සියලු ක්ෂේත්‍රවලින් කඩා ගෙන වැටිලා තිබෙනවා. ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි මෙහෙම වුණේ. මෙතෙක් කල් ආණ්ඩු කරපු දේශපාලන පක්ෂ කඩා ගෙන වැටුණා මිසක්, දේශපාලන පක්ෂ පිරිහුණා මිසක් රටක් පිරිහුණේ නැහැ. නමුත්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මෙතෙක් රට පාලනය කරපු අවුරුදු දෙක දිහා බැලුවාම ආණ්ඩුව විතරක් නොවෙයි, රටත් විනාශ වෙලා තිබෙනවා. එතුමාට 69 ලක්ෂයක් ඡන්දය දුන්නේ ගොඩක් බලාපොරොත්තු තබාගෙනයි. එතුමාගේ ජයග්‍රහණයෙන් ඉපිල ගිය අය කිරිබත් කෑවා; නැටුවා; සින්දු කිව්වා. ඒ විතරක් නොවෙයි. තරුණ තරුණියන් තාප්පවල චිත්‍ර පවා ඇන්දා. ඒ විධියට චිත්‍ර ඇඳපු තරුණ තරුණියන් හිතුවා, ඔවුන් තද කර ගෙන තිබුණු සිතුවිලි චිත්‍රවලට නැඟුවාම හරි කියලා. නමුත්, අද ඔවුන් රට ගැන කලකිරිලා; පාලනය ගැන කලකිරිලා; රටත් අත්හැර දමා යන තත්ත්වයට පත් වෙලා පාස්පෝට් පෝලිමේ ඉන්න පටන් අරගෙන තිබෙනවා. මේ රටින් කොහොම හරි පැන ගන්න ඕනෑය කියන මතය ඔවුන්ට ඇවිල්ලා තිබෙනවා. මෙන්න, අවුරුදු දෙකක ප්‍රගතිය!

මේ රට ගොඩ නඟන්න බැරි ඇයි? ඒකට හේතුව විධියට අපි දකින දේ මේකයි. අපි විතරක් නොවෙයි, මේ රටේ සියලු ජනතාව එය දකිනවා. ඒ, රාජ්‍ය වංචාව. මම හැම දේශපාලනඥයෙකුටම දොස් කියන්නේ නැහැ. සමහර දේශපාලනඥයන්, එසේ නැත්නම් දේශපාලන හවුහරණ අරගෙන සිටින රාජ්‍ය නිලධාරින් සහ බලවත් පුද්ගලයන් දිගට හරහට

ජනතා මුදල් මංකොල්ල කනවා. කොවිඩ් වසංගතය තිබුණත්, වැක්සින් එකෙනුත් ඔවුන් හොරකම් කරනවා. මිනිස්සුන්ට කන්න, බොන්න නැති වෙලාවේ කොවිඩ් වසංගතය වෙනුවෙන් ඇම්බියුලන්ස් ගෙනැල්ලා ඒකෙනුත් හොරකම් කරනවා. රට කොච්චර වැටුණත්, හොරකම් කරන මිනිසුන්ට ඉවක් බවක් නැහැ. ඇත්ත වශයෙන්ම අල්ලස් ගැනීමෙන්, කොමිස් ගැනීමෙන්, රාජ්‍ය නිලධාරින්ට බලපෑම් කරලා දූෂණ, වංචා කිරීමෙන් තමයි මේ රට වැටිලා තිබෙන්නේ. මේවාට වැට බැඳිය හැකි නම්, මේ රට ගොඩ නඟන්න පුළුවන්. මේ රටේ වෙන මොකුත් ප්‍රශ්න නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලි සබ්රි ඇමතිතුමා ගොඩක් දේවල් කථා කළා. හැබැයි, ඒ මොකුත් ඕනෑ නැහැ. මේ රටේ වංචාවට, දූෂණයට වැට බඳින්න පුළුවන් නම්, -විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ ඉන්න අයගෙන්ම ඒවාට වැට බඳින්න පුළුවන් නම්- මේ රට ගොඩ නඟන්න ඒ හොඳටම ඇති කියලා මම හිතනවා. ඒ ටික තේරුම් අරගෙන තමයි එදා රාජපක්ෂ ආණ්ඩුව ගෙනාපු දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරලා යහ පාලන ආණ්ඩුව විසින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට හඳුන්වා දුන්නේ. ඒ තුළින් මේ රටේ ප්‍රශ්න විසඳන්න පුළුවන්. වංචාව, දූෂණය, කොමිස් ගැහිල්ල නතර කළොත් මේ රට ගොඩ ගන්න පුළුවන් නිසා තමයි රාජ්‍ය නිලධාරින්ට ස්වාධීනව වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් අපි නිර්මාණය කරලා දුන්නේ. එදා මහ බැංකු කොල්ලය සිද්ධ වුණු වෙලාවේ අගමැතිවරයා ගෙනැල්ලා ප්‍රශ්න කරන්න නීතිපති දෙපාර්තමේන්තුවට, සොලිසිටර් ජෙනරාල්වරුන්ට කොන්ද පණ තිබුණා. එදා මුදල් ඇමතිවරයාගෙන් ප්‍රශ්න කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ශක්තිය තිබුණා. ජනාධිපතිතුමාගේ ප්‍රධාන නිලධාරියා අත්අඩංගුවට ගන්න අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින්ට ශක්තිය තිබුණා. එම නිසා යම් ප්‍රමාණයකින් හෝ මේ රටේ වංචා, දූෂණ කරන්න රාජ්‍ය නිලධාරින්, දේශපාලනඥයන් බය වුණා. නමුත්, මීටත් වඩා හොරු අල්ලන්න ඕනෑ, මෙතැනිනුත් එහාට යන්න ඕනෑ කියලා තමයි 69 ලක්ෂයක් ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. අන්තිමට මොනවාද වුණේ? ඒ සියලු දේ කඩාකප්පල් කළා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ගෙනා, රාජ්‍ය නිලධාරින් ශක්තිමත් කරලා, වංචාවට, අල්ලසට, දූෂණයට වැට බඳින වැඩ පිළිවෙළ ඉවත් කළා.

හැබැයි, ඒකේ තිබෙන අඩු පාඩු හැදුවාට ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒකේත් අඩුපාඩු තිබුණානේ. නමුත්, ඒක නොවෙයි කළේ. ඒක අහෝසි කරලා දැම්මා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ඒක අහෝසි කරලා දැම්මා. එතකොට අර බුද්ධිමතුන්ට, රට හදන්න නිවහල්ව, නිදහසේ තීරණ ගත් පුද්ගලයන්ට මොකද වුණේ? ඒ මිනිස්සු නන්නත්තාරවෙලා ගියා, නැවතත් දේශපාලන අතකොළු බවට පත් වුණා. මේ රට හදනකොට, එක් අයෙකුට සෑම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ම දැනුමක් නැහැ. ඒ නිසා හැමෝම එකතු වෙන්න ඕනෑ. කෘෂිකර්මය, ආර්ථිකය ඇතුළු මේ රටේ තිබෙන හැම දෙයක් පිළිබඳව, හැම ක්ෂේත්‍රයක් පිළිබඳව දැනුමක් තිබෙන එක පුද්ගලයෙක් නැහැ. අද හැම කෙනෙක්ම ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරන්න යන්න භයයි. දැන් කියනවා, රසායනික පොහොර ගැන කිව්වොත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාවත් එළවනවා කියලා. ඒ කියන්නේ ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරන්න පුළුවන්, හැබැයි, "රසායනික පොහොර" තමයි තහනම් වචනය. රේඩියෝ එකේ යන "ඔව්, නැහැ, බැහැ" සෙල්ලමේ වාගේ තහනම් වචනයක් තිබෙනවා. එතුමාත් එක්ක සාකච්ඡා කරන්න පුළුවන්, නමුත් තහනම් වචනයක් තිබෙනවා. එතකොට උගත්, බුද්ධිමත් නිලධාරියෙක් තම අදහස් ප්‍රකාශ කරන්නේ කොහොමද? ඒක නේද අද මේ රටට වෙලා තිබෙන්නේ? කාටවත් කථා කරන්න බැහැ. ගොවියෝ උද්ඝෝෂණ කරනවා, ගුරුවරු උද්ඝෝෂණ කරනවා, රාජ්‍ය සේවකයෝ කෑ ගහනවා, "අපට පඩි මදි, ජීවත් වෙන්න විධියක් නැහැ" කියලා. හැබැයි, ඒ ගැන කථා කළත් ඒවා කනකට ගන්නේ නැති එක නේද තිබෙන ප්‍රශ්නය? රැස්වීමට ආවත් රසායනික පොහොර ගැන කථා කරනවා නම්, රස්සාවත් නැහැ, ගෙදර යන්න වෙනවා. ඒ විධියට රටක් පාලනය කරන්න බැහැ.

අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ස්වාධීන කොමිෂන් සභා ගෙනැල්ලා මේ රටේ වංචාවට, දූෂණයට, අල්ලසට වැට බඳින්න කටයුතු කළා. අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගෙනාවා, ජාතික පොලිස් කොමිෂන් සභාව ගෙනාවා, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ගෙනාවා. මේ වාගේ කොමිෂන් සභා ගණනාවක් ගෙනැල්ලා වංචා, දූෂණ කරන සියලුදෙනාගෙන් තරාතිරමක් නොබලා ප්‍රශ්න කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කළා. කෙටියෙන්ම කියනවා නම්, එදා පොලිස්පතිවරයා පත් කරන්න ජනාධිපතිවරයාට බැහැ. ඒ සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව තිබුණා. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කරන්න ජනාධිපතිවරයාට බැහැ. ඒ වාගේම එතුමාට නීතිපතිවරයා පත් කරන්නත් බැහැ. අගවිනිසුරුවරයා පත් කරන්න ජනාධිපතිතුමාටවත්, වෙනත් කිසිම ප්‍රබල කෙනෙකුටවත් බැහැ. සර්ව පාක්ෂික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තමයි ඒ තනතුර සඳහා කෙනෙක් පත් කරන්න පුළුවන්කම තිබුණේ. නමුත්, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කළා. විශේෂයෙන්ම අද ඒ සභාව විධායක ජනාධිපතිතුමා කරන දේ හරියි කියන්න ගහන සීල් එකක් වුණා මිසක්, සාකච්ඡා කරන්න, නිදහසේ තීරණ ගන්න, ඒ පුද්ගලයා හරිද වැරදිද කියන්න, ඒ ගැන අදහස් දෙන්න, විරෝධයක් ප්‍රකාශ කරන්න නොහැකිවෙලා තිබෙනවා. ඒ හේතුවෙන් රටක් හැදෙයි කියලා තිබුණු බලාපොරොත්තුව අද නැතිවෙලා තිබෙනවා. ආණ්ඩුවක් විනාශ වුණොත්, ඊට පස්සේ ඒක ඉවරයි. ඊළඟට තව ආණ්ඩුවක් පත් වෙනවා. හැබැයි, රට විනාශ වෙද්දී මොකක්ද වෙන්නේ? අපි තව රටක් ගේන්නද? ඒ හින්දා තමයි, අද සියලුදෙනා මේ රට හැර දමා යන්න උත්සාහ කරන්නේ. විශේෂයෙන්ම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා නැවතත් ජනතා මුදල් මංකොල්ල කෑමේ පාරාදීසයක් බවට ශ්‍රී ලංකාව පත් කළා. ඒක තමයි කළේ. එම නිසා අද අපි දකින විධියට ආර්ථික ප්‍රශ්න ඇතුළු මේ රටේ තිබෙන සියලු ප්‍රශ්නවලට හේතුව, සියලු ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරපු එකයි.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න ඕනෑ. අපි මේ රට ගොඩ නඟන්න නම් පළමුවෙන්ම මහා පරිමාණයේ අල්ලස්, වංචා සහ දූෂණ නැති කරන්න ඕනෑ. ඒ සඳහා නීති ගෙනාවා. 1954දී මේ රටට අල්ලස් නීතිය හඳුන්වා දුන්නා. 1985දී අයථා ලෙස වත්කම් ඉපැයීමට විරුද්ධව නීති හඳුන්වා දුන්නා. 1994දී දූෂණ සහ වංචා සඳහා නීති හඳුන්වා දුන්නා. 1994න් පස්සේ ඒවායේ කිසිම සංශෝධනයක් වුණේ නැහැ. නමුත්, අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සිටි ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහත්මයා IT ක්‍රම වාගේ එක එක අලුත් ක්‍රමවලින් හොරු අල්ලන්න නීති හදලා අලුත් කෙටුම්පතක් සකස් කළා. එම කෙටුම්පත අවුරුදු එකහමාරක් තිස්සේ තිබෙන්නේ කොහේද? ඒ කෙටුම්පත තවමත් නීති කෙටුම්පත් සම්පාදකතුමිය ළඟ හිරවෙලා තිබෙනවා. ඒක අරගෙන අලුත් නීති හදන්නේ නැතිව තවමත් යල් පැන ගිය නීති ක්‍රියාත්මක කරනවා.

අලි සබ්රි මැතිතුමා කිව්වා, විශේෂයෙන්ම නඩුවල තිබෙන ප්‍රශ්න නිසා නඩු ගණනාවක් අහක ගියා කියලා. මේ රජයේ සිටින ප්‍රබල පුද්ගලයෝ, ඇමතිවරු ගණනාවක් ඊයේ-පෙරේදා නඩුවලින්

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

නිදොස්කොට නිදහස් වුණා. එසේ නිදොස්කොට නිදහස් වුණේ තාක්ෂණික දෝෂයක් නිසා මිස, ඒ නඩු අහලා නොවෙයි; සාක්ෂි නැති නිසා නොවෙයි. සාක්ෂි දෙන්න සියලු දේ සම්පූර්ණ වෙලා තිබියදී කොමසාරිස්වරු තුන්දෙනෙක් අත්සන් කළේ නැහැ කියලා තමයි එහෙම වුණේ. මම අලි සබ්රි මැතිතුමාට අභියෝග කරනවා, තමුන් නිවැරදි නම් ඒ නඩු ටික නැවත පවරන්න කියලා.

නැවත ඒ නඩු ටික පවරලා, පුළුවන් නම් ඒ නඩු අහලා ඒ ගොල්ලන් නිදොස් කොට නිදහස් කරන්න. නඩුවක් අහන්නේ නැතිව තමුන්ගේ ගෝල බාලයන් ටික, තමුන්ගේ හිතවතුන් ටික නිදහස් කරන එක නොවෙයි, හරි. නීතිපතිවරයෙක් නඩු දැම්මා නම්, ඒ නීතිපතිවරයාත් නීතිය දන්නේ නැතිව ද ඒ නඩු දැම්මේ? ඊළඟට ආපු නීතිපතිවරයාත් රජයේ නිලධාරියෙක්. ඊළඟ නීතිපතිවරයා ඇවිල්ලා කියනවා, මේකේ technical faults තිබෙනවා, ඒ නිසා මේක කරන්න බැහැ කියලා. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා නඩු තිස් ගණනක් අයින් කළා. -රජයේ ඉන්න වග කිවයුතු පුද්ගලයන් නිදොස්කොට නිදහස් කළා. ඒ නිසා මම අලි සබ්රි ඇමතිතුමාට කියනවා, පුළුවන් නම් මේ technical faults හරිගස්සලා නැවත නඩු පැවරීම් කටයුතු කරලා, ඒ නඩු අහලා, සාක්ෂි විමසලා අදාළ විනිසුරුවරුන් ලවා ඔවුන් නිදොස් කොට නිදහස් කරන්න කියලා. ගරු අමාත්‍යතුමාට පුළුවන් නම් ඒ වගකීම භාර ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩී.වී.චානක රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.44]

**ගරු ඩී.වී. චානක මහතා (ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.வி. சானக - விமானச் சேவைகள் மற்றும் ஏற்றுமதி வலயங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.V. Chanaka - State Minister of Aviation and Export Zones Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොත අපේ රටේ විශාල අභියෝග තිබෙන මොහොතක්. අපේ ඉතිහාසයේ අභියෝග තිබෙන සෑම අවස්ථාවකදීම රටේ වාසනාවකට හොඳ නායකයන් හම්බ වෙලා තිබෙනවා. අපේ රටේ ඉතිහාසයේ තිබුණු විශාල අභියෝගයක් තමයි රටේ විශාල යුද්ධයක් තිබුණු එක. රණවිරුවන් 30,000කගේ ජීවිතය නැති වෙච්ච, 60,000ක් තුවාල වෙච්ච යුද්ධයක් තිබුණා. හැබැයි, එදා අපේ වාසනාවට මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිතුමා බවට පත් වුණා. එතුමා එදා ජනාධිපති බවට පත් වෙලා ආර්ථික අභියෝග මැද රටේ තිබුණු යුද්ධය ජයග්‍රහණය කළා. එදා ආරක්ෂක ලේකම්තුමා වශයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එතුමාට සහයෝගය ලබා දුන්නා. ඒ වාගේම, ලංකාවට විතරක් නොවෙයි මුළු ලෝකයටම අභියෝගයක් වෙච්ච මේ මොහොතේ අද ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිතුමා බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍යතුමා බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේක ලෝකයටම අභියෝගයක් තිබෙන මොහොතක්. අද ලෝකයේම ආර්ථිකය කඩාගෙන වැටෙන මොහොතක්. ලෝකයම ලෙඩ බියෙන් පෙළෙන මොහොතක තමයි අද අපි මේ අභියෝගවලට ලක් වෙලා තිබෙන්නේ. හැබැයි, මේ අභියෝගවලට ලක් වෙන්න කලින් තමයි රටේ නායකතුමා තීරණය කළේ, ජනතාවගේ පටි තද කරනවා වෙනුවට නායකයන්ගේ පටි තද කර ගන්න ඕනෑ කියලා. විශේෂයෙන්ම එතුමා පත් වෙලා මුලින්ම කිව්වේ, තමන්ගේ ෆොටෝ එකවත් අමාත්‍යවරුන්ගේ ෆොටෝ එකවත් කාර්යාලවල ගහන්න එපා කියලායි. අවුරුදු තුනක් යනතෙක් රාජ්‍ය නිලධාරීන්ට, ඇමතිවරුන්ට වාහන ගෙනෙන්න එපා කිව්වා. ඒ වෙනුවට එතුමා කළේ, එතුමාට වෙන් වෙලා තිබුණු, ඒ වාගේම ජනාධිපති කාර්යාලයට වෙන් වෙලා තිබුණු වාහන 340ක් රාජ්‍ය ආයතනවලට ලබා දෙන්න කටයුතු කළ එක. ආදර්ශයක් ලබා දීලා තමයි වැඩ ආරම්භ කළේ. යහ පාලන ආණ්ඩුව කාලයේ අවුරුද්දකට රුපියල් කෝටි 500ක වාහන ගෙනැත් තිබුණා. ඒ යුගය අවසන් කරලා තමයි අද මේ ආණ්ඩුව බලයට පත් වුණේ. එක පැත්තකින් අපේ ආණ්ඩුවේ නායකයන් පටි තද කර ගන්න ගමන් අනෙක් පැත්තෙන් ජනතාවට විශාල බදු සහන ලබා දෙන්න පටන් ගත්තා.

එදා යහ පාලන ආණ්ඩුව තිබියදී රටේ ව්‍යාපාර විනාශ වෙලා, රට විනාශ වෙලා රට ආර්ථික පැත්තෙන් වැටිලා තිබුණා. පාස්කු ප්‍රහාරයත් එක්ක සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන් කඩාගෙන වැටිලා තිබුණා. අපි මොකක්ද කළේ? පළමුවෙන්ම අපි බදු අයින් කරන්න පටන් ගත්තා. VAT එක සියයට 15 ඉඳන් 8 දක්වා අඩු කරලා නැවත වතාවක් ව්‍යාපාර නැගිට්ටවන්න කටයුතු කරන්න පටන් ගත්තා. ඒ කාලයේ රටට free Wi-Fi දෙනවා කියලා තරුණ-තරුණියන් රවට්ටලා, අන්තිමට සියයට 30ක බද්දක් තොරතුරු තාක්ෂණයට ක්ෂේත්‍රයට - IT - පනවා තිබුණා. හැබැයි, අපේ ආණ්ඩුව බලයට පත් වුණු ගමන් සියයට 25ක් ඒ බදුවලින් අයින් කරලා තොරතුරු තාක්ෂණයට ඒ අවශ්‍ය මාර්ගය හදලා දුන්නා. අපට මතකයි පන්සලේ පිං කැටේට පවා බදු ගහන ආණ්ඩුවක් තමයි තිබුණේ. තිස්ස පන්සලේ පිං කැටය පවා සීල් තියපු ආණ්ඩුවක් තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව පන්සල්වලට, පූජනීය ස්ථානවලට තිබුණු බදු සම්පූර්ණයෙන්ම අයින් කරලා දැම්මා. උද්ඝෝෂණවලට ගහන යුගය වෙනුවට, ඔවුන්ට ඇහුම්කන් දීලා ඔවුන්ගේ ප්‍රශ්න විසඳන යුගයක් අපි ආරම්භ කළා. අද විශේෂයෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහා හදලා තිබෙනවා උද්ඝෝෂකයන්ට ගිහිල්ලා උද්ඝෝෂණය කරන්න පුළුවන් තැනක්. ජනාධිපතිතුමා පෞද්ගලිකවම එතැනට ඇවිල්ලා ප්‍රශ්න විසඳන යුගයක් ආරම්භ වුණා.

අද ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳුණා; උපාධිධාරීන්ගේ ප්‍රශ්නය විසඳුණා; රැකියා ලක්ෂයක් දුන්නා. කවදාවත් රජයේ රැකියාවක් ගැන හීනයක්වත් නොදැකපු අයට තමයි අද රජයේ රැකියා ලබා දෙන්න කටයුතු කළේ. අනික් පැත්තෙන් විශාල සංවර්ධනයකට රට අරගෙන යන්න කටයුතු කළා. කොරෝනා මැද තමයි අපි මේ සියල්ලම කරන්නේ. කවදාවත් vaccines ගෙන්වන්න වෙයි කියලා අපි හිතුවේ නැහැ. කවදාවත් PCR Tests කරන්න labs දාන්න වෙයි කියලා අපි හිතුවේ නැහැ. කවදාවත් වසංගත රෝග සඳහා රට වටේම රෝහල් හදන්න වෙයි කියලා අපි හිතුවේ නැහැ. හැබැයි, එහෙම වෙලාත් සංවර්ධනය නැවතුණේ නැහැ.

අනික් පැත්තෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා රට පුරා ගෙවල් ටික හදාගෙන යනවා, ඉන්දික අනුරුද්ධ මැතිතුමා සමඟ එකතු වෙලා. රට පුරාම ගෙවල් ටික ආධාර දීලා හදාගෙන යනවා. මේ වාගේ සංවර්ධනයකට තමයි රට අරගෙන ගියේ. රටේ මෙහෙම තත්ත්වයක් තිබිලාත් අද ඒ දේවල් කර ගෙන යනවා.

හැබැයි, අපේ විපක්ෂයේ අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කථා කරලා කිව්වා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ හොරකම් නවත්වන්නයි, රටේ නීතිය ස්වාධීන කරන්නයි කියලා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබුණු කාලයේ නීතිය ස්වාධීන වුණාද? රටේ හොරකම් නැති වුණාද? ලංකා ඉතිහාසයේ ලොකුම හොරකම වුණේ මොන කාලයේද? ඒක වුණේ ඔය දහනව වන ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථා සංශෝධනය තියෙද්දීම, යහ පාලන ආණ්ඩුව තියෙද්දී. රන්ජන් රාමනායකලා විනිසුරුවන්ට ඍජුව කථා කරලා තීන්දු වෙනස් කරන්න කටයුතු කළේ මොන කාලයේද? ඒ ඔය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබුණු කාලයේ. FCID එකට කථා කරලා හැම සතියකම රාජපක්ෂවරයෙක් අත්අඩංගුවට ගන්න කියලා කිව්වේ ඔය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබෙන කාලයේ තමයි. ඔය දහනව වන සංශෝධනය තිබෙද්දීම තමයි, ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා අල්ලගෙන ගිහිල්ලා දෙපාරක් හිර ගෙදර දැම්මේ. මැම්පත් වෙනස් කරලා, තමන්ට ඕනෑ විධියේ නිලධාරින් දමලා, FCID එක දාලා භය කරලා තමයි අමාත්‍යවරු හිරේ දැම්මේ. අද ඒ ගොල්ලන් නිදහස් වුණා. අද ඒ අමාත්‍යවරු නඩුවලින් නිදහස් වෙනකොට අහනවා, ආණ්ඩු බලය ආවාම ද නිදහස් වෙන්නේ කියලා. නැහැ, ආණ්ඩු බලය ආවාම නොවෙයි නිදහස් වන්නේ. අපි විපක්ෂයේ ඉන්දැද්දී තමයි ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා නිදොස් කොට නිදහස් කරනු ලැබුවේ. ගාමිණී සෙනරත් ලේකම්තුමා නිදොස් කොට නිදහස් වුණේ අපි විපක්ෂයේ ඉන්දැද්දී. බොරු නඩු හදනකොට, බොරු සාක්ෂි හදනකොට අන්තිමට ඒවා එළියට එනවා. ඒවා එළියට එන එක නවත්වන්න බැහැ. ඒවා එළියට එනකොට කියනවා, ආණ්ඩු බලයට ආවාම මේවා සිදු වෙනවා කියලා. එදා සිදු වුණේ දේශපාලන පළිගැනීම් විතරයි. දේශපාලන පළිගැනීම් විතරයි එදා මේ රට තුළ ක්‍රියාත්මක වුණේ. අද අපි දකිනවා, රට පුරා නැවත පිබිදීමක් ඇතිවෙන්න පටන්ගෙන තිබෙන බව. හැබැයි, අපි දකිනවා යහ පාලන ආණ්ඩුවේ හිටපු අය රට නැඟිටින්න පාර කපන එක හිතා මතා අහුරන්න උපරිම උත්සාහයක් ගන්නවා කියලා.

අපි දන්නවා, රටේ ඩොලර් පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන බව. සංචාරක ව්‍යාපාරය කඩා වැටීමත් එක්ක ඩොලර් පිළිබඳ ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම අද අපේ රට ලෝකය ඉදිරියේ ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ ආගන්තුක සත්කාරවලට. ඒක නැති කරන්න විපක්ෂය හිතා මතා කටයුතු කරන බව අපට පෙනී යනවා. සැප්තැම්බර් මාසය වනකොට රටේ ජනතාවගෙන් සියයට 60කට vaccines දීලා අපි රට අරිනවා කියලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජූනි මාසයේ කියනකොට, විපක්ෂය මොකක්ද කළේ? විපක්ෂ නායකතුමා හරි නම් කරන්න තිබුණේ, රට ඉස්සරහට යන්න ඕනෑ, රට අරින්න ඕනෑ කියලා රටේ ජනාධිපතිතුමාට එතුමාගේ සහාය දෙන එකයි. හැබැයි ඇත්තටම මොකද වුණේ? එතුමන්ලා හිතා මතාම මිනිස්සු පාරට බස්සන්න පටන්ගත්තා. මුලින්ම ගොවි ජනතාව පාරට බැස්සුවා. ඊට පස්සේ ධීවර ජනතාව පාරට බැස්සුවා. හැබැයි, මේ ගොඩක් උද්ඝෝෂණවල හිටපු මුහුණු ටික බැලුවාම, ගොවි ජනතාව කියලා ඉන්නේත් එකම කණ්ඩායම, ධීවර ජනතාව කියලා ඉන්නේත් එකම කණ්ඩායම, වෙන වෙන උද්ඝෝෂණවල ඉන්නේත් එකම කණ්ඩායම තමයි. මේවා හිතා මතා කළ දේවල්. සියයට 60කට වෙලාවට vaccines වැදුණාම, රටේ එන්නත්කරණය අවසන් වුණාම, මේ රට විවෘත කරන්න හැකියාව තිබෙනවා කියලා විපක්ෂය හොඳටම දැනගෙන හිටියා.

අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ සිටින මොහොතේ, අද නීතිය ගැන බොහෝ කථා කළ නිසා මම ඔබතුමාගේ ප්‍රකාශයක් පිළිබඳව සඳහන් කරන්නත් කැමැතියි.

ඔබතුමා කිව්වා, ඒ දවස්වල පොලිස්පතිතුමා, නියෝජ්‍ය පොලිස්පතිතුමන්ලා හිටියේ සිරිකොතේ කියලා. මම හිතන හැටියට වැරදිලා කියැවුණේ. ඒ දවස්වල එහෙම තමයි නේද හිටියේ ගරු මන්ත්‍රීතුමා? ඒ දවස්වල ඒ අය සිරිකොතේ තියාගෙන තමයි තීන්දු ගත්තේ. අන්තිමට හිටපු පොලිස් නිලධාරින්ට බන්ධනාගාරගත වෙන්න වුණා. හැබැයි, අද ඒ කණ්ඩායම ඇවිල්ලා තමයි නීතියේ ආධිපත්‍ය, නීතියේ ස්වාධීනත්වය පිළිබඳව කථා කරන්නේ. පොලීසිය භාරව හිටපු ඇමතිතුමා කියනවා නම් සිරිකොතේ ඉඳලා තීරණ ගත්තේ කියලා, පොලීසිය භාර හිටපු ඇමතිතුමා කියනවා නම් පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පතිවරු හිටියේ සිරිකොතේ කියලා, මේ නඩු දාලා තිබෙන්නේ කොහොමද? මේ නඩු හැදුවේ සිරිකොතේ කියන එක තමයි මේ හිටපු අමාත්‍යතුමන්ලා පිළිගෙන තිබෙන්නේ. ඔබතුමන්ලාගේ උද්ඝෝෂණ නවත්වනකොට ඔබතුමන්ලාට රිදුණා. රිදෙනකොට මොකද වුණේ? රටේ උසාවිවලින් නියෝග කිහිපයක් ලැබෙනකොටම අමතක වුණා තමන් කරපු දේවල් එළියට එනවා නේද කියලා. අන්තිමට පාර්ලිමේන්තුවේදී තමන්ගේ කටින් එළියට පැන්නා, ඒ අය සිරිකොතේ තියාගෙන තමයි නඩු දැම්මේ කියලා. එහෙම නම්, මේ එක නඩුවකින් දෙකකින් නොවෙයි, මේ නඩු සියල්ලන්ගෙන්ම නිදොස්කොට නිදහස් වෙන්න ඕනෑ. සිරිකොතේදී කොහොමද නඩු හදන්නේ? සිරිකොතේ කොහොමද පොලිස්පති ඉන්නේ? සිරිකොතේ කොහොමද නියෝජ්‍ය පොලිස්පතිවරු ඉන්නේ? ඒ වාගේ නඩු හදලා විනාශ කරපු යුගයක් තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති වුණේ. ඒ නිසා තමයි අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා නැවතත් ස්වාධීන රටක්, ජනතාවට ඉන්න හිතෙන රටක් හදන්න කටයුතු කළේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[පි.ප. 3.54]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! 2022ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட முன்மொழிவு களில் பாதுகாப்பு அமைச்சுக்கு 373.05 பில்லியன் ரூபாயும், பொது மக்கள் பாதுகாப்பு அமைச்சுக்கு 106.56 பில்லியன் ரூபாயுமென மொத்தம் 479.61 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. இது வரவு செலவுத்திட்டத்தின் மொத்தச் செலவினத்தில் கிட்டத்தட்ட 19.14 சதவீதமாகும். அதாவது, மொத்தச் செலவினத்தின் ஐந்தில் ஒரு பங்காகும். ஒரு சிறிய நாடான இலங்கை தனது மொத்தச் செலவினத்தில் ஐந்தில் ஒரு பங்கைத் தொடர்ச்சியாகப் பாதுகாப்புக்கு ஒதுக்குமாக இருந்தால், இந்த நாட்டினுடைய பொருளா தாரத்தை மீட்டெடுக்கவோ அல்லது இந்த நாட்டு மக்களுடைய வறுமையைப் போக்கவோ யாராலும் முடியாது என்பதை நான் இந்தச் சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

நேற்றைய தினம் கௌரவ அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்கள் ஒரு கருத்தைத் தெரிவித்திருந்தார். அதாவது, ஆட்சி மாற்றம் நடைபெற்றாலும், பொருளாதாரக் கொள்கையில் மாற்றம் ஏற்படாத வகையில் நாட்டுக்கென ஒரு நிலையான பொருளாதாரக் கொள்கை வகுக்கப்பட வேண்டும் என்றார். உதாரணமாக, இந்தியாவில் அப்படியான ஒரு பொருளாதாரக் கொள்கை இருக்கின்றது. எமது நாட்டில் அரசாங்கம் மாறுகின்றபோது, பொருளாதாரக் கொள்கையும் மாறுகின்ற காரணத்தால், நாட்டின் பொருளாதாரமானது அதலபாதாளத் துக்குள் தள்ளப்பட்டிருக்கின்றது. எனவே, பொருளாதார நிபுணர்களால் ஒரு நிலையான பொருளாதாரக் கொள்கை வகுக்கப்படல் வேண்டும்.

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

இன்று சாதாரண மக்கள் தங்களுடைய வாழ்க்கையைக் கொண்டுசெல்ல முடியாத ஒரு சூழ்நிலையில் இருக்கின்றார்கள். எனினும், அந்த மக்களுடைய நாளாந்தச் செலவைக் குறைக்கும் வகையில், அத்தியாவசியப் பொருட்களின் விலைக் குறைப்பு சம்பந்தமான எந்தவித முன்மொழிவும் இந்த வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்படவில்லை என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, நாடு பொருளாதார ரீதியில் பின்னடைவைச் சந்தித்திருக்கின்ற இவ்வேளையில், நீங்கள் இந்த வரவு செலவுத்திட்டத்தின் மொத்தச் செலவினத்தில் ஐந்தில் ஒரு பங்கைப் பாதுகாப்புக்கு ஒதுக்கி, எந்த நாட்டுடன் போர் செய்யப் போகிறீர்கள்? இந்தியாவுடன் போர் செய்யப் போகிறீர்களா? சீனாவுடன் போர் செய்யப் போகிறீர்களா? அல்லது அமெரிக்காவுடன் போர் செய்யப் போகிறீர்களா? என நான் அரசாங்கத்திடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, இன்றைய குழுநிலை விவாதத்தில் மனித உரிமைகள் ஆணைக்குழு தொடர்பாக நான் ஒரு சில கருத்துக்களைக் கூற விரும்புகின்றேன். இலங்கையானது மனித உரிமை விடயத்தில் மிகமோசமான நிலையில் இருக்கின்றது. ஒரு மனிதனுக்குரிய உரிமைகளை நிலைநாட்ட முடியாமல், தொடர்ச்சியாக இந்த அரசாங்கம் இருந்துகொண்டு இருக்கின்றது. அண்மையில் கனடாவிலிருந்து என்னுடைய நண்பர் ஒருவர் வந்திருந்தார். அவர் தங்கியிருந்த பிரதேசத்தில் இருந்த இராணுவப் புலனாய்வாளர்கள் அவரிடம் சென்று, "ஏன் நீங்கள் இங்கு வந்தீர்கள்? எதற்காக வந்தீர்கள்"? என்று வினவியதோடு, தங்களுடைய அலுவலகத்துக்கு வரவேண்டும் என்றும் சொல்லிவிட்டுச் சென்றிருக்கிறார்கள். இவ்வாறு வஞ்சிக்கின்ற செயற்பாடு கடந்த இரண்டு வாரங்களுக்கு முன்பு நடைபெற்றது.

நான் 'கொவிட்' தொற்றுக் காரணமாக வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டிருந்தபொழுது, அவர் எனக்குத் தொலைபேசி அழைப்பை எடுத்து, "சாவகச்சேரிப் பிரதேசத்திலிருக்கின்ற கச்சாய் இராணுவ முகாமைச் சேர்ந்த இராணுவப் புலனாய்வாளர்கள் தொடர்ச்சியாக என்னை விரட்டுகிறார்கள். நான் இலங்கையிலிருந்து போகவா? இந்த நாட்டில் எனக்கு இருக்க முடியாதா?" என்று என்னிடம் கேட்டார். அதற்கு நான், "நீங்கள் யாழ்ப்பாணத்திலுள்ள மனித உரிமைகள் ஆணைக்குழுவின் அலுவலகத்துக்குச் சென்று இதுதொடர்பில் முறையிடுங்கள்!" என்று கூறினேன். அதற்கு அவர், "மனித உரிமைகள் ஆணைக் குழுவில் முறைப்பாடு செய்தவர்களுக்கு நீதி கிடைக்கப் பெற்றிருக்கிறதா"? என்று என்னிடம் திருப்பிக் கேட்டார். அவர் அப்படிக் கேட்பதில் நியாயம் இருக்கிறது.

இன்றைக்கு மனித உரிமைகள் ஆணைக்குழு எப்படி இயங்குகின்றது? குறிப்பாக, மன்னார் மாவட்டத்தில் மனித உரிமைகள் ஆணைக்குழுவின் அலுவலகம் இயங்குவதற்கு UNHCR இனுடைய நிதி உதவியைப் பெற்றும்கூட, அங்கு பணிபுரிந்தவர்களுக்கு சம்பளம் வழங்கப்படவில்லை. மேலும், அங்கு தகுதியான சட்டத்தரணிகள் இல்லை.

(15th Start) அந்த அலுவலகத்துக்கு மக்கள் முறைப்பாடு செய்வதற்குச் சென்றால், அங்கிருக்கின்ற அதிகாரிகள், "நீங்கள் வவுனியாவுக்குச் சென்று முறைப்பாடு செய்யுங்கள்!" என்று சொல்கின்றார்கள். நேற்று ஒரு தரப்பினர் வவுனியாவிலுள்ள மனித உரிமைகள் ஆணைக்குழுவின் அலுவலகத்துக்கு முறைப்பாடு செய்வதற்காகச் சென்றிருந்தார்கள். அப்போது, "யாழ்ப்பாணத்தில் இருந்துதான் அரச அதிகாரி இங்கு வர வேண்டும். ஆகையால், அவர் வருகின்ற நாளைப் பார்த்து வாருங்கள்!" என்று அங்கிருந்தவர்களால் கூறப்பட்டிருக்கிறது. இவ்வாறு ஒரு நபர் மனித உரிமைகள் ஆணைக்குழுவுக்குச் சென்று முறைப்பாடு செய்யமுடியாத ஒரு சூழ்நிலை எங்களுடைய பிரதேசத்தில் இருக்கின்றது என்பதை தயவுசெய்து அரசாங்கம் புரிந்துகொள்ள வேண்டும். வவுனியா, மன்னார் ஆகிய மாவட்டங்களிலுள்ள இவ்வலுவலகத்தின் நிலைமை இவ்வாறு இருக்க, முல்லைத்தீவு மாவட்டத்திலுள்ள அலுவலகமானது இயங்குகிறதா? இல்லையா? என்று அங்கு பணிபுரிகின்றவர்களுக்கே சந்தேகமாக இருக்கின்றது. அது மக்கள் முறைப்பாடு செய்யக்கூடிய அலுவலகமா? என்பது கேள்விக்குறியாக இருக்கின்றது.

மூன்று மாதங்களுக்கு முன்பு இலங்கை கடற்படையினரால் எமது மீனவர்கள் தாக்கப்பட்டார்கள். அது தொடர்பில் அவர்கள் மனித உரிமைகள் ஆணைக்குழுவில் முறைப்பாடு செய்தார்கள். அதற்கு அந்த ஆணைக்குழுவினால் என்ன பதிலை வழங்க முடிந்தது? ஒன்றுமேயில்லை. அங்கு தகுதியான அதிகாரிகள் இல்லாத காரணத்தினால், மக்கள் செய்கின்ற முறைப்பாட்டை எழுதி தலைமையகத்துக்கு அனுப்புகின்றார்கள். அதனுடன், அந்தப் பிரச்சினை முடிந்துவிடுகின்றது. மனித உரிமை மீறப்படுகின்றபோது, தங்களுக்கு நீதி கிடைக்கும் என்ற நம்பிக்கையுடன் மக்கள் அங்கு சென்று முறைப்பாடு செல்கின்றார்கள். ஆனால், அங்கு அந்த நிலைமை இல்லை. குறிப்பாக, வவுனியா, முல்லைத்தீவு, மன்னார் ஆகிய மாவட்டங்களில் இருக்கின்ற மனித உரிமைகள் ஆணைக்குழுவின் அலுவலகங்கள் ஒழுங்காக இயங்குவதில்லை. யாழ்ப்பாண அலுவலகத்திலுள்ள அதிகாரிதான் இங்குள்ள செயற்பாடுகளையும் கவனிக்கவேண்டி இருக்கின்றது.

எங்களுடைய பிரதேசங்களில் மனித உரிமை மீறல் சம்பவங்கள் நிறையவே நடைபெறுகின்றன. எனினும், எங்களுடைய மாவட்டங்களிலுள்ள மனித உரிமைகள் ஆணைக்குழு அலுவலகங்கள் அசமந்தப் போக்குடனும் மக்களின் நம்பிக்கையை இழந்த நிலையிலும் இயங்கிக் கொண்டிருக்கின்றன. எனவே, அவற்றைப் பலப்படுத்த வேண்டுமென நான் அரசாங்கத்தைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். மக்கள் அங்கு சென்று ஒரு முறைப்பாட்டைச் செய்தால், அதற்குரிய நீதியைப் பெற்றுக்கொடுக்க வேண்டும் அல்லது அம்முறைப்பாட்டுடன் தொடர்புடைய விடயங்களை அவர்களுக்குத் தெளிவுபடுத்த வேண்டும். எனினும், அதற்குத் தகுதியான அதிகாரிகள் அங்கு இல்லை. தகுதியான அதிகாரிகள் இருந்தால், அவர்கள் முறைப்பாடுகளை உரிய முறையில் விசாரிப்பார்கள். அப்போது அரசாங்கத்துக்குச் சார்பானவர்களுக்கு எதிராகவும் முறைப்பாடுகள் வரும். அதன் காரணமாகத்தான், நீங்கள் அந்தப் பிரதேசங்களுக்குத் தகுதியான அதிகாரிகளை நியமிப்பதில்லை என்பதை நான் இங்கே குற்றச்சாட்டாக முன்வைக்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொலிஸ், இராணுவம், கடற்படை போன்ற படைத்தரப்புக்களால் மேற்கொள்ளப்படுகின்ற மனித உரிமை மீறல் செயற்பாடுகள் தொடர்பில் - நான் முன்பு நடந்த விடயங்களைக் குறிப்பிடவில்லை. - மனித உரிமைகள் ஆணைக் குழுவில் முறைப்பாடு செய்தால், எந்தவித நீதியும் கிடைப்பதில்லை. அப்படியான ஒரு சூழ்நிலைதான் இன்று இருக்கின்றது என்பதையும் நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று காலை கௌரவ கடற்றொழில் அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள், தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தின் தலைவர் போதைவஸ்து வியாபாரத்தில்

ஈடுபட்டிருந்ததாகக் குறிப்பிட்டிருந்தார். இது மனவேதனை அளிக்கின்ற ஒரு விடயமாகும். தமிழீழ விடுதலைப் புலிகளால் போரில் வெல்லமுடியவில்லை என்றாலும், அவர்களுடைய ஒழுக்கம், கட்டுப்பாடு என்பன பற்றி உலகத்தில் இருக்கின்ற யாவருக்கும் தெரியும்! தற்போது பாதுகாப்பு அமைச்சின் செயலாளராக இருக்கின்ற கமல் குணரத்ன அவர்கள் விடுதலைப் புலிகளுடைய ஒழுக்கம், கட்டுப்பாடு என்பன தொடர்பாக அவர் எழுதிய புத்தகத்தில்கூட குறிப்பிட்டிருக் கின்றார் என்பதையும் நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகிறேன். ஆகவே, தயவுசெய்து பிழையான தகவலைச் சபையில் சொல்லி, உண்மையான விடயத்தை மறைப்பதற்கு முயற்சி செய்யவேண்டாம். இதற்கு என்னுடைய கண்டனத் தைத் தெரிவித்து விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.06]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் றஹ்மானிர் றஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த நாட்டிலே கிட்டத்தட்ட ஓரிலட்சம் மக்கள் வாழ்கின்ற கிண்ணியாப் பிரதேசத்திலே பெரியதோர் அனர்த்தம் ஏற்பட்டு, இதுவரை 06 பேர் மரணித்திருப்பதாக நாங்கள் அறிகிறோம். அதிலே 8 வயது மற்றும் 6 வயதுடைய ஒரே குடும்பத்தைச் சேர்ந்த இரண்டு மாணவர்கள் உட்பட நான்கு மாணவர்களும் வயது வந்த இருவரும் உள்ளடங்கு கின்றார்கள்.

தற்பொழுது, வீதி அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ ஜோன்ஸ்டன் பர்னாந்து அவர்கள் இங்கிருக்கின்றார். கௌரவ அமைச்சர் அவர்களே, அண்மை யிலே பல பில்லியன்கள் செலவில் கொழும்பிலே ஒரு பெரிய bridgeஇனை நீங்கள் அமைத்திருக்கின்றீர்கள். அதேபோன்று நீங்கள் குறிஞ்சாக்கேணிப் பாலத்தையும் புனரமைக்க எடுத்த முயற்சிக்கு நன்றி சொல்கின்றேன். 27,000 குடும்பங்கள் வாழுகின்ற ஒரு பிரதேசத்தையும் 3,000 குடும்பங்கள் வாழுகின்ற இன்னொரு பிரதேசத்தையும் இணைக்கின்ற இப்பாலத்தைப் புனரமைப்பதாக இருந்தால் alternative arrangementஆக byroad ஒன்றை அல்லது small ferry service ஒன்றை அல்லது ஏதாவதொரு சாத்தியமான - feasibility - மாற்று ஏற்பாட்டைச் செய்துவிட்டுத்தான் மீளமைக்க வேண்டும். அதுதான் வழமை! இரண்டு பிரதேசங்களிலுமுள்ள 11 பாடசாலைகளுக்குச் செல்கின்ற மாணவர்கள் உட்பட ஒரு நாளைக்கு கிட்டத்தட்ட 8,000 பேர் இப்பாலத்தைப் பயன்படுத்துகின்றார்கள். அவ்வாறு alternative arrangement ஒன்றைச் செய்திருந்தால், இந்த உயிர் இழப்புக்களைத் தவிர்த்திருக்கலாம்! எனவே, தயவுசெய்து நீங்கள் வீதி அபிவிருத்தி அதிகாரசபையிடம் அல்லது அங்கேயிருக்கின்ற அதிகாரிகளிடம் யார் இதற்குப் பொறுப்பு? எவ்வாறு இந்த அனர்த்தம் நடந்தது? என்பன தொடர்பில் விசாரிக்க வேண்டும். இன்று அநியாயமாகப் பல உயிர்கள் இழக்கப் பட்டிருக்கின்றன. எனக்கும் பிள்ளைகள் இருக்கின்றார்கள்; உங்களுக்கும் பிள்ளைகள் இருக்கின்றார்கள். ஒரு பிள்ளையை இழந்தால், எவ்வளவு வேதனையாக இருக்கும் என்பது உங்களுக்கும் தெரியும்! எனவே, உடனடியாக இதற்கான alternative arrangement ஒன்றைச் செய்யவேண்டும். இந்தப் பாலத்தின் நிர்மாணப் பணிகள் மந்தமாக நடைபெறுகின்றன. எனவே, விரைவாக அந்தப் பாலத்தை நிர்மாணிப்பதற்காகத் தேவையான நிதியை ஒதுக்கீடு செய்யவேண்டும் எனவும் இந்த அனர்த்தத்துக்குக் காரணமானவர்களுக்கு - அவர்கள் அதிகாரி களாக இருந்தால் என்ன, அரசியல்வாதிகளாக இருந்தால் என்ன - எதிராக நடவடிக்கை எடுக்க வேண்டு மென்றும் நான் உங்களிடத்திலே அன்பாக வேண்டிக் கொள்கின்றேன்.

அடுத்து, இன்றைய தினம் நடைபெறுகின்ற சனாதிபதியின் நிதி ஒதுக்கீடு தொடர்பான குழுநிலை விவாதத்தில் நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகிறேன். இனங்களுக்கிடையிலே நல்லுறவை ஏற்படுத்துவதனூடாகத்தான் எங்களால் இந்த நாட்டை அபிவிருத்தி செய்யலாம். சிங்கப்பூராக இருக்கலாம், மலேசியாவாக இருக்கலாம். அந்த நாடுகளில் சட்டங்கள் ஒழுங்காக நடைமுறைப்படுத்தப்படுவதனாலும் இனங்களுக் கிடையே நல்லுறவு பேணப்படுவதனாலும் மதங்களுக்கு உரிய மரியாதை வழங்கப்படுவதனாலும்தான் இன்று அவை பொருளாதாரத்திலே வளர்ந்திருக்கின்றன.

எமக்குத் தேவையான எல்லா வளங்களும் இந்த நாட்டிலே இருக்கின்றன. இன்றிருக்கின்ற ஒரேயொரு பிரச்சினை இனங்களுக்கிடையேயுள்ள முரண்பாடுதான்! இதுதான் 30 வருட யுத்தத்துக்கும் காரணமாக அமைந்தது. யுத்தம் முடிந்து 10 வருடங்களில் முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த சஹ்ரான் என்ற கயவன் பாரியதொரு பயங்கரவாதத் தாக்குதலை இந்த நாட்டிலே மேற்கொண்டான். அந்தத் தாக்குதல் சம்பந்தமாக ஆராய்வதற்கென அப்போது சனாதிபதியாக இருந்த மைத்திரிபால சிறிசேன அவர்கள் ஓர் ஆணைக்குழுவை நியமித்திருந்தார். பயங்கரவாதிகள் 10 காரணங்களைச் சொல்லியிருக்கிறார்கள் என்று அந்த ஆணைக்குழுவின் அறிக்கையிலே குறிப்பிடப்பட்டிருக்கிறது. அந்தக் காரணங் களை ஏற்றுக்கொண்டு, அவர்கள் மேற்கொண்ட தாக்குதலை நான் நியாயப்படுத்தவில்லை. சஹ்ரான் உட்பட அந்த 8 பேரும் பயங்கரவாதிகள்! அதற்கு உதவி செய்தவர்கள் அத்தனை பேரும் பயங்கரவாதிகள்! எனவே, அவர்கள் அத்தனை பேருக்கும் தண்டனை வழங்க வேண்டுமென்றுதான் நான் சொல்கின்றேன். அந்தப் பத்துக் காரணங்களில் முதலாவது "defaming and scolding Allah" - "அல்லாஹ்வை ஏசியதனால்" என்றும் மூன்றாவது "Gnanasara *Himi* claiming that Allah will be reborn" என்றும் சொல்லப்பட்டிருக்கின்றது. இவ்வாறு உள்ளடங்குகின்ற ஒருவரை, இந்த நாட்டினுடைய சனாதிபதி அவர்கள் "ஒரே நாடு, ஒரே சட்டம்" என்ற சனாதிபதி செயலணியின் தலைவராக நியமித்திருக்கின்றார். தயவுசெய்து, அந்தச் செயலணியின் தலைவர் பதவியிலிருந்து அவரை நீக்கி, ஒரு சிறந்த மதகுருவை அல்லது சிறந்த அறிவாளியை அல்லது புத்திஜீவியை நியமியுங்கள்! என்று மிகத் தாழ்மையாகக் கேட்டுக்கொள்கின்றேன். இந்த நாட்டின் பொருளாதாரமானது இன ஒற்றுமை, இன ஐக்கியத்தில் தங்கியுள்ளது. "ஒரே நாடு, ஒரே சட்டம்" நாட்டுக்குத் தேவை! அதை நல்லவர்களைக் கொண்டு செய்வியுங்கள் என்று அன்பாகக்கேட்டு, விடைபெறு கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට විනාඩි කීයක් වෙන් කරලා තිබෙනවා ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට විනාඩි 13යි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මට විනාඩි කීයද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 12යි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
එතකොට, විපක්ෂයට?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාට විනාඩි 15ක් තිබෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
විනාඩි 40ක් තිබෙනවා නේ. එකතුව හරිද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු ඇමතිතුමා, මා ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉස්සෙල්ලාම ගරු රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමා අර පාලම සම්බන්ධව මතු කරපු ප්‍රශ්නයට පිළිතුරක් දෙන්නම්. එතුමා වාගේම රවුෆ් හකීම් මන්ත්‍රීතුමාත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අපේ ගරු ඉම්රාන් මහරූෆ් තරුණ මන්ත්‍රීතුමාත්, ගරු විපක්ෂ නායකතුමාත් අද කථා කරමින් කිව්වා, කින්නියා පාලම් පාරුව පෙරළීමෙන් හයදෙනෙකු විතර මිය ගිහින් තිබෙනවා කියලා. ඒ සම්බන්ධව අපගේ බලවත් කනගාටුව අපි මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

මට දැනුණු දේ තමයි, මේ ප්‍රශ්නයත් අපේ පිටට, ආණ්ඩුව පැත්තට දමන්න හදන බව. ඒ පාලමට මුල් ගල් තියලා තිබෙනවා, යහ පාලන ආණ්ඩුව. ඇස්තමේන්තු කරන්නේ නැතිව, ටෙන්ඩර් කැඳවන්නේ නැතිව, කිසිම දෙයක් කරන්නේ නැතිව මුල් ගල් තියලා තිබුණා. අපේ රජය ආවාට පස්සේ ඇස්තමේන්තු කරලා, ටෙන්ඩර් කැඳවලා ඒ පාලමේ කොටසක් ඒ ප්‍රදේශයේ ජනතාවගේ පාවිච්චිය සඳහා ඉක්මනින් හදලා දෙන්න කටයුතු කළා. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් මාර්ග කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහන සහ පාලම් හැදීමේ වැඩසටහන අනුව අපි කටයුතු කළා. ජූලි මාසයේ 09වැනි දා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා ඒ සම්බන්ධ ප්‍රශ්නයක් අහලාත් තිබුණා.

දැන් එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ඒ පාලම හදද්දී ඒ ජනතාවට පාවිච්චි කරන්න අතුරු මාර්ගයක් ලබා දීලා තිබුණා. හැබැයි, ඒ මාර්ගය කිලෝමීටර් තුනක් දුරයි. ඒ ජනතාව ඒක පාවිච්චි කරන්න කැමැති නැහැ. ඒක තමයි මට ලැබුණු තොරතුර. ඒ ferry service එක දාලා තිබෙන්නේ නගර සභාවෙන්. ඒ අනුමැතිය සහිත ඔක්කෝම විස්තර මම ගෙනාවා. මෙහි සඳහන් වෙනවා, "Naleem, Chairman, Urban Council Kinniya" යනුවෙන්. මා හිතන විධියට ඒ නගර සභාවේ බලය තිබෙන්නේ "සජබ"ට; ප්‍රාදේශීය සභාව අයිති වෙන්නේ Muslim Congress එකට. ඒ ගොල්ලන් තමයි ඒ ferry service එකට අවසර දීලා තිබෙන්නේ. ඒ හින්දා ඒ පාලම් පාරු සේවයට අපි අවසර ලබා දුන්නා කියලා මතයක් හදන්න එපා. Local Government එකෙන්, එහෙම නැත්නම් ඒ පළාත් පාලන ආයතනවලින් තමයි ඒ අවසරය ලබා දීලා තිබෙන්නේ. මට දැනගන්න ලැබිලා තිබෙන විධියට ඒ දරුවන් පාරුවෙන් අරගෙන යනකොට life jackets දාගෙන නැහැ. මම නියෝජ්‍ය පොලිස්පතිතුමාගෙන් ඇහුවා. මම පොලිස්පතිතුමාටත් කථා කළා. මම කිව්වා, ඒකට වග කිවයුතු අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. ඒ ferry service එක කරපු අය දැන් පැනලා ගිහින් ලු. මම කිව්වා, රටේ නීතිය අනුව ඔවුන්ට විරුද්ධව කටයුතු කළ යුතුයි කියලා. එය මිනීමැරුමක්. ඒ දරුවන් life jackets දාන්නේ නැතිව අරගෙන ගිය හින්දායි ඒ සිදුවීම වෙලා තිබෙන්නේ. ඒ නිසා මෙතැනදී රජයට ඇඟිල්ල දිගු කරන්න හදන්න එපා. මේ වාගේ සිදුවීම්වලින් දේශපාලනය කරන්න හදන්න එපා. මම ඉතාම ගෞරවයෙන් ඒ ඉල්ලීම කරනවා.

මේ සිද්ධිය දේශපාලනයට හරවා ගන්න එපා. එසේ කිරීම අපි හෙළා දකිනවා.

එදා තිබුණේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. 2015 වර්ෂයේදී නැගෙනහිර පළාතේ තමුන්නාන්සේලා වැඩියෙන්ම උදවු කළේ ඒ ජනාධිපතිතුමායි, ආණ්ඩුවයි පත් කර ගන්න. නමුත් තමුන්නාන්සේලාට බැරි වුණා, ඒ පාලම් හදන්න. ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා අපට ස්තුති කරලාත් තිබෙනවා. අපි හොඳ දෙයක් කළේ. ලක්ෂයක් පමණ ජනතාවට සහ තමුන්නාන්සේලාට සැලකුවේ නැහැ, පසුගිය ආණ්ඩුව. ඒක තමයි ඇත්ත තත්ත්වය? "උතුරු වසන්තය" යටතේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ එදා දැවැන්ත සේවයක් කළා; පාලම් ගණනාවක් හැදුවා. මේ පාලමත් ප්‍රාදේශීය සභාවට අයත් වන එකක්. අපි එය හදන්න ටෙන්ඩර් කරලා දීලා තිබෙනවා. මෙහිදී රජය පැත්තෙන් වැරැද්දක් වෙලා නැහැ. හැබැයි, අපි ඒ සිදුවීම ගැන කනගාටු වෙනවා; ඒ මිය ගිය දරුවන්ගේ සහ මිය ගිය සෙසු අයගේ පවුල්වල සියලුදෙනාට අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඔබතුමා නැඟිටලා කථා කළත්, මා නැඟිටලා කථා කළත්, සජිත් ප්‍රේමදාස මහත්මයා නැඟිටලා කථා කළත්, ඒ මිය ගිය දරුවන්ට, දෙමව්පියන්ට පණ එන්නේ නැහැ.

මම ආණ්ඩුකාරතුමියට කථා කරලා කිව්වා, මේ ගැන වහාම පරීක්ෂණයක් කරලා, ඒකට අවසර දුන්නේ කොහොමද, එහි

නීත්‍යානුකූලභාවය මොකක්ද කියා සොයා බලන්න කියලා. කවුරු හෝ වැරැද්දක් කරලා තිබෙනවා නම් -ඒ අපේ කෙනෙකු වෙන්න පුළුවන්; ප්‍රාදේශීය සභාව වෙන්න පුළුවන්- ඔවුන්ට විරුද්ධව අනිවාර්යයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඇත්තටම මේක මිනී මැරුමක් හැටියටයි මා නම් දකින්නේ. මම මේ ගැන හෙට උදේ කථා කරන්නයි හිටියේ. නමුත් ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු හින්දායි මම මේ වෙලාවේ ඒ ගැන කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැය ශීර්ෂ ගණනාවක් පිළිබඳ සලකා බැලීම කරනවා. අතිගරු ජනාධිපතිතුමාගෙන් පටන් ගත්තාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව ආදී වශයෙන් වැය ශීර්ෂ බොහොමයක් අද සලකා බැලෙනවා. මට වෙලාව නැති නිසා ඒ ඔක්කොම ගැන කියන්න යන්නේ නැහැ.

අපි දැක්කා, විපක්ෂයේ හුඟක් අය අතිගරු ජනාධිපතිතුමාට ඇඟිල්ල දිගු කරන්න හදපු ආකාරය. අතිගරු ජනාධිපතිතුමා අධිකරණයට ඇඟිලි ගහන, අල්ලස් කොමිසමට ඇඟිලි ගහන, නීතිපති දෙපාර්තමේන්තුවට ඇඟිලි ගහන, බලය අනිසි ලෙස පාවිච්චි කරන නායකයෙක් කියලා ඒත්තු ගන්වන විධියට තමයි විපක්ෂයේ හුඟක් අය කථා කළේ. මගෙන් පසුව කථා කරන නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාත් ඒකම කියයි. ඒක තමයි ඇත්ත තත්ත්වය. *[බාධා කිරීමක්]* ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒ ගැන කථා කරනවා නේද? ඔබතුමා මගේ යාළුවා.

පසුගිය අවුරුදු එකහමාර දිහා බැලුවාම පෙනෙනවා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කියන්නේ ඉතාම විනයගරුක නායකයෙක් බව. කාටවත් එතුමාට විරුද්ධව ඇඟිල්ල දිගු කරන්න බැහැ. එතුමා කිව්වේ නැහැ, 'මම සරල නායකයෙක් වෙලා මේ රට පාලනය කරනවා' කියලා. නමුත් එතුමා ඉතාම සරල නායකයෙකු හැටියට මේ රට පාලනය කරනවා. දූෂණයට නැවතීමේ තිත තබනවා කියලා එතුමා කිව්වා. ඇයි, එහෙම කිව්වේ? එහෙම කිව්වේ, ගිය අවුරුදු පහේදී පළමු දවස් සියයෙන් අලුත් රටක් හදනවා කියපු යහ පාලන නඩය මහ බැංකුව හොරා කාපු හින්දා. එදා හිටපු නායකයන් මේ රටේ පුරවැසිභාවයවත් නැති කෙනෙකුට මහ බැංකුවේ අධිපතිකම දුන්නා. ඔහු හොරකම් කරද්දී ඒ වෙනුවෙන් කඩේ ගිය අය තමයි අද උදේ ඉඳලා මේ ගරු සභාවේ විපක්ෂය වෙනුවෙන් කථා කළේ.

මේවා අලුත් දේවල් නොවෙයි. එතුමන්ලා ඉන්නේ නිදි පෙති ගහලා ඇහැ ඇරුණා වාගේ. හරියට නිදි පෙත්ත ගහලා ඇහැ ඇරුණා වාගේ! එතුමන්ලාට අමතක වෙලා, රාජපක්ෂ පරද්දන්න ඉන්න එකම නායකයා සජිත් ප්‍රේමදාස කියලා එතුමා රට වටේ ගෙනිච්ච හැටි. "සජිත් ප්‍රේමදාස මහත්මයාට විතරයි රාජපක්ෂ මහත්මයා පරද්දන්න පුළුවන්" කියලා, එතුමා රට වටේ ගෙනියලා එතුමාට අපේක්ෂකත්වය අරගෙන දුන්නා. අන්තිමට ඡන්ද ලක්ෂ 15කින් පැරදුණා. එතුමා කියපු දේවල් තමුන්නාන්සේලාට මතකයි නේ. බොත්තම ඔබපු ගමන් midwife එවනවා කිව්වා. එතුමා ජනාධිපති වුණා නම් බොත්තම ඔබලා තමයි අය වැයත් ඉදිරිපත් කරන්නේ. දැනුත් හුඟක් අය බලාපොරොත්තු වෙනවා සජිත් ප්‍රේමදාස මහත්මයා බලයට ගෙනෙන්න. විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙකු කියනවා මම දැක්කා, "අපි අනිවාර්යයෙන්ම සජිත් ප්‍රේමදාස මහත්මයා ජනාධිපති කරනවා" කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හීනෙන්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

අපි නම් හරි කැමැතියි, සජිත් ප්‍රේමදාස මහත්මයා විපක්ෂ නායක හැටියට ඉන්න එක ගැන. අපි විශේෂයෙන්ම සලකලා එතුමාට ෆයිසර් එන්නතම දුන්නා. ඒ, එතුමා අපට ඕනෑ නිසා; එතුමා රැකගන්න ඕනෑ නිසා. එතුමා ඡන්ද කිහිපයක් පරාදයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා පටන්ගත්තා වාගේ තමයි. පටන් ගැන්මම, පරාජය! මේ කොවිඩ් - 19 වසංගතය තිබුණේ නැත්නම් තමුන්නාන්සේලා පළාත් සභා ඡන්දයත් පරාදයි. ඒ හින්දා තමුන්නාන්සේලා සතුටු වෙන්න ඕනෑ, කොවිඩ් - 19 වසංගතය තිබෙන එක ගැන. ඡන්දය පැවැත්වුවා නම් තමුන්නාන්සේලාට අන්ත පරාජයක් ලැබෙනවා. ඡන්දයකට ගියා නම් ඔය කයිවාරු ගහන්න හම්බ වෙන්නේ නැහැ.

මම මේ කාරණයත් මතක් කරනවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කියන්නේ, වැදගත් නායකයෙක්; සරල නායකයෙක්; දූෂණයෙන් තොරව මේ රට පාලනය කරන නායකයෙක්. එතුමා ඒක ඔප්පු කරලා තිබෙනවා. ඒ වාගේම, එතුමා ප්‍රජාතන්ත්‍රවාදයට ඉතාම ගරු කරන නායකයෙක්. නමුත්, එතුමාට මොන තරම් අපහාස කරනවාද, මොන තරම් නින්දා කරනවාද? එතුමාගේ වැඩ පිළිවෙළට නින්දා අපහාස කරමින් මොන තරම් නම් පහර දෙනවාද? එතුමාගේ නම මොකක්ද කියලා අවුරුදු එකහමාරක් ගියාට පස්සේ තමයි සමහර මන්ත්‍රීවරුන්ට මතක් වුණේ. බදුල්ල දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලන්නේ නැතිව පැනලා ආපු, තාත්තා කියද්දීත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මිනිසුන් මැරෙනකල් බලාගෙන හිටපු සමහර මන්ත්‍රීවරු අද ඇවිල්ලා කියනවා, "නන්දසේන ගෝඨාභය රාජපක්ෂ මහත්මයා" කියලා.

එතුමන්ලා පාස්කු ඉරිදා ප්‍රහාරය ගැනත් කථා කරනවා. පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන කට උත්තර ගන්න හදන කොට හොඳ වෙලාවට ඒ මන්ත්‍රීතුමා බය වෙලා රෝහලට ගියේ. එහෙම ගියේ නැත්නම් එතුමාගේ පපුවේ ලෙඩේ අහු වෙන්නේත් නැහැ. අපි සතුටු වෙනවා, එහෙම හරි එතුමාගේ පපුවේ ලෙඩේ අහු වෙලා ඔපරේෂන් එකක් කරලා ජීවත්ව ඉන්න එක ගැන. බැරි වෙලාවත් එතුමාට පපුවේ අමාරුව හැදිලා මැරුණා නම් කියාවි, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා එතුමා ඝාතනය කළා කියලා. තමුන්නාන්සේලාගේ කෙරුවාවල් මිනිස්සු දන්නවා.

තමුන්නාන්සේලා අද කථා කරනවා, අධිකරණයේ ස්වාධීනත්වය ගැන, අල්ලස් කොමිසමේ ස්වාධීනත්වය ගැන. තමුන්නාන්සේලාට අතීතය මතකද? තමුන්නාන්සේලා මට විතරක් නඩු 10ක් දැම්මා. අද මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා, මේ කාලයේ නඩු 45ක් ඉල්ලා අස්කර ගත්තා කියලා. ඒ කාලයේ තමුන්නාන්සේලා නඩු දැම්මේ, අඩුම ගානේ කොමිසමේ ඉන්න තුන්දෙනාවත් අත්සන් කරන්නේ නැතිව. හිතු මනාපයට, පළිගැනීමේ චේතනාවෙන්, ඉක්මනින් පැමිණිලි හදමින්, සාක්ෂි සකස් කරමින් තමයි තමුන්නාන්සේලා නඩු දැම්මේ. තමුන්නාන්සේලාට ඒවා අමතක වෙලා. වැඩ බැරි ටාසන්ලා ටික රට හදන්න බැරි තැන, හොරකමේ යන ගමන්, ජනතාවගේ මතය වෙන තැනකට ගෙන යන්න අසත්‍ය නඩු දැම්මා. ඒක තමයි තමුන්නාන්සේලා කළේ.

රටක් දිනවපු නායකයාට, මහින්ද රාජපක්ෂ මැතිතුමාට ගහන්න පුළුවන් තරම් මඩ ගහලා, එතුමාගේ දරුවන් හිරේ දමලා,

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

සහෝදරයන් හිරේ දමලා පළිගත්තා. අද ඉන්න -වර්තමාන- ජනාධිපතිතුමාත් හිරේ දමන්න හදපු අය තමයි තමුන්නාන්සේලා. මේ ගරු සභාවේ දැන් ඉන්න දෙන්නා, තුන්දෙනා නොවෙයි, ඒ. ඉන්නවා එහෙම කරපු වෙන පිරිසක්. චම්පික රණවක, රාජිත සේනාරත්න, අනුර දිසානායක ඇතුළු අය තමයි එදා හිටපු ඒ කණ්ඩායම. තමන්ගේ නායකයා මරපු පක්ෂය එක්කයි කටයුතු කළේ. එදා අරලියගහ මන්දිරයට ඉස්සරහ දොරෙන් තමයි ගියේ. එදා විපක්ෂයක් තිබුණේ නැහැ. එදා අය වැයක් ආවාම විපක්ෂයත් එකයි, ආණ්ඩුවත් එකයි. ඒක තමයි යථාර්ථය. අපට ඒවා අමතක වෙලා නැහැ, මහත්තයෝ. තමුන්නාන්සේලා දැන් හිතාගෙන ඉන්නේ, කෑ ගැසුවාම, උද්ඝෝෂණයක් කළාම ආණ්ඩු බලය හම්බ වෙයි කියලා. ඒකට හුඟක් කල් ඉන්න වෙනවා, තමුන්නාන්සේලාට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හීනෙන් පුළුවන්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒකට තමුන්නාන්සේලාට හුඟක් කල් ඉන්න වෙනවා. මේ රටේ ජනතාව කවදාවත් අමතක කරන්නේ නැහැ, තමුන්නාන්සේලා කරපු දේවල්. කොවිඩ් - 19 අර්බුදය එනකොට මේ රටේ මිනිසුන් මැරෙනකල් ආසාවෙන් හිටපු විපක්ෂයක් තිබෙන්නේ. තමුන්නාන්සේලා ඒකට ආසාවෙන් සිටියේ. පුළුවන් තරම් බැලුවේ මිනිසුන් මැරෙන්න ඉඩ හරින්නයි. එන්නත ගෙනැල්ලා ගහන කොට තමුන්නාන්සේලා කිව්වා, "එන්නත ගෙනැල්ලා මේ ලංකාව පරීක්ෂණාගාරයක් කරන්න එපා" කියලා. ඒක තමුන්නාන්සේලාට මතකද? *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ කිව්වේ නැතත්, තමුන්නාන්සේගේ නායකයෝ එහෙම කිව්වා. "එන්නත ගෙනැල්ලා මේ ලංකාව පරීක්ෂණාගාරයක් කරන්න එපා" කිව්වා; "මිනිස්සු මැරෙන්න ඉඩ අරින්න එපා" කිව්වා. නමුත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එන්නත්කරණය අතින් ලෝකයේ පළමුවෙනි රටවල් දහය අතරට අපේ ලංකාව ගෙන ආවා. විපක්ෂයේ අය වේවා, ආණ්ඩු පක්ෂයේ අය වේවා, රාජ්‍ය නිලධාරියා වේවා, දුප්පත් ගොවියා වේවා මේ රටේ හැම කෙනෙකුගේම ජීවිත බේරා දුන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමායි කියන එක ඉතිහාස ගතවන බව මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි.

එතුමා ගෙන්වපු vaccine ලබාගෙන, රජයෙන් දෙන vaccine ලබාගෙන, තමුන්නාන්සේලා එතුමාට මඩ ගහයි. තමුන්නාන්සේලා හැම වෙලාවේම කළේ කොවිඩ් වසංගතය පතුරුවන්න කටයුතු කරපු එකයි. පුළුවන් තරම් උද්ඝෝෂණ කළා; මිනිසුන් පාරට ගෙනාවා. අද මනෝ ගනේෂන්ට කොවිඩ් - 19 ආසාදනය වෙලා. එතුමා මගේ මිත්‍රයා. තමුන්නාසේලා බලන්නේ මළ මිනී තුළින් හරි බලය ලබා ගන්නයි. මේ රටේ ජනතාව ඒක දන්නවා. අපේ ජනාධිපතිතුමා, අපේ අගමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය, අපේ මන්ත්‍රීවරුන් කවුරුවත් තමුන්නාන්සේලාගේ තුට්ටු දෙකේ මන්ත්‍රීවරුන් වාගේ කටයුතු කරන්නේ නැහැ. රන්ජන් රාමනායකට මොන තරම් බලයක් ලැබිලා තිබුණාද මේ රටේ විනිශ්චයකාරවරුන්ට කථා කරන්න? අනෙක් අය කොහොම කථා කරන්න ඇද්ද? එළියට ආවේ රන්ජන්ගේ හඬපට විතරයි. මන්ත්‍රීවරුන් හිරේ දමන්න, එල්ලුම්ගස් යවන්න විනිශ්චයකාරවරුන්ට දුරකථන ඇමතුම් ලබා දුන්න තමුන්නාන්සේලා අද ස්වාධීන අධිකරණයක් ගැන කථා කරන එක විහිළුවක්. තමුන්නාසේලාට අයිතියක් නැහැ ඒ ගැන කථා කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
හොඳයි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් නඩු 45ක් ඉල්ලා අස් කර ගත්තා. දැන් එහි සිටින සභාපතිතුමියට "වහෙන් ඔරෝ" තර්ජනය කරනවා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කරන්නේ තර්ජනයක්. ඒක තමයි ආණ්ඩු බලය තියෙද්දීත් කළේ. "ඉල්ලා අස් කර ගත්තොත් අපි බලාගන්නම්" කියලා තර්ජනය කරනවා. මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමා කියනවා, "ඉන්න අපේ කාලය එනකල්" කියලා. මේ හදන්නේ රාජ්‍ය නිලධාරින් භය කරන්න; කොමිෂන් සභාවල ස්වාධීනව කටයුතු කරන අය භය කරන්න. ඒක තමයි කරන්නේ. තමුන්නාන්සේලා හිතන්න එපා, මේ රටේ මිනිස්සු මෝඩයි කියලා. මේ රටේ ජනතාව බුද්ධිමත්. තමුන්නාන්සේලා අනිසි ලෙස තර්ජනය කරනවා.

අපි තමුන්නාන්සේලාට මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කිසිම දෙයක් අනවශ්‍ය ලෙස පාලනය කරන්න යන්නේ නැහැ.

ඊළඟට කියනවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු නිසා තමයි මේ ප්‍රශ්න ඔක්කෝම කියලා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කොහොමද? වජිර අබේවර්ධන මොනවාද කියන්නේ? වජිර අබේවර්ධන කිව්වා, සිරිසේන ජනාධිපතිතුමාගේ රෙදි ටික ගලවන්න තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ කියලා. ඒ වීඩියෝ එක බැලුවාද? අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. වජිර අබේවර්ධන එහෙම කිව්වා. ඒ වාගේ දේවල් කරන්න තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ වෙන මොනවාටවත් නොවෙයි, රාජපක්ෂලාට නැවත ඡන්දය ඉල්ලන්න බැරි වෙන්නයි. තමුන්නාන්සේලා කටයුතු කෙරුවේ, රාජපක්ෂලා ඉවර කරන්න. මේ රටේ ජනතාවට ඒවා අමතක වෙලා නැහැ.

ඒ කාලයේ අගමැති කොහේද ඉන්නේ කියලා දන්නේත් නැහැ. ජනාධිපතිට බලයක් තිබෙනවාද කියලා දන්නේත් නැහැ. ඒ නිසා තේ පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා සාක්ෂි දෙන කොට මොනවාද කිව්වේ? එතුමා කිව්වා, "මා ආරක්ෂක කවුන්සිලයට ගෙන්නුවේ නැහැ" කියලා. එහෙම නම් කොහේද බලයක් තිබුණේ? අගමැතිතුමාට ආරක්ෂක කවුන්සිලයට එන්න බැරි නම්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද ඇති වුණු ප්‍රතිඵලය? ඒක නිසා තමයි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ඒක වෙනස් කළේ. තමුන්නාන්සේලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා කළේ මොකක්ද? ඒකෙන් මේ රටේ ආරක්ෂාව නැති වීම විතරක් නොවෙයි, මිනිස්සු මැරෙන්නත් කටයුතු සිද්ධ වුණා. ඒකෙන් රටක් පාලනය කරගන්න බැරි වුණා. ආර්ථිකය වැටුණා, රටේ පරිපාලනය වැටුණා.

තමුන්නාන්සේලා අද රාජ්‍ය සේවකයන් ගැන කථා කරනවා. සිල් රෙදි බෙදුවා කියලා ලලිත් වීරතුංග මැතිතුමා හිරේ දැම්මා. එහෙම නේද? ලලිත් වීරතුංග මැතිතුමා ජනාධිපති ලේකම්

කාර්යාලයේ වැටුප් ගන්නේ නැතිව වැඩ කරනවා. පී.බී. ජයසුන්දර මහත්මයාත් එහෙමයි. ඔවුන් දක්ෂ නිලධාරින්. රාජ්‍ය නිලධාරින්ට තමුන්නාන්සේලා සලකපු හැටි අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. ඒ අය FCID එකට ගෙනාවා, CID එකට ගෙනාවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගෙනාවා. තමුන්නාන්සේලාට මතකද? රාජ්‍ය නිලධාරින්ට මේවා අමතක වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැය ශීර්ෂය ගැන කථා කරන අවස්ථාවේ මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. අතිගරු ජනාධිපතිතුමා සරල නායකයෙක්. එතුමා වැඩට එන්නේ ගෙදර ඉඳලා. එතුමා ජනාධිපති මන්දිරය පාවිච්චි කරන්නේ නැහැ. ඒකටත් සමහරු කැමති නැහැ. සමහරු කියනවා, ජනාධිපති මන්දිරයට යන්න කියලා. තමුන්නාන්සේලාට අපි මතක් කරනවා, මේ රටේ ඒකාධිපතියෙක් බලාපොරොත්තු වෙන්න එපා කියලා.

මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ කිව්වා, ගෝඨාභය රාජපක්ෂ මිනිස්සු මරලා මෝරුන්ට දෙනවා කියලා. ගෙදර මෝරු ඉන්නවා කිව්වා. අන්තිමට රාජිත, මෝරා කිඹුලා වුණා. කිඹුලා පෙන්වලා තමයි ඡන්ද ගන්න හැදුවේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ශ්‍රේෂ්ඨ නායකයෙක්; වැදගත් නායකයෙක්. දූෂණයෙන් තොරව මේ රට පාලනය කරන නායකයා හැටියට, මේ system එක වෙනස් කරපු නායකයා හැටියට ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඉතිහාස ගත වෙනවාය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා කින්නියා පාලම ගැන සඳහන් කරපු නිසා මම ඒ ගැන පොඩි කාරණයක් කියන්න ඕනෑ. ගරු මහාමාර්ග ඇමතිතුමනි, අපට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. එතැන ඉදිවෙන්නේ, මීටර් 160ක් විතර දිග පාලමක්. සාමාන්‍යයෙන් පාලමක් ඉදිවෙද්දී කිලෝමීටර් තුනක විතර bypass එකක් දාන්නේ නැහැ. ඇස්තමේන්තු කිරීමේ දී ඒ සඳහා විකල්ප මාර්ගයක් හැදුවේ නැත්තේ ඇයි?

ගොඩක් වෙලාවට construct කිරීමේ පහසුවත් එක්ක contractor හදන්න ඕනෑ, bypass එකක්. ඉදිකිරීම් ආරම්භ කරලාත් ඇයි bypass එකක් හැදුවේ නැත්තේ? අපි දන්නේ නැහැ මේක ඇස්තමේන්තුවට ඇතුළත් වුණාද නැද්ද කියලා. අන්න එතැන තමයි ගැටලුව තිබෙන්නේ. මොකද මේක විශාල ජනතාවක් පාවිච්චි කරන පාරක් නිසා, ඒ පාර සඳහා විකල්පයක් තිබෙන්න ඕනෑ. කිලෝමීටර් තුනහමාරක් කියන්නේ විකල්පයක් නොවෙයි. එම නිසා, ඒ ප්‍රශ්නය අපට ඔබතුමාගෙන් අහන්න වනවා. එයට ඔබතුමා ඉදිරි කාලයේ දී හෝ පිළිතුර ලබා දෙන්න. ඒක තමයි ජනතාව ප්‍රශ්න කරන්නේ. මේ වාගේ විශාල ඉදිකිරීමක් කරද්දී, ඒ වාගේ අපහසු විකල්පයක් දුන්නේ මොකද කියන ප්‍රශ්නය අපි අහනවා.

කින්නියා පාලම් පාරුවේ අනතුර ගැන අපි කනගාටු වනවා. ඒ මැරුණු අයගේ පවුල්වලට අපේ සමගි ජන බලවේගයේ කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු ඇමතිතුමනි, එය සමගි ජන බලවේගයට බලය තිබෙන නගර සභාවක්ද, ප්‍රාදේශීය සභාවක්ද කියලා ඔබතුමා ඇහුවා. අපේ සමගි ජන බලවේගයට කිසිම නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක බලය නැහැ. එවකට අපේ සමගි ජන බලවේගය ඡන්දයට ඉදිරිපත් වුණේ නැහැ. කෙසේ වෙතත්, ඒ සිදුවීම ගැන අපි කනගාටු වනවා. ඒ කෙසේ වෙතත්, තමුන්නාන්සේලාට උදවු කරපු තවුෆික් මන්ත්‍රීතුමාගේ ගෙදරට ප්‍රහාරයක් එල්ල වෙලා තිබෙනවා. ඒ ජනතාව තවුෆික් මන්ත්‍රීතුමාගේ නිවසට පහර දුන්නේ මොකද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒකත් සොයා බලන්න වෙයි. එතුමාට ඇඟිල්ල දික් වුණේ මොකද, මේ විකල්ප මාර්ගයේ හෝ මේ ඉදි කිරීමට එතුමාගේ යම්කිසි සම්බන්ධයක් තිබෙනවාද කියන කාරණය හොයලා බලන්න වෙයි. මීට වඩා මම ඒ ගැන කියන්නේ නැහැ.

විශේෂයෙන්ම අද සාකච්ඡාවට ගැනෙන වැය ශීර්ෂ අතරින්, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කරද්දී, එතුමා යටතේ තිබෙන -

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ හොඳ මිත්‍රයා. - [බාධා කිරීමක්] අපේ වෙලාවෙන් ගන්නම්. ඔබතුමාට මම කියන්න කැමැතියි, මේක දේශපාලනයට හරවා ගන්න එපා කියලා. මේ පාරේ bypass එක දාන්න තිබෙන්නේ කිලෝමීටර් තුනහමාර නම්, දාන්න වෙනවා නේ. කලපුවනේ තිබෙන්නේ. ඒ නිසා කිලෝමීටර් තුනහමාරක bypass එකක් දාලා තිබෙනවා. ජනතාව ඒක පාවිච්චි කරලා නැහැ. එතකොට ඔබතුමන්ලාගේ පක්ෂය නගර සභාවේ නැත්නම්, අපි කියමු ඒක UNP නගර සභාව කියලා. ඔබතුමන්ලාත් හිටියේ UNP එකේ නේ. UNP නගර සභාවෙන් තමයි, තමුන්නාන්සේලා එක්ක අර මහ බැංකුවෙන් හොරකම් කරපු -

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ඔබතුමා මගේ වෙලාව ගන්නවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

නැහැ, නැහැ. ඔබතුමා මේක ඇද ගත්තා. අපරාදේ, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කළා නම් ඉවරයි නේ.

ගරු මන්ත්‍රීතුමනි, මේක අපේ ගොඩට දාන්න හදන්න එපා කියලා අපි පැහැදිලිව කියනවා. මම ඔබතුමාට කිව්වා. අහිංසක ළමයින් තමයි ඒ මැරිලා තිබෙන්නේ. ඒ මේ රටේ දරුවෝ. ඒ නිසා මේක තුට්ටු දෙකේ දේශපාලනයට ඇද ගන්න එපා. ඔබතුමා තුට්ටු දෙකේ දේශපාලනය කරන්නේ නැහැ. UNP නගර සභාව වැරැද්දක් කළේ, නීතිය ක්‍රියාත්මක කරන්න කියලා, අපි කියන්නේ නැහැ නේ. මම කිව්වේ, මේ permit එක දීලා තිබෙන්නේ කින්නියා නගර සභාවෙන් කියන එකයි. එම ලිපිය මම **සභාගත*** කරනවා.

ඒ ලිපිය දෙමළ භාෂාවෙන් තිබෙන්නේ. මම සිංහල භාෂාවටත් එය පරිවර්තනය කළා. ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, මම ඒ ලිපියේ පිටපතක් ඔබතුමාටත් එවන්නම්. ඒ අවසරය දීලා තිබෙන්නේ, නගර සභාවෙන්. Life jackets දාගෙන ගියා නම්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

මේක වෙන්නේ නැහැ. කවුරු කෙරුවත් වැරැද්ද එකයි. ආණ්ඩුව කළත්, ප්‍රාදේශීය සභාව කළත්, වැරදි නම් වැරදියි. එම ප්‍රාදේශීය සභාවේ බලය තිබෙන්නේ UNP එකටද, පොහොට්ටුවටද - ආණ්ඩුවටද - කියලා නැහැ. කවුරු වැරැද්ද කළත්, වැරදියි. හැබැයි, කරුණාකරලා අමාත්‍යාංශයට ඇඟිල්ල දික් කරන්න එපා. අපේ අමාත්‍යාංශයෙන් වරදක් කරලා නැහැ. වරදක් කරලා තිබෙනවා නම්, මම සමාව ගන්න සූදානම්. අපි එහෙම වරදක් කරලා නැහැ. අපි කරලා තිබෙන්නේ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් හදන්න බැරි වුණු පාරවල් ටිකයි, පාලම් ටිකයි හදන එක විතරයි. ඒ නිසා කරුණාකරලා නොදැන කථා කරන්න එපා. ඔබතුමා මේ කරුණු නොදැන, ඔබතුමාට කවුරු හෝ ලබා දුන් තොරතුරක් අනුව නේ කථා කරන්නේ. ඒක මම දන්නවා. නැත්නම් ඔබතුමා ඔහොම කථා කරන්නේ නැහැ. මම ඔබතුමාට මේ ලිපිය එවන්නම්. ඒ ගැන හොයලා බලන්න. අමාත්‍යාංශය කිසිසේත්ම වරදක් කරලා නැහැ. Ferry service එක දීලා, ඒ නගර සභාව තමයි මට පෙනෙන විධියට වරද කරලා තිබෙන්නේ. කවුරු කළත්, එය වැරැද්දක් නම් ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළ යුතුයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ඇත්තටම මට මේ තොරතුරු දුන්නේ වෙන කවුරුවත් නොවෙයි, අපේ ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාගෙන් මීට කලින් ප්‍රශ්න කළා. මේ bypass එක ගැන මම ඇහුවා. මම ඊට වඩා මේ කාරණය ඇදගෙන යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරද්දී, විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. ජනාධිපතිතුමා යටතේ කොමිෂන් සභා ගණනාවක් තිබෙනවා. එතුමා යටතේ ඇති පොලිස් කොමිසම ගැන මම විශේෂයෙන් කථා කරන්නම ඕනෑ. මොකද, අපිත් පොලිස් කොමිසම එක්ක කටයුතු කළා. අපේ කාලයේ පොලිස් කොමිසමක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පොලිස් කොමිසම පැමිණිලි විභාග කරන තැනට වැටිලා. පොලීසියේ තිබෙනවා නේ සුළු පැමිණිලි අංශයක්. අන්න ඒ, සුළු පැමිණිලි අංශයේ රාජකාරිය තමයි අද පොලිස් කොමිසම කරන්නේ. අපේ කාලයේ මාරුවීම් කළේ, උසස්වීම් කළේ, පොලිස් ස්ථානාධිපතිවරු පත් කරනකොට ඒ සඳහා නිර්දේශ ලබා දුන්නේ, ඒ සෑම දෙයක්ම කළේ පොලිස් කොමිසමෙන්. හැබැයි අද පොලිස් කොමිසම නිකම්ම ආයතනයක් විතරයි. ඒක පැමිණිලි භාර ගන්න, දුක් ගන්නා රාළගේ රාජකාරිය කරන තැනට පත් වෙලා තිබෙනවා.

මේ මෑතක ASP පත්වීම් 225ක් දුන්නා. එතැන සුදුසුකම් නැති අය ඉන්නවා. 125කට ආසන්න ප්‍රමාණයක් දූෂණ චෝදනා තිබෙන අය. ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ confirm වුණේ නැති නිලධාරියෙක් එතැන ඉන්නවා. එම තනතුරේ confirm වුණේ නැති නිලධාරියෙක් ASP තනතුරක් ලබා ගෙන තිබෙනවා. SIS එකේ හිටපු නිලධාරීන් 15 දෙනෙකු ASP තනතුර සඳහා interview එකට යද්දී SIS භාර ප්‍රධාන නිලධාරියා බලපෑම් කරලා තිබෙනවා. මේවා කියන්නේ වෙන කවුරුවත් නොවෙයි. ඒ අසාධාරණයට ලක් වූ නිලධාරීන්. ඒ අය අද නඩුවක් පවරා තිබෙනවා. දේශපාලන තක්සේරුව මත තමයි අද පොලිස් කොමිසම, එහෙම නැත්නම් පොලීසිය ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණය මා බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මේ සියලු පත්කිරීම් කළේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන්, පොලිස් කොමිසමෙන් නොකිව්වාට. විශාල පිරිසක් අසමත් කරලා තිබෙනවා. දිගින් දිගටම දීර්ඝ කාලයක් ඒ අයගේ සුදුසුකම් සියල්ල පරීක්ෂා කරලා ලකුණු වැඩිම අයට විතරයි පත්වීම් ලබා දුන්නේ. ඒවා ඒ කාලයේ කරපු හැටි මම කියන්න යන්නේ නැහැ. නමුත්, රාජ්‍ය සේවා කොමිසමෙන් දිගින් දිගටම අපට ඉල්ලන්න වුණා, පරක්කු කරන්නේ නැතුව මේ පත්වීම් ටික දෙන්න කියලා. ඒක තමයි ඇත්ත කථාව.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන එතුමා එක්ක වාද කරලා වැඩක් නැහැ. අද දේශපාලන තක්සේරුවක් ගැන කියන්නේ වෙන කවුරුවත් නොවෙයි, ජගත් කුමාර මන්ත්‍රීතුමා. එතුමා පැහැදිලිවම කිව්වා, OIC පත්වීම දෙනකොට පළාතේ මන්ත්‍රීවරයාගේ ලියුම ඕනෑ කියලා. එතුමා ඒ ගැන ගාමිණී ලොකුගේ මහත්මයා එක්ක රණ්ඩු කළා. ඒ නිසා අපි නොවෙයි ඒක කියන්නේ. අද OIC පත්වීම ගන්න පළාතේ මන්ත්‍රීගේ ලියුම ඕනෑ. SP පත්වීම ගන්න දිස්ත්‍රික් නායකයාගේ හෝ වෙනත් කෙනෙකුගේ ලියුම ඕනෑ. අද ඒ තත්ත්වයට පොලිස් කොමිසම බාල්දු වෙලා තිබෙන බව මා කියන්න ඕනෑ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අද පත්වෙලා තිබෙන තත්ත්වය ගැනත් විශේෂයෙන්ම මම කනගාටු වෙනවා. මොකද, මම අදාළ අමාත්‍යාංශය භාරව හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක්. අද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යූනියන්වල ඉන්න අයත්, උසස් තනතුරුවල ඉන්න අයත් ඇතුළු සියලුදෙනා -සියයට 95ක් විතර- ලිපියක් අත්සන් කරලා තිබෙනවා, සභාපතිවරයා සහ DG අයින් කරන්න කියලා. මොකද, ඔවුන් අත්තනෝමතිකව කටයුතු කරන නිසා. අපි දන්නවා, ඒ සභාපතිවරයා ජනාධිපතිතුමාගේ ගජ මිතුරෙක් කියලා. ඒකට කමක් නැහැ. ගජ මිතුරා හරි කමක් නැහැ, රාජකාරිය හරියට කරනවා නම්. මෑතකදී පත්වීම් 9ක් දුන්නා, රුපියල් ලක්ෂ 10කට ආසන්න වැටුප් සහිත. ඒ වාගේම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු දෙදෙනෙක් ගත්තා. එක්කෙනෙකුගේ වැටුප රුපියල් හත්ලක්ෂ අනූදාහයි. ඒ වාගේම විධායක අධ්‍යක්ෂවරු කිහිප දෙනෙක් ගත්තා. ඒ එක්කෙනෙකුගේ වැටුප රුපියල් හත්ලක්ෂ තිස්දාහක් විතර වෙනවා. මේ විධියට එතුමා අනවශ්‍ය පත්වීම් නවයක් කළා. කෝප් එකේදී මේ ගැන වාර්තා වුණා. ඒ පත්වීම් සියල්ල තමන්ට ඕනෑ හිතවතුන් ගන්න කරපු පත්කිරීම්. ඒ වාගේම DG කෙනෙක් ඉන්නවා, එතුමාත් ඒකටම හරි යන DG කෙනෙක්. ගරු මුදල් ඇමතිතුමනි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සියලුදෙනා එකතු වෙලා කවදාවත් මේ විධියට ඔබතුමන්ලාට පෙත්සමක් ඉදිරිපත් කරලා නැහැ. මේ අපේ අය නොවෙයි. එතැන ඉන්න සියලු යූනියන්වල අය, උසස් තනතුරු දරන සියලු නිලධාරීන් -සියයට 95ක්- මේකට අත්සන් කරලා කියනවා, සභාපතිවරයා සහ DG අයින් කරන්න කියලා. ඊයේ ගරු ජනාධිපතිතුමා පොහොර සංස්ථාවක සභාපතිවරයකු අයින් කළා. ඒ, ඔවුන් තොරතුරු -දත්ත- හරියට දන්නේ නැහැ කියලා. තොරතුරු -දත්ත- දන්නේ නැහැ කියලා ඔබතුමන්ලා සභාපතිවරු අයින් කරනවා. ඔබතුමන්ලා මේ විධියට මේ ආයතනයත් අකර්මණ්‍ය කරලා තිබෙන්නේ. ඒ අනුව, නිලධාරීන් 1,300ක් අකර්මණ්‍ය කරලා තිබෙනවා. ඒ සියලුදෙනා එකඟ වෙනවා, මේ සභාපතිවරයා සහ DG අයින් කරන්න. ඒ නිසා ඒක කරන්න කටයුතු කරන්න. මා පැහැදිලිවම කියනවා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අද ඉබාගාතේ යන්නේ කියලා. ඒකේ ඉන්නේ 'සජබ'

නියෝජනය කරන අය නොවෙයි. ඒකේ අති බහුතරයක් යුනියන්වල අය කියනවා නම්, උසස් නිලධාරීන් කියනවා නම්, ඒ අයට ඒ ආයතනයේ රාජකාරි කරන්න වටපිටාවක් නැහැ කියලා, ඒ අදාළ අය අයින් කරන්න කටයුතු කළේ නැත්නම් ඒ ආයතය විනාශ වෙනවා.

ඊළඟට, මම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ගැනත් කථා කරන්න ඕනෑ. මම දන්නා විධියට අද ඒ කොමිසම හුදු ආයතනයක් විතරයි. ඔබතුමන්ලාත් දන්නවා, බොහොම ප්‍රසිද්ධ පැන්ඩෝරා පත්‍රිකා සිද්ධිය ගැන. ජනාධිපතිතුමා කිව්වා, මාසයක් ඇතුළත ඒ ගැන පරීක්ෂණ කරන්න කියලා. දැන් පැන්ඩෝරා සිද්ධියට මාස දෙකක් ගතවෙලා. තවම වාර්තාව නැහැ. ඒක මේ මහ ඈතක සිදුවීමක් නොවෙයි නේ. අපට මතක තිබෙන ඊයේ-පෙරේදා වෙච්ච සිදුවීමක් නේ. ඒ නිසා අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ආණ්ඩුවේ එක්තරා ආයතනයක කොන්ත්‍රාත්තුවක් ඉටු කරන තැනක් බවට පත්වෙලා තිබෙනවා. මා හිතන විධියට නඩු හතළිස් ගණනක් ඉල්ලා අස්කරගෙන තිබෙනවා. ඒකයි ඇත්ත තත්ත්වය.

අද ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාද නොකළත්, මේ අවස්ථාවේදී හමුදා ගැනත් මම කථා කරන්න ඕනෑ. අද හමුදා කඳවුරුවලින් අතිබහුතරයකට නිශ්චිත කෑම වේල ලැබෙන්නේ නැහැ, ගරු මුදල් ඇමතිතුමනි. අපි දන්නවා, සාමාන්‍යයෙන් සතියකට දවස් තුනක් කුකුළු මස්, මාළු නම් තලපත් මාළු දවසක්, එහෙම නැත්නම් වෙනත් මස් වර්ගයක් දෙනවා. මම මේ නිශ්චිතව දෙන විධිය නොවෙයි කිව්වේ. ඒ විධියට දෙනවා. හැබැයි, මාස දෙකක් යනකල් ගොඩක් කඳවුරුවලට කුකුළු මස් ලැබිලා නැහැ. බිත්තරයක්, එහෙම නැත්නම් කරවල කෑල්ලක් තමයි ලැබිලා තිබෙන්නේ. ඒ හේතුවෙන් අද යුද සෙබළුන්ට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, යුද සෙබළුන්ට උද්ඝෝෂණ කරන්න බැහැ. අපේ රට ආරක්ෂා කරන ආරක්ෂක අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කරලා තිබුණත්, ඒ අයගේ බත් පතට -කෑම වේලට- අවශ්‍ය ආහාර ටික ලැබෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා මේ ගැන ඔබතුමන්ලා හොයා බලන්න. රටේ ආරක්ෂාව සපයන ආරක්ෂක හමුදාව කලකිරෙනවා නම්, ඔවුන් ඉන්නේ කනගාටුවෙන් නම්, ඒක රටකට හොඳ දෙයක් නෙවෙයි. විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් තනතුර දරපු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති පුටුවේ ඉන්න වෙලාවක මෙහෙම සිද්ධවන එක ඒ තරම් හොඳ දෙයක් නොවෙයි කියන එක මා පැහැදිලිවම කියනවා.

ඒ විතරක් නොවෙයි. මේ පොහොර ප්‍රශ්නයට කොවිඩ් - 19 බලපෑවාද කියලා මා ඔබතුමන්ලාගෙන් අහනවා. කොවිඩ් - 19 වසංගතයයි, පොහොර ප්‍රශ්නයයි අතර සම්බන්ධතාවක් තිබෙනවාද? කිසිම සම්බන්ධතාවක් නැහැ. ඒ නිසා පොහොර ප්‍රශ්නය ඇති කරලා ගොවියා අද වළ පල්ලට යවා තිබෙන්නේ, අද පාරිභෝගිකයාට එළවලු ටිකක් ගන්න බැරි තැනට, හාල් කිලෝව රුපියල් 140කට ගන්න සිද්ධ වන තැනට පත් කර තිබෙන්නේ වෙන කවුරුවත් නොවෙයි, ඔබතුමන්ලා. මෙය ජනාධිපතිතුමා සියයට 100ක් වග කිව යුතු කාරණයක්. එතුමා නිකුත් කළ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පවා සඳහන් වන්නේ, කාබනික කෘෂිකර්මයට ළඟා වීම අවුරුදු 10කින් ක්‍රියාත්මක කරන බවයි. නමුත් දැන් අවුරුදු දෙකකින් නොවෙයි, අවුරුද්දකින් නොවෙයි, overnight. රෑ වෙලා පසුව දා එළිවනකොට මහ කන්නය සියයට 100ක් කාබනික වගාවට යොමු කරන්න එතුමා ගත් ඒ තීන්දුව නිසා තමයි මේ තත්ත්වය ඇති වුණේ. ඒ නිසා පැහැදිලිවම මේ තත්ත්වයට එතුමා වග කියන්න ඕනෑ.

අපි දැක්කා, ඊයේ ගැසට් නිවේදනයක් reverse කරනවා. ඒ අනුව, පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් අස් කළා. දැන් එක දිගට ගැසට් නිවේදන reverse වෙනවා. මේ ප්‍රශ්න නිලධාරීන් පිටම දමලා හරි යනවාද? ඊයේ ජනාධිපතිතුමා සමඟ කළ සාකච්ඡාවේ අමාත්‍යාංශ ලේකම්වරු, රාජ්‍ය ඇමතිතුමා, කැබිනට් ඇමතිතුමා, පී.බී. ජයසුන්දර මහත්මයාත් සිටියා. ඒ සියලුදෙනා එකතුවෙලා ගත්ත තීන්දුවක් එදා රාත්‍රියේ සිට ක්‍රියාත්මක වෙද්දී, ඒ ගැසට් නිවේදනය පහුවදා reverse වනකොට ඒ නිලධාරියා එළියට විසිවෙනවා නම්, -එළියට දමනවා නම්- කවුද මේ ආණ්ඩුව කරන්නේ? ඒ පිළිබඳ අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක හරියට වමට සිග්නල් දමලා දකුණට හරවනවා වාගේයි. ආණ්ඩුව කරන තරමක් කරන්නේ, වමට සිග්නල් දමලා දකුණට හරවන එකයි. ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමනි, මේ සියල්ලක්ම මේ රජය ගන්නා වැරදි තීන්දු තීරණයි කියලා අපට පෙනෙනවා. ගොවියකු විධියට ඔබතුමාත් ඒ ගැන හොඳට දන්නවා. ඔබතුමා කෙසෙල් වගා කරනවා. මේ වැඩේ මේ විධියට කරන්න බැහැයි කියලා අපි හැම දාම කිව්වා. ඔබතුමන්ලාත් කිව්වා. අපි දන්නවා, ඔබතුමන්ලා ඒ ගැන එළියේ නොකිව්වාට ඇතුළෙදී කිව්වා කියලා. හැබැයි, මේ කටයුතු කරලා අද ගොවියා අමාරුවේ දමලා තිබෙනවා. දැන්වත් ඒක පිළිගන්නේ නැහැ නේ.

මා නියෝජනය කරන බිංගිරිය ආසනයේ ගොවිපොළකට ජනාධිපතිතුමා ආවා. දැන් ගිහින් බලන්න, ඒ ගොවිපොළේ තත්ත්වය මොකක්ද කියලා. එදා ගොවිපොළට එන තෙක් සන්දර්ශන පවත්වමින් සිටියා. දැන් ගොවිපොළ අකර්මණ්‍යයි. කාබනික වගාව හොඳයි. ඒ සඳහා විශාල පිරිවැයක් දරන්න වෙනවා; විශාල කාලයක් ගතවෙනවා. නමුත්, දැන් ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. එදා අපි ජනාධිපතිතුමාට කිව්වා, කාබනික ගොවිපොළවලට විතරක් නොවෙයි, කුඹුරටත් යන්න කියලා. සතියකින් එන්නම් කිව්වා. දැන් ජනාධිපතිතුමා කුඹුරකට එක්කගෙන යන්න කෙනෙක් නැහැ. ඒ නිසා ගොවියාගේ ප්‍රශ්නය දැන ගන්න කෙනෙක් නැහැ; ප්‍රශ්නය කියන්න කෙනෙක් නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. අපි ගියේ Facebook එකෙන් ඒ සංවිධායකතුමා ගැන දැකලායි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සංවිධායක වෙන්න ඉස්සෙල්ලා ඔබතුමාගේ පක්ෂයේ සංවිධායකතුමා එතුමා කියලා ඔබතුමා දන්නවා. ජනාධිපතිතුමා ගියේ එතුමා ධෛර්යවත් කරන්න සහ ඒ ගැන සොයා බලන්න. ඒ නිසා ඒක අල්ලාගෙන මඩ ගහන්න එපා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
නැහැ, මඩ ගහන්නේ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
පක්ෂ දෙකක් නොවෙයි නේ, මන්ත්‍රීතුමනි. හැම දේම දේශපාලනයට හරවා ගන්න එපා. 'වහ' වෙනුවෙන්ම පෙනී සිටින්න එපා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කාබනික වගාවට විරුද්ධ නැහැ. ගරු ඇමතිතුමනි, කඩිගමුවේ ෂෙල්ටන් මහත්මයාගේ පුතා ගැන ඔබතුමාත් දන්නවා. ඔහු මගේ මිත්‍රයා. ඔහුත් කාබනික වගාව

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

කරනවා. ඔබතුමා ඇවිල්ලා බලන්න. හැබැයි, ඒ පිරිවැය ගොවියාට දරන්න බැහැ. කොළඹ හතේ නෝනලාට ඒ මුදලට එළවලු ගන්න පුළුවන් වුණාට, අනික් අයට ගන්න බැහැ. කාබනික වගාවට යම් ඉඩක් තිබෙනවා. ඒ නිසා ඒක කරන්න ඕනෑ විධියක් තිබෙනවා. ඒ විධියට ක්‍රියාත්මක නොකර -

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමා විරුද්ධද ජනාධිපතිතුමා ගිය එකට?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මා විරුද්ධ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
කෙළින් කියන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මා විරුද්ධ නැහැ. මා ඔබතුමාට කිව්වා නේ. ඔබතුමා කිව්වා නේ, සතියකින් කුඹුරටත් එනවා කියලා. අපි කියන්නේ, කාබනික ගොවිපොළට ගියා වාගේම කුඹුරටත් එන්න කියලායි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අපි ගියා. ඔබතුමා දැක්කේ නැද්ද? සාමාන්‍ය විධියට වී වගා කරන කුඹුරුවලට ගියා; කාබනික පොහොර යොදා වගා කරන කුඹුරුවලට ගියා. මමත් ගියා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමන්ලා කොයි කුඹුරටද ගියේ කියන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමා එන්නකෝ, මා පෙන්වන්නම්. අපි දෙදෙනා යමුකෝ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, මමත් එතැන සිටියා නේ. කුඹුරුවලට ගියේ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේම කුඹුරු ටික වගා කරලා ඉවරයි. තමුන්නාන්සේ ඉන්නේ කොහේද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමා මට දිගින් දිගටම බාධා කරන්න එපා. කුඹුරේ, ගොවියාගේ ප්‍රශ්නය පැහැදිලිවම හඳුනා ගත්තා නම් අපේ ගරු ජනාධිපතිතුමා මේ තත්ත්වයට පත් වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ගැසට් නිවේදන reverse කරනවා; අරවා reverse කරනවා; මේවා reverse කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය 4.40ට අවසන් වෙනවා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පාවිච්චි කළ වෙලාවත් එක්ක ඔබතුමාට තවත් විනාඩි දෙකක් ලැබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩි 4ක් තිබෙන්න ඕනෑ. මා වෙලාව mark කරගෙන ඉන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මොනවා reverse කළත්, මෙන්න මේ පත්‍රිකාවේ සඳහන් 2019.04.21 දිනය ඔබතුමන්ලාට කවදාවත් reverse කරන්න බැහැ. මම මේ දිනය ලියලා තිබෙන මේ කොළේ පොඩ්ඩක් වටේටම පෙන්වන්නම්. මෙන්න මේක reverse කරන්න පුළුවන්ද? මේ දිනයේ වූ සිදුවීම reverse කරන්න පුළුවන්ද? මේ සිදුවීමට සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන්ද ඔබතුමන්ලාට? *[බාධා කිරීම්]* මේක කවදාවත් ඔබතුමන්ලාට කරන්න බැහැ. *[බාධා කිරීම්]* ඒක හොඳට මතක තියා ගන්න. ඔබතුමන්ලාට අනෙක් සෑම ප්‍රශ්නයක්ම විසඳන්න පුළුවන් වෙයි. හැබැයි, කවදාවත් පාස්කු ප්‍රහාරයට වගකිව යුත්තන් -*[බාධා කිරීම්]*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වෙලාවෙන් මේ වෙලාව ගන්න. පොලිසිය භාරව හිටපු ඇමති කියනවා-,*[බාධා කිරීම්]* පොලිසිය භාරව හිටපු ඇමතිතුමා කියනවා, පොලිස්පති හිටියේ සිරිකොත කියලා. තමුන්නාන්සේ ඕක -,*[බාධා කිරීම්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලාට අමතක වෙලා තිබෙනවා, දවස් 52ක් අර කෙළවරේ ඉඳගෙන ඉන්න මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එක්ක ආණ්ඩුව කළා කියලා. ඒ දවස් 52න් පස්සේ රටේ ආරක්ෂාව සම්බන්ධ වගකීම තිබුණේ වෙන කාටවත් නොවෙයි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවල් අපි සභාගත කළා, එතුමාගේ හිටපු ඇමතිතුමාට, රංජිත් මද්දුම බණ්ඩාරට යවපු දැනුම් දීම. මෙතුමා හිටපු නියෝජ්‍ය ඇමති. *[බාධා කිරීම්]* පොලීසිය භාර නියෝජ්‍ය ඇමති. *[බාධා කිරීම්]* පාස්කු ප්‍රහාරය පිළිබඳ දැනුවත් කරලා නැද්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දවස් 52 ආණ්ඩුව එනකොට, සහරාන්ට විරුද්ධව රතු වරෙන්තු නිකුත් කරලා, සහරාන් ලුහු බඳින්න අවශ්‍ය කටයුතු ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ DIG නාලක සිල්වා කර කර හිටියේ. ඊට පස්සේ තමයි නාමල් කුමාර සංදර්ශනය දාලා, සිරිසේන මැතිතුමාත් රවට්ටලා, ඒ දවස් 52 ඇමතිකම්, අගමැතිකම් කළේ. දවස් 52දී රටේ නීතිය වල් වැදුණා. දවස් 52න් පස්සේ නාමල් කුමාර රංගනය දාලා *[බාධා කිරීම්]* නාමල් කුමාර රංගනය දාලා නාලක සිල්වා අත්අඩංගුවට ගත්තේ නැත්නම් පාස්කු ප්‍රහාරයක් සිද්ධ වෙන්නේ නැහැ කියලා මම හැමදාම කියනවා. ඒ නිසා මේවාට අපිට ඇඟිල්ල දික් කරන්න එපා. ඔබතුමන්ලා සාධාරණය ඉෂ්ට කරන්න. අන්න පියතුමන්ලා CID එක ළඟ රස්තියාදු වෙනවා. හිංසනයට පත් වුණු වින්දිතයන්ට තමයි අද ඔබතුමන්ලා දඬුවම් දෙන්නේ. ඒ වින්දිතයන්ට දඬුවම් දෙන එකට අපි හැමදාමත් විරුද්ධයි කියන එක පැහැදිලිවම කියන්න ඕනෑ. ඒ නිසා පාස්කු ප්‍රහාරයට වගකිව යුතු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
Head 10, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 52,500,000

Question, "That the sum of Rs. 52,500,000, for Head 10, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 10, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 11.- OFFICE OF THE FINANCE COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 94,616,000

Question, "That the sum of Rs. 94,616,000, for Head 11, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 11, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 4,700,000

Question, "That the sum of Rs. 4,700,000, for Head 11, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 11, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 13.- HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 221,264,000

Question, "That the sum of Rs. 221,264,000, for Head 13, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 13, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 2,600,000

Question, "That the sum of Rs. 2,600,000, for Head 13, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 13, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 16.- PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,931,850,000

Question, "That the sum of Rs. 2,931,850,000, for Head 16, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 16, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 195,200,000

Question, "That the sum of Rs. 195,200,000, for Head 16, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 16, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 17.- OFFICE OF THE LEADER OF THE HOUSE OF PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 59,100,000

Question, "That the sum of Rs. 59,100,000, for Head 17, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 17, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 1,250,000

Question, "That the sum of Rs. 1,250,000, for Head 17, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 17, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 18.- OFFICE OF THE CHIEF GOVT. WHIP OF PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 137,100,000

Question, "That the sum of Rs. 137,100,000, for Head 18, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 18, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 1,800,000

Question, "That the sum of Rs. 1,800,000, for Head 18, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 18, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 19.- OFFICE OF THE LEADER OF THE OPPOSITION OF PARLIAMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 154,880,000

Question, "That the sum of Rs. 154,880,000, for Head 19, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 19, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 17,800,000

Question, "That the sum of Rs. 17,800,000, for Head 19, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 19, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 20.- ELECTION COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 860,600,000

Question, "That the sum of Rs. 860,600,000, for Head 20, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 20, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 107,000,000

Question, "That the sum of Rs. 107,000,000, for Head 20, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 20, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 21.- NATIONAL AUDIT OFFICE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,959,200,000

Question, "That the sum of Rs. 1,959,200,000, for Head 21, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 21, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 39,000,000

Question, "That the sum of Rs. 39,000,000, for Head 21, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 21, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 22.- OFFICE OF THE PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 25,830,000

Question, "That the sum of Rs. 25,830,000, for Head 22, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 22, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 200,000

Question, "That the sum of Rs. 200,000, for Head 22, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 22, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 25.- DELIMITATION COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 12,070,000

Question, "That the sum of Rs. 12,070,000, for Head 25, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 25, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 125,000

Question, "That the sum of Rs. 125,000, for Head 25, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 25, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

"කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 4.58ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2021 නොවැම්බර් 24 වන බදාදා.***

*பி.ப. 4.58 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2021 நவம்பர் 24, புதன்கிழமை.*

*At 4.58 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Wednesday, 24th November, 2021.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශීර්ෂ අංක 1, ශීර්ෂ අංක 2 සහ 4 සිට 11 දක්වා ද, ශීර්ෂ අංක 13, 16 සිට 22 දක්වා හා ශීර්ෂ අංක 25 සංශෝධන රහිතව කාරක සභාවේ දී සම්මත වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

සභාව කල්තැබීම, ගරු සභානායකතුමා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා.

## සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ ගැටලු විසඳීමට වැඩ පිළිවෙළක්
## பாரம்பரியக் கைத்தொழிலாளர்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கான வேலைத்திட்டம்
## PROGRAMME TO ADDRESS ISSUES OF TRADITIONAL INDUSTRIALISTS

[අ.භා. 4.59]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ ජන ජීවිතය තුළ අතීතයේ සිටම පැවතගෙන එන දේශීය කර්මාන්ත රාශියක් ඇත. එම කර්මාන්තකරුවන් දෙස බලන විට වර්තමානයේ ඔවුන් මහත් වූ ගැටලු රාශියකට මැදිහත් වී ඇත.
>
> මෙම කර්මාන්ත අතර මැටි භාණ්ඩ කර්මාන්තය, රන්-රිදී කර්මාන්තය, පිත්තල කර්මාන්තය, වේවැල් කර්මාන්තය ආදි කර්මාන්ත විශේෂයෙන් සැලකිල්ලට ගත හැක. මෙම කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදනයන්හිදී අමුද්‍රව්‍යවල පවතින අධික මිල, පවතින ආර්ථික තත්ත්වය මත කර්මාන්තකරුවන්ගේ ලාභය අඩුවීම හා නිසි වෙළෙඳ පොළක් නොමැති වීම වැනි කරුණු මත කර්මාන්තකරුවන් මෙම කර්මාන්තවලින් ඉවත්ව යෑමේ තත්ත්වයක් පැන නැගී ඇති අතර, මේ කර්මාන්ත සඳහා නව කර්මාන්තකරුවන් යොමුවීමට මැළිකමක් ද දක්වයි.
>
> එමනිසා මෙම සම්ප්‍රදායික කර්මාන්තවල නිරතවූවන් මුහුණ දෙන ගැටලු නිරාකරණය කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මම මේ ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ පවුල් 15,000කට අධික පිරිසක් පාරම්පරික තඹ සහ රිදී කර්මාන්තයෙන් ජීවත් වෙනවා. ඒ අයට කණකොකා හඬන්න පටන් ගත්තේ චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ ඉන්දියාවත් එක්ක අත්සන් කළ සප්ටා ගිවිසුම නිසායි. මේ කර්මාන්තය සඳහා අබලි ද්‍රව්‍ය තමයි ගොඩක් යොදාගත්තේ. ඒවා ඉන්දියාවට යැවීම නිසා මේ කර්මාන්තය ඇද වැටුණා. ඒ වාගේම, පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ එවකට අමාත්‍ය, රිසාඩ් බදියුදීන් මැතිතුමා කිසිම ටෙන්ඩර් පටිපාටියකින් තොරව තඹ විකිණීම නිසා තඹ කර්මාන්තයේ නියැලී සිටි ජනතාව කබලෙන් ලිපට වැටුණා.

රටට හොඳ ආදායමක් ගෙනාපු තඹ සහ රන් රිදී කර්මාන්ත ඉදිරියට රැකගෙන යන්න රජයේ අවධානය යොමු කරන්න කියා මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ප්‍රසන්න රණවීර මහතා (වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணவீர - பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Prasanna Ranaweera - State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion)
ගරු කථානායකතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර මැතිවරණ කොට්ඨාසයේ මේ කර්මාන්ත ශාලා විශාල වශයෙන් අද දක්නට ලැබෙනවා. මහනුවර සිට කොළඹ දක්වා එන විට හමුවන පිළිමතලාව නගරය දියුණුවෙන් දියුණුවට පත්වෙලා තිබෙන්නේ මේ කර්මාන්තය නිසායි. නමුත් අද මේ කර්මාන්තය කරගෙන යෑමට අපහසුවක් තිබෙන නිසා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා. එදා මේවා දෑත්වලින් කරපු කර්මාන්ත. ඒ යුගය අවසන් කරලා, අද මැෂින්වලින් ඒ කර්මාන්ත කරන යුගයකට ඇවිල්ලා තිබෙනවා. ඒ අහිංසක මිනිස්සු වෙනුවෙන් සහන මිලකට අමු ද්‍රව්‍ය දෙනවා වාගේම, ඒ අයට පුළුවන් උපරිම අන්දමින් සහන ක්‍රමයක් යටතේ ණය ලබා දෙන්නත් කටයුතු කරන්න කියලා මම මේ ගරු සභාවෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

සංචාරක ව්‍යාපාරය ඇද වැටීම නිසාත් එම කර්මාන්තයට මහත් පාඩුවක් වුණා. ඒ සියලු දේවල් නිරාකරණය කරගෙන ඒ අය වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් සකස් කර දෙන ලෙසත් මෙම ගරු සභාවෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ගුණතිලක රාජපක්ෂ මැතිතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළේ ඉතාම විශේෂ යෝජනාවක්. ඒ යෝජනාව මම ස්ථිර කරනවා. මම ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු වශයෙන් මේ පාරම්පරික කර්මාන්ත සම්බන්ධයෙන් ඇත්තටම ලොකු ළැදියාවකින් කටයුතු කරන කෙනෙක්. අපි මේ අවස්ථාවේ ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ අගය කරන්න ඕනෑ. එතුමා "ගම සමඟ පිළිසඳර" වාගේ වැඩසටහන්වලදී හඳුනා ගත්තා, මේ රටේ තිබෙන පාරම්පරික කර්මාන්ත මොනවාද කියලා. ගම්පහ දිස්ත්‍රික්කයේ ගරු ප්‍රසන්න රණවීර මැතිතුමා මෙහි විෂයභාර රාජ්‍ය අමාත්‍යවරයා හැටියට පත් කර තිබෙනවා. එතුමා ලොකු උනන්දුවක් දක්වනවා, මේ කාරණා ඉෂ්ට කරන්න. අපි හඳුනා ගන්න ඕනෑ, අපේ මේ පාරම්පරික කර්මාන්තකරුවන් කියන්නේ කවුද කියලා. ඒවා අපේ උරුම. අපේ ජන උරුම අපි රැක ගන්න ඕනෑ. මේ කර්මාන්ත පරම්පරාගතව පවත්වාගෙන යන කර්මාන්ත. මේ කර්මාන්තවල යෙදෙන අය කාටවත් අත නොපා ජීවත් වනවා. ඒ නිසා ඔවුන්ට තිබෙන ගැටලු අපි හොඳින් හඳුනා ගන්න ඕනෑ.

ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපේ මේ කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටලු ගණනාවක් තිබෙනවා. ඔවුන් සමඟ සාකච්ඡා කරලා ඒ ගැටලු හොඳින් හඳුනා ගන්න ඕනෑ. එක ගැටලුවක් තමයි, ඔවුන්ට අවශ්‍ය අමු ද්‍රව්‍ය සපයා ගැනීමේදී ඔවුන් මුහුණ පාන කාරණා. මේ සම්බන්ධයෙන් තිබෙන නීති රීති වෙනස් කරන්න ඕනෑ. කැණීම් වාගේ කටයුතුවලට බලපත්‍ර ලබා ගැනීමේදී විවිධ ගැටලුවලට ඔවුන්ට මුහුණ දෙන්න සිදුවනවා. මේ පවතින නීති රීති නිසා ඔවුන් නිරන්තරයෙන් යම් යම් පීඩාවලට ලක් වනවා. ඒ නිසා මේ කර්මාන්තකරුවන් හඳුනාගෙන, ඔවුන්ට අවශ්‍ය අමු ද්‍රව්‍ය ටික -වේවැල් වේවා, බට වේවා, මැටි වේවා- පහසුවෙන් සපයා ගන්න අවශ්‍ය කටයුතු සකස් කරන්න ඕනෑ. කනගාටුවට කරුණ මෙයයි. 1978දී ආර්ථික වෙනස් වීමත් එක්ක අපේ සංස්කෘතිය, අපේ ජන සමාජයේ තිබෙන අපේකම් සියල්ල විනාශ වුණා. අද වනකොට මේ කර්මාන්තවලටත් කණ කොකා හඬමින් තිබෙන කාලයක් තිබෙන්නේ.

යහ පාලන ආණ්ඩු කාලයේත් මේ රටට අය වැය කිහිපයක් ඉදිරිපත් කළා. ඒවා සුවිශේෂී අය වැය විධියට ඒ කාලයේ කථා කළා. ඒ ඉදිරිපත් කළ අය වැය ලේඛනවලින් මේ කර්මාන්තකරුවන් වෙනුවෙන් කළ දේවල් මොනවාද? එදා වීල්බැරැක්කය මේ රටට ගෙනෙන්න පුළුවන් වුණත්, යකඩ ටික ගෙනෙන්න බැහැ. ඒකට බදු වදිනවා. තහඩුව ගෙනෙන්න බැහැ, රෝද ගෙනෙන්න බැහැ, බදු වදිනවා. හඳුන්කූරු මේ රටට ගෙනෙන්න පුළුවන්. හැබැයි, හඳුන්කූර හදන්න අවශ්‍ය ඉරටු සහ අමු ද්‍රව්‍ය ටික ගෙනෙන්න බැහැ, බදු වදිනවා. ඒ නිසා දේශීය කර්මාන්තකරුවන් පහළටම ඇද වැටුණා. ඔවුන් මේ ජන සමාජයේ අතර මං වෙච්ච පුද්ගලයන් වුණා. ඒ නිසා අපි ගරු රාජ්‍ය ඇමතිතුමාට මේ අවස්ථාවේදී යෝජනා තරනවා, ඒ අහිංසක පාරම්පරික කර්මාන්තකරුවන් ටික රැක ගන්න නම් ඔවුන්ට නීතිමය වශයෙන් රැකවරණය ලබා දීලා, ඔවුන්ට අවශ්‍ය අමු ද්‍රව්‍ය ටික ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඒවා අපේ ජන උරුමයන් නිසා එම කර්මාන්තකරුවන් රැකීම අපේ වගකීමක් බව මම මේ අවස්ථාවේදී මතක් කරමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුදත් මංජුල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகுசுதத்மஞ்சுல)
(The Hon. Sudath Manjula)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අපේ හිතවත් ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉතා කාලෝචිත යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මම, අපේ විෂය භාර රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රසන්න රණවීර මැතිතුමාත් මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ මේ යෝජනාවට තවත් එකතුවක් කළ යුතුයි කියා අදහස් කරනවා.

ඇත්තටම අපේ ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට අද මේ තිබෙන්නේ, අපේ දේශීය කර්මාන්ත, දේශීය හස්ත කර්මාන්ත අභාවයට යමින් තිබෙන යුගයක්. විවෘත ආර්ථිකයේ අනිටු විපාකත් එක්ක අපේකම ක්‍රම ක්‍රමයෙන් අපෙන් ඈත් වන වෙලාවක්. එම නිසා ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා. අපේ රටේ අපනයන වෙළඳපොළට යන බුලත් ටික ගබඩා කරන්න හදන බට කූඩ නිර්මාණය කරන්නේ මගේ මැතිවරණ කොට්ඨාසයේ -රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයේ- මහකන්ද, වල්ගම්පත, ලෙනගල කියන ග්‍රාම නිලධාරි වසම්වල. ඒ ග්‍රාම නිලධාරි වසම්වල පාරම්පරිකව මේ කටයුතු කරගෙන යනවා. වේවැල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි ප්‍රමාණයක් නිපදවෙන්නේත් තුන් කෝරළයේ, රුවන්වැල්ල, යටියන්තොට, දැරණියගල ප්‍රදේශවල. ඒ වාගේම, කෑගල්ල දිස්ත්‍රික්කයේ මොලගොඩ ප්‍රදේශය මැටි කර්මාන්තය අතින් බොහොම ප්‍රචලිත ප්‍රදේශයක්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ අයට තිබෙන ප්‍රධානම ගැටලුව තමයි අමු ද්‍රව්‍ය හා ප්‍රවාහනය පිළිබඳව තිබෙන නෛතික ගැටලු. බට ලී ටික මහකන්ද ප්‍රදේශයට ගේන්න තිබෙන්නේ කිලෝමීටර ගණනක් දුර ඉඳලායි. බට කර්මාන්තයට අවශ්‍ය බට ලී තිබෙන කැලෑව තිබෙන්නේ ටිකක් බැහැරින්. ඒ බට ටික ප්‍රවාහනය කරනකොට ඒ අහිංසක නිෂ්පාදකයාට නෛතික ගැටලු විශාල ප්‍රමාණයකට -නීතිමය බාධාවලට- මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

වේවැල් කර්මාන්තයත් -වේවැල්වලින් තනන ලද ගෘහ භාණ්ඩ ආදී විවිධ නිෂ්පාදන- අද අභාවයට යමින් තිබෙනවා. මේ ආකාරයට අපනයන වෙළඳපොළට යන විවිධ නිෂ්පාදනවලට අදාළ කර්මාන්ත අද පාරම්පරිකව පසුබෑමකට ලක් වෙලා තිබෙන්නේ, එම භාණ්ඩ නිෂ්පාදනය කරන්න අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම පිළිබඳව තිබෙන ප්‍රශ්න නිසායි. ඒ වාගේම රන්, රිදී, පිත්තල නිෂ්පාදනය සඳහාත් අවශ්‍ය අමුද්‍රව්‍ය පිළිබඳව බරපතළ අර්බුදයකට අද මුහුණ දීලා තිබෙනවා. එම නිසා ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ පාරම්පරික නිෂ්පාදකයා, අපේකම, අපේ උරුමය ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් සහ ඔවුන්ගේ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රවාහනයට සහ පහසු මිලට ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන යෝජනාව කරමින්, අද මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.09]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව ඉතාම කාලෝචිත සහ

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

වැදගත් යෝජනාවක්. අපේ රටේ මැටි, රන්, රිදී, පිත්තල, වේවැල් ආදී පාරම්පරික කර්මාන්ත ගණනාවක් තිබෙනවා. මේ කර්මාන්තකරුවන් ඉතිහාසයේ සිට දීර්ඝ කාලයක් මේ කාර්යය කරගෙන ඇවිත් තිබෙනවා. නමුත්, වර්තමානයේ ඒ අය අභියෝග ගණනාවකට මුහුණ දී සිටිනවා. මේ අභියෝග හමුවේ මේ කර්මාන්ත ඉදිරියට ගෙන එන්න ඔවුන්ට සහාය ලැබුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. උදාහරණයක් වශයෙන් අපි මැටි කර්මාන්තය ගනිමු. මැටි කර්මාන්තයෙන් අද ලෝකයේ නිර්මාණ ගණනාවක් බිහි වෙනවා. මැටි කර්මාන්තයට හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා. එමඟින් විශාල මුදලක් උපයන්නත් අවස්ථාව ලැබී තිබෙනවා. නමුත්, අපේ මේ පාරම්පරික කර්මාන්තකරුවාට ඒ සඳහා අවස්ථාවක් තිබෙනවාද? ඔවුන්ට පාරම්පරික දැනුම තිබෙනවා; හොඳ නිර්මාණ කිරීමේ හැකියාව තිබෙනවා. නමුත් ඒවාට සැබෑ වටිනාකමක් ලබා ගැනීම සඳහා ඒ අයට අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවාද? රන් කර්මාන්තය ගත්තත් අද ඒ නිෂ්පාදනවලට ලෝකයේ විශාල ඉල්ලුමක් තිබෙනවා.

අපේ රටේ සංචාරක ව්‍යාපාරය වර්තමාන කොවිඩ් වසංගත තත්ත්වයත් එක්ක මේ වන විට යම්කිසි පසුබෑමකට ලක් වෙලා තිබුණත්, 2018 වර්ෂය වන විට ලෝකයේ හොඳම සංචාරක ගමනාන්තය බවට පත්වීම දක්වා අපේ රට ඉදිරියට ආවා. එහෙම නම් ලෝකයේ අද තිබෙන ප්‍රවණතා හමුවේ, මේ නිර්මාණවලට, නිෂ්පාදනවලට, නිර්මාණශීලීත්වයට, ඒ දැනුමට අපේ පාරම්පරික දැනුමත් එකතු කරලා මේ කර්මාන්තකරුවන්ට සහාය ලබා දුන්නොත් අපට පුළුවන් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ හොඳ වෙළෙඳ පොළක් ලංකාව තුළත් ඇති කරගන්න. දැනටමත් යම් ප්‍රමාණයකට එය සිද්ධ වෙනවා. නමුත් ඒක තවත් ඉදිරියට ගෙන ගොස් හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවස්ථාව තිබෙනවා. මේ සම්බන්ධ අමාත්‍යාංශයකුත් තිබෙන නිසා ගරු රාජ්‍ය ඇමතිතුමාට පුළුවන් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම එතුමා සෑහෙන උනන්දුවක් දක්වනවා මැටි කර්මාන්තය ඇතුළු මේ අනෙකුත් කර්මාන්තවලට හොඳ වෙළඳපොළක් ඇති කිරීමට සහ ඒ සම්බන්ධයෙන් තිබෙන ගැටලුවලට විසඳුම් ලබා දෙන්න.

ඒ නිසා අපි විශ්වාස කරනවා, මෙය අපේ රටට හොඳ ආදායම් මාර්ගයක්, හොඳ රැකියා අවස්ථා ගණනාවක් බිහි කරන්න පුළුවන් වටිනා අවස්ථාවක් කියලා. විශේෂයෙන්ම මැටි, රත්රන් ආදි කර්මාන්ත ක්ෂේත්‍රවලින් අද ලෝකයේ කෝටිපතියන් බවට පත් වුණු අය සිටින බව, විශාල වශයෙන් මුදල් උපයන ලොකු ආයතන පිහිටුවා තිබෙන බව අපි දන්නවා. එවැනි තත්ත්වයක් හමුවේ එම කර්මාන්ත සම්බන්ධයෙන් පාරම්පරික දැනුම තිබෙන අපේ රටේ උදවියගේ දක්ෂකම් ඉස්සරහට අරගෙන ඒ අයට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම ඒ අයට අමු ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒවා විසඳාගන්න සහාය ලබා දීලා, ඒ අයට වෙළෙඳ පොළ සම්බන්ධ කරන්න අපට පුළුවන් වුණොත් ඒ මඟින් අපේ රටට ලොකු ආදායමක් උපයන්න පුළුවන්. අපට ඩොලර් නැති ප්‍රශ්නය තිබෙන මේ වෙලාවේ මෙය ඩොලර් උපයන මාර්ගයක් බවට පත් කරගන්න පුළුවන් කියන කාරණය මා කියනවා.

ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා ගෙනැවිත් තිබෙන මේ යෝජනාව වැදගත් යෝජනාවක්. මේ වකවානුවේ ඒ කර්මාන්තකරුවන්ට තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා දීලා, ඒ කර්මාන්තවලින් අපේ රටට ආදායම් මාර්ග කරගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සැකසීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි, අද සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ගෙනාවාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේක කාලීන මාතෘකාවක්. මහනුවර දිස්ත්‍රික්කයේ එවැනි පාරම්පරික ගම්මාන ගණනාවක් තිබෙනවා. ඇත්ත වශයෙන්, පිළිමතලාව කියන නගරය නිර්මාණය වන්නේම පාරම්පරික කර්මාන්ත සහිත ගම්මානවලින්. පසුගිය කාල වකවානුව තුළ පිත්තල කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම තුළින් එම ජනතාව අතිවිශාල ආදායමක් ලබාගත්තා. නමුත් අද පමුණුව, දැලිවල, මුගටියාපොළ, කිරිවවුල, ගඩලාදෙණිය, හෑපාන, පල්ලේවෙල ආදි ප්‍රදේශවල පිත්තල කර්මාන්තකරුවන් විශාල පිරිසක් අතරමං වෙලා ඉන්නවා කියලා කිව්වොත්, ඒක නිවැරැදියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා ඒ කර්මාන්තය කඩා වැටීමට ඉඩ හැරීම අපේ පරම්පරාවේ වගකීම් පැහැර හැරීමක් කියලායි මම නම් විශ්වාස කරන්නේ.

එම කර්මාන්තය කඩා වැටීමට ප්‍රධාන හේතුවක් තිබෙනවා. සාමාන්‍යයෙන් පසුගිය කාලයේ පිත්තල අමු ද්‍රව්‍ය කිලෝග්‍රෑමයක් රුපියල් 450කට අලෙවි වුණේ. නමුත්, මේ වන කොට එම අමු ද්‍රව්‍ය කිලෝග්‍රෑමයක මිල රුපියල් 700 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම, කාබයිට් කිලෝග්‍රෑම් 100ක බැරල් එකක් රුපියල් 20,000කට තමයි පසුගිය කාලයේ මිල දී ගත්තේ. කාබයිට් කියන්නේ, පිත්තල කර්මාන්තකරුවන්ට අත්‍යවශ්‍ය අමු ද්‍රව්‍යයක්. ඒවා මේ වනකොට රුපියල් 60,000කටයි අලෙවි වෙන්නේ. ඒ වාගේම, පසුගිය කාලයේ ග්‍රයින්ඩර ගල් කැල්ලක් රුපියල් 150කට අලෙවි වුණේ. දැන් ඒ මිල රුපියල් 350 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. මේ විධියට පිත්තල කර්මාන්තය ආශ්‍රිත අමු ද්‍රව්‍යවල මිල ගණන් අතිවිශාල වශයෙන් ඉහළ යෑම මහනුවර දිස්ත්‍රික්කයේ පිළිමතලාවේ දවුලගල, පමුණුව ප්‍රදේශවල සිටින අපේ පිත්තල කර්මාන්තකරුවන්ට දරුණු ලෙස බලපා තිබෙනවා. එම නිසා ඒ අය විශාල වශයෙන් ගොඩනැඟිලි ඉදි කරන තැන්වල පෙදරේරුවන්, අත් උදව්කරුවන් වශයෙන් විතැන් වෙලා සිටිනවා. ඒ හේතුවෙන් විදේශ ආදායම් විශාල ප්‍රමාණයක් අපේ රටට අහිමි වෙනවා.

විෂයය භාර අපේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, පහසු මිලකට අමු ද්‍රව්‍ය ලබා දීම සඳහා කරුණාකර ක්‍රියාකාරීව මැදිහත් වෙන්න කියලා. ඔබතුමාට එය කරන්න පුළුවන්. ඒ වාගේම, ඒ සම්බන්ධයෙන් පනවා තිබෙන බදු ඉවත් කරලා එම අමු ද්‍රව්‍ය පහසුවෙන් මිලදී ගන්න ඔවුන්ට අවස්ථාවක් හදලා දෙන්න. එහෙම නැති වුණොත්, දවුලගල, හන්දෙස්ස, පමුණුව, පිළිමතලාව කියන ප්‍රදේශවල දැවැන්ත ව්‍යාපාරිකයන්ගේ, එහෙම නැත්නම් නිෂ්පාදකයන්ගේ, ඒ සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ කඩා වැටීමත් එක්කම ආර්ථිකයත් කඩාගෙන වැටේවි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, තෙල්දෙණිය මැතිවරණ බල ප්‍රදේශය ගත්තොත්, එහි මහරවෙල කියන ප්‍රදේශය මැටි කර්මාන්තයට ඉතාම ජනප්‍රිය ප්‍රදේශයක්. ඒ ප්‍රදේශය මැටි කර්මාන්තය කෙරෙන ප්‍රදේශයක්. නමුත් ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔවුන්ට නව ශිල්ප ක්‍රමවල අවශ්‍යතාව තිබෙනවා. අද ලෝකයේ

මැටි කර්මාන්තය ක්‍රියාත්මක වෙන්නේ සාම්ප්‍රදායික මැටි කර්මාන්තය කරපු ආකාරයට නොවෙයි කියලා ඔබතුමා දන්නවා. ඒ සඳහා වන උපකරණ තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ අයට තිබෙන පොදු ගැටලුවක් තමයි වෙළෙඳ පොළ නොමැති වීම කියන ගැටලුව.

කුරගල ප්‍රදේශය බෙර, දවුල් කර්මාන්තයට ප්‍රසිද්ධයි. උඩුනුවර මැතිවරණ බල ප්‍රදේශයේ තමයි ඒ ගම් පිහිටා තිබෙන්නේ. ඇම්බැක්ක, ලී කැටයම් කලාවට ප්‍රසිද්ධයි. එම කර්මාන්තවලට තරුණ තරුණියන් ආකර්ෂණය නොවීම එම කර්මාන්තයේ කඩා වැටීමට ප්‍රබල හේතුවක් වෙලා තිබෙනවා. එම නිසා මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. ඒ වාගේම, මම ඔබතුමාට උදව්වකුත් කරනවා. ගන්නෝරුව ප්‍රදේශයත්, මොරගහමුල ප්‍රදේශයත්, හන්දෙස්ස ප්‍රදේශයත්, Bogambara Prison එක තිබෙන ප්‍රදේශයත් ආශ්‍රිතව වෙළෙඳ පොළක් හදලා, එම කර්මාන්තකරුවන්ට මහනුවර දිස්ත්‍රික්කය තුළ පොදු තැනක් හදා දීලා, ඒ අයගේ ආදායම් වැඩි කරගන්න පහසු ප්‍රදේශයක් හරිගස්වා දෙන්න අපි සූදානම්. මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා වශයෙන් මට පුළුවන් ඒ සම්බන්ධීකරණ කටයුත්ත කරලා දෙන්න. ගරු ගුණතිලක රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාවට පණක් ලබා දෙමින්, මෙය හුදු කථා බහක් නොකර, ඒ වෙනුවෙන් ප්‍රායෝගික වැඩ පිළිවෙළක් හදලා මහනුවර දිස්ත්‍රික්කයේ සිටින මේ කර්මාන්තකරුවන් බේරාගන්න ඔබතුමා කටයුතු කරාවි කියා මා විශ්වාස කරනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ සඳහා උත්සාහයක් ගන්න කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.17]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

අපි මේ කාලය තුළ වැඩිපුර කථා කරනවා, ස්වදේශිකත්වය සම්බන්ධයෙන්. ඒ වාගේම අපේ රටේ අවශ්‍යතා අනුව අපේ නිෂ්පාදන දියුණු කරලා අපේ නිෂ්පාදකයන් ඉදිරියට ගෙන ඒම ගැන අප වෙනදාට වඩා කථා කරන යුගයක් මේ තිබෙන්නේ. අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව වශයෙන් ගරු ගුණතිලක රාජපක්ෂ මැතිතුමා ඉතා කාලෝචිත යෝජනාවක් තමයි ගෙනැල්ලා තිබෙන්නේ. මෙහිදී මම විශේෂයෙන්ම සතුටු වන කාරණයක් තිබෙනවා. ඒ තමයි, ගරු ප්‍රසන්න රණවීර රාජ්‍ය අමාත්‍යතුමා මේ ගැන සවිඥ්ඥාණකව හිතන්න පුළුවන් රාජ්‍ය අමාත්‍යවරයෙක් වීම. එතුමාට භාර දුන් කාර්යය මේ වන විටත් එතුමා හොඳින් කරගෙන යනවා. ස්වදේශිකත්වය මුල් කරගත් අපේ නිර්මාණවලට විශාල අභිවෘද්ධිමත් කාලයක් උදා කරමින් තිබෙන අවස්ථාවක මේ ප්‍රශ්නය ආණ්ඩු පාර්ශ්වයෙන්ම කථා කරන්න පටන් ගත් එක සුවිශාල ජයග්‍රහණයක්. එවැනි ස්වයං විවේචනයක් තිබෙන්න ඕනෑ, ඒ කර්මාන්ත ගැන කථා කරලා, ඒවායේ ප්‍රශ්න මොනවාද කියලා හඳුනාගෙන ඒවාට අවශ්‍ය උත්තර දෙන්න නම්.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ රනාල ගත්තාම, එහි මැටි කර්මාන්තය කෙරෙනවා. මොරටුව ගත්තාම, එහි දැව කර්මාන්තය කෙරෙනවා. අතුරුගිරිය ආදී ප්‍රදේශවල වාගේ කර්මාන්තයට අදාළ නිෂ්පාදන කෙරෙනවා. මේ සියලු දේවල් ගත්තාම, පොදුවේ අපේ මන්ත්‍රීවරුන් කථා කරපු ප්‍රශ්න එක්ක බැලුවාම අපට පෙනෙනවා, මේ කියන නීත්‍යානුකූල රාමුව තුළ අපට විශාල ගැටලුවක් තිබෙන බව. අපි එක පැත්තකින් කියනවා, අපේ ස්වදේශික කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය කරන්න ඕනෑ, ඒ අයට අත හිත දෙන්න ඕනෑ කියලා. හැබැයි ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, සියලු අණ පනත්, රීති යනාදී හැම දෙයක්ම නිර්මාණය වෙලා තිබෙන්නේ ඒ අය කරන කටයුතු සංකෝචනය කරලා, හකුළවන්නයි.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කියනවා අපි දැක්කා, හකුරු කර්මාන්තය සඳහා රා ටිකක් ලබාගන්න කිතුලක් මැදගන්න ඉඩ දෙන්න කියලා. එවැනි තීරණයක් ගත්තා. ඒවා ඉතාම හොඳ දේවල්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා තවත් ඉස්සරහට ගිහින් මේ වාගේ ප්‍රශ්නසහගත තැන්වලට ඍජුව මැදිහත් වෙලා කටයුතු කරන්න.

අපේ ඇලුමිනියම් කර්මාන්තයේ නියැළී ඉන්න අය මට විශේෂයෙන්ම කියපු කාරණයක් තිබෙනවා. ඒ අය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙන් පුංචි කුරු වගයක් ගන්නවා. ඒවා ලබා දෙන ක්‍රියා පිළිවෙතේ යම් දෝෂයක් ඇති වෙලා තිබෙනවා. අද වනකොට ඒ කර්මාන්තකරුවන්ට තාච්චි ටික හදා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම, එම අමු ද්‍රව්‍යවල විශාල හිඟයක් තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේවාට ඔබතුමා මැදිහත් වෙලා ඒ අයට අවශ්‍ය සියලු දේ ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

අද අපේ දේශීය කර්මාන්ත කඩා වැටෙන්න ප්‍රධාන වශයෙන්ම බලපා තිබෙන්නේ වෙළෙඳ පොළක් නොමැති වීමයි. ඒ සඳහා අවශ්‍ය වෙළෙඳ පොළ නිර්මාණය කරගැනීමේ විශාල වගකීමක් අපට තිබෙනවා. අපි අනවශ්‍ය භාණ්ඩ පවා පිට රටින් ගෙන්වනවා. අපි අහලා තිබෙනවා, අන්තිමේදී නිදියන පැදුරත් පිට රටින්ම ගෙනෙනවා කියලා. අපි ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරයි කියා මම බලාපොරොත්තු වෙනවා. ඔබතුමා ඒ සඳහා පූර්ණ මැදිහත්වීමක් කරයි කියලාත් මම විශ්වාස කරනවා.

බෙහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.19]

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාම කාලෝචිත මාතෘකාවක් යටතේ ගෙන එන ලද වැදගත් යෝජනාවක්.

ශ්‍රී ලංකාවේ ජන ජීවිතය තුළ අතීතයේ පටන් පාරම්පරික ලෙස පැවත එන දේශීය කර්මාන්තය අද අරාජික තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මෙම කර්මාන්ත අතර මැටි කර්මාන්තය, රන් රිදී කර්මාන්තය, පිත්තල කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආදී කර්මාන්ත විශේෂයෙන් සැලකිල්ලට ගත හැකියි. මේ කර්මාන්ත ආශ්‍රිතව ජීවත් වන විශාල ජනතාවක් අප රට තුළ ඉන්නවා. නමුත්, ඔවුන්ට බොහෝ ප්‍රශ්න ගැටලු තිබෙනවා. ඒ ආශ්‍රිත නිෂ්පාදනයේදී අමු ද්‍රව්‍යවල හිඟකමක් තිබෙනවා. ඒ වාගේම අමු ද්‍රව්‍යවල මිල අධිකයි. වෙනත් ප්‍රදේශවලින් අමු ද්‍රව්‍ය

**[ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය ]**

ගෙන්වන්න සිදු වී තිබෙනවා. ඒවාට යන වියදම ඉතා වැඩියි. ඒ වාගේම පවතින ආර්ථික තත්ත්වය මත නිෂ්පාදකයන්ගේ ලාභය අඩු වෙලා තිබෙනවා. නිසි වෙළෙඳ පොළක් නොමැති වීම නිසා එම කර්මාන්තකරුවන් එම කර්මාන්තවලින් ඉවත් වන තත්ත්වයක් පැන නැඟී තිබෙනවා. ඒ වාගේම නව කර්මාන්තකරුවන් මෙම කර්මාන්තවලට යොමු වීමේ මැළිකමක් ද දක්වනවා.

එම සාම්ප්‍රදායික කර්මාන්තවල නිරත වූවන් මුහුණ දෙන ගැටලු නිරාකරණය කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් යොදන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ රජය මැටි කර්මාන්තය ඇතුළු ග්‍රාමීය කර්මාන්ත වෙනුවෙන් කටයුතු කිරීම සඳහා රාජ්‍ය ඇමතිවරයකු පත් කර තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. කලින් කර්මාන්ත අමාත්‍යාංශය තිබුණත්, මේ වාගේ කර්මාන්තවලට වැඩි සැලකිල්ලක් දැක්වූයේ නැහැ. ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය වාගේ ආයතන මූලික වෙලා තමයි එම කර්මාන්ත සම්බන්ධයෙන් ඒ දවස්වල ක්‍රියා කළේ. නමුත්, දැන් අපට එම කර්මාන්තවලට වෙන් වූ රාජ්‍ය අමාත්‍යවරයෙක් සිටිනවා. ඉතින් ඒක අපට ලොකු පහසුවක් වෙලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. ඉදිරි අනාගතයේ දී දේශීයත්වයට මුල් තැන දී එතුමා කටයුතු කරයි කියා මම විශ්වාස කරනවා.

දේශීය දේවල්වලට පයින් ගහලා, ඒවා පහත් කරලා අද අපි දුක් විඳිනවා. මැටි පිඟන් වෙනුවට ප්ලාස්ටික්, ඇලුමිනියම් භාජන පාවිච්චි කරලා මිනිස්සු අද වෙද්දී නිකරුණේ ලෙඩ වෙලා ඉන්නවා. අවසාන වශයෙන්, මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපේ රටේ මේ කර්මාන්තය දියුණු කරන්නට ලබා දිය හැකි සියලු පහසුකම් ලබා දෙන්න කියලා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට පිළිතුරු කථාව, ගරු ප්‍රසන්න රණවීර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.22]

**ගරු ප්‍රසන්න රණවීර මහතා (වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணவீர - பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Prasanna Ranaweera - State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙන ඒම පිළිබඳව ගරු ගුණතිලක රාජපක්ෂ මැතිතුමාට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. පසුගිය ඉතිහාසය පුරා මේ සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව, එම කර්මාන්තවල යෙදෙන අපේ රටේ ජනතාව කෙරෙහි අවධානය යොමු වෙලා තිබුණේ නැහැ. නමුත්, එම ජන කොටස් පිළිබඳව, අවධානයට ලක් නොවුණු එම පිරිස පිළිබඳව සොයා බලා කටයුතු කිරීමේ වගකීම අතිගරු ජනාධිපතිතුමා මාහට පැවරුවා. සංසමිත්තා තෙරණිය මේ රටට වැඩම කිරීමත් එක්ක, අවුරුදු 2,300කට වැඩි ප්‍රෞඪ ඉතිහාසයක් තිබෙන අපේ රටේ එදා පටන් පැවත එන මේ සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව සොයා බලා කටයුතු කිරීමේ ඒ අභියෝගය එතුමා මට භාර දුන්නා. ඊට පසු මම මේ ක්ෂේත්‍රය පිළිබඳව සිටින ආචාර්යවරු, මහාචාර්යවරු, ඒ වාගේම නිපුණතාව, දක්ෂතාව තිබෙන පිරිස් සමඟ සාකච්ඡා කර බැලුවා. ඒ වාගේම එම කර්මාන්තවල නිරත අයගේ ජීවන තත්ත්වය උසස් මට්ටමට ගෙන එන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අපි සොයා බැලුවා. එහිදී මූලික කාරණා කිහිපයක් අපි දැක්කා. පසුගිය කාලයේ ඔවුන් කෙරෙහි අවධානය යොමු නොවුණු නිසාම ඔවුන්ට ඇති වූ ගැටලු රාශියක් මගේ නිරීක්ෂණයට ලක්වුණා. නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ නිමාව පහළ මට්ටමක පැවැතීම, නවීන තාක්ෂණය භාවිත නොකිරීම, අමුද්‍රව්‍ය ගැටලු, ආකල්පමය ගැටලු, නව යන්ත්‍රසූත්‍ර භාවිත නොකිරීම, පුහුණු ශ්‍රමය ලබා නොගැනීම කියන කාරණා පිළිබඳව අපි අවධානය යොමු කළා. මේ මූලික ගැටලු විසඳා දේශීය සහ විදේශීය වෙළෙඳ පොළ ජයගත හැකි උසස් නිමාවක්, කල් පැවැත්මක් සහිත ගුණාත්මක බවින් යුතු පරිසර හිතකාමී භාණ්ඩ ඔවුන් ලවා කෙසේ නිර්මාණය කර ගත යුතු ද යන්න කෙරෙහි අපේ අවධානය යොමු කළා. අපි ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත්තා. අපි මේ වනකොට ඒ අමුද්‍රව්‍ය පිළිබඳ ගැටලු විසඳන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. අපි පන්තොටින් පන් වවන්න පටන් ගත්තා. යටියන්තොටින් වේවැල්, පොළොන්නරුවෙන් හණ, හම්බන්තොටින් කළුවර ආදී වශයෙන් වගා කරන්න පටන් ගත්තා.

අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා කථා කරද්දී කිව්වා, පසුගිය කාලයේ තඹ පිත්තල සියල්ලක්ම අපනයනය කළා කියලා. කර්මාන්ත අමාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමා සමඟ අපි සාකච්ඡා කරලා, එතුමාගේ උපදෙස් මත ඒ සියලු අබලි ද්‍රව්‍ය අපනයනය කිරීම තහනම් කිරීමට කැබිනට් පත්‍රිකාවක් දැම්මා. ඒ අනුව, කර්මාන්තකරුවන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ටික ලබා දීමට අපි කටයුතු කරමින් සිටිනවා. නමුත්, අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ යම් ගැටලුවක් පවතිනවා. ඒ තමයි, අබලි ද්‍රව්‍ය අපනයනය කිරීම තහනම් කළත් රේගුව සම්බන්ධ කර ගෙන හොර රහසේ export කරන කණ්ඩායම් තවදුරටත් මේ රට තුළ ක්‍රියාත්මක වෙන එක. මේ ජාවාරමට අපි තිත තැබිය යුතුයි. අමාත්‍යාංශය විධියට අපට පමණක් මේ කටයුත්ත කරන්න බැහැ. මේ කර්මාන්තකරුවන් දිරිගැන්වීම සඳහා අනෙකුත් ආයතනවල සහයෝගය, ශක්තිය අප ලබාගත යුතුයි. ඒ වාගේම අපි පරිසර අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරලා මැටි කර්මාන්තයට මාසයකට අවශ්‍ය අමුද්‍රව්‍ය වශයෙන් මැටි කියුබ් 05ක් බැගින් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ජාතික ශිල්ප සභාවේ හැඳුනුම්පත තිබෙන අයට ඒවා ලබා දීමට කටයුතු කළා.

මෙතෙක් කල් මේ විෂයයන් පිළිබඳව ජනතාව තුළ තිබුණේ ඉතා අඩු මට්ටමක ආකල්පයක්. එක එක්කෙනා එක එක කෝණවලින් තමයි මේවා දිහා බැලුවේ. ඒ නිසා අපට ජනතාව තුළ මේවා සම්බන්ධයෙන් ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව තිබුණා. මේ පිළිබඳව ජනතාව තුළ ධනාත්මක චින්තනයක් ඇති කිරීම සඳහා, ලෝක වෙළෙඳ පොළට නව නිර්මාණ සැපයීම සඳහා, අගය එකතු කිරීමේ වැඩ පිළිවෙළ, අලෙවිකරණය, ආදායම් වියදම් පරිපාලනය පිළිබඳ පුහුණු පාඨමාලා විශාල ප්‍රමාණයක් ඇති කිරීම අපි සිද්ධ කළා. ඒ වාගේම පසුගිය වර්ෂය තුළ සෑම ගම්මානයකටම මිලියන 5ක -ලක්ෂ 50ක- මුදලක් වියදම් කරමින් ගම්මාන සියයකට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීලා, අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ටික ලබා දීමටත් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ මඟින් ඔවුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කරනවා සේම, හොඳ අලෙවිකරණයක්, marketing mix එකක් අපි බලාපොරොත්තු වුණා. ඒ තුළ නිෂ්පාදනය, මිල, ගුණාත්මකභාවය සහ ඇසුරුම කියන කොටස් හතරම තිබෙනවා. ඒක නැතුව මේ වැඩේ කරන්න බැහැ. ඇසුරුම්කරණය විශේෂයි. මේ කරුණු හතර තුළ සාම්ප්‍රදායික භාණ්ඩ විතරක් නොවෙයි, -*[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඕනෑම ප්‍රශ්නයක් තිබෙනවා නම්, අහන්න.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ප්‍රධානම ප්‍රශ්නය තමයි අමුද්‍රව්‍ය සඳහා තිබෙන ගැටලුව. ඒ වාගේම ඒවායේ මිල ඉතාම අධික ලෙස ඉහළ ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම පිත්තල කර්මාන්තයේ අමුද්‍රව්‍යවල. ඒ නිසා මේවාට පනවා තිබෙන බදු අඩු කරලා හරි කමක් නැහැ, අපට අමුද්‍රව්‍ය පහසු මිලට ගන්න පුළුවන් ක්‍රමයක් හදලා දෙන්න ඔබතුමාට පුළුවන්ද?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

ගරු මන්ත්‍රීතුමා, මෙතෙක් කල් අබලි ද්‍රව්‍ය විධියට පිත්තල සහ යකඩ ඔක්කෝම අපි ඉන්දියාවට පැටෙව්වා. අපි ඒක තහනම් කළා. ඔබතුමා කියපු කාරණය ගැන අපි ඉදිරියේදී කථා කරලා බලමු. මේ අමු ද්‍රව්‍යවලට පනවා තිබෙන බදු සම්බන්ධව මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා බලමු. ඔබතුමාත් දන්නවා, මහනුවර ප්‍රදේශයේ පිළිමතලාවේ පිත්තලවලින් විසිතුරු සාම්ප්‍රදායික නිර්මාණ සිදු කළා. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ කිරිබත්ගොඩ, මහර ආසනවල වෙළඳපොළ ආර්ථිකයත් එක්ක යන නිෂ්පාදන තමයි සිදු වුණේ. සරනේරු, padlocks වාගේ ඒවා හදන කර්මාන්තය කිරිබත්ගොඩ ප්‍රදේශයේ සිදු වුණා. ඒවා විශාල ලෙස ආනයනය කළේ පිටරටින්. ආනයන ආදේශක භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හැකියාව අපට ඇති වුණා. නමුත් සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීමත් සමඟම විසිතුරු භාණ්ඩ කර්මාන්තයේත් ගැටලු මතු වුණා. ඒ නිසා පිත්තල කර්මාන්තයේ යෙදී සිටින ජනතාවටත් ගැටලු ඇති වෙලා තිබෙනවා. වෙස් මුහුණු සැදීමේ කර්මාන්තයේ යෙදුණු ජනතාවටත් ගැටලු ඇති වෙලා තිබෙනවා. ලී කැටයම් කර්මාන්තයේ යෙදුණු ජනතාවටත් ගැටලු ඇති වෙලා තිබෙනවා. නමුත් ඉදිරියේදී මේ කර්මාන්තවල හොඳ ප්‍රවණතාවක් ඇති වේවි කියලා අපි විශ්වාස කරනවා. සාම්ප්‍රදායික කර්මාන්ත අපි නවීන තාක්ෂණයත් එක්ක බද්ධ කරලා කටයුතු කළ යුතුයි. අපේ සම්ප්‍රදාය, අපේ උරුමය ආරක්ෂා කර ගනිමින් ලෝක වෙළෙඳ පොළ ජය ගන්නේ කෙසේ ද කියන කාරණය ගැනත් අපි බලන්න ඕනෑ. ඒ නිසා තමයි නිෂ්පාදනය, මිල, ගුණාත්මකභාවය සහ ඇසුරුම කියන කොටස් හතරේ quality එක වැඩි කරන්න ඕනෑ කියලා අපි කිව්වේ. පිරිවැය අඩු කරලා, භාණ්ඩවල ගුණාත්මකභාවය වැඩි කරලා, ඇසුරුමේ ආකර්ෂණීයභාවය වැඩි කිරීම තුළින් අළෙවිය වැඩි කර ගන්න පුළුවන්. ඊයේ, www.lakshilpa.com කියන website එක open කරන්න අපට පුළුවන් වුණා. ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා, ඒ වාගේම ගරු විමල් වීරවංශ ඇමතිතුමා, ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා ඒ අවස්ථාවට සහභාගි වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ. කථාව අවසන් කරන්න.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ online marketing - e-marketing - හරහා අපේ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවන්න අපට පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර භාණ්ඩ තිබෙනවා, ඒවායේ මිල ගණනය කරන්න බැහැ. ඔවුන්ගේ නිර්මාණවලට වටිනාකමක් දෙන්න බැහැ. ඒ වටිනාකම ඔවුන්ට දෙන්න වෙන්නේ auction ක්‍රමයට. මොකද, දක්ෂ නිර්මාණකරුවන්ගේ අති දැවැන්ත නිර්මාණ තිබෙනවා. ඒවා auction ක්‍රමයට වුණත් ඇණවුම් කරන්න පුළුවන් වෙන විධියට තමයි අපි ඒ වැඩකටයුතු කරගෙන යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ආර්ථික අභියෝග හමුවේ අපේ ඉලක්ක සපුරා ගන්න නම්, අපි නවීන තාක්ෂණයත් එක්ක යා යුතු වෙනවා. අද ලෝකයම ඇඟිලි තුඩකට ගන්නට හැකි වෙලා තිබෙන මොහොතක, නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් ජනතාවට මේ සම්බන්ධ තිබෙන ගැටලුවලට විසඳුම් ලබා දෙමින්, අපේ සම්ප්‍රදාය රකිමින් අපි නව උත්පාදන ආර්ථිකයක් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ඉදිරියේ දී ගන්න බව ප්‍රකාශ කරනවා.

ඉදිරියේදීත් ගම් මට්ටමින්, බිම් මට්ටමින් ජනතාව අතරට ගිහිල්ලා ඔබතුමන්ලා ඉදිරිපත් කරපු කරුණු අනෙකුත් අමාත්‍යාංශ එක්කත් සාකච්ඡා කරලා, අවශ්‍ය පහසුකම් ටික සපයා දීලා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්න පුළුවන් කියන මට්ටමක අපි ඉන්නවා. මොකද, උපාධියක් තිබුණත් අද මාසිකව උපරිම රුපියල් 40,000යි, 50,000යි ගන්න පුළුවන්. හැබැයි, මේ අයට තාක්ෂණය සමඟ සාම්ප්‍රදායික දේවල් ලබා දුන්නොත්, ඊටත් වඩා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ හැකියාවක් ලැබෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. මෙවර අය වැයෙනුත් අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්නයි. ඒ නිසා අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න අපේ අමාත්‍යාංශයෙන් කළ හැකි උපරිම දේ කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පුළුවන් නම් ගන්නෝරුව, බෝගම්බර වාගේ තැන්වල හදන්න යන වෙළෙඳ පොළවල අළෙවි මධ්‍යස්ථාන පහසුකම් ලබා දෙන්න.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මේ වසරට අපට තිබුණු මුදල් ඉවරයි. ලබන වසරේ ප්‍රතිපාදනවලින් අපි ඒ අවශ්‍ය කටයුතු කරන්නම්. ඔබතුමා නිතර නිතර මට කථා කරනවා. මේ සම්බන්ධයෙන් උනන්දුවක් තිබෙන අපේ සහෝදර මන්ත්‍රීවරු ඔක්කෝම ආවා, මාත් එක්ක සාකච්ඡා කරලා ඒ ගම්වලට වැඩ කරන්න. මේ අවුරුද්දේ අපි ගම් 100ක ඒ වැඩ කටයුතු කළා. ඉදිරි වර්ෂයේදී ඒ ප්‍රවර්ධන කටයුතු අපි අනිවාර්යයෙන්ම කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 නොවැම්බර් 20 වන දින සභා සම්මතිය අනුව, 2021 නොවැම්බර් 24 වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே, மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2021 நவம்பர் 20ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2021 நவம்பர் 24, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Wednesday, 24th November, 2021, pursuant to the Resolution of Parliament of 20th November, 2021.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා කොළඹ 5 කිරුළපන මාවතේ**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත කළ හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை கொழும்பு 5, கிருலப்பனை மாவத்தையிலுள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
Kirulapone Avenue, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.